135 වන කාණ්ඩය - 14 වන කලාපය
தொகுதி 135 – இல. 14
Volume 135 – No. 14

M.C.M. Iqbal

2001 අප්‍රේල් 04 වන බදාදා
புதன்கிழமை, 4 ஏப்பிறல் 2001
Wednesday, 4th April, 2001

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
## அதிகார அறிக்கை
## OFFICIAL REPORT

( අශෝධිත පිටපත / பிழை திருத்தப்படாதது / Uncorrected)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

වරප්‍රසාද :

ගරු මංගල සමරවීර අමාත්‍යතුමා 2001.03.22 සහ 2001.04.02 දිනවල පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශ

පුංචිබොරැල්ල බෝධි ප්‍රාකාරය : කඩා ඉවත් කිරීම

විසර්ජන පනත් කෙටුම්පත, 2001 : [විසි එක් වන වෙන් කළ දිනය] :

[ශීර්ෂ 590, 591, 602, 605 – 632 (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ) : ශීර්ෂ 550 (පළාත් සභා සහ පළාත් පාලන) : ශීර්ෂ 320 (විදුලිබල හා බලශක්ති)] කාරක සභාවේදී සලකා බලන ලදී

කල්තැබීමේ යෝජනාව :

බෞද්ධ පුරාවස්තුන් ආරක්ෂා කර ගැනීම පිණිස පුදුසු වැඩ පිළිවෙළක්

---

# பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

*சிறப்புரிமை:*

*மாண்புமிகு மங்கள சமரவீர அவர்கள் 2001.03.22, 2001.04.02 ஆகிய தினங்களில் பாராளுமன்றத்தில் விடுத்த கூற்றுக்கள்*

*புஞ்சிபொரல்லை போதியின் சுற்று நிருமாணம்: உடைத்தகற்றல்*

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2001 [ஒதுக்கப்பட்ட இருபத்தோராம் நாள்]:

*[தலைப்புகள் 590, 591, 602, 605-632 (பொது நிருவாக, உள்நாட்டலுவல்கள், நிருவாக மறுசீரமைப்பு); தலைப்பு 550 (மாகாண சபைகள், உள்ளூராட்சி); தலைப்பு 320 (மின்வலு, சக்தி)] - குழுவில் ஆராயப்பட்டது*

ஒத்திவைப்புப் பிரேரணை :

பௌத்த தொல்பொருட் சின்னங்களைப் பாதுகாப்பதற்கான திட்டம்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE :

Statements made by the Hon. Mangala Samaraweera in Parliament on 22.03.2001 and 02.04.2001

PUNCHI BORELLA BODHI : DEMOLITION OF SURROUNDING STRUCTURE

APPROPRIATION BILL, 2001 [Twenty First Allotted Day] :

Considered in Committee [Heads 590, 591, 602, 605 to 632 (Public Administration, Home Affairs and Administrative Reforms) ; Head 550 (Provincial Councils and Local Government) ; Head 320 (Power and Energy)]

ADJOURNMENT MOTION :

Scheme for protection of Buddhist archaelogical monuments

2 – H 011659 – 1,850 (2001/05)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

2001 අප්‍රේල් 4 වන බදාදා
*புதன்கிழமை, 4 ஏப்பிறல் 2001*
*Wednesday, 4th April, 2001*

*පූ. භා. 10.00ට පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු ලලිත් දිසානායක මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் மு. ப. 10.00 மணிக்குக் கூடியது. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு லலித் திஸாநாயக்க] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 10.00 a.m.* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. LALITH DISSANAYAKE] *in the Chair.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

සී. පී. ඩී. බණ්ඩාරනායක මහතා (වන සම්පත් හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
*(திரு. சீ. பீ. டி. பண்டாரநாயக்க – வன வள, சூழலியல் பிரதி அமைச்சர்)*
(The Hon. C. P. D. Bandaranaike – Deputy Minister of Forestry and Environment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් අට මම පිළිගන්වමි :

(1) මීරිගම, ඉඳිපරපේ, පස්යාල පාර අංක 49 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්. ඒ. පී. එල්. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගම්පහ, තිලක පාර, අංක 17/1 දරන ස්ථානයේ පදිංචි පී. විජේදස මහතාගෙන් ලැබුණු පෙත්සම ;

(3) මාකොළ, හගී පාතිමා ගාර්ඩ්න්, අංක 45 දරන ස්ථානයේ පදිංචි වී. ඒ. ඉස්මාහුන් මහතාගෙන් ලැබුණු පෙත්සම ;

(4) කැලණිය, කිරිබත්ගොඩ, ජාතික නිවාස සංකීර්ණය අංක 2 දරන ස්ථානයේ පදිංචි කේ. පී. ජේ. සෝමපාල මහතාගේ ලැබුණු පෙත්සම ;

(5) ඉඹුල්ගොඩ, පහළ ඉඹුල්ගොඩ, ජයබිම අංක 301/1 දරන ස්ථානයේ පදිංචි අයි. එල්. ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම ;

(6) මීරිගම, හලුගම, ආර්. එම්. විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම ;

(7) අඹේපුස්ස, දඹුගොල්ල, 'ප්‍රියසෙවන' පදිංචි ඩබ්ලිව්. ඩබ්ලිව්. ඩී. විජේසූරිය මහතා ගෙන් ලැබුණු පෙත්සම සහ

(8) වේයන්ගොඩ, වඳුරුව, අංක 79 දරන ස්ථානයේ පදිංචි කේ. රූපානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම.

නිහාල් ගලප්පත්ති මහතා
*(திரு. நிஹால் கலப்பத்தி)*
(Mr. Nihal Galappatthy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් තුන මම පිළිගන්වමි :

(1) පත්තිපිටිය, පෙලන්වත්ත, සමුපකාර මාවතේ අංක 473/24 දරන ස්ථානයේ පදිංචි ආර්. එම්. සුදුමැණිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම ;

(2) ගම්පහ, මුඳුන්ගොඩ, අංක 413/24 දරන ස්ථානයේ පදිංචි එම්. ඩී. ප්‍රේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම සහ

(3) වලස්මුල්ල, විහාර මාවත, මිද්දෙනිය පාර පදිංචි, ඩබ්ලිව්. එච්. හදනවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ලකී ජයවර්ධන මහතා
*(திரு. லக்கீ ஜயவர்தன)*
(Mr. Lucky Jayawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි පහත සඳහන් පෙත්සම් හතර මම පිළිගන්වමි :

(1) පේරාදෙනිය, හේත්දෙනිය අංක 151 දරන ස්ථානයේ පදිංචි කේ. එම්. කේ. කුලසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හන්දෙස්ස, යාලේගොඩ, අංක 76 දරන ස්ථානයේ පදිංචි ඩී. එම්. මුතුබංඩා මහතාගෙන් ලැබුණු පෙත්සම ;

(3) අටබාගේ, දල්පිටිය, ගහසිරිගම අංක 23 දරන ස්ථානයේ පදිංචි විල්ප්‍රඩ් ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම සහ

(4) ගෙලිඔය, පිටවලවත්ත, අංක 150 දරන ස්ථානයේ පදිංචි කේ. ජී. පුංචිකිරා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
*(ஜனாப் இம்தியாஸ் பாக்கிர் மாக்கார்)*
(Mr. Imthiaz Bakeer Markar)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් පහ මම පිළිගන්වමි :

(1) අලුත්ගම, ගාලු පාර, අංක 322 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම ;

(2) අගලවත්ත, බෙල්ලන පාර, ජාතික නිවාස, අංක 5 දරන ස්ථානයේ පදිංචි එම්. ඩී. සී. දයාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම ;

(3) කටුබැද්ද, ප්‍රධාන කාර්යාලය, කොළඹ දකුණ ප්‍රාදේශීය ප්‍රවාහන මණ්ඩලය, ආදයම් විමර්ශන ඒකකය, ඒ. ජේ. පී. සිල්වා මහතා ගෙන් ලැබුණු පෙත්සම ;

(4) මතුගම, යටදෙල, එළගහවත්ත පදිංචි බී. ඒ. සෝමසිරි පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම සහ

(5) පිහිණියාව බටහිර, අංක 848බී දරන ස්ථානයේ පදිංචි එස්. පී. කොතලාවල මහතාගෙන් ලැබුණු පෙත්සම ;

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*

*சமர்ப்பிக்கப்பட்ட மனுக்கள் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Public Petitions Committee.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### තිමුදුර ලයනල් මහතා : මිහින්තලේ ග්‍රාමාරක්ෂක කඳවුරට මාරු කිරීම
### திரு. திமுதுர லயனல் : மிஹிந்தலை ஊர்காவற்படை முகாமுக்கு இடமாற்றம்
### MR. THIMUDURA LIONEL : TRANSFER TO HOME GUARDS CAMP, MIHINTALE

259/'00

3. සරත් ගුණවර්ධන මහතා
*(திரு. சரத் குணவர்தன)*
(Mr. Sarath Goonawardana)

විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) (i) බුස්ස, පට්ටිදෙර, තිමුදුර ලයනල් යන අය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ සිවිල් ආරක්ෂක අංශයේ, ආරක්ෂක ක්‍රම ප්‍රදර්ශකයෙකු ලෙස සේවය කළ බවත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් ගුණවර්ධන මහතා]

(ii) 1999 ඔක්තෝබර් මස 08 වැනි දින සිට ඔහු මිහින්තලේ ග්‍රාමාරක්ෂක කඳවුරට ස්ථාන මාරුවක් දී ඇති බවත්,

එතුමා දන්නෙහිද?

(ආ) එසේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ සිවිල් ආරක්ෂක අංශයේ ආරක්ෂක ක්‍රම ප්‍රදර්ශකයෙකු ලෙස සේවය කළ ඔහු ග්‍රාමාරක්ෂක කඳවුරට ස්ථාන මාරුවක් ලබා දීමට හේතුව කුමක්දැයි එතුමා සඳහන් කරනනෙහිද?

(ඇ) අමාත්‍යාංශ අංක සී 17541 දරන ග්‍රාමාරක්ෂක ලෙස සේවය කිරීමට පවා ඔහුට සිදුවූ බව එතුමා දන්නෙහිද?

(ඈ) මේ අසාධාරණ තීන්දුවට එරෙහිව ගන්නා පියවර කුමක්දැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, சக்தி அமைச்சரும் பாதுகாப்புப் பிரதி அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) (i) பூசா, பட்டிதொரவில் வதியும், திரு. திமுதுர லயனல், தேசிய பாதுகாப்பு அமைச்சின் சிவில் பாதுகாப்புப் பிரிவில் பாதுகாப்பு முறை தொடர்பான செய்முறையாளரகக் கடமையாற்றினார் என்பதையும்,

(ii) 1999.10.08 ஆம் திகதி முதல் அவர் மிஹிந்தலை ஊர்காவற் படை முகாமிற்கு மாற்றப்பட்டுள்ளார் என்பதையும்,

அவர் அறிவாரா ?

(ஆ) தேசிய பாதுகாப்பு அமைச்சின் சிவில் பாதுகாப்புப பிரிவில் பாதுகாப்பு முறைகள் தொடர்பான செய்முறையாளராகக் கடமையாற்றிய இவரை ஊர்காவற்படை முகாமிற்கு இடமாற்றம் செய்வதற்கான காரணம் என்னவென்பதையும் அவர் குறிப்பிடுவாரா ?

(இ) அமைச்சின் சீ. 17541 இலக்கமுடைய ஊர்காவற்படை உறுப்பினராகக் கடமையாற்றும் நிலமை இவருக்கு ஏற்பட்டதென்பதை அவர் அறிவாரா ?

(ஈ) இந்த அநீதியான தீர்மானத்திற்கெதிராக அவர் மேற்கொள்ளும் நடவடிக்கை என்னவென்பதைக் குறிப்பிடுவாரா ?

(உ) இன்றேல் ஏன் ?

asked the Minister of Power and Energy and Deputy Minister of Defence :

(*a*) Is he aware that –

(i) Thimudura Lionel of Pattidora. Boossa served as a Security Methods Demonstrator in the Civilian Security Division of the Ministry of Defence, and

(ii) he was transferred to the Home Guards Camp in Mihintale with effect from 08th October, 1999?

(*b*) Will he state the reason why the Ministry transferred him to the Home Guards Camp in that manner while he had been serving as a Security Methods Demonstrator in the Civilian Security Division of the Ministry of Defence?

(*c*) Is he aware that he even had to work as Home Guard No. C. 17541, as a result?

(*d*) Will he state what steps he will take against this injustice?

(*e*) If not, why?

ගරු රෙජී රණතුංග මහතා (ආහාර සහ අලෙවි සංවර්ධන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு ரெஜி ரணதுங்க - உணவு, சந்தைப்படுத்தல் அபிவிருத்தி அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)
(The Hon. Reggie Ranatunga – Minister of Food and Marketing Development and Chief Government Whip)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) එසේය.

(ii) එසේය.

(ආ) ආරක්ෂක ක්‍රම ප්‍රදර්ශක තනතුරෙහි නියමිත කාර්ය වන්නේ ග්‍රාමාරක්ෂක පුහුණු කඳවුරුවල ආරක්ෂක පුහුණු පාඨමාලාවන්ට බඳවා ගනු ලබන පිරිසට පුහුණුව ලබා දීමේදී සහායවීමයි. එබැවින් මෙම නිලධාරියා ග්‍රාමාරක්ෂක පුහුණු කඳවුරට අනුයුක්ත කර ඇත.

(ඇ) මොහු කිසිම අවස්ථාවකදී ග්‍රාමාරක්ෂකයෙකු ලෙස සේවයේ යොදවා නැත. කෙසේ වෙතත් පුහුණු කඳවුරුවල සේවයේ නියුතු වන නිලධාරීන්ට හඳුනා ගැනීමේ අංකයක් නිකුත් කරනු ලැබේ.

(ඈ) පැන නොනගී.

(ඉ) පැන නොනගී.

## ආර්. පද්මනාදන් මහතා : රත්නපුර රෝහලේ පොලීසියට කළ පැමිණිල්ල
## திரு. ஆர். பத்மநாதன்: இரத்தினபுரி ஆஸ்பத்திரிப் பொலிசில் செய்த முறைப்பாடு
## MR. R. PADMANATHAN : COMPLAINT TO RATNAPURA HOSPITAL POLICE

246/00

5. සුසන්ත පුංචිනිලමේ මහතා
(திரு. சுசந்த புஞ்சிநிலமே)
(Mr. Susantha Punchinilame)

විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) රත්නපුර මැතිවරණ කොට්ඨාසයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මහවලවත්ත පහල කොටස, රත්නපුර පදිංචි ආර්. පද්මනාදන් යන අයට 2000.09.30 දින එම ගම පදිංචි අබ්දුල් මජීඩ්, අබ්දුල් රසූල්, රාෂික්, කාදර් මීරම් යන අය අමානුෂික ලෙස පහරදීම නිසා පත්මනාදන් යන අය රත්නපුර මහ රෝහලේ දින 05ක් නේවාසිකව ප5තිකාර ලබා ගත බව එතුමා දන්නෙහිද?

(ආ) මේ පිළිබඳව රත්නපුර රෝහලේ පොලීසියෙහි 2000.11.01 දින පැමිණිල්ලක් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) රත්නපුර පොලිසිය ඉහත කී පුද්ගලයන් සම්බන්ධයෙන් මේ වන තෙක් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැති බව එතුමා දන්නෙහිද?

(ඈ) ඒ මන්දැයි එතුමා මෙම සභාවට හෙළි කරන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

மின்வலு, சக்தி அமைச்சரும் பாதுகாப்புப் பிரதி அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) இரத்தினபுரி தேர்தல் தொகுதியில், இரத்தினபுரி பிரதேச செயலாளர் பிரிவில் மஹவல வத்த, கீழ்ப் பிரிவில் வசிக்கும் ஆர். பத்மநாதன் என்பவரை 2000.09.30 ஆம் திகதி இக்கிராமத்தில் வசிக்கும் அப்துல் மஜீத், அப்துல் ரஸூல், ராஸிக், காதர் மிரம், ஆகியோர் மனிதாபிமானமற்ற முறையில் தாக்கியதால் இரத்தினபுரி பெரிய ஆஸ்பத்திரியில் ஐந்து தினங்கள் தங்கியிருந்து சிகிச்சை பெற்றாரென்பதை அவர் அறிவாரா ?

(ஆ) இது தொடர்பாக இரத்தினபுரி ஆஸ்பத்திரி பொலிசில் 2000.11.01 ஆம் திகதி முறைப்பாடு செய்யப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா ?

(இ) இரத்தினபுரிப் பொலிசார் மேற்குறிப்பிட்ட நபர்களுக்கெதிராக இற்றைவரை எதுவித நடவடிக்கையும் மேற்கொள்ளவில்லை என்பதை அவர் அறிவாரா ?

(ஈ) இதற்கான காரணத்தை அவர் இச்சபையில் அறிவிப்பாரா ?

(உ) இன்றேல் ஏன் ?

asked the Minister of Power and Energy and Deputy Minister of Defence :

(*a*) Is he aware that Mr. R. Pathmanathan of Lower Division of the Mahawala Watta Estate in the Ratnapura Divisional Secretariat Division in the Ratnapura electorate had to be in the Ratnapura General Hospital for five days for treatment due to being assaulted by Abdul Madjeed, Abdul Razul, Razik and Cader Mirum of the same village on 30.09.2000?

(*b*) Is he aware that a complaint had been lodged at the Ratnapura Police Post on 01.11.2000, in this regard ?

(*c*) Is he aware that Ratnapura Police have not taken any action up to now against the aforesaid person?

(*d*) Will he disclose the reason for it?

(*e*) If not, why?

ගරු රෙජී රණතුංග මහතා
*(மாண்புமிகு ரெஜி ரணதுங்க)*
(The Hon. Reggie Ranatunga)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) මෙවැනි සිද්ධියක් සම්බන්ධයෙන් ආර්. පද්මනාදන් යන අය විසින් 2000.09.30 දින හෝ ඊට ආසන්න දිනයක රත්නපුර පොලීසියට පැමිණිල්ලක් කර නැත.

(ආ) මෙවැනි සිද්ධියක් සම්බන්ධව 2000.11.01 දින රත්නපුර රෝහල් පොලිසියට පැමිණිල්ලක් ලැබී නැත.

(ඇ) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

(ඉ) පැන නොනඟී.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Question No. 6.

සුසන්ත පුංචිනිලමේ මහතා
*(திரு. சுசந்த புஞ்சிநிலமே)*
(Mr. Susantha Punchinilame)
මම අහනවා.

ගරු රෙජී රණතුංග මහතා
*(மாண்புமிகு ரெஜி ரணதுங்க)*
(The Hon. Reggie Ranatunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඩබ්ලිව්. එම්. ජයරත්න මහතා : ආණමඩුව පොලීසියට කළ පැමිණිල්ල

### *திரு. டபிள்யூ. எம். ஜயரத்ன : ஆனமடுவ பொலிசில் செய்த முறைப்பாடு*

### MR. W. M. JAYARATNE : COMPLAINT TO ANAMADUWA POLICE

278/'00

1. අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා (පාලිත රංගේ බණ්ඩාර මහතා වෙනුවට)
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர் - திரு. பாலித ரங்கே பண்டார - சார்பாக)*
(Alhaj A. H. M. Azwer on behalf of Mr. Palitha Range Bandara)

විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) (i) ආණමඩුව, නවගත්තේගම, රඹකනයාගම පදිංචි ඩබ්ලිව්. එම්. ජයරත්න මහතාගේ නිවස 2000.10.14 වැනි දින රාත්‍රී 10.30ට පමණ ගිනි තබා රු. 7,000ක පමණ අලාභයක් සිදුකර ඇති බවත්,

(ii) ජයරත්න මහතා විසින් මේ පිළිබඳව පැමිණිලි කිරීමට 2000.10.16 වැනි දින ආණමඩුව පොලිස් ස්ථානයට ගියද පැමිණිල්ල භාර නොගත් බවත්,

එතුමා දන්නෙහි ද?

(ආ) 2000.10.17 වැනි දින නැවත පොලිසියට ගොස් පැමිණිලි කිරීමෙන් පසු මේ සඳහා ආණමඩුව පොලිස් ස්ථානය ගත් පියවර කුමක් ද යන්න එතුමා මේ සභාවට හෙළිකරන්නෙහි ද?

(ඇ) මෙම ගිනි තැබීම සම්බන්ධ රඹකනයාගම පදිංචි චන්දන, අජිත්, හේමන්ත සහ අතුල යන අය සම්බන්ධව පොලිසිය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග කුමක්දැයි එතුමා මේ සභාවට දන්වන්නෙහි ද?

(ඈ) (i) මෙතෙක් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොමැතිනම්, පැමිණිලි ගැන ක්‍රියා කිරීමට පියවර ගන්නෙහි ද යන්නත්,

(ii) සිදුවූ හානිය වෙනුවෙන් රජය වන්දි ගෙවීමට ක්‍රියා කිරීමට කරන්නෙහි ද යන්නත්

එතුමා මේ සභාවට හෙළි කරන්නෙහි ද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, சக்தி அமைச்சரும் பாதுகாப்புப் பிரதி அமைச்சருமானவரைக் கேட்ட வினா :

*(அ)* (i) ஆனமடுவ, நவகத்தேகம, ரம்பகனயாகமவில் வதியும், திரு. டபிள்யூ. எம். ஜயரத்னவின் வீடு 2000.10.14 ஆம் திகதி இரவு 10.30 மணியளவில் தீ வைத்து எரிக்கப்பட்டதால் சுமார் 7,000 ரூபா நஷ்டம் ஏற்பட்டுள்ளதென்பதையும்,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා]

(ii) திரு. ஜயரத்ன இது தொடர்பாக முறைப்பாடு செய்வதற்கு 2000.10.16 ஆம் திகதி ஆனமடுவ பொலிஸ் நிலையத்திற்குச் சென்ற போதிலும் முறைப்பாடு ஏற்றுக்கொள்ளப்படவில்லை என்பதையும்,

அவர் அறிவாரா ?

(ஆ) 2000.10.17 ஆம் திகதி மீண்டும் பொலிஸ் நிலையத்தில் முறைப்பாடு செய்ததன் பின் இது தொடர்பாக மேற்கொள்ளப்பட்ட நடவடிக்கை என்னவென்பதை அவர் வெளிப்படுத்துவாரா ?

(இ) இத் தீவைப்புடன் சம்பந்தப்பட்ட ரம்பகனயாகமவில் வதியும் சந்தன, அஜித், ஹேமந்த மற்றும் அத்துல என்பவர்கள் தொடர்பாக பொலிஸார் மேற்கொண்டுள்ள நடவடிக்கை என்னவென்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா ?

(ஈ) (i) இதுவரை அது சம்பந்தமான நடவடிக்கை மேற்கொள்ளப்படவில்லையெனில் அம் முறைப்பாடு தொடர்பாக நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்,

(ii) ஏற்பட்ட நஷ்டத்திற்கான இழப்பீடு வழங்க அரசாங்கம் நடவடிக்கை மேற்கொள்ளுமா என்பதையும்,

அவர் இச் சபையில் வெளிப்படுத்துவாரா ?

(உ) இன்றேல் ஏன் ?

asked the Minister of Power and Energy and Deputy Minister of Defence :–

(*a*) Is he aware that –

(i) the house of Mr. W. M. Jayaratne, residing in Rambakanayagama, Nawagaththegma, Anamaduwa has been set on fire at about 10.30 on the night of 14.10.2000, causing a loss of about Rs. 7,000 ; and

(ii) even though Mr. Jayaratne went to the Anamaduwa Police Station on 16.10.2000 to complain about the incident, the complaint has not been accepted?

(*b*) Will he disclose to the House the action taken by the Anamaduwa Police after Mr. Jayaratne reached the Police Station a second time on 17.10.2000 and complained?

(*c*) Will he inform the House of the action taken by the Police against the persons named Chandana, Ajith, Hemantha and Athula of Rambakanayaya, who are involved in setting fire to his house?

(*d*) Will he reveal to this House –

(i) whether steps will be taken to act on the complaint, if no action has been taken so far in this regard : and

(ii) whether the Government will take action to pay compensation for the damage caused?

(*e*) If not, why?

ගරු රෙජී රණතුංග මහතා
(மாண்புமிகு ரெஜி ரணதுங்க)
(The Hon. Reggie Ranatunga)

On behalf of the Minister of Power and Energy and Deputy Minister of Defence, I *table** the answer.

*සභා මේසය මත තබන ලද පිළිතුර :*
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(*a*) (i) A complaint has been made to this effect at the Anamaduwa Police Station on 18.10.2000.

(ii) No.

(*b*) Anamaduwa Police made inquiries into the complaint and statements of the complaint have been recorded. As the suspects are evading arrest, Police inquiries are being conducted to apprehend them. Facts have been reported to Magistrate Court Anamaduwa under B Report No. 239/2000.

(*c*) As above in "*b*".

(*d*) (i) Does not arise.

(ii) Representations have to be made to relevant authorities by the affected party.

(*e*) Does not arise.

## ඩබ්ලිව්. එම්. ඩී. කිරියා මහතා : ආණමඩුව පොලිසියට කළ පැමිණිල්ල

## திரு. டபிள்யூ. எம். டீ. கிரியா : ஆனமடுவ பொலிசில் செய்த முறைப்பாடு

## MR. W. M. D. KIRIYA : COMPLAINT TO ANAMADUWA POLICE

279/00

1. අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා (පාලිත රංගේ බණ්ඩාර මහතා වෙනුවට)
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர் - திரு. பாலித ரங்கே பண்டார - சார்பாக )
(Alhaj A. H. M. Azwer on behalf of Mr. Palitha Range Bandara)

විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) (i) ආණමඩුව, නවගත්තේගම, රඹකනයාගම පදිංචි ඩබ්ලිව්. එම්. ඩී. කිරියා මහතාට 2000.10.15 වැනි දින රාත්‍රී 7.30ට පමණ පොලුවලින් පහරදී දකුණු කකුල කඩා ඇති බවත්,

(ii) මේ පිළිබඳව 2000.10.17 වැනි දින ආනමඩුව පොලිසියට පැමිණිලි කරු ඇති බවත්,

එතුමා දන්නෙහි ද?

(ආ) (i) මෙම පහරදීම සිදුකර ඇත්තේ රඹකනයාගම පදිංචි ජේමා නැමැත්තෙක් සහ ඔහුගේ පුතාවන චන්දන නැමැත්තෙක් බවත්,

(ii) එහෙත් මේ වනතෙක් මේ පිළිබඳව කිසිදු පියවරක් ආණමඩුව පොලිසිය විසින් ගෙන නොමැති බවත්,

එතුමා දන්නෙහි ද?

(ඇ) මෙම පහරදීම නිසා කිරියා මහතා දින දෙකක් ආණමඩුව රෝහලේත් පසුව තවත් දින දෙකක් පුත්තලම රෝහලේදීත් නේවාසිකව ප්‍රතිකාර ගත් අතර ආණමඩුව පොලිසිය මේ සම්බන්ධව ගෙන ඇති පියවර එතුමා මේ සභාවට දන්වන්නෙහි ද?

(ඈ) මෙම සිද්ධිය පිළිබඳව නීතිය සාධාරණ ලෙස ක්‍රියාත්මක කරමින් නිසි පියවර ගන්නා ලෙස අදාල බලධාරීන්ට එතුමා උපදෙස් දෙන්නෙහි ද?

(ඉ) නො එසේ නම්, ඒ මන් ද?

மின்வலு, சக்தி அமைச்சரும் பாதுகாப்புப் பிரதி அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) (i) ஆனமடுவ, நவகத்தேகம ரம்பகனயாகமவில் வதியும், திரு. டபிள்யூ. எம். டி. கிரியா என்பரை 2000.10.15 ஆம் திகதி இரவு 7.30 மணியளவில் தடிகளால் தாக்கி இவரின் வலது கால் முறிக்கப்பட்டதையும்,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ii) இது தொடர்பாக 2000.10.17 ஆம் திகதி ஆனமடுவ பொலிஸ் நிலையத்தில் முறைப்பாடு செய்யப்பட்டுள்ளதை

அவர் அறிவாரா ?

(ஆ) (i) இத்தாக்குதல் ரம்பகனயாகமவில் வதியும் பிரேமா மற்றும் அவரது மகனான சந்தன என்பவர்களால் மேற்கொள்ளப்பட்டதென்பதையும்,

(ii) இது தொடர்பாக பொலிஸார் எவ்வித நடவடிக்கையும் மேற்கொள்ளவில்லை என்பதையும்,

அவர் அறிவாரா ?

(இ) இத் தாக்குதல் காரணமாக திரு. கிரியா இரு தினங்கள் ஆனமடுவ வைத்தியசாலையிலும் மேலும் இரு தினங்கள் புத்தளம் வைத்தியசாலையிலும் தங்கியிருந்து சிகிச்சை பெற்றிருப்பதனால் இது சம்பந்தமாக ஆனமடுவ பொலிஸார் மேற்கொண்டுள்ள நடவடிக்கை என்னவென்பதை அவர் இச் சபையில் அறிவிப்பாரா ?

(ஈ) சட்டத்தை நியாயமாக அமுல்படுத்தி, இச் சம்பவம் தொடர்பாகத் தகுந்த நடவடிக்கை மேற்கொள்ளுமாறு தொடர்புடைய அதிகாரிகளுக்கு அவர் பணிப்புரை வழங்குவாரா ?

(உ) இன்றேல் ஏன் ?

asked the Minister of Power and Energy and Deputy Minister of Defence :–

(*a*) Is he aware that –

(i) Mr. W. M. D. Kiriya residing in Rambakanayagama, Nawagaththegama in Anamaduwa has been beaten with clubs at about 07.30 in the evening on 15.10.2000 and his right leg is broken;

(ii) on 17.10.2000 a complaint was lodged at the Anamaduwa Police Station concerning this matter?

(*b*) Is he aware that –

(i) he was assaulted by one Pema and his son Chandana who are living in Rambakanayagama ;

(ii) the Anamaduwa Police has not taken steps concerning this assault so far?

(*c*) As a result of this attack Mr. Kiriya had to be warded for 2 days in the Anamaduwa Hospital, and two more days in the Puttalam Hospital for treatment and so will he inform the House of the steps taken by the Anamaduwa Police in this connection?

(*d*) Will he direct the relevant authorities to take necessary action concerning this incident, administering the law justly?

(*e*) If not, why?

ගරු රෙජී රණතුංග මහතා
(மாண்புமிகு ரெஜி ரணதுங்க)
(The Hon. Reggie Ranatunga)

On behalf of the Minister of Power and Energy and Deputy Minister of Defence, I *table** the answer.

*සභා මේසය මත තබන ලද පිළිතුර :*
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(*a*) (i) A complaint has been made to this effect at the Anamaduwa Police Station on 17.10.2000.

(ii) Yes.

(*b*) (i) Yes.

(ii) Anamaduwa Police has made inquiries into the complaint.

(*c*) One suspect has been arrested and released on Police bail. At the inquiries it has been reveasled that the other suspect was an Army deserter. Inquiries are being continued to trace his where abouts and to arrest him.

(*e*) Does not arise.

(*f*) Does not arise.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Question No. 4.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

I ask Question No. 4 on behalf of Mr. Palitha Range Bandara.

ගරු රෙජී රණතුංග මහතා
(மாண்புமிகு ரெஜி ரணதுங்க)
(The Hon. Reggie Ranatunga)

On behalf of the Minister of Power and Energy and Deputy Minister of Defence, I ask for two weeks' time.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Question No. 7.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

I ask Question No. 7 on behalf of Mr. Johnston Fernando.

ගරු රෙජී රණතුංග මහතා
(மாண்புமிகு ரெஜி ரணதுங்க)
(The Hon. Reggie Ranatunga)

On behalf of the Minister of Power and Energy and Deputy Minister of Defence, I ask for two weeks' time.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## සැරයන් ඩී. එම්. ඒ. එස්. ධනසේකර : සේවයෙන් පහ කිරීම

### சார்ஜன் டீ. எம். ஏ. எஸ். தனசேக்கர : சேவையிலிருந்து நீக்குதல்

### SERGEANT D. M. A. S. DHANASEKERA : DISMISSAL

470/'01

8. අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා (තිලක් කරුණාරත්න මහතා වෙනුවට)

*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர் - திரு. திலக் கருணாரத்ன- சார்பாக)*

(Alhaj A. H. M. Azwer on behalf of Mr. Thilak Karunaratne)

විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය:

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදවේ ද්‍රවිඩ ත්‍රස්තවාදී කොටි මර්දන අංශයේ වසර 15කට ආසන්න කාලයක් සේවය කරන ලද දෙරගමුව, පල්ලේගම, අංක 80 හි පදිංචි සේවා අංක 04959 සැරයන් ඩී. එම්. ඒ. එස්. ධනසේකර මහතා සේවයේ යෙදී සිටියදී කිසිදු හේතුවක් නොදන්වා හමුද අධිකරණයට පවා ඉදිරිපත් නොකොට වැටුප් නොගෙවා සේවයෙන් ඉවත්කර ඇති බව එතුමා දන්නෙහිද ?

(ආ) එම වසර 15 ඇතුළත ද්‍රවිඩ ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගැනීමට සහ ද්‍රවිඩ ත්‍රස්තවාදය මර්දනය කිරීම පිණිස මොහු විසින් ගන්නා ලද පියවර රාශියක් ඇති බව එතුමා පිළිගන්නෙහිද ?

(ඇ) මෙවන් පුද්ගලයින්ගේ සේවය වඩාත් අවශ්‍ය කාලයක මොහු සේවයෙන් පහ කිරීමට හේතු කවරේදැයි එතුමා පැහැදිලි කරන්නෙහිද ?

(ඈ) මේ පිළිබඳ යළි විමර්ශනයක් කොට මොහුට අසාධාරණයක් සිදු වී ඇත්නම් එය නිවැරදි කොට ඔහු යළි සේවයේ පිහිටුවීමට අවශ්‍ය පියවර එතුමා ගන්නෙහිද ?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද ?

*மின்வலு, சக்தி அமைச்சரும் பாதுகாப்புப் பிரதி அமைச்சருமானவரைக் கேட்ட வினா :*

*(அ) இலங்கை விமானப் படையில் தமிழ்ப் பயங்கரவாதப் புலி ஒழிப்புப் பிரிவில் 15 வருடங்களளவில் கடமையாற்றிய தொரகமுவ, பள்ளேகம, இலக்கம் 80 இல் வதியும் சேவை இலக்கம் 04959 ஐக் கொண்ட வீரர் திரு. டி. எம். ஏ. எஸ். தனசேக்கர கடமையிலீடுபட்டிருக்கும்போது எக்காரணமும் காட்டாது இராணுவ நீதிமன்றிலும் நிறுத்தப்படாது சம்பளம் கொடுக்கப்படாது சேவையிலிருந்து நீக்கப்பட்டுள்ளாரென்பதை அவர் அறிவாரா ?*

*(ஆ) அந்தப் பதினைந்து ஆண்டுகளாக தமிழ்ப் பயங்கரவாதிகளைக் கைது செய்யவும் தமிழ்ப் பயங்கரவாதத்தை ஒழிப்பதற்கும் இவர் பல நடவடிக்கைகளை எடுத்துள்ளாரென்பதை அவர் அறிவாரா ?*

*(இ) இத்தகையவர்களின் சேவை மிக அவசியமாகத் தேவைப்படும் ஒரு காலத்தில் இவரைப் பதவிநீக்கம் செய்ய காரணம் யாது என்பதையும் அவர் விளக்குவாரா ?*

*(ஈ) இது தொடர்பாக மீள் பரிசீலனை செய்து இவருக்கு ஓர் அநீதி நடைபெற்றிருந்தால் அதைச் சீர் செய்து இவரை மீண்டும் பதவியிலமர்த்த தேவையான நடவடிக்கைகளை அவர் எடுப்பாரா ?*

*(உ) இன்றேல் ஏன் ?*

asked the Minister of Power and Energy and Deputy Minister of Defence,–

(*a*) Is he aware that Sergeant No. 04959 D. M. A. S. Dhansekara of No. 80, Pallegama, Doragamuwa who had been serving in the anti Tamil Terrorist Tigers Unit of the Sri Lanka Air Force for 15 years has been removed from service without informing the reason, without paying the salary and without subjecting him to a court martial ?

(b) Does he admit that during those 15 years, he had taken many steps to arrest Tamil terrorists and combat terrorism ?

(c) Will he explain the reasons for his dismissal at a time when the service of persons of his calibre is most essential ?

(d) Will he take steps to inquire into the matter again and remedy the injustice caused to him, if any, and reinstate him ?

(e) If not, why ?

ගරු රෙජී රණතුංග මහතා

*(மாண்புமிகு றெஜி ரணதுங்க)*

(The Hon. Reggie Ranatunga)

On behalf of the Minister of Power and Energy and Deputy Minister of Defence, I *table** the answer.

**සභා මේසය මත තබන ලද පිළිතුර :*

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

*Answer tabled :*

(a) There is no anti- Tamil Terrorist Tigers Unit in the Sri Lanka Air Force. Sergeant Dhanasekara D. M. S. has been demobilized from the service of Sri Lanka (Volunteer) Air Force due to the reasons that he had not reported for duty without permission and was absent for 116 days. As a serviceman his discipline has been very unsatisfactory.

(b) This Sergeant has been enlisted to the Sri Lanka (Volunteer) Air Force as a Catering Assistant and engaged in the duties of collecting information because he was aware of information with regard to the insurgency in the South. Thereafter, he had been employed under the Chief Provost Marshal during which period there were so many complaints against him.

(c) As per 'a' above.

(d) As he has been released from the service of Sri Lanka (Volunteer) Air Force on the basis that his services are not required any further, he will not be mobilized for duty.

(e) Does not arise.

## වරප්‍රසාද : ගරු මංගල සමරවීර අමාත්‍යවරයා 2001.03.22 සහ 2001.04.02 දිනවල පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශ

### சிறப்புரிமை : மாண்புமிகு மங்கள சமரவீர அவர்கள் 2001.03.22, 2001.04.02 ஆகிய தினங்களில் பாராளுமன்றத்தில் விடுத்த கூற்றுக்கள்

### PRIVILEGE : STATEMENTS MADE BY THE HON. MANGALA SAMARAWEERA IN PARLIAMENT ON 22.03.2001 AND 02.04.2001

වෛද්‍ය රාජිත සේනාරත්න මහතා

*(வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)*

(Dr. Rajitha Senaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ කාල වේලාව ලබා දීම ගැන මම ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. මම දන් මගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී මෙම උත්තරීතර සභාවේ නැඟී සිටින්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මගේ අයිතීනුත්, එසේම මේ සමස්ත සභාවේ අයිතීනුත් කඩවීමක් පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීමටයි. මංගල සමරවීර අමාත්‍යවරයා පසුගිය අප්‍රියෙල් 2 වැනිදා මෙම සභාව අමතමින් මට හානි ගෙන දෙන අන්දමේ ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය කිරීම සඳහා මා මාර්තු 23 වැනිදා පාර්ලිමේන්තුවේ කළ කථාව එතුමා ඕනෑකමින් වැරදි හා විකෘති ලෙස අර්ථ දැක්වූවා. මගේ කථාවේ අශෝධිත පිටපතේ සඳහන් කරුණු පවා විකෘති කළා. ඒ කථා කොටස් පවා එතුමා පූර්ණ වශයෙන් ඉදිරිපත් කළේ නැහැ. එසේම මගේ කථාව වැරදි ලෙස සහ විකෘති ලෙස උපුටා දැක්වීමෙන් එතුමා මේ සභාව නොමඟ යවා තිබෙනවා. එසේ කිරීමෙන් ඔහු පාර්ලිමේන්තුවේ බලතල හා වරප්‍රසාද පනතේ 'අ' කොටසේ 5 වන වගන්තිය උල්ලංඝනය කොට තිබෙනවා. මම ඒ පිළිබඳව මෙම ගරු සභාවට ප්‍රකාශයක් කිරීමට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිව්යෝර්ක් නුවර ජනාධිපති මන්දිරය පිළිබඳව මා අසත්‍ය ප්‍රකාශයක් කළ බව සමරවීර ඇමතිතුමා ප්‍රකාශ කළා. 2001.03.23 දින මා මෙම පාර්ලිමේන්තුවේදී කථා කළ අවස්ථාවේ ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර 40 වන වීදියේ ජනාධිපති මාළිගාවක් ඉදි කිරීමට යන වියදම හැන්සාඩ්ගත කළා. නමුත් මංගල සමරවීර අමාත්‍යවරයා ඒ ලියැවිල්ල කුමක්දැයි නොබලා කියවා මා වෙත අභූත චෝදනා එල්ල කර තිබෙනවා.

ඒ විතරක් නෙවෙයි, ශ්‍රී ජයවර්ධනපුර ඉදිවන ජනාධිපති මාළිගාවේ Elivation සැලැස්ම පමණක් නොව, බිම් සැලැස්මද මම මාර්තු 23 වනදා සභාගත කළා. ඒවා සභාගත නොකළ බවට ඇමැතිවරයා නඟන චෝදනාව සම්පූර්ණයෙන්ම වැරදි සහගතයි. එසේම මා සභාගත කළ Elivation සැලැස්ම නිවැරදි බව එතුමා සිය ප්‍රකාශයෙන් පිළිගෙන තිබෙනවා. මා සභාගත කළ Elivation සැලැස්ම හා එතුමා සභාගත කළ Elivation සැලැස්ම අතර වෙනස මම ඉදිරිපත් කළා. ඒවා පරස්පරයි. ඒ අනුව එතුමා සභාගත කළ Elivation සැලැස්ම වැරදි බව එතුමාම දැන් පිළිගෙන තිබෙනවා.

1999.02.10 දින 'තරුණි' පත්‍රයේ පළවූ හේමා සමරවීර මහත්මියගේ සම්මුඛ සාකච්ඡාවක් සම්බන්ධයෙන් මා වැරදි ප්‍රකාශයක් කළේ යැයි එතුමා චෝදනා නඟනවා. මගේ කථාවේ කිසිම අවස්ථාවක මම 1999.02.10 දින තරුණි පුවත්පතක් පිළිබඳව සඳහන් කළේ නෑ. ඒ දිනැති වෙනත් කිසිම පුවත්පතක් පිළිබඳව මම සඳහන් කළේ නෑ. නමුත් එතුමා විසින්ම සභාගත කළ 1999.02.10 දින 'තරුණි' පුවත්පත මම කියෙව්වා. එහි මෙසේ තිබෙනවා.

'මහත්මයා මියගියාට පස්සේ මගේ ළමයි පිළිවෙළකට හදගන්න එක මට විශාල ප්‍රශ්නයක් වුණා. ලේක්හවුස් ආයතනයේ රැකියාව මට විශාල පිටිවහලක් වුණා. මාත් එක්ක එකට වැඩ කළ හැම කෙනෙක්ම හරිම නිහතමානී සහයෝගයක් මට දුන්නු බව මා කවදාවත් අමතක කරන්නේ නෑ. ඒ පඩියෙන් තමයි මම හැම දෙයක්ම කළේ.'

මම කීවේ සමරවීර මහත්මියට වික්‍රමසිංහ පවුල උදව් උපකාර කළ බවයි.

මා මෙම ගරු සභාව ඉදිරියේ කියූ කරුණු ඒ ප්‍රකාශය මඟින්ම සනාථ වෙනවා. එතුමාගේ මවට ලෙක්හවුසියේ රැකියාව ලබා දුන්නේ එස්මන්ඩ් වික්‍රමසිංහ මහතායි. සමරවීර මහත්මිය රැකියාව කළේ එස්මන්ඩ් වික්‍රමසිංහ මහතාගේ ලේකම්වරිය ලෙසයි. ඒ මහත්මියට පඩි ගෙව්වේ වික්‍රමසිංහ මහතායි. එපමණක් නොව, 1970 සමඟි පෙරමුණු රජය බලයට පත්ව ලේක්හවුසිය රජයට පවරා ගැනීමෙන් පසුව එතුමාගේ මව රැකියාවෙන් දොට්ට දැමූ විට නැවත එතුමියට රැකියාව ලබා දුන්නේ වික්‍රමසිංහ මහතායි.

මේ අනුව පාර්ලිමේන්තුව නොමඟ යවා ඇත්තේ කවුරුන්ද යන්න ඉතාම පැහැදිලියි. මංගල සමරවීර අමාත්‍යවරයා අවස්ථා කිහිපයකදීම මෙසේ පාර්ලිමේන්තුව නොමඟ යවා තිබෙනවා. 2001.03.22 දින පාර්ලිමේන්තුවේදී එතුමා මෙසේ ප්‍රකාශ කළා.

'ගරු සභාපතිතුමනි, මම කියන දේ අහගන්න. මගේ කථාවෙන් පසුව කවරුහරි සාක්ෂි ඇතිව, ලියවිලි ඇතිව ඔය කියන දේ ඔප්පු කරනවා නම්,' ඒ ඔප්පු කළ මොහොතේදී මම මගේ අමාත්‍යාංශයේ අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස් වෙනවා. මෙය කරුණාකර ලියාගන්න. ඕනෑ කෙනෙක් ඔප්පු කරන්න. මම ඉල්ලා අස්වෙනවා. මම කථා කළාට පසුව තමුන්නාන්සේලා ඕනෑ තරම් කථා කරන්න. ඔප්පු කරන්න. ඔප්පු කළ දවසට මම ඉල්ලා අස්වෙනවා. මම යනවා. මම මේ අමාත්‍යාංශය දාලා යනවා. ඇමතිකමෙන් විතරක් නොවෙයි, හිතුණොත් පාර්ලිමේන්තුවෙනුත් මම ඉල්ලා අස්වෙනවා.'

එතුමා කියන දේ අසත්‍ය නම්, ඒ බව කාටහරි ලියකියවිලි ඇතිව ඔප්පු කරන්න පුළුවන් නම් ඉල්ලා අස්වන බව එතුමා එද ප්‍රකාශ කළා.

මොනවාද එතුමා එද පාර්ලිමේන්තුවේදී කියූ දේ. එතුමා මේ පිළිබඳව පැවැත්වූ පුවත්පත් සාකච්ඡාව පිළිබඳව මෙහෙම කියනවා.

'මා එහිදී දළ සැලැස්මක් පෙන්නුවා.'

ඒ කියන්නේ එදින එතුමා දළ සැලැස්මක් පෙන්වා තිබෙනවා. අන්න ඒ දළ සැලැස්ම සම්පූර්ණ බොරුවක් බවයි මා හැම විටම කියා සිටියේ. ඒ දළ සැලැස්ම ජනතාව රැවටීමට සකස් කළ බොරු සැලැස්මක්. ඒ බොරු සැලැස්ම තමයි එතුමා පසුව මේ ගරු සභාවේදීත් සභාගත කළේ. දැන් එතුමාම එය බොරු සැලැස්මක් බව පිළිගෙන තිබෙනවා.

එතුමා 2001.03.22 පාර්ලිමේන්තුවට කියූ අනෙක් කරුණ කුමක්ද?

'ගරු සභාපතිතුමනි, මෙම සම්භාවනීය ගොඩනැගිල්ල විවෘත කළ දවසේ එනම් 1982 අප්‍රේල් 29 වැනි දින නාගරික සංවර්ධන අධිකාරිය විසින්, ගරු අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ඉල්ලීම අනුව ඉදිරිපත් කළ කෝට්ටේ නගරයේ ඉදිරි සංවර්ධන සැලැස්ම ඇතුළත් පොත මෙන්න මේකයි. ගරු සභාපතිතුමනි, ඒ අනුව අගනුවර පිහිටි රජයේ සියලුම පරිපාලන ආයතන නැවත පිහිටුවිය යුතු තැන් ශ්‍රී ජයවර්ධනපුරයෙන් හඳුනාගෙන ඉදිරිපත් කර තිබුණි. අවසානයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තු සංකීර්ණය විවෘත විය. දොළොස් වසරක් තිස්සේ කොළඹ නගරය දියුණු කිරීමේ සැලැස්ම හා ශ්‍රී ජයවර්ධනපුර සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාත්මක වුණේ නැහැ. මෙහි සඳහන් ඒවායින් ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක වුණේ මේ පාර්ලිමේන්තුවයි, ශ්‍රී ජයවර්ධනපුර රෝහලයි පමණයි. ඊට පසුවත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව දොළොස් වසරක් මේ රටේ බලයේ සිටියා.'

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉදිරිපත් කළ ඔහු කියන සැලැස්ම මේ ගරු සභාවේ පුස්තකාලයේ තිබෙනවා. ශ්‍රී ජයවර්ධනපුරයට ගෙන යා යුතු ආයතන හැටියට එහි නම් කර තිබෙන්නේ මෙන්න මේ ආයතනයි.

පාර්ලිමේන්තුව–ඒක හැදුවා. බත්තරමුල්ල පරිපාලන සංකීර්ණය–ඒක තමයි සෙත්සිරිපාය. පැලවත්ත පරිපාලන සංකීර්ණය–ඒක තමයි ඉසුරුපාය. ශ්‍රී ජයවර්ධනපුර රෝහල–ඒකත් හැදුවා. වික්‍රමසිංහ නිවාස යෝජනා ක්‍රමය–ඒකත් හැදුවා. ජාතික පොලිස් මූලස්ථානය–ඒක හදන්න බැරිවුණා. රමාඩා හෝටලය – ඒකත් හදන්න බැරිවුණා. තරුණ සේවා සභාව – ඒකත් හැදුවා. විවෘත විශ්ව විද්‍යාලය – ඒක හැදුවා. ජනාධිපති විද්‍යාලය – ඒක හැදුවා.

ඇමැතිතුමා කියන්නේ ජයවර්ධනපුරට ගෙන ආවේ පාර්ලිමේන්තුවත්, රෝහලත් පමණයි කියලයි. නමුත් හඳුනාගත් ආයතන 10න් 8ක්ම හැදුවා. ඇමතිතුමා ගරු සභාවේදී අසත්‍ය ප්‍රකාශ කර ඇති බව එයින්ම පැහැදිලියි.

එතුමා මේ සභාව නොමඟ යවන ආකාරය පිළිබඳ තවත් උදහරණයක් මේ. ජනාධිපති මාළිගය පිළිබඳව එතුමා මෙසේ පවසනවා.

'මේ ගොඩනැගිල්ලේ 500කට වැඩි දෙනෙකුට තිල භෝජන සංග්‍රහයක් දෙන්න පුළුවන්.'

500කට වැඩි දෙනෙකු කියන්නේ කීය ද? එය 505ක් ද නැත්නම් 1000ක්ද? මේ ගොඩනැගිල්ලේ 1000කට භෝජන සංග්‍රහයක් දෙන්න පුළුවන්. එතුමා සත්‍ය ගණන නොකියා 500කට වැඩි දෙනෙක් කියා ලිස්සා යනවා. 1000 කියන්නේ 500කට වැඩි ගණනක් තමයි. නමුත් ඒ ගණන 500ක් වගේ දෙගුණයක්.

ඒ විතරක් නොවෙයි, මාළිගාවේ වර්ග ප්‍රමාණය පිළිබඳව එතුමා එදින කථාවේ සඳහන් කරන්නේ මොනවාද?

"The total extent of the Residence, Sir, - I have a lot to speak - is 93,545 Square Feet. I am still at the Residence. Total cost is Rs. 600 million. Rate per square foot is Rs. 6,414.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍ය රාජිත සේනාරත්න මහතා]

Then I come to the Security Block, the second island. There are three islands on this land. In the Security Block there are 93,440 Square Feet. The total cost Rs. 325 million and rate per square feet is Rs. 3,478. Then with regard to the sectretariat, the Basement, Ground First and second Floors, all together the total Floor Area is 116,843 Square Feet, Corridors and Verandas the Floor area is 28,632 Square Feet and the total Floor Area of the Secretariat is 287,195 Square Feet."

එතුමා පැවැත්වූ පුවත්පත් සාකච්ඡාවේදී එතුමා පැවසුයේ ලේකම් කාර්යාලයේ වර්ග ප්‍රමාණය අඩි 1,70,000ක් බවයි. මේ ගරු සභාවේදී එතුමා සභාගත කළ සටහනට අනුව ලේකම් කාර්යාලයේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 1,45,475 නමුත්, එතුමා මේ ගරු සභාවට ප්‍රකාශ කළේ කුමක් ද? ලේකම් කාර්යාලයේ සමස්ත බිම් ප්‍රමාණය වර්ග අඩි 2,87,195 බව යි. The total Floor Area of the Secretariat is 287,195 Square Feet එතුමා මේ සභාවට වැරදි තොරතුරු ලබා දුන්න බව එතුමා විසින් ම සනාථ කොට තිබෙනවා.

ඒ විතරක් නොවෙයි ඉදි කිරීම පිළිබඳව වැරදි තොරතුරු එතුමා මෙම ගරු සභාවට ඉදිරිපත් කළා. එතුමා මෙහෙම කියනවා.

'1982 දීයි තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුව විවෘත කළේ. ඒ කාලයේදී සිමෙන්ති කොට්ටයක් 71.55යි. අද රුපියල් 340යි. 1979-80 කාලයේදී තමයි තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුව ඉදි කළේ, වර්ග අඩියකට රුපියල් 5,000 බැගින්. අද ඩොලර් එකේ රේට් එක දිහා බැලුවාම තමුන්නාන්සේලා වර්ග අඩියකට රුපියල් 20,169ක් වියදම් කර තිබෙනවා.'

මෙම පාර්ලිමේන්තු සංකීර්ණයේ සම්පූර්ණ වර්ග අඩි ප්‍රමාණය 516,672යි. ඒ සඳහා ඇස්තමේන්තු ගත කළ මුදල රුපියල් මිලියන 69409 නමුත් එය ඉදි කර ගෙන යද්දී ඊට වඩා වැඩි මුදලක් එනම් රුපියල් මිලියන 1025.96ක් වැය වුණා. ඒ අනුව වර්ග අඩියක් සඳහා වැයවූ මිල වන්නේ රුපියල් 1935 යි.

මේ සියලු කරුණු සලකා බලන කල මංගල සමරවීර ඇමැතිවරයා ඉතා බරපතල අන්දමින් මේ ගරු සභාවට අසත්‍ය ප්‍රකාශ කර ඇති බවත්, අසත්‍ය සංඛ්‍යා ලේඛන සභාගත කර ඇති බවත්, පැහැදිලියි. ඒ නිසා මේ පිළිබඳව විශේෂ පරීක්ෂණයක් පැවැත්වීමට පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එතැන දී මම මේ හා සමානවම එතුමා විසින් වරප්‍රසාද කඩ කළ අවස්ථා පිළිබඳව තවත් තොරතුරු ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

I will look into the matter.

## පුංචි බොරැල්ලේ බෝධි ප්‍රාකාරය : කඩා ඉවත් කිරීම

## புஞ்சிபொரல்லை போதியின் சுற்று நிருமாணம் : உடைத்தகற்றல்

## PUNCHI BORELLA BODHI : DEMOLITION OF SURROUNDING STRUCTURE

අල්හාජ් එම්. එච්. මොහොමඩ් මහතා
*(அல்ஹாஜ் எம். எச். முஹம்மத்)*
(Alhaj M. H. Mohamed)

Mr. Deputy Chairman of Committees, I wish to raise a matter of great public importance and I want your permission to do so. This is concerning the –

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, under Standing Order 23 –

අල්හාජ් එම්. එච්. මොහොමඩ් මහතා
*(அல்ஹாஜ் எம். எச். முஹம்மத்)*
(Alhaj M. H. Mohamed)

Sir, I only want to mention that this morning, the බෝධි මළුව at Punchi Borella –

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

If it is a question of public importance, I think it has to be under Standing Order 23 which states :

"Provided, however, a question relating to a matter of public importance may be asked at the conclusion of questions........"

Only the Party Leader or the –

අල්හාජ් එම්. එච්. මොහොමඩ් මහතා
*(அல்ஹாஜ் எம். எச். முஹம்மத்)*
(Alhaj M. H. Mohamed)

I agree, but I crave for your indulgence, Sir, because this is a matter concerning the Buddhists. This morning, at 2 o'clock. the Ministry had sent bulldozers and the police and got the whole buildng destroyed.

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ உறுப்பினர் ஒருவர்)*
(An hon. Member)

It is like Taliban.

අල්හාජ් එම්. එච්. මොහොමඩ් මහතා
*(அல்ஹாஜ் எம். எச். முஹம்மத்)*
(Alhaj M. H. Mohamed)

It is worse than Taliban. They have destroyed the whole building of the Bodhi.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

May be, but the only thing is –

අල්හාජ් එම්. එච්. මොහොමඩ් මහතා
*(அல்ஹாஜ் எம். எச். முஹம்மத்)*
(Alhaj M. H. Mohamed)

People are protesting and unless action is taken immediately, Sir, there will be trouble.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

According to Standing Order 23, you have to give due notice to the Minister concerned.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අල්හාජ් එම්. එච්. මොහොමඩ් මහතා
(அல்ஹாஜ் எம். எச். முஹம்மத்)
(Alhaj M. H. Mohamed)

I appreciate your problem but this concerns the Buddhists. Therefore I appeal to the Government to take meaningful steps and prevent this demolition. This is a very serious matter. Nobody is safe in this country.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

According to Standing Order 17 (2) (c) අපි විසි දෙනකු නැගිටලා මේ බෝධිය කැඩීම පිළිබඳව විරෝධය පළ කරනවා. මංගල ඇමතිතුමාට තලේබාන් වෙන්නට ඉඩ දෙන්නට එපා. එයාව කැබිනට් එකෙන් අස් කරන්නය කියා අපි ජනාධිපතිතුමියගෙන් ඉල්ලනවා. පුංචිබොරැල්ලේ බෝධිය කඩනවා. ජාවා ලේන් එකේ මහ පල්ලිය කඩන්නට යනවා. මොකද මේවා කරන්න එන්නේ? පිස්සුද? ඒක නිසා අපි මේ පාර්ලිමේන්තුවේ වගකිව යුතු විරුද්ධ පක්ෂයක් වශයෙන් ඉල්ලා සිටිනවා, බෞද්ධ ආගමට හෝ කිසිම ආගමකට මේ වගේ අපරාධ කරන්නට ඉඩ දෙන්න එපාය කියා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

We have a limited time. Appropriation Bill – Year 2001 – [*Interruption*].

අල්හාජ් එම්. එච්. මොහොමඩ් මහතා
(அல்ஹாஜ் எம். எச் முஹம்மத்)
(Alhaj M. H. Mohamed)

Please, Sir. I want five minutes. This is a very important matter concerning the Buddhists. There might be serious repercussions.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

First of all you have to get permission from the Chair.

ගරු රිචඩ් පතිරණ මහතා (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு றிச்சட் பத்திரண - பொது நிர்வாக, உள்நாட்டு அலுவல்கள், நிருவாக மறுசீரமைப்பு அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Richard Pathirana – Minister of Public Administration, Home Affairs and Administrative Reforms and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාට ඒ ප්‍රකාශය කරන්නට ඉඩ දෙන්න කියා මම ඉල්ලනවා. කිසිම ප්‍රශ්නයක් නැහැ.

අල්හාජ් එම්. එච්. මොහොමඩ් මහතා
(அல்ஹாஜ் எம். எச் முஹம்மத்)
(Alhaj M. H. Mohamed)

Sir, this is a very serious matter. With your permission I wish to bring to the notice of the House that this morning at 2.00 a. m. the Hon. Mangala Samaraweera, Minister of Urban Development and Minister for everything, has sent the police, the army and bulldozers and started demolishing the walls of the Bodhi. This Bodhi was established on 23.02.1922 to commemorate the visit of Prince of Wales. This is not a thing that started today. From 1922 it had been a place of worship for the Buddhists. Then, Sir, after that it was expanded. Then the Mayor of Colombo, the late Mr. Vincent Perera, enlarged it a little further and permitted people to offer flowers and worship. I am raising this matter here because the people are protesting vehemently against the demolition. It is a place of worship. It existed even in 1922. Therefore, I request the Government to take immediate steps to reconstruct the building.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

Her Excellency the President must give an order.

අල්හාජ් එම්. එච්. මොහොමඩ් මහතා
(அல்ஹாஜ் எம். எச் முஹம்மத்)
(Alhaj M. H. Mohamed)

I do not know whether the President will do it. Anyway, I appeal to the Government. There are senior Ministers and other hon. Members present here. They could look into this matter. I went in the morning to see this place. There is a wine stores situated opposite this shrine room. It was not demolished. I am organizing a picketing this evening at 4 o'clock. I request all hon. Members of Parliament, including The hon. Members from the Government side, to come and join that protest. It is very important. My own advice, Sir, is that the Hon. Minister must take psychiatric treatment.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

Sir, I rise to a point of Order. බෝධය කැඩුවාට කමක් නැහැයි, අනුරුද්ධ සෙනෙවිරත්න ඇමතිතුමා කියනවා. බෝධිය කඩන්න කියනවා. ඇමතිතුමා, තමුන්නාන්සේ මාක්ස්වාදියෙක්. තමුන්නාන්සේගේ නායකතුමා තමයි, කිව්වේ – [බාධා කිරීම්]

## විසර්ජන පනත් කෙටුම්පත, 2001
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2001
## APPROPRIATION BILL, 2001

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.– [ප්‍රගතිය අප්‍රේල් 3] [නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது. – [தேர்ச்சி : 08, ஏப்ரல்] [குழுக்களின் பிரதித் தவிசாளர்அவர்கள் தலைமை வகித்தார்கள்]*

*Considered further in Committee.– [Progress : 3rd April] [DEPUTY CHAIRMAN OF COMMITTEES]*

590 වන ශීර්ෂය.–රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා

1 වන වැඩ සටහන.–සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම
රු. 36,34,96,000

தலைப்பு 590. – பொது நிருவாக, உள்நாட்டலுவல்கள், நிருவாக மறுசீரமைப்பு அமைச்சர்

நிகழ்ச்சித் திட்டம் 1. – சிவில் நிருவாகம் – மீண்டுவரும் செலவு
ரூபா 36,34,96,000

HEAD 590.– MINISTER OF PUBLIC ADMINISTRATION, HOME AFFAIRS AND ADMINISTRATIVE REFORMS

Programme 1.– Civil Administration – Recurrent Expenditure,
Rs. 363,496,000

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය සභාපතිතුමා
*(பிரதித் தவிசாளர் அவர்கள்)*
(The Deputy Chairman)

Vote on the Ministry of Public Administration, Home Affairs and Administrative Reforms – Heads 590, 591, 602, 605 to 632. Ministry of Provincial Councils and Local Government – Head 550. The Vote will be taken at 2.00 p.m. Mr. Suranimal Rajapakse to move the cut, please.

[පූ. භා. 10.20]

සුරනිමල් රාජපක්ෂ මහතා
*(திரு. சுரனிமல் ராஜபக்ஷ)*
(Mr. Suranimal Rajapakse)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි 'වැඩ සටහන රුපියල් 10කින් අඩුකළ යුතුය'යි මම යෝජනා කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේත්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ සාකච්ඡාවට භාජනය කරන මේ අවස්ථාවේදී මා ප්‍රථමයෙන්ම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය පිළිබඳව අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වෙනවා. පෙර රජ සමයට පෙර සිට මේ දක්වා විවිධ සමාජ යුග අවධීන්ගේ විකාශනය දෙස විමර්ශනාත්මක අවධානය යොමු කිරීමේදී, වර්තමාන සමාජය එම විකාශනයේ කිසියම් ප්‍රමාණයක ප්‍රතිපෝෂණය මගින් නිර්මාණය වී ඇති අතර, සමාජයක ප්‍රගමනය මෙන්ම අවගමනය සඳහාද, පවතින සමාජ වාතාවරණය ඉහත සඳහන් සමාජයේ පැවැත්මට විවිධ තත්ත්වයෙන් අඩු වැඩි වශයෙන් බලපා තිබෙන බව සඳහන් කරන්න ඕනෑ. ඒ තත්ත්වය යටතේ 1994 පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් කිව්වේ, 'රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන්ට අවංකව, සෘජුව සහ හෘදය සාක්ෂියට එකඟව රාජකාරි කිරීමට අවශ්‍ය පසුබිම ගොඩ නැඟීම පිණිස පොදුජන එක්සත් පෙරමුණ ක්‍රියාත්මක කරන ප්‍රතිපත්තියේ මුල් ගල වතු ඇත්තේ නිවහල් හා ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවීමයි' යන්නයි. එක්සත් ජාතික පක්ෂ නායකතුමා ස්වාධීන කොමිෂන් සභා ගැන කථා කර පොලිස් කොමිසම, මැතිවරණ කොමිසම පිහිටුවන්න කියනවා වාගේම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවන්න කියන යෝජනාව අද ඉදිරිපත් කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයේත් එය සඳහන් කර තිබෙනවා. අපි කියන්නේ 17 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැටියට මේ ස්වාධීන කොමිෂන් සභා ඉදිරිපත් කර, සම්මත කර ක්‍රියාවට පරිවර්තනය කරන්නය කියායි.

7 වසරක පොදුජන එක්සත් පෙරමුණේ පාලන යුගය තුළ රාජ්‍ය සේවය ඉතා නින්දිත ලෙස පළුදු වී ගොස් තිබෙන බව අද අපට පෙනී යනවා. රාජ්‍ය සේවයේ ගෞරවය හා ආත්ම ගෞරවය නැවත ප්‍රතිෂ්ඨාපනය කළ යුතුව තිබෙනවා. අද මේ රටේ පාලන ව්‍යුහය සම්බන්ධ වී තිබෙන්නේ දිසාපතා ක්‍රමය තුළයි. දිසාපතිවරුන් පරිපාලන ක්ෂේත්‍රයේ, දිස්ත්‍රික්කයේ ප්‍රධානියා – නියමුවා – හැටියට, ක්‍රියාකාරකයා හැටියට පත් කිරීමට පියවර ගත්තත්, අද දේශපාලනීකරණය නිසා දිසාපතිවරයාත් දේශපාලනීකරණයට හසුවීම නිසා අද දිස්ත්‍රික්කය තුළ සියලු තීන්දු ගැනීම් සිදු වන්නේ දේශපාලන ක්‍රියාදාමය තුළයි. ඒ නිසා රාජ්‍ය සේවයේ පසු බැස්මක්, කඩා වැටීමක් අද සෑම ආයතනයකම සිදු වී තිබෙනවා. ඒ නිසා දිසාපතිතුමා මේ දේශපාලන ආකාරයකට තමුන්නාන්සේලා හසුරුවන නිසා ප්‍රාදේශීය ලේකම්වරුනුත් අද ඒ තමන්ගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ දේශපාලන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නට කටයුතු කරගෙන යනවා.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජීවත් වන ජනතාව, මේ දේශපාලන ක්‍රියාවලියට නැඹුරු වීම නිසා, ඒ අයට විශාල වශයෙන් නොයෙක් කලබලවලට, එහෙම නැත්නම් නොයෙකුත් දුක් ගැහැටවලට මුහුණ පාන්නට ඒ අයට සිද්ධ වී තිබෙනවා. ඒ නිසා මෙන්න මේ දේශපාලනකරණයෙන් රාජ්‍ය සේවය මුදා ගත යුතුව තිබෙනවා. ගරු අමාත්‍යතුමා මේ අමාත්‍යාංශයට නවක අමාත්‍යවරයකු වුවත් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ රාජ්‍ය සේවය දේශපාලනකරණයෙන් මුදා ගන්න පියවර ගන්න කියලයි. මුළු මහත් සමාජ යන්ත්‍රයම, සමස්ත ජනතාවම මෙහෙයවන්නේ හසුරුවන්නේ පාලනය කරන්නේ රාජ්‍ය සේවය තුළින්. අපට සමාජ ප්‍රගමනයක් බලාපොරොත්තු වන්න පුළුවන් වන්නේ රාජ්‍ය සේවය නිවැරදි ආකාරයට හැසිරවීම තුළින් හා ක්‍රියාත්මක කරවීම තුළින් පමණයි. එතකොට තමයි ආර්ථික සංවර්ධනයක් බලාපොරොත්තු වන්න පුළුවන් ; සමාජ සංවර්ධනයක් බලාපොරොත්තු වන්න පුළුවන්. එම නිසා එවැනි ක්‍රියාදාමයක් ඇති කළ යුතුව තිබෙනවා.

මම එක උදාහරණයක් කියන්නම්. ප්‍රාදේශීය ලේකම්වරුන් අද දේශපාලනකරණයට හසු වීම නිසා පරිසරය පවා විශාල වශයෙන් දූෂණය වෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13ක් තිබෙනවා. මා ජීවත් වන කැලණි ගඟ අසබඩ ගං තීරුවේ දොම්පේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දිහා බැලුවොත්, දේශපාලන හස්තයට නතු වීම නිසා කිසිදු ආකාරයක විමසා බැලීමකින් තොරව කැලණි ගඟෙන් වැලි ගොඩ දැමීමත්, ගං ඉවුර කපා රථ වාහන ගඟට බස්සවන්න පුළුවන් ආකාරයට හැසිරවීමත් නිසා කැලණි ගං ඉවුර විනාශ වෙමින් තිබෙනවා. කැලණි ගඟේ වැලි ගොඩ දැමීම නිසා ගං පතුල විශාල වශයෙන් ගැඹුරු වෙලා තිබෙනවා. ඒ නිසා මුහුදු වතුර කැලණි ගඟේ උඩුගං බලා දිවෙන තත්ත්වයක් තිබෙනවා. එහෙම වුණොත් කොළඹ වගේ නාගරික ප්‍රදේශවලට ජලය ලබා දෙන අඹතලේ ජලාශයේ ජලය පිරිහරණය කිරීමත් අපහසු කාරියක් වෙයි.

ඊට ඉහළ පදිංචිව සිටින නවගමුව, හංවැල්ල, කඩුවෙල, පූගොඩ, රංවල, කිරිඳිවැල කැලණි ගඟ ආශ්‍රිත ප්‍රදේශවල පදිංචි ජනතාවට ළිං මාර්ගයෙන් ලබා ගන්නා භූගත ජලය පාවිච්චි කිරීමටද අපහසු තත්ත්වයක් උද වෙනවා. මේ සියල්ල සිදු වී තිබෙන්නේ දේශපාලනකරණය නිසයි. ඒ නිසා මම ඔබතුමාගෙන් අවධානයට යොමු කරවන්නේ මේ තත්ත්වයෙන් රට මුදා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් වහාම ඇති කිරීම ඉතාමත් වැදගත් කියන කාරණයයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ග්‍රාම සේවා නිලධාරීන් පත් කිරීමේ ක්‍රියාවලිය ගැන සඳහන් කරනවා නම්, තරග විභාගයක් තුළින් ග්‍රාම සේවා නිලධාරීන් පත් කරන්නට එද කටයුතු කෙරුණා. එද තරුණ අසහන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු හැටියට ක්‍රියා කළ මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කැබිනට් අමාත්‍යවරයෙකු හැටියට කටයුතු කරනවා. ඒ තරුණ අසහන කොමිෂන් සභාව නිර්දේශ කළේත් තරග විභාග තුළින් රාජ්‍ය සේවයට නිලධාරීන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියා කලාපය ශක්තිමත් කළ යුතු බවයි. නමුත් අද සමෘද්ධි නියාමකයින් ග්‍රාම සේවා නිලධාරීන් හැටියට ඒ පුරප්පාඩු තනතුරුවලට පුරවා ගැනීමට ක්‍රියා කරනවා. මේ නිසා සමෘද්ධි නියාමකයින් ගම්මාන තුළ සාමය භේද කළ කණ්ඩායමක් හැටියට, එක පිරිසකට පමණක් සේවය කළ කණ්ඩායමක් හැටියට ග්‍රාම සේවා නිලධාරී තනතුරට ඇතුළත් වීම තුළින් ගම තුළ භේදයක් ඇති වී සාමය පළුදු වෙමින් පවතින අතර, ග්‍රාම සේවා නිලධාරී තනතුර කෙරෙහි තිබෙන විශ්වාසයත් අද පළුදු වෙමින් පවතිනවා. ඒ නිසා රාජ්‍ය සේවය යථා පරිදි ඉටු වෙමින් ගම් මට්ටමේ සිට දිසා මට්ටම දක්වා දිවෙන ඒ ජනතා විශ්වාසය පළුදු නොවන ආකාරයට ක්‍රියා කරන්නය කියා ගරු අමාත්‍යතුමාගෙන් මම විශේෂයෙන්ම ඉල්ලා සිටනවා. ගරු අමාත්‍යතුමනි, එම නිසා රජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හැටියට මේ අංශ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

ගරු අමාත්‍යතුමනි, අද වැටුප් වැඩි කරන්නට තමුන්නාන්සේ කැබිනට් මණ්ඩලයට යෝජනා කර තිබෙන්නේ රාජ්‍ය පරිපාලන සේවයට පමණයි. රාජ්‍ය පරිපාලන සේවය හා සමාන සේවාවන් රාශියක් තිබෙනවා. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය, ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය, ශ්‍රී ලංකා සැලසුම් සේවය, ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා විගණක සේවය සහ ශ්‍රී ලංකා විගණක පරිගණක සේවය යන මේ සේවාවන් රාජ්‍ය පරිපාලන සේවය හා සමාන සේවාවන් හැටියට සලකන නිසා මේ අයටත් එක හා සමාන වැටුප් වැඩි වීමක් නිර්දේශ කිරීම අත්‍යවශ්‍යම කාර්යයක් හැටියට සැලකිය යුතු වෙනවා.

තමුන්නාන්සේලා මේ අයවැය ලේඛනයෙන් රාජ්‍ය අංශවල මුදල් නාස්තිය අඩු කිරීමට, එහෙම නැත්නම් වියදම් වන මුදල් ප්‍රමාණය ඉතුරු කර ගැනීමට පියවර වශයෙන් යම් යම් දේවල් කපා හරින්න යෝජනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර තිබෙනවා. සේවකයන්ගේ අතිකාල දීමනා කපා හරින්නට යෝජනා කළා. දුරකථන පහසුකම් අවම කරන්නට යෝජනා කළා. ප්‍රවාහන පහසුකම් අඩු කරන්නට යෝජනා කළා. ඒ නිසා රජයේ කාර්යාලවල පාලනය අඩාල වෙමින් තිබෙනවා. නිලධාරීන්ගේ වැඩ කිරීමේ ප්‍රමාණය අඩු වී තිබෙනවා. මේ සියලු බලපෑම්වලට ගොදුරු වන්නේ මේ රටේ ජනතාවයි. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න. නාස්තිය, දූෂණය අඩු කරන්න තමුන්නාන්සේලා ක්‍රියා කරනවා නම් එය තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් පරිදි, කැබිනට් මණ්ඩලයේ ඉඳලාම පටන් ගන්නය කියන එකයි මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටින්නේ. කැබිනට් එකේ ඉඳලාම ඒ වැඩ පිළිවෙළ කරන්න. තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයේ : එද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ කැබිනට් ඇමැතිවරු 25 දෙනකු සිටියදී ව්‍යාපෘති ඇමැතිවරු හා රාජ්‍ය ඇමැතිවරු ගැන සඳහන් කර ඇමැතිවරු 91 දෙනකු සිටිනවාය කියා, ඇමරිකාවේ 1876 සිට හිටපු ඇමැතිවරුන්ගේ ගණනත් සඳහන් කරමින්, "අපි මේ මුදල් නාස්තිය අඩු කරන්න පියවර ගන්නවා" ය කියා කිව්වා.

නියෝජ්‍ය සභාපතිතුමා
*(பிரதித் தவிசாளர் அவர்கள்)*
(The Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් ඔබතුමාට තිබෙනවා.

සුරනිමල් රාජපක්ෂ මහතා
*(திரு. சுரனிமல் ராஜபக்ஷ)*
(Mr. Suranimal Rajapakse)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විනාඩි 15ක කාලයක් මට ලබා දී තිබෙනවා.

නියෝජ්‍ය සභාපතිතුමා
*(பிரதித் தவிசாளர் அவர்கள்)*
(The Deputy Chairman)
විනාඩි 12ක කාලයක් ඔබතුමාට දී තිබෙනවා.

සුරනිමල් රාජපක්ෂ මහතා
*(திரு. சுரனிமல் ராஜபக்ஷ)*
(Mr. Suranimal Rajapakse)
විනාඩි 15ක කාලයක්.

නියෝජ්‍ය සභාපතිතුමා
*(பிரதித் தவிசாளர் அவர்கள்)*
(The Deputy Chairman)
විනාඩි 12ක් දී තිබෙනවා.

සුරනිමල් රාජපක්ෂ මහතා
*(திரு. சுரனிமல் ராஜபக்ஷ)*
(Mr. Suranimal Rajapakse)
මම කලින් සඳහන් කළ කාරණය පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්න. මම ඒ ගැන ඊට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභා ක්‍රියාවලි ගැන සඳහන් කරනවා නම් 1856 ගම්සභා ආඥාපනත ආරම්භ වී තිබෙනවා. 1981 දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය ඇති කර විමධ්‍යගත කිරීම ක්‍රියාවට පරිවර්තනය කළා. 1987, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කර, බලය විමධ්‍යගත කර, 1988 පෙබරවාරි මාසයේ පළමුවැනිද මේ රටේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කළා. ඒ විමධ්‍යගත කළ පළාත් සභා ක්‍රමය මේ රටේ ඇති කරන්න පියවර ගත්තේ මේ රටේ ජනවාර්ගික අර්බුදයට විසඳුමක් ලබා දෙන්නටයි. එද තමුන්නාන්සේලා එයට විරුද්ධ වුණත් අපට චෝදනා එල්ල කරමින් තමුන්නාන්සේලා අදත් එය ඉදිරියට ගෙන යනවා. ඒ සංශෝධන ඇති කරන්නට පියවර ගත්තේ නැහැ. ඊළඟට මම පළාත් සභා ඇමතිතුමාගේ විශේෂ අවධානයට මේ කාරණය යොමු කරනවා. එද අමරසිරි දොඩම්ගොඩ ඇමතිතුමා පළාත් පාලන මැතිවරණ කල් දැමීමේ කොට්ඨාස අනුව මැතිවරණ තියන්න නැවත කොමිසම් නියමයක් අනුව ක්‍රියා කරනවාය කියලයි. තමුන්නාන්සේත් පළාත් සභා මැතිවරණ කල් දමා තිබෙනවා. කෙසේ වෙතත් කිසියම් අලුත් ක්‍රමයක් යටතේ එය ඉක්මනින් පවත්වන්නට තමුන්නාන්සේ පියවර ගන්නවාද කියන කාරණයට මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නට කැමැතියි.

ඒ වාගේම මුළු රටේම තිබෙන ප්‍රාදේශීය සභා නගර සභා ක්‍රමවත් වැඩ පිළිවෙළකට යොමු කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරුන් මෙහෙයවීමේ නිසි වැඩ පිළිවෙළක් ඉතාම අත්‍යවශ්‍ය වී තිබෙනවා. හැම ප්‍රාදේශීය සභාවකම, නගර සභාවකම අතිවිශාල වශයෙන් දූෂණ සිද්ධ වෙනවා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය මඟින් ඒ සඳහා යම් විකල්ප ක්‍රියා මාර්ගයක් ආරම්භ කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම විවිධ පළාත්වල සිටින නිලධාරීන්ට ස්ථාන මාරු වීම් ලබා ගැනීමේ ක්‍රමයක් ඇති කරන්නට ඕනෑ. කැලිකසල නිසා සිදුවන පරිසර දූෂණය වළක්වා ලන්නට විශේෂිත වූ වැඩ පිළිවෙළක් නගර සභා, පළාත් පාලන ආයතන මඟින් ක්‍රියාවට පරිවර්තනය කරන්නටය කියා ඉල්ලා සිටිමින් මම නිශ්ශබ්ද වෙනවා.

[පූ. භා. 10.30]

**ගරු රිචඩ් පතිරණ මහතා (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
*(மாண்புமிகு றிச்சட் பத்திரண - பொது நிர்வாக, உள்நாட்டு அலுவல்கள், நிருவாக மறுசீரமைப்பு அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)*
(The Hon. Richard Pathirana – Minister of Public Administration, Home Affairs and Administrative Reforms and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සහ පළාත්සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය මේ සභාවේ සාකච්ඡාවට භාජනය වන මේ අවස්ථාවේදී අපේ අමාත්‍යාංශය විසින් දැන් කර තිබෙන වැඩ සහ ඉදිරියේදී කරන්නට බලාපොරොත්තු වන කාර්යයන් ගැන යම් විස්තරයක් තමුන්නාන්සේලාට ඉදිරිපත් කරන්නට මා කල්පනා කළා. එවිට තමුන්නාන්සේලාට වඩාත් හොඳින් මේ විවාදයේ කටයුතු කරගෙන යන්නට පුළුවන් වේවිය කියා මා විශ්වාස කරනවා. ඊළඟට මේ වැය ශීර්ෂය රුපියල් 10කින් කපා හැරිය යුතුයි කියා යෝජනා කිරීම ගැන, සුරනිමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා. එතුමා කරුණු ඉදිරිපත් කරමින් දිසාපතිවරුන් දේශපාලනීයකරණයට ලක් වෙලාය කියා එතුමාගේ කථාවේදී සඳහන් කළා. මා ඇමති තනතුරට පත් වුණාට පසුව නම් මගේ අමාත්‍යාංශයෙන් කිසිම දිසාපතිවරයෙකුට කිසිම දේශපාලන බලපෑමක් කළේ නැහැ. ලංකාවේ දිසාපතිවරුන්ට ස්වාධීනව තමන්ගේ කටයුතු කරන්න මම ඉඩ දෙනවා කියා මම මේ සභාවේදී කියනවා. ඒක තමයි, මගේ ප්‍රතිපත්තිය. අද වනතෙක් මම ඒ අයට "මේක කරන්න කියා" කිසිම නියෝගයක් දී නැහැ. නමුත් පරිපාලන නීති මේ රටේ තිබෙනවා. ඒ අනුව වැඩ කරන්නට ඕනෑ.

අනෙක් කාරණය මේකයි : පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීමට මම තීරණය කර තිබෙනවාය කිව්වා. නැහැ. රනුග්ගේ මහතාගේ නායකත්වයෙන් යුත් පරිපාලන සේවා සංගමය හමු වී කිව්වා, ඒ ගොල්ලන්ගේ ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුයි කියා. ඒ කියන්නේ පරිපාලන සේවා ව්‍යවස්ථාවයි. ඒ අයත් සමඟ කතා කර, ඒ අය හද දුන් පත්‍රිකාව මම කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. ඒ අනුව පරිපාලන සේවයේ යම් කිසි වැටුපක් වැඩි වෙනවා. නමුත් ඒක වැඩි වෙන්නේ මේ අවුරුද්දේ නොවෙයි, ලබන අවුරුද්දේ ජනවාරිවල සිටයි.

දැන් වැටුප් කොමිසමක් පත් කර තිබෙනවා. ඒ වැටුප් කොමිසමේ නිර්දේශවලට අනුව, ලංකාවේ අනෙක් සේවාවල අයටත් වැටුප් වැඩි වෙයි. මන්ත්‍රීවරුන් යම් යම් සේවාවල නම් සඳහන් කළා, මේ මේ සේවාවන්හි දුක්ගැනවිලි තිබෙනවාය කියා. වැටුප් කොමිසම් සභාවේ සාමාජිකයෙක් විදියට අපේ ලේකම්තුමාත් ඉන්නවා. පරිපාලන සේවයේ අයගේ වැටුප් වැඩි වී තිබෙනවා. ඒ නිසා ඒකට සමාන්තර සේවාවලත් වැටුප් වැඩි කිරීම සාධාරණයි කියා මමත් පිළිගන්නවා. ඒ නිසා මම එතුමාට කිව්වා, "තරුණතර වැටුප් කොමිසමේ අවධානය ඒ ගැන යොමු කරන්නය කියලා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු රිචර්ඩ් පතිරණ මහතා]

අනෙක් කාරණාව තමයි, පළාත් පාලන අමාත්‍යාංශය ගැන, පළාත් සභා ඡන්ද ගැන සහ පළාත් පාලන ඡන්ද ගැන තමුන්නාන්සේලා කිව්වා. ඒ සම්බන්ධයෙන් මගේ නමින්, න්‍යාය පුස්තකයේ යෝජනාවක් තිබෙනවා. මොකක්ද? කොට්ඨාස මට්ටමෙන් ඡන්දය පැවැත්වීම ආදී කරුණු ගැන. ලබන මාසයේ 22 වැනි දට මේ සභාවේ විවාදයක් තමුන්නාන්සේලා ඉල්ලුවා, විපක්ෂ නායකතුමා මගින් මම කිව්වා ලබන මාසේ 22 වෙනි ද විවාදයක් කරනවා කියලා. ඒ යෝජනාව ගැන තමුන්නාන්සේලාගේ අදහස් මොකක්ද කියා දක්වන්න. මම විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලුවා. "සංශෝධන අවශ්‍යයි කියලා හිතනවා නම්, කරුණාකර සංශෝධන ඉදිරිපත් කරන්න කියා. එතුමා මට කිව්වා, දේශපාලන පක්ෂවලින් තරග කරන්න ඕනෑ කියා. අපේ අමාත්‍යතුමා යෝජනා කර තිබෙන්නේ දේශපාලන පක්ෂ නැතිව තරග කරන්න කියලායි. නමුත් යම්කිසි කෙනෙක් කියනවා නම් දේශපාලන පක්ෂ වලින් තරග කරන්න ඕනෑ කියලා අපට ප්‍රශ්නයක් නැහැ. නමුත්, ලංකාවේ බොහෝ දෙනෙකුගේ මතයක් තිබෙනවා දේශපාලන පක්ෂ නැතුව තරග කළ යුතුයි කියා. අප ඒ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. තමුන්නාන්සේලා ඒකට අකමැති නම්, 22 වැනි ද විවාදයේදී කියන්න පුළුවන්, "අප මේකට අකමැතියි" කියලා. අපට අවශ්‍ය තමුන්නාන්සේලාගේ සහයෝගයත් අරගෙන, ජනතා විමුක්ති පෙරමුණේ සහයෝගයත් අරගෙන, කාගේත් සහයෝගයෙන් මේ පනත වෙනස් කරන්නයි. ආණ්ඩුවේ කැමැත්ත අනුව විතරක් නොවෙයි. තමුන්නාන්සේලා කාගේත් සහයෝගයෙන් ලංකාවේ පළාත් පලන ඡන්ද පවත්වන ආකාරය පිළිබඳව යම්කිසි වෙනසක් කරන්න අපට අවශ්‍යයි. විපක්ෂ නායකතුමා පක්ෂ නායක රැස්වීමේදී විවාදයක් ඉල්ලුවා මේ සම්බන්ධව. මම දෙන්න බොහොම කැමැති වුණා. ඒ වෙලාවේදී ටිරෝන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාත් හිටියා. මම කිව්වා, "හරි අපි 22 වෙනිද විවාද කරමු"යි කියලා. දවසක් දී තිබෙනවා විවාද කරන්න. ඒ වෙලාවට තමුන්නාන්සේලාටත් පුළුවන් අදහස් ප්‍රකාශ කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ප්‍රකාශයක් තිබෙනවා. ඒ ප්‍රකාශය මම කියවන්න කැමැතියි. මේ රටේ සමස්ත රාජ්‍ය පරිපාලන කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ කටයුතුත්, මෙහෙයවීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර, මෙම විවාදය ආරම්භයේදීම අපේ අමාත්‍යාංශය විසින් සිදුකර ඇති හා සිදු කිරීමට අපේක්ෂිත කරුණු කිහිපයක් පිළිබඳව ඔබ සැමගේ අවධානය යොමු කිරීමට මම අදහස් කරමි. අප රජය ආරම්භයේදීම මෙම අමාත්‍යාංශයේ,මෙම අමාත්‍යාංශය භාරව සිටි වර්තමාන අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමාට මට කලින් කරන ලද සේවාවන් පිළිබඳව මගේ ස්තුතිය පුද කිරීම මගේ යුතුකමක්. එතුමා අද මේ රටේ අග්‍රාමාත්‍යවරයා ලෙස පත් වී තිබෙනවා. එතුමාට මම සුබ පතනවා.

අපගේ අමාත්‍යාංශයේ මෙහෙවර

ජනතා අපේක්ෂාවන්ට සහ රජය විසින් හඳුනා ගත් ජාතික ප්‍රමුඛතාවන්ට මැනවින් ප්‍රතිචාර දක්විය හැකි කාර්යක්ෂම හා ඵලදායී නව රාජ්‍ය සේවා සම්ප්‍රදායක් සහ ප්‍රාදේශීය පරිපාලන ක්‍රමයක් සහතික කිරීම අපේ අමාත්‍යාංශයේ මෙහෙවර වේ.

ඒ කියන්නේ ප්‍රධාන කරුණු දෙකක්. එකක් ජනතා අපේක්ෂාවන් ඉෂ්ට කිරීම. අනෙක් එක රජයේ සංවර්ධන ක්‍රියා මාර්ගයන් ප්‍රතිපත්ති නිසියාකාරව ක්‍රියාත්මක කිරීම. මේ කරුණු දෙකම ඉෂ්ට වෙන්නට ඕනෑ.

ඉන් කියැවෙන ආකාරයටම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් එක අතකින් සමස්ත රාජ්‍ය පරිපාලන යන්ත්‍රයත්, අනෙක් අතින් ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහයත් අප මෙහෙයවන්නේ ප්‍රධාන අභිප්‍රායන් දෙකක් සාක්ෂාත් කර ගැනීමටයි.

1. ජනතාවට කාර්යක්ෂම සේවා සැපයුමක් සහතික කිරීමටය.

2. රජය විසින් හඳුනාගත් සංවර්ධන ව්‍යාපෘති සඵලව ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය ආයතනික රාමුව සලසා දීම.

රාජ්‍ය පරිපාලන යන්ත්‍රනයේ යම් යම් අඩුපාඩුකම් තිබෙන්නට පුළුවනි. නිදහසෙන් පස්සේ නොයෙක් හේතුන් නිසා දිගින් දිගටම එම දුර්වලකම් වැඩි වෙමින් තිබුණු බව පෙනෙනවා. රාජ්‍ය පරිපාලන අංශයේ නොයෙක් අඩුපාඩුකම් තිබෙනවා. මම පිළිගන්නවා. මම කියන්නේ නැහැ, රාජ්‍ය පරිපාලන අංශයේ රාජ්‍ය සේවයේ කිසිම අඩුපාඩුවක් නැහැ, සර්වසම්පූර්ණයි කියලා. මම පිළිගන්නවා, යම් යම් අඩුපාඩුකම් තිබෙන බව මගේ අරමුණ, මගේ අපේක්ෂාව මේ අඩුපාඩුකම් සම්පූර්ණ කර ජනතාවට හොඳ කාර්යක්ෂම සේවයක් ලබා දෙන එක. අනෙක් එක රජයේ සංවර්ධන ක්‍රියාදමයන් ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂමව ඉෂ්ට කිරීම. මම එහි විෂය භාර ඇමතිවරයා හැටියට තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මම ඒ සඳහා මගේ සම්පූර්ණ කැපවීම ලබා දෙන බව. ඒ නිසා ඉදිරි කාලය සඳහා අපගේ අමාත්‍යාංශයේ විෂය පථයට නව දැක්මක් නිර්මාණය කර ගෙන තිබෙනවා.

21 වැනි සියවසට විශිෂ්ට රාජ්‍ය සේවා කළමනාකරණයක්

අපගේ පළමුවැනි අභිප්‍රාය වන ජනතාවට කාර්යක්ෂම සේවා සැපයුමක් සහතික කිරීම සඳහා අප මේ වන විට පියවර රාශියක් ගෙන තිබෙන අතර ඉදිරි කාලය තුළ ගත යුතු පියවර පිළිබඳව දැනට සැලසුම් කරගෙන යනවා. මේ අතින් බලන කළ ප්‍රාදේශීය පරිපාලනය ඉතාම වැදගත්. එම ප්‍රාදේශීය පරිපාලන පද්ධතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී කාර්යාල යන අංශ තුනෙන් සමන්විත වන, ජනතාවගේ එදිනෙදා කටයුතුවලදී වඩාත්ම සමීප වන ආයතනයි. ජනතාවගේ උපතේ සිට මරණය දක්වා සිදු වන සිදුවීම්වලට එම කාර්යාල සම්බන්ධ වෙනවා. ඒ නිසා ජනතාවට සේවා සැපයීම කාර්යක්ෂමව කරන්නට නම් මේ ප්‍රාදේශීය පරිපාලන ආයතන ඵල ගැන්විය යුතුව තිබෙනවා. අපි ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත.

1. මුලින්ම ප්‍රාදේශීය පරිපාලනයට සම්බන්ධ කාර්යාලවල නිලධාරී පුරප්පාඩු පිරවීමට අප පියවර ගෙන ඇත.

ඒ අනුව එම කාර්යාලවල ලිපිකරු කාර්ය මණ්ඩලය අවශ්‍යතා බොහොමයක්ම මේ වන විට සම්පූර්ණ කර ඇත. පසුගිය වර්ෂයේ පැවැත්වූ ලිපිකාර විභාගයෙන් සමත්වූ නවක ලිපිකරුවන් 226 දෙනෙකු පමණ ප්‍රාදේශීය පරිපාලනයේ කාර්යාලවල පුරප්පාඩු සඳහා පත් කොට ඇත.

අළුතින් පත් කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් යොදා ගෙන මේ දක්වා සියලුම සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු පුරප්පාඩු පුරවා ඇත. කාර්යාල කිහිපයක හැර සියලුම ප්‍රාදේශීය ලේකම් තනතුර මේ වන විට සුදුසු නිලධාරීන්ගෙන් සම්පූර්ණ කර ඇත. දැනට පුරප්පාඩු වී ඇති ප්‍රාදේශීය ලේකම් තනතුරු කිහිපයක් ඉදිරි දිනවලදී පිරවීමට කටයුතු කරනු ලැබේ. මෙයින් අප බලාපොරොත්තු වන්නේ ජනතාවට සේවා සපයන ආයතනවල වැඩ කටයුතු කරන්නට අවශ්‍ය තරම් දක්ෂතා හා පුහුණුව ඇති නිලධාරීන් පත්කිරීමටයි.

2. අප පසුගිය කාලය තුළ ගත් ඉතා වැදගත් පියවරක් නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල අධීක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමයි.

මගේම යෝජනාවක් අනුව දැන් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල අධීක්ෂණය කෙරෙනවා. ඒ කියන්නේ අපේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කණ්ඩායමක් කලින් නොදන්වා ගිහින් ඒ ප්‍රදේශීය ලේකම් කාර්යාල අධීක්ෂණය කර, ඒ ඒ තැන්වල තිබෙන අඩුපාඩුකම් ගැන කරනු ලබන වාර්තා මම කියවා බලා, "මෙන්න මේ අඩුපාඩු තිබෙනවා. කරුණාකර මේවා සම්පූර්ණ කරන්නය" කියා ප්‍රාදේශීය ලේකම්වරුන්ට දන්වා යවනවා. සමහර කාර්යාලවල ලිපි ප්‍රමාද වෙනවා නම් – ලැබෙන ලිපිවලට පිළිතුරු යැවීම ප්‍රමාද නම් – ඒ වගේම මහජනයාගෙන් ඉඩම් ප්‍රශ්න ආදය ගැන සොයා බලන්නට ප්‍රමාද වෙනවා නම්, මා පෞද්ගලිකවම ඒවා පරීක්ෂා කර බලා, "ප්‍රාදේශීය ලේකම්තුමා මෙන්න මේ වැරදි තිබෙනවා, කරුණාකර මේවා හදන්න" කියා ඒ අයට පෞද්ගලිකවම ලිපි මඟින් දන්වා යවනවා. දැනට අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 28ක් අධීක්ෂණය කර තිබෙනවා. ඉදිරියේදී ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රාදේශීය ලෙකම් කාර්යාල අධීක්ෂණය කරන අතර, ඒවායින් වඩා හොඳ මහජන සේවයක් ලබාදීමට අවශ්‍ය පියවර ගන්නවා.

3. මෙම කාර්යාලවලින් ඉෂ්ට වන සේවාවන්ට අදළ ක්‍රමවේදයන් සහ වැඩ පටිපාටි සරල කරන්නට අප පියවර ගෙන ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් වැඩක් කර ගන්නට ආ විට පුද්ගලයකුට රස්තියාදු නොවී එය ඉක්මණින් ඉටු කර ගන්නට හැකි ආකාරයට යල් පැන ගිය විධි ක්‍රම හා පටිපාටිවල වෙනස්කම් සිදු කර ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජ්‍ය සේවය බොහෝ දෙනකුගේ විවේචනයට භාජනය වන්නේ කෙනෙක් කාර්යාලයකට ගිහින් වැඩක් කරවා ගන්නට බැරිවීම නිසා බව තමුන්නාන්සේලා දන්නවා. කාර්යාලයකට දවස් පහක්, හයක්, හතක්, අටක් යන්න ඕනෑ. නැත්නම් ඒ කාර්යය කෙරෙන්නේ නැහැ. මම කියලා තිබෙන්නේ ඒ කාර්යය කරන්න පුළුවන්ද, බැරිද කියන එක පළමු වන දවසේම ඒ පුද්ගලයාට කියන්න ඕනෑ කියන එකයි. නැත්නම් ඒ නිලධාරියාට විරුද්ධව ක්‍රියා කරන බව මා පැහැදිලිවම කියා තිබෙනවා. යම් රජයේ නිලධාරියෙක් මහජනයා රස්තියාදු කළොත්, ඒ ගැන මට පැමිණිල්ලක් ලැබුණොත් අනිවාර්යයෙන්ම මම ඔහුට විරුද්ධව ක්‍රියා කරනවා. මම ඒ ගැන කියලයි තිබෙන්නේ.

ටී. මහේස්වරන් මහතා
(திரு. ரி. மகேஸ்வரன்)
(Mr. T. Maheswaran)
යාපනයේත් එහෙම කරනවාද?

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)
යාපනයේත් එහෙමයි. මම මුළු ලංකාවටම ඇමති. කොළඹට විතරක් නොවෙයි. හැම තැනටම එහෙමයි. You can send a letter තමුන්නාන්සේ ලිපියක් එවන්න.

ගරු රෙජී රණතුංග මහතා
(மாண்புமிகு றெஜி ரணதுங்க)
(The Hon. Reggie Ranatunge)
එතුමා යාපනයේ යන්නේ නැහැ.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)
මම ලංකාවටම ඇමති. යාපනයත් ලංකාවේ කොටසක්. තමුන්නාන්සේ හිතා ගෙන ඉන්නේ ඒ කොටස වෙන් වෙලාය කියලාද? යාපනය කියන්නේත් ලංකාවේම කොටසක්. ඒක මතක තියා ගන්න.

ගරු රෙජී රණතුංග මහතා
(மாண்புமிகு றெஜி ரணதுங்க)
(The Hon. Reggie Ranatunge)
එතුමා ඉන්නේ ගම්පහ.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)
මහේස්වරන් ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඉන්නේ ගම්පහ නේද? යාපනයේ යන්නේ නැහැ නේද? කමක් නැහැ. යනවා නම් ප්‍රවේශමෙන් යන්න. ඒ වාගේම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉටු කරවා ගන්න සේවාවන් පිළිබඳව විස්තර අඩංගු අත් පත්‍රිකා මුද්‍රණය කොට ඒ කාර්යාලවල තැබීමට අදහස් කරනවා.

මේ අවස්ථාවේදී මම මේ කරුණ ගැන සඳහන් කිරීම මගේ යුතුකමක් හැටියට සලකනවා. තවලම හිටපු ප්‍රාදේශීය ලේකම් විජය වික්‍රමරත්න මැතිතුමා 'ජනතාවට අත්වැලක්' නමින්. පොතක් මුද්‍රණය කොට තිබුණා. එය ඉතාම හොඳ පොතක්. ඒ කියන්නේ, තමන්ට යම් වැඩක් කර ගන්නට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියොත්, – ඉඩම් ප්‍රශ්නයක්, එහෙම නැත්නම් සමෘද්ධි සහනාධාර, එහෙමත් නැත්නම් වෙනත් අවශ්‍යතාවක් සඳහා ගියොත් – ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුත්තේ කෙසේද යන කරුණු ඇතුළත් පොතක්. සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට එතුමාගේ ඒ පොත යවන්න කටයුතු කර තිබෙනවා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා; මහජනයා රස්තියාදු නොකර, ප්‍රාදේශීය ලේකම් තුමන්ලා කටයුතු කරාවිය කියා.

ඒ වගේම, තවත් වැදගත් පියවරක් හැටියට සෑම තැනකම උපකාරක වැඩ පිළිවෙළක් ඇති කරන්නට මම නියෝග කර තිබෙනවා. යම් වැඩක් කරවා ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට එන අයට උපකාරවීම, සඳහා යම් නිලධාරියකු පත් කර කාර්යාලයට ඇතුළු වන තැනම Help Desk එකක් පවත්වා ගෙන යෑමට යෝජනා කළා. දැනට තිබෙන විමසීම් කවුළුවෙන් කෙරෙන්නේ පුද්ගලයන්ට මඟ පෙන්වීම පමණයි. ඊට වඩා වැඩි යමක් මෙයින් ඉටු කර ගන්නට බලාපොරොත්තු වෙනවා.

මම මේ අවස්ථාවේදී ඩික්සන් නිලවීර මැතිතුමා ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමා පරිපාලන අධිකාරියේ ලේකම් හැටියට කටයුතු කරනවා. එතුමා බොහොම හොඳින් මට මේ කරුණු ගැන උපදෙස් ලබා දෙනවා. එතුමාගේ යෝජනාවක් අනුව, අපි සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම Help Desk එකක් තබන්නට කටයුතු කරනවා. යම් කටයුත්තක් කරවා ගැනීමට කවුරු හරි ආවොත්, එයාට පුළුවන් එතැනට ගිහින් ඒ ගැන අහන්න. සමහර ඉල්ලුම් පත්‍ර ගම්බද ජනතාවට, නූගත් අයට පුරවන්න බැහැ. Help Desk එකේ සිටින නිලධාරියා ඒ වගේ අයට ඒ පෝර්ම පුරවන හැටි පැහැදිලිව කියා දෙන්න ඕනෑ. නැත්නම් ඒ නිලධාරියා එය පුරවාදීමට කටයුතු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා දන්නා විධියට අපේ රටේ අනවශ්‍ය පෝර්ම තිබෙනවා. සමහර ඒවා පැදුරු වාගේ දිගයි. මගේ කාලයේදී ඒ අනවශ්‍ය පෝර්ම සියල්ල අයින් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. මහජනයාට පහසුවෙන් තම කාර්යය කර ගන්නට අවස්ථාව සලසා දෙන්න ඕනෑ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර කළමනාකරණ තරග කලිනුත් පැවැත්වුණා. ඒවා වඩාත් දියුණු මට්ටමකින් පවත්වා, හොඳින් වැඩ කරන කාර්යාලවල නිලධාරීන් අභිප්‍රේරණය කරන්නට කටයුතු කරනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැරුණු විට, තම අවශ්‍යතා ඉටු කරවා ගන්නට ජනතාව වැඩිපුරම එන තැන් තමයි; ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වැනි ආයතන. ඒවා අපගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුයි. ඒවායින් ජනතා අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීමට හැකි වන ආකාරයෙන් කටයුතු සලස්වන්නට ක්‍රියා මාර්ග රැසක් මේ වන විට අප ගෙන තිබෙනවා.

ඊළඟට, අභ්‍යන්තර සංනිවේදනය සඳහා ඊ–මේල් භාවිතා කිරීම. 2001.02.19 දින පැවැති කළමනාකරණ කමිටු රැස්වීමේදී ගන්නා ලද තීරණයක් අනුව, 2001.04.02 දින සිට අමාත්‍යාංශයේ අභ්‍යන්තර සංනිවේදන කටයුතු සඳහා ඊ–මේල් පමණක් භාවිතා කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අමාත්‍යවරයා හැටියට අමාත්‍යාංශයට ගියාම මට එක දෙයක් පෙනී ගියා. අපේ අමාත්‍යාංශයට තට්ටු කිහිපයක් තිබෙනවා. දෙවන තට්ටුවේ ඉඳලා හත් වන තට්ටුවට ලියමනක් යන්නට සමහර විට සුමාන දෙකක් යනවා. ඒ වාගේ ප්‍රමාදයක් පවතිනවා. ඒ පිළිබඳව අපේ ලේකම්තුමා වන ජුනයිඩ් මැතිතුමාට කිව්වා. දැන් ඊ-මේල්වලින් තමයි, ජේරම කරන්නේ. [බාධා කිරීමක්] ඊ-මේල් භාවිතය තුළින් තමයි අද වැඩ කටයුතු කරන්නේ. එම නිසා ප්‍රමාදයකින් තොරව මහජනයාගේ වැඩ කටයුතු කරයි කියා මම බලාපොරොත්තු වෙනවා. –[බාධා කිරීමක්] The address?

අසෙයිඩ් අලි සාහිර් මවුලානා මහතා
(ஜனாப் அஸெய்யித் அலி சாஹிர் மௌலானா)
(Mr. Asseyed Ali Zahir Moulana)
I will get it from Mr. Junaid.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)
I will send it.

අසෙයිඩ් අලි සාහිර් මවුලානා මහතා
(ஜனாப் அஸெய்யித் அலி சாஹிர் மௌலானா)
(Mr. Asseyed Ali Zahir Moulana)
Thank you, Sir.– [*Interruption*].

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)
Do you want to know the –[*Interruption*]. All night. I will send it. [*Interrupiton.*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)
එක්කත් ඊ-මේල් සම්බන්ධතා තියා ගත්තොත් හොඳයි. [බාධා කිරීමක්]

ගරු රිචර්ඩ් පතිරණ මහතා
*(மாண்புமிகு றிச்சட் பத்திரண)*
(The Hon. Richard Pathirana)
එහෙම තමයි තිබෙන්නේ.

ඊමේල් භාවිතය තුළින් කඩිනම් සන්නිවේදනය මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට පරිගණක භාවිතය ප්‍රචලිත කිරීමට හා පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීමට අදහස් කෙරේ. අපේ අමාත්‍යාංශය යටතේ ඇති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ සිදුවන ප්‍රමාදයන් වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බව සඳහන් කරන්න කැමැත්තෙමි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තමයි හුඟක් ප්‍රමාදය තිබුණේ. හුඟක් පැමිණිලි තිබුණේ ඒ ගැනයි. ඒ අය විශ්‍රාම ගියාම කාලයක් යනතුරු විශ්‍රාම වැටුප් ලැබෙන්නේ නැහැ කියා.

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය පසු ඊළඟ මාසයේදීම කලින් මාසයේදී ලබාගත් වැටුපෙන් සියයට 70 විශ්‍රාම වැටුප ලෙස ගෙවන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට දැනටමත් චක්‍රලේඛ මගින් දන්වා ඇත.

මේ මාසයේ වැඩ කරන කෙනෙක් ලබන මාසයේ විශ්‍රාම ලැබුවොත් මේ මාසයේ ලැබූ වැටුපෙන් සියයට 70ක් විශ්‍රාම වැටුප හැටියට ගෙවන්න ඕනෑ. ඒ සඳහා ලිපිගොනුව හදන්න ඕනෑ නැහැ. දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලයක් තිබෙනවා, රුපියල් 1,000ක වැටුපක් ගත්ත එක්කෙනාට රුපියල් 700ක වැටුපක් ගෙවන්න දැන් විශ්‍රාම වැටුප් පිළිබඳව අදාළ චක්‍රලේඛය යවා තිබෙනවා. මමත් මන්ත්‍රීවරයෙක් හැටියට දිගටම හිටියා. ඒ කාලයේ හුඟ දෙනෙක් ඇවිත් මට කියන්නේ, සර්, අප විශ්‍රාම ගත්තා. තවම අපට කියක්වත් ලැබෙන්නේ නැහැ. කඩෙන් ණයට බඩු දෙන්නේ නැහැ කියලයි. දැන් තත්ත්වය ඇතිවීම වළක්වන්න වැඩ පිළිවෙළක් යොද තිබෙනවා. එම නිසා විශ්‍රාම ගත්තාම, ඊළඟ මාසයේම තමන් අන්තිමට ලැබූ වැටුපෙන් සියයට 70ක විශ්‍රාම වැටුපක් ලබන්නට අනුමතිය දී තිබෙනවා. ඒක ගෙවන්න දෙපාර්තමේන්තු ප්‍රධානියාට පුළුවන්. හැබැයි, මේක තවම හුඟක් දෙනෙක් දන්නේ නැහැ. ඒ නිසා හුඟ දෙනෙක් කියනවා, කියක්වත් ලැබෙන්නේ නැහැ කියා. එම නිසා මම ජනමාධ්‍යවේදීන්ගෙන් ඉල්ලීමක් කරන්නට කැමැතියි. මේ ගැන ප්‍රසිද්ධියක් ලබා දීම අවශ්‍යයි. විශ්‍රාම ගත්තාම ඊළඟ මාසයේ ඒකෙන් ලැබූ වැටුපෙන සියයට 70ක විශ්‍රාම වැටුපක් ගන්න හැම කෙනෙකුටම අයිතියක් තිබෙනවා. ඒ අනුව විශ්‍රාම ගිය පසු දුෂ්කරතා නිසා ඇති වන කලකිරුණු තත්ත්වය මඟ හැරෙනු ඇත. එසේම විශ්‍රාමිකයා ජීවත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මගින් විශ්‍රාම වැටුප් ලබා දීමට අවශ්‍ය පියවර ගනු ඇත.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර අය විශ්‍රාම යනවා, අක්මීමනින්. විශ්‍රාම වැටුප ගන්නේ නුවරින්. මම කිව්වා, ඒක බැහැ, මීට පසු තමන් පදිංචි ප්‍රදේශයෙන්ම ගන්න ඕනෑය කියා. තමන් පදිංචි නුවර නම් නුවරින් ගන්න ඕනෑ. මම නුවර ගිය අවස්ථාවේදී මට දැන ගන්න ලැබුණා, විශ්‍රාමිකයන් 1200ක් නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ගන්නා බව. ඒක අමාරුයි. කොළඹ කාර්යාලයෙන් 1800ක් විතර විශ්‍රාම වැටුප් ගන්නවා. ඒක වැඩියි. නමුත් ඒ මෙහේ පදිංචි අය නොවෙයි. ඒ අය ලංකාවේ නොයෙක් පළාත්වල පදිංචි අය. ඒ වාගේම සමහර අය සමහර මිය ගිය අයගේ විශ්‍රාම වැටුපත් ගන්නවා. ලංකාවේ මාසයකට රුපියල් ලක්ෂ 30ක විශ්‍රාම වැටුප් මුදල් ව්‍යාජ ලෙස ගන්නවා. මැරුණු අය ගැන ප්‍රාදේශීය ලේකම්තුමා දන්නේ නැහැ. ඒ මොකද, හරියාකාරව වාර්තා ලැබෙන්නේ නැති නිසායි. එම නිසා [බාධා කිරීමක්] භූතයෝ හරි කවුරු හරි ගන්නවා. කොහොම හරි මාසයකට රුපියල් ලක්ෂ 30ක් විතර වැඩිපුර යනවා. එම නිසා මම කිව්වා, තමන් පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ගන්නය කියලා. මම එහෙම යෝජනා කළාම සමහර අය කිව්වා, ජෝඩුවම විශ්‍රාම ගත් අය ඉන්නවාය, මාසයකට සැරයක් කොළඹ ඇවිල්ලා විශ්‍රාම වැටුපත් අරගෙන පොඩි ජොලියක් දාලා යන්න ඒ අය කැමතිය කියා. මම කිව්වා, ඒ ජොලිය වෙනත් සාමාන්‍ය දවසකට දාගන්නය කියලා.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)
කොහොමද, ඒ ජොලිය දාන්නේ?

ගරු රිචර්ඩ් පතිරණ මහතා
*(மாண்புமிகு றிச்சட் பத்திரண)*
(The Hon. Richard Pathirana)
දාන්නේ මෙහෙමයි. මහත්තයා ඇවිල්ලා විශ්‍රාම වැටුප ගන්නවා. බෝතලයකුත් ගන්නවා. නෝනත් එක්ක රවුමක් යනවා; ෂොපින් යනවා. අන්න එහෙමයි. අපට රජයේ මුදල් –

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)
ඒගොල්ලන් යන්නේ විහාර මහා දේවී පාර්ක් එකටද?

ගරු රිචර්ඩ් පතිරණ මහතා
*(மாண்புமிகு றிச்சட் பத்திரண)*
(The Hon. Richard Pathirana)
එහෙත් යනවා ඇති.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)
ඒකත් රජයට අරගෙන. [බාධා කිරීමක්]

ගරු රිචර්ඩ් පතිරණ මහතා
*(மாண்புமிகு றிச்சட் பத்திரண)*
(The Hon. Richard Pathirana)
අපි ඒක රජයට ගත්තේ තමුන්නාන්සේලාගෙන් නොයෙක් බාධා සිද්ධ වෙන නිසයි. ඒ නිසයි, අපි ඒක රජයට ගත්තේ. හොඳට හරිගස්සලා දෙන්න ගත්තේ. අපි ඒක ආපසු නගර සභාවට දෙනවා. භය වෙන්න එපා. තමුන්නාන්සේත් හැන්දෑවට යනවාද?

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)
තමුන්නාන්සේත් මාත් එක්ක එනවා නම් මම යන්න කැමැතියි.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
*(மாண்புமிகு றிச்சட் பத்திரண)*
(The Hon. Richard Pathirana)
නැහැ, මම ඕනෑ නැහැ. තමුන්නාන්සේ යන්න.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)
එස්. බී. දිසානායක ඇමතිතුමාගේ 'ලව් පාර්ක්' කෝ ?

ගරු රිචර්ඩ් පතිරණ මහතා
*(மாண்புமிகு றிச்சட் பத்திரண)*
(The Hon. Richard Pathirana)
ඒක හදයි. ඒ ගැන එතුමා ආපු වෙලාවක එතුමාගෙන් අහන්න. මම කිව්වේ නැහැ නේ. මම කියපු දේවල් ගැන විතරක් මගෙන් අහන්න. අනිත් අය කියපු දේවල් ගැන තමුන්නාන්සේ මගෙන් අහන එක හොඳ නැහැ නේ.

ගාමිණී අතුකෝරල මහතා
*(திரு. காமினி அத்துகோரள)*
(Mr. Gamini Atukorale)
එතුමා කියපු දේවල් ඔක්කොම තමුන්නාන්සේ දන්නවා නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු රිචඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

මම දන්නවා. අතුකෝරල මන්ත්‍රීතුමනි, කරුණාකර එතුමා ඉන්න වෙලාවක එතුමාගෙන් අහන්න. `කෝ, අර පෙම් උයන' කියලා කෙලින්ම අහන්න. මම විපක්ෂයේ ඉන්න කාලයේදී තමුන්නාන්සේලාගෙන් ඇහැව්වා වගේ, අහන්න. `කෝ අර පෙම් උයන' කියලා අහන්න. [බාධා කිරීමක්] මම කියන්නේ විශ්‍රාම ගිය අයට. පෙම් කළාට කමක් නැහැ කියලයි. මොකද වෙන්නේ? ඒකේ තහනමක් නැහැ නේ. අස්වර් මන්ත්‍රීතුමා ඉන්නවා මොකද එතුමා පෙම් නොකරද ඉන්නේ? ඒකට කමක් නැහැ.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

මම ඒ තරම් වයසට ගිහිල්ලා නැහැ. තවම තරුණයි.

ගරු රිචඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

තමුන්නාන්සේ වයසයි කියලා මම කිව්වේ නැහැ. මම එහෙම කිව්වේ නැහැ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට තව කාරණයක් කියන්න තියෙනවා. විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල අප සංස්ථාගත කළේ ලක්ෂ 4ක් පමණ වන මේ රටේ රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ට තම විශ්‍රාම දිවිය ආත්මාභිමානයෙන් යුතුව ගත කිරීමට අවස්ථාවක් සලසා දීමේ අරමුණින් යුතුවයි. ඒ හිටපු ඇමතිතුමාගේ කාලයේදියි. මේ අරමුදල සඳහා රජයෙන් රුපියල් දස ලක්ෂයක මුදලක් ලබා දෙන ලදී. විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල සඳහා අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂ 10ක් දුන්නා. විශ්‍රාමිකයන්ගේ භාර අරමුදලේ දිස්ත්‍රික් මට්ටමෙන් සංගම් 21 සහ ප්‍රාදේශීය ලේකම් මට්ටමෙන් සංගම් 296ක් මේ වන විට පිහිටුවා තිබෙනවා.

ග්‍රාම නිලධාරීන්ට මාසිකව තම කාර්යාල සඳහා ගෙවන දීමනාව වැඩි කර ගෙවීම දැනටමත් කැබිනට් මණ්ඩලය මගින් අනුමත කර ඇත. ග්‍රාමීය සේවය කරන ග්‍රාම නිලධාරීන්ට රු. 150 වෙනුවට රු. 300ක් ගෙවනවා. මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ගමේ අයට රු. 150යි, දුන්නේ. නමුත් මේ වතාවේ රු. 300ක් ගෙවනවා. එය ජනවාරි මාසයේ 01 වන ද ඉඳලාම ගෙවනවා. ඊළඟට නගරයේ සේවය කරන ග්‍රාම නිලධාරීන්ට රු. 150 වෙනුවට රු. 500ක මාසික දීමනාවක් ගෙවනවා. ඒ කාර්යාල දීමනාවක් වශයෙනුයි. ටවුන් එකේ සිටිනවා නම්, රු. 150 රු. 500 දක්වා වැඩි කළා. ගමේ සිටිනවා නම් රු. 150 රු. 300 කළා. හැබැයි, ඒ අය කාර්යාලයේ ඉන්න ඕනෑ. මට තිබෙන පැමිණිල්ලක් තමයි, ග්‍රාම නිලධාරී මහත්වරු කාර්යාලයේ ඉන්නේ නැහැ කියන එක. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඒ අය කාර්යාලයේ නොසිටියොත් මම ඒ අය සේවයෙන් ඉවත් කරනවා. ඒක මගේ ප්‍රතිපත්තියයි. කාර්යාලයේ ඉන්න ඕනෑ. මම දැන් දීමනාවක් ඩබල් කර දීලා තිබෙනවා. රු. 150ක මාසික දීමනාව රු. 500 කළාය කියන්නේ ලොකු දෙයක් දැන් බොරැල්ලේ පන්සලක හය දෙනෙක් ඉන්නවා. ඒ අය මහන වෙන්න ගිහිල්ලද කියා මම දන්නේ නැහැ. කමක් නැහැ. කොහොම වුණත් හය දෙනෙක් විතර ඉන්නවා. ඒ අයට කාර්යාල ගන්න යයි මම කිව්වා. කාර්යාලය සඳහා රු. 150කට ටවුමේ කාමරයක් ගන්න බැහැ.

ගාමිණී අතුකෝරල මහතා
(திரு. காமினி அத்துகோரள)
(Mr. Gamini Atukorale)

හය දෙනාගේම කාර්යාල පන්සලේද ?

ගරු රිචඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

හය දෙනාගේම කාර්යාල තිබෙන්නේ පන්සලේ. මොකද, වෙන තැනක් ගන්න බැරි නිසයි.

රාජ්‍ය පරිපාලන විෂයෙහි ඉදිරි පියවරවල් රැසක් අප පසුගිය කාලයේදී ගනු ලැබුවා. ශ්‍රී ලංකා පරිපාලන සේවය වෘත්තික සේවාවක් බවට පත් කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ එකඟත්වයද ඇතිව ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව සංශෝධනය කර ඇත. වඩාත් තෘප්තිමත් පරිපාලන සේවාවක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර අපේ අමාත්‍යාංශය මගින් ගෙන ඇත. ඇබෑර්තු අනුව වාර්ෂිකව බඳවා ගැනීමටත්, සෑම වර්ෂයකම විභාගය පැවැත්වීමටත් මම උපදෙස් දී ඇත. බඳවා ගැනීමේදී අබේරත්න කමිටුවේ නිර්දේශ හැකිතාක් දුරට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විභාගය දැන් ගැසට් කර තිබෙනවා. හුඟ දෙනෙක් පත්‍රවලට ලිපි ලියනවා. එම විභාගය ගන්න පුළුවන් වයස අවුරුදු 28ය කියා. නැහැ. 30යි. ළඟදී ඒ සංශෝධනය පත්‍රයේ පළ වේවි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විභාගය වයස අවුරුදු 30 වන තුරු ගන්න පුළුවන්. හැබැයි 32 කරන්න නම් බැහැ. නමුත් අවුරුදු 30 වෙනකම් පුළුවන්. තව සුමාන දෙකකින් ඒ සංශෝධනය පළ වෙන බව අපේ අමාත්‍යාංශයේ ලේකම් ජුනයිඩ් මහතා මට කිව්වා. එම නිසා ජනමාධ්‍යවේදීන්ට මම කියන්න කැමැතියි, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විභාගය ගන්න පුළුවන් වයස අවුරුදු 28ය කියා පළ කරන්න එපාය කියා. එය අවුරුදු 30 කරලා තිබෙන්නේ. වයස අවුරුදු 30 දක්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විභාගය ගන්න පුළුවන්.

පරිපාලන ප්‍රතිසංස්කරණ යටතේ අතිගරු ජනාධිපතිතුමිය විසින් පරිපාලන ප්‍රතිසංස්කරණ අධිකාරියේ ලේකම් ඩික්සන් නිලවීර මැතිතුමා සමඟ මාසිකව සාකච්ඡා රාශියක් පවත්වා තිබෙනවා.

සජිත් ප්‍රේමදාස මහතා
(திரு. சஜித் பிரேமதாச)
(Mr. Sajith Premadasa)

ගරු ඇමතිතුමා පොඩි පැහැදිලි කර ගැනීමකට ඉඩ දෙනවා ද ?

ගරු රිචඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

කවුද, කතා කරන්නේ ?

සජිත් ප්‍රේමදාස මහතා
(திரு. சஜித் பிரேமதாச)
(Mr. Sajith Premadasa)

මම

ගරු රිචඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

හා කියන්න.

සජිත් ප්‍රේමදාස මහතා
(திரு. சஜித் பிரேமதாச)
(Mr. Sajith Premadasa)

ග්‍රාම නිලධාරීන් ගැන කතා කරන කොට හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. විවිධාකාර බොරු චෝදනා මත, දේශපාලන බලපෑම් මත ග්‍රාම නිලධාරීන් එක එක ස්ථානවලට මාරු කර යවනවා. ග්‍රාම නිලධාරීන්ට දේශපාලනය කිරීම අනිවාර්යයෙන්ම තහනම්ය කියන එක අපි හැමෝම දන්නවා. නමුත් යථාර්ථය මොකක්ද? තම තමන්ට සුදුසු දේශපාලන පක්ෂ තෝරාගෙන බොහෝ දෙනෙක් දේශපාලනය කරනවා. නමුත් දඬුවම් ලබන්නේ එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ සහ ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ ග්‍රාම නිලධාරීන් පමණයි.

ගරු රිචඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

ගරු මන්ත්‍රීතුමා, හම්බන්තොට දිසාපතිතුමා මේ සභාවේ ගැලරියේ ඉන්නවා. මම මේ වෙලාවේ කියනවා, කිසිම ග්‍රාම නිලධාරියකු දේශපාලන හේතු මත මාරු කරන්නට එපාය කියා.

සජිත් ප්‍රේමදාස මහතා
(திரு. சஜித் பிரேமதாச)
(Mr. Sajith Premadasa)

මම ඔබතුමාට ලැයිස්තුවක් දුන්නොත්, එක්සත් ජාතික පක්ෂයෙන් දේශපාලනය කිරීම තුළින් –



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

මන්ත්‍රීතුමා ලැයිස්තුව දෙන්න. මම බලන්නට ඕනෑ, මාරු කර තිබෙන්නේ දේශපාලනය කළාට ද කියා. ග්‍රාම නිලධාරීන්ට දේශපාලනය කරන්න බැහැ. දේශපාලනය කළාය කියා ඔප්පු වුණොත් රක්ෂාවෙන් අස්වෙන්නට වෙනවා.

සජිත් ප්‍රේමදාස මහතා
(திரு. சஜித் பிரேமதாச)
(Mr. Sajith Premadasa)

එතකොට පොදුජන එක්සත් පෙරමුණේ –

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

ඒත් බැහැ.

සජිත් ප්‍රේමදාස මහතා
(திரு. சஜித் பிரேமதாச)
(Mr. Sajith Premadasa)

ඒත් බැහැ. එතකොට මම ඇමතිතුමාට ලැයිස්තුවක් ඉදිරිපත් කළොත්, ඒ විධියට හානියට ලක් වුණු ග්‍රාම නිලධාරීන් ගැන –

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

මම සොයා බලන්නම්. මන්ත්‍රීතුමා ලැයිස්තුව එවන්නකෝ.

සජිත් ප්‍රේමදාස මහතා
(திரு. சஜித் பிரேமதாச)
(Mr. Sajith Premadasa)

හරි. මම එවන්නම්.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

ඒක හම්බන්තොටට පමණක් ද?

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

ලංකාවේ ඕනෑම තැනක.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

අපේ ප්‍රදේශයේ හරියට දේශපාලන ඇහිලි ගැහීම් කරලා ඒ අය එහාට මෙහාට මාරු කරනවා. [බාධා කිරීමක්]

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ලැයිස්තුව දෙන්න. නිකම් ලැයිස්තු දෙන්න එපා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අතුරු ප්‍රශ්න නිසා මගේ කාලය හුඟාක් ඒවාට යනවා. නමුත් කරන්න දෙයක් නැහැ.

ශ්‍රී ලංකා පරිපාලන සේවය ගැන මම තීරණයක් අරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තිබෙන ඇබෑර්තුවලට වාර්ෂිකව විභාගයෙන් ගන්නවා. හැම අවුරුද්දකම විභාගය පවත්වනවා. හැබැයි, තොග වශයෙන් බඳවා ගන්නේ නැහැ. එහෙම බඳවා ගත්තාම හරියට පුහුණුවක් දෙන්නට බැහැ. එම නිසා තිබෙන ඇබෑර්තුවලට බඳවා ගන්නවා. හැම අවුරුද්දකම විභාගය පවත්වනවා. ඒ ඒ අවුරුද්දේ විභාගයෙන් කට්ටිය අරගෙන, හොඳට පුහුණුවක් ලබාදීලා, පරිපාලන සේවයේ තනතුරුවලට පත් කරනවා.

පසුගිය වර්ෂය තුළ දී තරඟ විභාග පැවැත්වීමෙන් හා අදාළ සේවා ව්‍යවස්ථාවට අනුකූල ඒ හා ශ්‍රී ලංකා පරිපාලන සේවයට 306 දෙනකුත් ලිපිකාර සේවයට 1027 දෙනකුත්, අනෙකුත් ඒකාබද්ධ සේවාවන්ට 1833 දෙනකුත් බඳවා ගෙන තිබෙනවා. අලුතෙන් තනතුරුවලට රජයේ නිලධාරීන් බඳවා ගත් විට සේවාරම්භක පුහුණුවක් ලබා දීමේ අවශ්‍යතාව සහ වැදගත්කම අප දැඩි ලෙස අවධාරණය කර ඇත. මෙය පසුගිය කාලයේ සතුටුදායක මට්ටමකින් පැවතුණේ නැත. ඒ නිසා එබඳු නවක නිලධාරීන්ට විධිවත් සේවාරම්භක පුහුණුවක් ලබා දීමට අප පියවර ගෙන ඇත.

ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සේවා ස්ථාන අතර සුහද ස්ථාන මාරු කිරීමේ සාධාරණ වැඩ පිළිවෙළක් ඇති කිරීම සඳහා විධිමත් මාරුවීමේ ප්‍රතිපත්තියක් අප සකස් කරමින් සිටිනවා. ඒ මඟින් රජයේ ආයතනවල සේවා අවශ්‍යතාවනුත්, නිලධාරීන්ගේ පෞද්ගලික අවශ්‍යතාවනුත් තුලනය කර බලා සාධාරණ මාරු වීම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට හැකි වෙනවා ඇති.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නට කැමතියි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ මාරුවීම් සියල්ලම කෙරෙන්නේ මාරුවීම් මණ්ඩල මඟින් බව. එයට කිසිම දේශපාලන ඇඟිලි ගැසීමක් නැහැ. මම පැහැදිලිව කියනවා, දේශපාලනඥයින්ට ඒකට ඇඟිලි ගහන්නට බැහැ කියා. මාරුවීම් සියල්ලම කරන්නේ මාරුවීම් මණ්ඩල මඟින්. පරිපාලන සේවයේ නිලධාරීන්, ලිපිකරුවන්, සහ ඒකාබද්ධ සේවයට අයිති නිලධාරීන් මාරු කරන්නේ ඒ විධියට තමයි.

රාජ්‍ය සේවකයින්ගේ කාර්ය සාධනය ඇගයුමකට ලක් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ සමාලෝචනය කෙරෙමින් පවතින අතර, ඉතා ප්‍රමුඛ අවශ්‍යතාවක් ලෙස සලකා මෙතෙක් ලත් අත්දැකීම් ද ප්‍රයෝජනයට ගෙන වඩාත් දියුණු වැඩ පිළිවෙළක් මතු කාලයේ දී ක්‍රියාත්මක කිරීමට අදහස් කොට ඇත.

රජයේ ආයතනවල අනවශ්‍ය සහ අතිරේක කාර්ය මණ්ඩල සිටින බව අපට පෙනී ගිය නිසා රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල සමාලෝචනයක් කිරීමට ද අප පියවර ගෙන ඇත.

රාජ්‍ය සේවයේ ඵලදායිතාව වැඩි දියුණු කිරීමට ඵලදායිතා කව සංකල්පය මුල් කර ගෙන අප ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කොට ඇත. ඒවායේ ප්‍රතිඵල තිබෙනවා. දැනට රජයේ කාර්යාල බොහොමයක ඉතා උසස් තත්ත්ව කළමනාකරණයක් පවතිනවා. මේ කථාව අවසන් කරන්නට පෙර මම සටහනක් කරන්නට කැමතියි. එනම්, දෙවැනි වාරයටත් අපගේ අමාත්‍යාංශය රාජ්‍ය අංශයේ ඵලදායිතා සහ තත්ත්ව සම්මානය දිනා ගෙන තිබෙන බවයි.

තමුන්නාන්සේලා දන්නවා, විභාගයෙන් ලිපිකරුවන් බඳවා ගත්තාම ඔවුන්ට කිසිම පුහුණුවක් දෙන්නේ නැති බව. නමුත් මම අපේ ලේකම්තුමාට කිව්වා, ලිපිකරුවන් බඳවා ගත්තාට පසු ඒ අය පුහුණු කරන්නට ඕනෑය කියා. ඒ අය කාර්යාලයට යන්නට ඉස්සෙල්ලා කාර්යාලයට ගිහින් කරන්නට ඕනෑ මොකක්ද කියලා දැනගෙන තිබෙන්නට ඕනෑ. ලිපිකරු සේවයට බඳවා ගත්තාට පස්සේ පුහුණුවක් ලබා දෙන්නට දැන් අපි වැඩ කටයුතු කර තිබෙනවා. අලුතින් පත්වීම් ලබා ජනතා සේවය සඳහා යාමට පෙර කෙටි කාලීන පුහුණුවක් රජයේ සේවකයන්ට ලබා දිය යුතුය, යන ස්ථාවරයේ අපි සිටින්නෙමු. මේ අනුව පසුගිය මාර්තු 20 දින සිට අලුතින් බඳවා ගත් ලිපිකරු හා සමාන්තර සේවාවන්හි 700ක් දෙනාට දින පහක සේවාරම්භක පුහුණු වැඩ සටහනක් ආරම්භ කෙරිණි. මෙම පුහුණු කටයුතු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය සේවා පුහුණු ආයතනය මඟින් සිදු කෙරේ. රාජ්‍ය සේවයට අලුතින් ඇතුළුවන පිරිසට ජනතා සේවය නිසි පරිදි ඉටු කරන ආකාරය පිළිබඳවත් ඒ සඳහා මානසිකව කැපවන අන්දම පිළිබඳවත් මූලික දැනුමක් දීම, ප්‍රධානතම අරමුණ වේ. මෙම පුහුණු වැඩ මුළුවේදී,

* රාජ්‍ය සේවය යනු කුමක්ද?
* රාජ්‍ය සේවකයකුගෙන් අපේක්ෂිත ජනහිතවාදී සාමාන්‍ය හැසිරීම
* වගකීම්, යුතුකම් හා ආකල්ප කෙබඳු විය යුතුද?
* ශක්තිමත් රාජ්‍ය සේවයක් සඳහා ලිපිකරුවාගේ කාර්යභාරය කුමක්ද?
* කාර්යාල ක්‍රම, කාර්යාලයක් තුළ වැඩ සැළසුම් කිරීම, ලිපිගොනු කරණය හා ලිඛිත සන්නිවේදනය
* රාජ්‍ය මුදල් හා ගිණුම් කටයුතු, ආනයන කටයුතු, නිවාඩු, වරප්‍රසාද, විනයානුකූල පැවතුම් හා විනය පරිපාටිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

* මහජන සම්බන්ධතාව - මහජනයා රජයේ සේවකයාගේ ස්වාමිවරුන් බව, රාජ්‍ය සේවය ජනතාව වෙනුවෙනි. වැටුප් ලැබෙන්නේ ජනතා මුදලිනි. රැකියාව ලැබී ඇත්තේ ඒ අය නිසාය යන මානසික ආකල්පය ඇති කිරීම.
* කුසලතා වර්ධනය
* ඵලදායිතා වර්ධනය හා ඒ සඳහා කැපවන ආකාරය පිළිබඳ මෙම පුහුණුවේදී විශේෂ අවධානය යොමු කර ඇත.

රාජ්‍ය සේවය ගැන පැහැදිලි අවබෝධයක් දී සිය සේවය හරිහැටි කර ගෙන යාමට අවශ්‍ය ආකල්ප වර්ධනයටත් මානසික හැඩගැස්සීමටත් කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකරලීමට මූලික දැනුමක් ලබාදීමට සැලකිල්ල යොමු කර ඇත. පුහුණුව කෙරෙන අතර තුර මෙම නවක සේවකයන්ට සරල අභ්‍යාස දෙනු ලැබේ. උදහරණ වශයෙන් ලිපියක් සකසන ආකාරය, ලිපි ගොණු පත්වාගෙන යාම වැනි දේ. මෙවර අලුතින් බඳවාගත් 700ක් දෙනා අතරින් ලිපිකරුවන්ට වෙනම පුහුණුවක් හා වෙනත් සමාන්තර සේවා සඳහා වෙනම පුහුණු පංති සංවිධානය කිරීමත් අමාත්‍යාංශය මගින් සිදු කොට ඇත.

එමෙන්ම මේ තරුණ පිරිසට පරිඝනක දැනුම ලබාදීමටද විශේෂ අවධානයක් යොමු කර ඇත. ඔවුන්ගේ පරිඝනක දැනුම පිළිබඳ තොරතුරු රැස්කිරීමට අප විසින් ආකෘති පත්‍රයක් පුහුණුවට කැඳවන ලිපිය සමඟ ලබා දී ඇත. සපයන තොරතුරු අනුව අවශ්‍ය මට්ටමින් පුහුණුව සංවිධානය කරනු ලැබේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව අවසන් කිරීමට පෙර මම අතිගරු ජනාධිපතිතුමියට ස්තුතිවන්ත වෙනවා. එතුමිය රුපියල් 28,632,582,000ක් සහ රුපියල් 1,040,240,000ක් අපේ අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම්වලටත් ප්‍රාග්ධන වියදම්වලටත් ලබා දී තිබෙනවා. ඒ ගැන මම අතිගරු ජනාධිපතිතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම එතුමිය මට මෙම අමාත්‍යාංශය ලබා දීම ගැනත් මම එතුමියට ස්තුතිවන්ත වෙනවා.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

Social Service Centre, 276" Rock wood Mutur, නමැති සංවිධානයෙන් මට ලිපියක් ලැබී තිබෙනවා : විශේෂයෙන්ම ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ මහා කුණාටුවෙන් අලාභ හානි වූ රජයේ සේවකයන් බොහෝ දෙනෙක් සිටිනවා. ඒ අය පොලී නොමැති ණයපහසුකම් ඉල්ලා සිටිනවා. 1979දී මේ වාගේ කුණාටුවක් ඇති වුණු අවස්ථාවේදී රජයේ සේවකයන්ට පොලියක් නොමැතිව ණය මුදල් ලබා දුන්නා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්නටය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

ඒ ගැන තමුන්නාන්සේ වාගේම තවත් ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් මගේ අවධානය යොමු කර තිබෙනවා. මම ඒ ගැන කල්පනා කර බලනවා.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

කල්පනා කර බලන්න නොවෙයි. උත්සාහ කර බලන්න. තමුන්නාන්සේ හොඳ ඇමැතිවරයෙක්නේ. තමුන්නාන්සේ කරලා දෙනවනේ.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

උත්සාහ කරලා බලන්නම්.

සුරනිමල රාජපක්ෂ මහතා
(திரு. சுரனிமல் ராஜபக்ஷ)
(Mr. Suranimal Rajapakse)

අවුරුදු 30ක් 40ක් පදිංචිවී සිටින ඉඩම් බෙදා දීමට තවමත් ඇතැම් දිසාපති කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රියාකර නැහැ. ඒ සඳහා විධිමත් නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ කරුණාකර මට දන්වන්න, අහවල් දිසාපති කාර්යාලයෙන් ඒ කටයුතු කෙරිලා නැහැ කියා. එතකොට මම ඒ ගැන ක්‍රියා කරන්නම්. තමුන්නාන්සේ මට දන්වා එවන්නකෝ. තමුන්නාන්සේලාගේ ඕනෑම ප්‍රශ්නයක් ඇමතිවරයා හැටියට මට එවන්න. මම ඒ ගැන කටයුතු කරනවා. ඕනෑම ප්‍රශ්නයක්. ඕනෑම දේශපාලන පක්ෂයක් වුණාට මට කමක් නැහැ. එක්සත් ජාතික පක්ෂය වුණත් කමක් නැහැ. ජනතා විමුක්ති පෙරමුණ වුණත් කමක් නැහැ. වෙනත් දේශපාලන පක්ෂයක් වුණත් කමක් නැහැ. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ඕනෑම දේශපාලන පක්ෂයක් වුණත් කමක් නැහැ. මගේ අමාත්‍යාංශයට සම්බන්ධ ඕනෑම ප්‍රශ්නයක් තිබෙනවා නම්, කරුණාකර මට දන්වන්න [බාධා කිරීමක්] මම ඒ ගැන කටයුතු කරනවා.

සුරනිමල් රාජපක්ෂ මහතා
(திரு. சுரனிமல் ராஜபக்ஷ)
(Mr. Suranimal Rajapakse)

සමහර සේවා ස්ථානවල අවුරුදු 10කට වඩා සේවය කරන නිලධාරීන් නිසා සමහර ජනයා යම් අපහසුතාවකට පත් වෙනවා.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

මාරුවීම් ප්‍රතිපත්තියක් ඇති කරන්න මම කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. අවුරුදු පහෙන් පහට මාරුවීම් ලබා දෙන්නයි ඒ යෝජනාව. හොඳයි නේද?

ආර්. එම්. රංජිත් මද්දුමබණ්ඩාර මහතා
(திரு. ஆர். எம். ரஞ்சித் மத்துமபண்டார)
(Mr. R. M. Ranjith Maddumabandara)

පොඩි ප්‍රශ්නයක් තිබෙනවා ගරු අමාත්‍යතුමනි. බුත්තල ප්‍රාදේශීය ලේකම්වරිය ඌව පළාතේ හොඳම ප්‍රාදේශීය ලේකම්වරිය වුණා. නමුත් දැන් මාස ගණනකට ඉස්සර වෙලා -

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

දිසානායක මහත්මිය?

ආර්. එම්. රංජිත් මද්දුමබණ්ඩාර මහතා
(திரு. ஆர். எம். ரஞ்சித் மத்துமபண்டார)
(Mr. R. M. Ranjith Maddumabandara)

ඔව් එතුමිය දේශපාලන හේතුන් මත මාරු කළා.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අමාත්‍යාංශයට ගියාම මේ කියන නිලධාරී මහත්මිය සිටියේ සංචිතයේයි. එතකොට මට අපේ නිලධාරී නෝනා කෙනෙක් ඇවිල්ලා කිව්වා, අපරාදේ හොඳ ප්‍රාදේශීය ලේකම්වරියක් සංචිතයේ සිටිනවායි කියලා. මම එම නිලධාරිනියට එන්න කිව්වා. එන්න කියලා කිව්වා කරුණාකරලා අක්මීමනට එන්න කියා. ඒ නෝනා කිව්වා, අක්මීමනට එන්න බැහැ, අම්මා ඉන්නේ බණ්ඩාරවෙල නිසා ඒ පැත්තට යන්න ඕනෑය කියලා. මම කිව්වා, එහෙම නම් වැලිමඩට යන්න කියලා. දැන් එම නිලධාරිනිය වැලිමඩ වැඩ කරනවා.

ආර්. එම්. රංජිත් මද්දුමබණ්ඩාර මහතා
(திரு. ஆர். எம். ரஞ்சித் மத்துமபண்டார)
(Mr. R. M. Ranjith Maddumabandara)

බොහොම ස්තුතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට කථා කිරීමට තිබෙන කාල සීමාව අවසන් වීගෙන එනවා.

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)
එම නිසා මීට වඩා දීර්ඝ කථාවක් කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ මිත්‍ර, මගේ හිතවත් සහෝදර අමාත්‍ය න්නදිමිත්‍ර ඒකනායක මැතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳවත් සාකච්ඡාවට භාජන වන නිසා, එතුමාටත් වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව දෙන්න ඕනෑ. එතුමාගේ අමාත්‍යාංශයේත්, මගේ අමාත්‍යාංශයේත් කටයුතුවලට තමුන්නාන්සේලාගේ සියලු සහයෝගය ලබා දෙන ලෙස ගෞරවයෙන් ආයාචනය කරනවා.

විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශයේ ලේකම් එම්. එන්. ජුනයිඩ් මැතිතුමා තමුන්නාන්සේලා දන්නවා. එතුමා රාජ්‍ය සේවයේ ඉතාම ප්‍රවීණ පළපුරුදු නිලධාරියෙක්. එතුමාගේ ප්‍රධානත්වයෙන් අපේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු ඉතාම හොඳින් කරගෙන යාම ගැන අමාත්‍යාංශයේ සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ට මා ස්තුති කරනවා. ඒ මොකද ඉතාම හොඳට ඒ අය කිසිම ප්‍රශ්නයක් නැතිව වැඩ කටයුතු කරගෙන යනවා.

මම කවදාවත් ජාති භේද වාදියෙක් නොවෙයි. ලංකාවේ සිටින ඕනෑම හොඳ නිලධාරියෙක් මගේ අමාත්‍යාංශයේ ලේකම් හැටියට එවනවා නම් මම එතුමා සමඟ සතුටින් වැඩ කරනවා කියා මම කිව්වා. මගේ ආදර්ශය ඒකයි. ද්‍රවිඩ හෝ වේවා, මුස්ලිම් හෝ වේවා ඒ අයත් මේ රටේ ජනතාව. එම නිසා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ සේවය කිරීමට ඒ අයටත් අයිතියක් තිබෙනවා.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය කියන්නේ සියලුම රාජ්‍ය සේවකයන් පරිපාලනය කරන අමාත්‍යාංශයයි. මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉතාම ශ්‍රේෂ්ඨ විධියට බොහොම පළපුරුදු නිලධාරියකු විධියට හැම දෙනාම හොඳින් හසුරුවා ගෙන වැඩ කරනවා. එතුමා ඇතුළු සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ට මගේ ස්තුතිය පුද කරන අතර, විශේෂයෙන්ම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂතුමියටත්, රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාටත්, ඒ වාගේම මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන අනෙකුත් සියලුම දෙපාර්තමේන්තුවල සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් මගේ ස්තුතිය පුද කරනවා. අද දින මෙම වැය ශීර්ෂය සම්මත කර ගන්නට තමුන්නාන්සේලා සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. හැම දෙනාටම ස්තුතියි.

[පූ. භා. 11.00]

සුනිල් හඳුන්නෙත්ති මහතා
(திரு. சுனில் ஹன்துன்னெத்தி)
(Mr. Sunil Handunnetti)
ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමාගේ කථාවෙන් පසුව, විශේෂයෙන්ම ඵලදායී යෝජනා ගණනාවකුත් අඩංගු වූ කථාවකින් පසුව කථා කරන්නට ලැබීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ගරු ඇමතිතුමාගේ කථාව තුළත් අඩංගු වූ කාරණා කිහිපයක් සමඟම යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්නටත් මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම 2001 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා විභාගයක් පවත්වන බව, 2001 මාර්තු 16 වැනි දින ගැසට් පත්‍රයේ පළ වී තිබෙනවා. ඒ අනුව දැන් ඒ සඳහා අයදුම්පත් කැඳවමින් තිබෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, වයස් සීමාව සම්බන්ධයෙන් මෙතැනදී විශේෂ ප්‍රශ්නයක් මතු වී තිබෙනවා. මොකද? පරිපාලන සේවයේ -

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)
මම තමුන්නාන්සේට කියන්නම්. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 30ක් වශයෙන් සංශෝධනය කර, ඒ බව අප්‍රියෙල් මස 06 වැනි දින ගැසට් පත්‍රයේ පළ කොට ඇති.

සුනිල් හඳුන්නෙත්ති මහතා
(திரு. சுனில் ஹன்துன்னெத்தி)
(Mr. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, බොහොම ස්තුතියි. නමුත් දැන් ප්‍රශ්නයක් තිබෙනවා. මෙම වයස් සීමාව අවුරුදු 30 දක්වා ඉහළ දැමීමෙන් අවුරුදු දෙකක සහනයක් ලැබෙනවා. නමුත් ඔබතුමා උසස් අධ්‍යාපන ඇමතිවරයා හැටියටත් කටයුතු කළ නිසා දන්නවා ඇති, විශේෂයෙන්ම 1992-93 අධ්‍යයන වර්ෂවල, ඒ වගේම 1993-94 අධ්‍යයන වර්ෂවල පවා උපාධිධාරීන් විශාල ප්‍රමාණයකට මේ වයස් සීමාවේදී පවා යම් යම් ගැටලු මතු වී තිබෙනවා. මොකද? ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය, කැලණිය විශ්ව විද්‍යාලයය විතරක් නොවෙයි, රුහුණු විශ්ව විද්‍යාලයයේ කෘෂි විද්‍යා පීඨයෙන් පිට වන උපාධිධාරීන් පවා මේ නිසා බරපතල අර්බුදයකට ලක් වෙනවා.

මම උදාහරණයක් ඉදිරිපත් කරන්නම්. 1992 දී උසස් පෙළ සමත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශ්ව විද්‍යාලවලට ප්‍රවේශ වන්නට අවස්ථාව ලැබුණේ 1995 අග: දෙසැම්බර් මාසයේදීයි. විශ්ව විද්‍යාල පාඨමාලාව අවසන් කරන්නට අවුරුදු තුන හමාරක් විතර, සමහර විට කෘෂි විද්‍යා පීඨයේ නම් අවුරුදු හතර හමාරක් විතර කාලය ගත කරන්නට ඒ අයට සිදු වුණා. ඊට පස්සේ පාඨමාලා අවසන් කරද්දී 1998 අග තමයි, කලින් වතාවේ පරිපාලන සේවයට බඳවා ගැනීමේ විභාගය ගැසට් කළේ. දැන් නැවතත් මේ සියලු දෙනාටම අවුරුදු 30 සීමාව පවා ඉක්මවා තමයි පරිපාලන සේවයට බඳවා ගැනීමේ විභාගයට පෙනී සිටීමට සිද්ධ වන්නේ. ගරු අමාත්‍යතුමාගෙන් මා නැවතත් සලකා බලන ලෙස ඉල්ලා සිටින්නේ, මෙයයි. බොහෝ දෙනකුට අඩු තරමේ එක අවස්ථාවක්වත් මේ විභාගයට පෙනී සිටීමේ නොහැකියාව, අර්බුදය හැටියට පැන නැඟී තිබෙනවා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, රාජ්‍ය සේවයේ ඌන සේවාවල සේවය කරන උපාධිධාරීන්ට එනම්, දනට ලිපිකරු, යතුරු ලේඛක, ගබඩා භාරකරු, පොත් තබන්නන් ආදි වශයෙන් රාජ්‍ය සේවයේ නියැළී සිටින උපාධිධාරීන්ට 1993.4.30 වන දින නිකුත් කළ 2/93 චක්‍රලේඛය අනුව මෙම විභාගයට පෙනී සිටීමේ ඉඩකඩ අවස්ථා ගණනකින් හෝ වයස් සීමාවකින් තොරව තිබුණා. ඒ කියන්නේ දනට රාජ්‍ය සේවයේ යෙදී සිටින උපාධිධාරීන්ට වයස් සීමාවකින් හෝ අවස්ථා සීමාවකින් තොරව ශ්‍රී ලංකා පරිපාලන සේවා විභාගයට ඉදිරිපත් වීමේ හැකියාව තිබුණා කියන එකයි.

නමුත් 2/93 චක්‍රලේඛය අහෝසි වී ඒක ඇනහිටීමත් එක්ක, ඒ අයට - ඌන සේවා උපාධිධාරීන් හැටියට දනට රාජ්‍ය සේවයේ කටයුතු කරන අයට - වයස අවුරුදු 30 උපරිමයට යටත්ව තමයි විභාගයට වාඩි වීමට සිද්ධ වී තිබෙන්නේ. ඒක නිසා ගරු අමාත්‍යතුමනි, අපි කියන්නේ නැහැ අසීමාන්තික -

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake – Minister of Provincial Councils and Local Government)
මන්ත්‍රීතුමා, ඒ අයට සීමිත තරග විභාගයකුත් තිබෙනවා.

සුනිල් හඳුන්නෙත්ති මහතා
(திரு. சுனில் ஹன்துன்னெத்தி)
(Mr. Sunil Handunnetti)
විවෘත විභාගයට ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙන්න කියායි මේ ඉල්ලීම තිබෙන්නේ. මොකද, ඒ අයට අසීමාන්තික ඉඩකඩක් ලබා දෙන්න කියා නොවෙයි අපි ඉල්ලා සිටින්නේ. අපි ඉල්ලා සිටින්නේ මේ වයස් සීමාව ඒ අයට පුළුල් කරන්නය කියායි. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමේ විභාගයට පෙනී සිටීමේ වයස් සීමාව අවුරුදු 30ට සීමා නොකර තවදුරටත් පුළුල් කරන්න කියන එකයි. ගරු අමාත්‍යතුමනි, පරිපාලන සේවයේ බොහෝ පුරප්පාඩු තිබෙනවා. ඔබතුමා මේ සම්බන්ධයෙන් සලකා බලා, ඌන සේවා උපාධිධාරීන්ටත් ඒ විවෘත තරග විභාගයට පෙනී සිටීමේ අවස්ථාව ලබා දීම සඳහා ඉඩකඩ සලසා දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අමාත්‍යතුමා වෙනද සිදු වන අකරතැබ්බ අපට වෙන්න ඉඩ නොදී, කලින්ම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරන අමාත්‍යාංශයට අදළ ප්‍රගති වාර්තාව අපට ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වෙනවා. හැබැයි, එතුමාගේ ප්‍රගති වාර්තාවේ අඩංගු නොවුණු - එතුමාට යම් විධියකින් මඟ හැරුණා වෙන්න පුළුවන් කාරණා කිහිපයකුත් අපි ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලකයා කියන්නේ, එහෙම නැත්නම් පරිපාලන නිලධාරියා කියන්නේ, රාජ්‍ය සේවකයා කියන්නේ කවුද? රාජ්‍ය සේවකයා හැටියට අපි හඳුනා ගන්නේ රජයේ වත්කම්වල භාරකාරයයි. රටේ ජනතාවගේ, බදු ගෙවන ජනතාවගේ දේපොළවල, රාජ්‍ය දේපොළවල භාරකරු ඔහුයි. හැබැයි, රාජ්‍ය සේවකයා රජයේ දේපොලවල අයිතිකාරයා නොවෙයි. ඔහු භාරකරුවා පමණයි. ඒ නිසා ඔහු රටේ බදු ගෙවන ජනතාවට සෘජුවම වගකිව යුත්තෙක්. රජයේ දේපොල පරිහරණය කරන පුද්ගලයා හරියට සාංඝික දේපොල පරිහරණය කරන පුද්ගලයකු වගෙයි. සාංඝික දේපොලක් පරිහරණය කරන විට එය තමන්ගේ පෞද්ගලික අයිතියක් විධියට පරිහරණය කරන්න බැහැ. නමුත් දඅ සිද්ධ වී තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රාජ්‍ය දේපොල පරිහරණය කරන උදවිය ඒවායේ භාරකරුවන් හැටියට නොවෙයි ඒවා පරිහරණය කරන්නේ. සියලු දෙනාම නොවෙයි, බොහෝ තැන්වල සිද්ධ වී තිබෙන්නේ එහෙමයි. බොහෝ තැන්වල අයිතිකරුවන් බවට පත් වන්න උත්සාහ කිරීම සිද්ධ වෙනවා. රාජ්‍ය සේවකයා බදු ගෙවන ජනතාවට තමන්ගේ සේවය ලබා දෙන්න ඕනෑ. ජනතාවගේ දේපොල තමයි අපි මේ පරිහරණය කරන්නේ කියන හැඟීමෙන් නොවෙයි බොහෝ අවස්ථාවල කටයුතු කරන්නේ. ඉතිහාසයේදී රාජ්‍ය සේවය තුළ ඒ වගේ අක්‍රමිකතාවන් ගණනාවක්ම සිද්ධ වී තිබෙනවා. මම ඇමති ධුරය භාර ගත්තාට පස්සේ, මගේ පාලන කාලය තුළ නම්, ඒ වගේ දේවල් වන්න ඉඩ දෙන්නේ නැහැ කියා ගරු ඇමතිතුමා කියයි. නමුත් ගරු ඇමතිතුමනි 1994 සිට පොදු පෙරමුණේ පාලන කාලය තුළ සිද්ධ වුණු - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය තුළ සිද්ධ වුණු බරපතල අක්‍රමිකතාවන් ගණනාවක් තිබෙනවා.

විශේෂයෙන්ම රජයේ විගණකාධිපතිවරයා 1998 ජූලි මාසයේ 14වැනි ද රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාට එවූ රජයේ විගණක වාර්තාවේ තිබෙන එක කාරණයක් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. [බාධා කිරීමක්]

ගරු රිචර්ඩ් පතිරණ මහතා
*(மாண்புமிகு றிச்சட் பத்திரண)*
(The Hon. Richard Pathirana)
1998 ?

සුනිල් හඳුන්නෙත්ති මහතා
*(திரு. சுனில் ஹந்துன்னெத்தி)*
(Mr. Sunil Handunnetti)
ඔව්, 1998 ඒ වාර්තාව අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ඉතා අසාමාන්‍ය විධියට තමයි දුරකථන පාවිච්චි කර තිබෙන්නේ. ගාස්තු අසාමාන්‍යයි කියන ඡේදය යටතේ රජයේ විගණකාධිපතිවරයා මෙන්න මේ විධියට කියනවා.

'1996 වර්ෂය සඳහා ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා වෙනුවෙන් දරන ලද දුරකථන වියදම රු. 25,553ක් වූ අතර, ඊට සාපේක්ෂව ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් දරා ඇති වියදම විදේශ දුරකථන ගාස්තුව ඇතුළුව 26 ගුණයකින් වැඩිවීමක් පෙන්නුම් කෙරේ.'

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි හිටපු ගරු ඇමතිතුමා 1996 වර්ෂයේදී රු. 25,552.73ක ඇමතුම් ලබාගෙන දුරකථන පාවිච්චි කර තිබෙනවා. මෙම ගාස්තුව දුරකථන 3ක් සඳහායි. එනකොට නියෝජ්‍ය ඇමතිතුමා ලබා ගත් දුරකථන අමතුම්වල ගණන කොච්චරද ? රු. 637,000.38යි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විෂය භාර ඇමතිවරයාගේ [බාධා කිරීමක්] හිටපු නියෝජ්‍ය ඇමතිවරයා. ඒක තමයි මම කියන්නේ ඔබතුමා මේ සම්බන්ධයෙන් ගත් පියවරක් තිබෙන්න ඕනෑ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය තුළ මේ වගේ කටයුතු සිද්ධ වී තිබෙනවා. විෂය භාර ඇමතිවරයා රු. 25,000ක දුරකථන පරිහරණය කරන විට, නියෝජ්‍ය ඇමතිවරයා 6,37,000ක දුරකථන පරිහරණය කරනවා. නියෝජ්‍ය අමාත්‍යවරයාගේ විදේශීය දුරකථන බිල රුපියල්. 1,42,076.18 යි. ගරු අමාත්‍යතුමනි, මම අර කලින් කිව්වා වගේ මෙහෙම පරිහරණය කරන්නට හිතෙන්නේ වෙන මොකවත් නිසා නොවෙයි. රජයේ දේපොළ තමන්ගේ පෞද්ගලික දේපොළ කියා සිතන නිසයි. රාජ්‍ය පරිපාලකයෝ කියන්නේ රාජ්‍ය දේපොළවල අයිතිකාරයෝ කියලා තමන් හිතා ගත්තාට පස්සේයි. ඇත්තටම ඔවුන් ඒවායේ අයිතිකාරයෝ නොවෙයි. ඒවායේ භාරකරුවෝයි එහෙම නැතිනම් මේවා පරිහරණය කරන්නෝයි. මේවා රටේ බදු ගෙවන ජනතාවගේ දේවල් මේ රුපියල්. 6,37,000 නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික මුදල් නම් ප්‍රශ්නයක් නැහැ. මේ රුපියල්. 6,37,000 මේ රටේ දුක් විඳින, බදු ගෙවන ජනතාවගේ මුදල් ගරු අමාත්‍යතුමනි, මෙය ඔබතුමාගේ අවධානයට යොමු කළේ ඒකයි. මේ වගේ තත්ත්වයක් තිබෙනවා. මේ වගේ ඉතිහාසයක් තිබෙනවා. මතු දැන ගැනීම සඳහා මම මෙය සභාගත* කරනවා.

ගරු අමාත්‍යතුමනි, රජයේ විගණන වාර්තාවල පවා තිබෙන්නේ මෙන්න මේ වගේ ඉතිහාසයක් තමයි. ඒ නිසා ඔබතුමා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමනි, ඒ වගේම මම නව කාරණයක් ගැන කියන්නට කැමැතියි දැන් ඔබතුමා දේශපාලන පත්වීම් සම්බන්ධයෙන් කිව්වා. දේශපාලන පත්වීම් සම්බන්ධයෙන් මීට වඩා සැලකිලිමත් වෙනවාය කිව්වා. ගරු අමාත්‍යතුමනි, මම එක කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්නම්, අංක 15/90 චක්‍රලේඛය අනුව විභාගවලින් රාජ්‍ය පරිපාලන සේවයට බඳවා ගැනීම 1994 දක්වා කාල සීමාව තුළ ක්‍රියාත්මක වුණත් 1994න් පසුව එය නොසලකා හැර තිබෙනවා. විශේෂයෙන්ම සමෘද්ධි නියාමකයන්, ගොවි නියාමකයන්, වරායට බඳවා ගත් උදවිය, සමහර සංස්ථාවලට බඳවා ගත් උදවිය, ඒ දේශපාලන පත්වීම් ගණයට වැටී තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එක උදාහරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පානදුර ආසනයේ අංක 683/ඒ, වලපලපට්ටිය ශාඛා සමිතියේ සභාපතිතුමා සහ ලේකම්තුමා විසින් යවන ලද ලිපියක් මගේ අතේ තිබෙනවා. මේ ලිපිය යවා තිබෙන්නේ රෙජිනෝල්ඩ් කුරේ ප්‍රධාන අමාත්‍යවරයාටයි. එම ලිපියේ මෙසේ සඳහන් කර තිබෙනවා.

2000.11.27

ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා
ගරු ප්‍රධාන අමාත්‍ය,
බස්නාහිර පලාතේ පලාත් සභාව,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
කොළඹ,

නව ග්‍රාම නිලධාරී පත්වීම් ලබාදීම

උක්ත කරුණට අදලව අප ශාඛාව මහින් නම් කරන ලද නො: 17/05, ගල්ගොඩ පන්සල පාර, පානදුර, යන ලිපිනයේ පදිංචි එස්. ඒ. ප්‍රියන්ත සමරසිංහ යන අය එම පත්වීම බාර නොගත් බැවින් ඒ වෙනුවට නො : 11, ඩඩ්ලි සේනානායක මාවත පානදුර පදිංචි අයි. ඒ. නිහාල් යන අය අයදුම් පත්‍රයක්ද සහිතව මේ සමඟ යොමු කරනු ලබන අතර එය ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි

විශ්වාසිවූ

ගරු ලේකම් — ගරු සභාපති
එච්. ඒ. අනිල් — රජීව වීරමන්

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ශාඛාවේ සභාපති රජීව වීරමන් සහ ගරු ලේකම් එච්. ඒ. අනිල් යන අය මේ ලිපියට අත්සන් කර තිබෙනවා. ප්‍රධාන අමාත්‍යවරයාත් මේ ලිපියට අත්සන් කර තිබෙනවා. මෙම ඉල්ලීම ඉටු කරදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ප්‍රධාන අමාත්‍යවරයා හැටියට

*පුස්තකාලයේ තබා ඇත.
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුනිල් හඳුන්නෙත්ති මහතා]

රෙජිනෝල්ඩ් කුරේ අමාත්‍යතුමා අත්සන් කර තිබෙනවා. මේ ලිපිය 2000.11.27 දින දරන ලිපියක්. ගරු අමාත්‍යතුමා මේ සම්බන්ධයෙන් ගත් පියවර ගැන කියන්න මම දන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, නමුත් මේ වගේ කටයුතු සිද්ධ වෙලා තිබෙනවා. එදා ග්‍රාම නිලධාරීවරු [බාධා කිරීමක්]

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)
රෙජිනෝල්ඩ් කුරේ අමාත්‍යතුමා කාට යැවූ එකද ?

සුනිල් හඳුන්නෙත්ති මහතා
(திரு. சுனில் ஹந்துன்னெத்தி)
(Mr. Sunil Handunnetti)
රෙජිනෝල්ඩ් කුරේ අමාත්‍යතුමා මෙය අනුමත කර ප්‍රාදේශීය ලේකම්ට යවා තිබෙනවා.

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake – Minister of Provincial Councils and Local Government)
එතුමාට ග්‍රාම සේවා නිලධාරීන් පත් කරන්න බැහැ.

සුනිල් හඳුන්නෙත්ති මහතා
(திரு. சுனில் ஹந்துன்னெத்தி)
(Mr. Sunil Handunnetti)
නමුත් ඒක වෙලා තිබෙනවා.

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඒ වගේ ලියුම් ගනුදෙනුවක් වෙලා ඇති.

සුනිල් හඳුන්නෙත්ති මහතා
(திரு. சுனில் ஹந்துன்னெத்தி)
(Mr. Sunil Handunnetti)
දැන් ඔබතුමා මෙතැන කියයි, මේවා කරන්න බැහැයි කියා. නමුත් සිද්ධවෙලා තිබෙනවා.

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඒක බැහැ. සමෘද්ධි නිලධාරීනුත් බැහැ.

සුනිල් හඳුන්නෙත්ති මහතා
(திரு. சுனில் ஹந்துன்னெத்தி)
(Mr. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විධියට දේශපාලන පත්වීම් දීම නිසා අද ඒවා දේශපාලනීකරණය වෙලා, ස්ථිරසාර මුල් බැස ගත් ප්‍රතිපත්ති බවට පත් වෙලයි තියෙන්නේ. ඒ නිසා මේ රාජ්‍ය යන්ත්‍රණය තුළ සිදු වෙන ක්‍රියාදාමය ගැන අද ජනතාවට තිබෙන්නේ පැහැදිලි අදහසක් නොවෙයි.

ඒ වාගේම, අද රාජ්‍ය සේවකයෝ කොයි තරම් ස්වාධීනව, මොන තරම් ආදර්ශවත් විධියට කටයුතු කරනවාද කියන කාරණාව සම්බන්ධවත් අපි සැලකිලිමත් වන්න ඕනෑ. මම මේ කියන්නේ හැම දෙනා ගැනම නොවෙයි. බොහෝ දුෂ්කරතා විඳගෙන වුවද තමන්ගේ මෙහෙවර ඉෂ්ට කරන්න ඕනෑය කියා සලකන බොහෝ නිලධාරීන් අද රාජ්‍ය සේවයේ ඉන්නවා, විශාල පිරිසක් ඉන්නවා. නමුත් එහෙම හිටියා වුණත් අද දේශපාලනීකරණයට ලක් වන තැන් අනන්තයි; අප්‍රමාණයි. ඒ සඳහා හොඳ උදාහරණයක් තිබෙනවා. පසුගිය මහා මැතිවරණය ආසන්න කාල වකවානුවේ ජනාධිපතිතුමිය දිස්ත්‍රික් ලේකම්වරුන් හෝජන සංග්‍රහයකට ජනාධිපති නිල නිවාසයට කැඳෙව්වා. එහෙම අයිතියක් ජනාධිපතිතුමියට තිබෙනවා වන්න පුළුවන්. මොකද ? ජනාධිපතිතුමිය හැටියට, එතුමියට රජයේ නිලධාරීන් කැඳවන්න සහ ප්‍රශ්න සාකච්ඡා කරන්න අයිතියක් තිබෙනවා. නමුත් මැතිවරණයක් කට මුල තියෙද්දී දිස්ත්‍රික් ලේකම්වරුන් එහෙම කැඳවන එක සුදුසු නැහැ. මොකද ? මැතිවරණ ක්‍රියාදාමයක් තුළ තේරීම් භාර නිලධාරීන් බවට පත්වන්නේ දිස්ත්‍රික් ලේකම්වරුන්. ඒ නිසා එය දිස්ත්‍රික් ලේකම්වරුන්ට කළ අනිසි බලපෑමක්; මානසික බලපෑමක්. එය ඕනෑ විධියකට අර්ථකථනය කර ගන්න පුළුවන්. එහෙම සිද්ධ නොවනවාය කියා කාටද සහතිකයක් දෙන්න පුළුවන් ? එහෙම හෝජන සංග්‍රහයකට කැඳවලා, මේ හදිසියේ රටේ උද්ගත වී තිබෙන ප්‍රශ්නයක් සාකච්ඡා කරනවාද කියන කාරණය නොවෙයි ප්‍රශ්නය. එහෙම වන්නත් පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකයි මම මේ අවධානයට යොමු කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව එක කාරණාවක් තිබෙනවා. අවසාන වශයෙන් මම එය ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. බිබිලේ පරකඩුගල ග්‍රාම නිලධාරී ආර්. බී. නන්දසේන කියන මහත්මයා – මහත්මයෙක්ද කියා හිතා ගන්නත් බැහැ – 2001 පෙබරවාරි 23 වැනිද, දිසානායක මුදියන්සේලාගේ ප්‍රියන්ත සමන් කියන අවුරුදු 5ක් වයසැති දරුවකුට ඉතාම අමානුෂික ලෙස ඒ ගමේදී පහර දීමක් කර තිබෙනවා. මට මේ ලිපිය යොමු කර තිබෙන්නේ, බිබිල මානව හිමිකම් සංවිධානයෙනුයි. පිටකුඹුර පාර, බිබිල. ඒ සම්බන්ධව බිබිල පොලීසියේ පැමිණිලි කර තිබෙනවා. ගරු අමාත්‍යතුමාට ඕනෑ නම් ගරු විජයමුණි සොයිසා නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඒ ගැන අහගන්න පුළුවන්. ඒ ග්‍රාම නිලධාරියාගේ ඒ කටයුත්තට කිසි 'ඇක්ෂන්' එකක් නොගෙන – ක්‍රියා මාර්ගයක් නොගෙන – බේරා ගන්න එතුමා මැදිහත් වෙලා තිබෙනවා. එතුමා විස්තරය දන්නවා. මේ ග්‍රාම නිලධාරියා කිසිම ප්‍රශ්නයකින් තොරව සේවය කරනවා. මේ සම්බන්ධයෙන් මානව හිමිකම් සංවිධානයට යොමු කර තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්. මම එය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ ලියවිල්ලත් මම ඔබතුමාට දෙනවා. හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා එම ලියවිල්ල සභාගත* කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් මට යම් දෙයක් කියන්නට තිබෙනවා.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

සුනිල් හඳුන්නෙත්ති මහතා
(திரு. சுனில் ஹந்துன்னெத்தி)
(Mr. Sunil Handunnetti)
මට තව එක මිනිත්තුවක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
විනාඩියකටත් වැඩියෙන් වැඩිපුර කාලයක් දැනටම ඔබතුමා අරගෙන තිබෙනවා.

සුනිල් හඳුන්නෙත්ති මහතා
(திரு. சுனில் ஹந்துன்னெத்தி)
(Mr. Sunil Handunnetti)
මම අවසාන කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ මිනිත්තුව දෙන්න. මට මේ කාරණය අවධාරණය කරන්නට ඕනෑ. විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 15ක් තිබෙනවා. ප්‍රාදේශීය සභා සහ නගර සභා මේ ආයතන තුළ සිදුවන ක්‍රියාදාමය සම්බන්ධයෙන් රටේ අවධානය මීට වඩා යොමු වෙන්නට ඕනෑ. විශේෂයෙන්ම 2001 මාර්තු 29 වැනිද 'ලක්බිම' පුවත්පතේ මේ විධියට තිබෙනවා.

'කොළොන්නාව – මහරගම සභාපතිවරුන් ඉවතට'

*පුස්තකාලයේ තබා ඇත.
நூல்நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
*Placed in the Library.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒක හොඳ තත්ත්වයක්. මොකද, මහරගම ප්‍රාදේශීය සභාවේ උපසභාපතිවරයාගේ අත්තනෝමතික ක්‍රියා සහ අක්‍රමිකතා ක්‍රියා සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් බස්නාහිර පළාත් සභාවේ විශාල අරගලයක් කළා. කොළඹ දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්ගේ තත්ත්වය එක් තමයි. මම ගරු ඇමතිතුමාගේ අවධානය ඒ ගැන යොමු කරනවා. හෝමාගම ප්‍රාදේශීය සභාවේ සභාපති වුණත් බරපතල අක්‍රමිකතා හා දූෂණ ගණනාවක් ඇතිවයි කටයුතු කරන්නේ. ඒ ගැන ගරු ඇමතිතුමා සොයා බලනවා නම් ගරු ඇමතිතුමාට අපි ඕනෑම සහයෝගයක් දෙන්නම්. බුද්ධදාස මහත්මයා අද කඩුවෙල ප්‍රාදේශීය සභාව තනිකර බුදලයක් කරගෙන තිබෙනවා. ඒවා බදු ගෙවන ජනතාවගේ දේපළ දන් ඒක බුදලයක් කරගෙනයි ඔහු කටයුතු කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රාජ්‍ය සේවය තමන්ගේ පෞද්ගලික අයිතියක් කරගන්න එක නොවෙයි සිද්ධ වෙන්න ඕනෑ. එහෙම වුණොත් ගරු ඇමතිතුමනි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ තත්ත්වය තවත් ඉදිරියට වර්ධනය වෙනවා. මිසක් රාජ්‍ය සේවය ගොඩ ගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා වෙත අප ඉදිරිපත් කළ කරුණු සහ යෝජනා සැලකිල්ලට ගෙන විශේෂයෙන්ම රාජ්‍ය සේවයේත්, පරිපාලන සේවයේත් ඉහළ නිලධාරීන්ගේ වත්කම් බැරකම් අධීක්ෂණය කරන්න විශේෂයෙන් මැදිහත් වීමක් කරන්නය කියන කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරමින් මගේ කථාව අවසන් කරනවා. මට අමතර වෙලාවක් ලබාදීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

[පූ. භා. 11.13]

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**

*(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சர்)*

(The Hon. Nandimithra Ekanayake – Minister of Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයත්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයත් ඒකට ගෙන විවාද කරන මේ අවස්ථාවේදී කථා කරන්නට ලැබීම ගැන මේ ඉතාමත් සන්තෝෂ වෙනවා. මොකද, මම කලක් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ රාජ්‍ය නිලධාරියෙක් වශයෙන් සේවය කළා. පළාත් සභා ක්‍රමය ඇති වුණාට පසුව 1989 මහ මැතිවරණයට පෙර මාස ගණනාවක් පළාත් සභා යටතේත් සේවය කළා. එමෙන්ම මේ දෙක ගහයි පොත්තයි වගේ යන අමාත්‍යාංශ දෙකක්. පළාත් රාජ්‍ය සේවාව ගත්තොත් සමාන්තර සේවාවල ඉන්න නිලධාරීන් වැඩි හරියක් ඉන්නේ පළාත් සභා යටතේයි. ඒ වාගේම දීප ව්‍යාප්ත සේවාව ගත්තාම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ ඉන්න නිලධාරීනුයි ඉන්නේ වෙලාව පිළිබඳ ගැටලුවක් තිබෙන නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සකස් කළ කථාවක් කරන්නට බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීවරු කරන සියලුම චෝදනා සහ විමසීම් පිළිබඳව මේ විවාදය අවසානයේදී පිළිතුරු දීමට මම බලාපොරොත්තු වෙනවා.

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් බලය බෙදාහැරීමේ ප්‍රතිපත්ති රාමුව තුළ, ජාතික වශයෙන් ඉටුකරනු ලබන වැදගත් කාර්යභාරය තහවුරු කරමින්, මෙම වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡාවට මුල පිරීම සඳහා ලැබුණු මෙම අවස්ථාව මම බෙහෙවින් අගය කොට සලකනවා.

අපේ අමාත්‍යාංශයේ කාර්යභාරය ගත්තාම ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා විමධ්‍යගත සංවර්ධන පරිපාලනය මඟින් ඉටුකරනු ලබන සුවිශේෂ කාර්ය භාරය ඉතා මැනවින් හඳුනාගෙන තිබෙන අප රජය, පළාත් මට්ටමෙන් එම කටයුතු ඵලදායක ලෙස ඉටුකිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දී තිබෙනවා. ඒ අනුව පළාත් සභා යටතේ පාලනය වන මාර්ග වැඩිදියුණු කිරීම, වාරිමාර්ග සංවර්ධනය, කෘෂිකාර්මික සංවර්ධනය වැනි යටිතල පහසුකම් සැපයෙන අංශ රාශියක් පමණක් නොව අධ්‍යාපනය, සෞඛ්‍යය, සමාජ සුබසාධනය, සංස්කෘතික හා ආගමික කටයුතු යන සමාජ හා මානව ක්ෂේත්‍ර රාශියක් ද පළාත් සභා විසින් සුවිශාල කාර්යභාරයක් ඉටුකරන බව ප්‍රකාශ කරන්න ඕනෑ.

පළාත් මට්ටමෙන් මතුවන කාලීන අවශ්‍යතා පදනම් කරගත් ගැටලුවලට විසඳුම් සැපයෙන පරිදි ප්‍රමුඛත්වය ලැබිය යුතු අංශ තෝරාගනිමින් ඒවා වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්වලට ඇතුළත් කර සංවර්ධන ක්‍රියාදාමය ඵලදායක කරගැනීම සඳහා පළාත් සභා විශේෂ වගකීමකින් ක්‍රියාකරන බව අප කවුරුත් දන්නවා. එහිලා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ද අර්ථවත් කාර්යභාරයක් ඉටුකර තබෙනවා: දැනුත් ඉටු කරනවා. ඒ පිළිබඳ තොරතුරු ඇතුළත් සංක්ෂිප්ත වාර්තාවක් මම මෙම ගරු සභාව වෙත ලබාදෙනවා. අමාත්‍යාංශයේ ප්‍රගතිය ගැන කථා කරනවා නම් මගේ අමාත්‍යාංශය විසින් ඉටු කරන ලද කාර්යභාරය පිළිබඳව සහ අනාගත සැලසුම් පිළිබඳව ඉතා කෙටි විස්තරයක් ඉදිරිපත් කිරීමට මම මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා.

පළමුකොටම, මා මගේ අමාත්‍යාංශය දකින්නේ රේඛීය අමාත්‍යාංශයක් විධියට පමණක් නොවෙයි : මේ රටට අත්‍යාවශ්‍ය වූ විමධ්‍යගත පාලන ව්‍යුහයක් තුළ, ජාල සබඳතාවක් ගොඩනඟා ඇති අමාත්‍යාංශයක් ලෙසයි. එහිදී මගේ අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යභාරය වන්නේ සම්න්ධීකරණයයි. එය පළාත් සභා සහ රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණයක් වශයෙන් හඳුන්වන්න පුළුවන්.

මෙම සම්බන්ධීකරණයේ තවත් අංශයක් වන්නේ පළාත් පාලන ආයතන සමග ඇති සම්බන්ධීකරණයයි. එමෙන්ම විදේශාධාර ලබන බොහෝ සංවර්ධන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රය නියෝජනය කරමින් එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වන්නේ අපේ අමාත්‍යාංශයයි. මේ හැර පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සේවක මණ්ඩල වෙනුවෙන් ඉදිරිපත් කරන වෘත්තීයමය ගැටළු පිළිබඳ නියෝජනයන් සම්බන්ධයෙන් ඉටු කරනු ලබන සේවාව අපේ අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබනවා.

පළාත් සභා සඳහා අමාත්‍යාංශයෙන් ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන ගැන කථා කරනවා නම් මුදල් කොමිෂමේ නිර්දේශ අනුව පළාත් සභා වෙත ලබාදෙනු ලබන ප්‍රදාන මෙම අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදනය කරනු ලබනවා ඊට පළාත් සභාවල පුනරාවර්ථන වියදම් වෙනුවෙන් ලබාදෙන සාමූහික ප්‍රදාන මෙන්ම ප්‍රාග්ධන ආයෝජන වෙනුවෙන් ලබාදෙන උපමාන පාදක ප්‍රදාන, අනුරූපිත ප්‍රදාන හා පළාත් විශේෂිත සංවර්ධන ප්‍රධාන ඇතුළත්. දින කිහිපයකට පෙර තමුන්නාන්සේලා අතට පත් කළ ඒ කුඩා පොත් පිංචේ මේ සම්බන්ධයෙන් වැඩි විස්තර තිබෙනවා.

2001 අය වැය යටතේ සාමූහික ප්‍රදාන වෙනුවෙන් රුපියල් මිලියන 26,821ක් ද උපමාන පාදක ප්‍රදාන වෙනුවෙන් රුපියල් මිලියන 1000ක්ද අනුරූපිත ප්‍රදාන වෙනුවෙන් මිලියන 1000 ක් ද පළාත් විශේෂිත සංවර්ධන ප්‍රධාන වෙනුවෙන් මිලියන 7,023 ක් ද මෙම අමාත්‍යාංශයට වෙන්කර තිබෙනවා. මේ සමස්ත අයවැයෙන් මේ රජයෙන් වෙන් කළ මුදල්වලින් සියයට 9ක් වෙන් වී තිබෙන්නේ අපේ අමාත්‍යාංශයටයි. වෙනත් වචනවලින් කියනවා නම්. මේ අමාත්‍යාංශ අතරින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයත්, ආරක්ෂක අමාත්‍යාංශයත් හැරුණු කොට, වැඩිම මුදල් ප්‍රමාණයක් ලබා දී තිබෙන්නේ මේ අමාත්‍යාංශයටයි. පළාත් සේවාවන් සඳහා මේසා මුදල් සම්භාරයක් වෙන් කර දීම ගැන අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. යුද්ධය හා ආර්ථික දුෂ්කරතා ඉදිරියේ වුණත් පළාත් සේවාවන් සැපයීම සහ පළාත් සංවර්ධන කටයුතු සඳහා අපේ අමාත්‍යාංශය හරහා මේ සා විශාල මුදල් සම්භාරයක් අතිගරු ජනාධිපතිතුමිය 2001 අයවැයෙන් වෙන් කර තිබෙනවා. 1994 සිට ගත්තාම ක්‍රමික විකාශයක් පෙනෙන්නට තිබෙනවා. ඒ නිසා ඒ ගැන තමුන්නාන්සේලාගේ අවධානය අප යොමු කරන්නට ඕනෑ.

පළාත් පාලන ආයතන ශක්තිමත් කරගැනීම සඳහාත් පළාත් පාලන ආයතනවල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත්, අපේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශීය ණය හා සංවර්ධන අරමුදල යටතේ පළාත් පාලන ආයතන සඳහා

සාප්පු සංකීර්ණ ඉදි කිරීම, කුණු කසළ බැහැර කිරීමට අවශ්‍ය වාහන යන්ත්‍රෝපකරණ ලබා ගැනීම, ආදාහනාගාර ඉදි කිරීම, මහා මාර්ග ආදිය නඩත්තු කිරීමට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම, සතිපොළවල් ඉදි කිරීම වැනි කටයුතු සඳහා ඉතාමත් සහන පොලියකට – සියයට 6.5 සිට සියයට 10ක පොලියක් මත – ණය මුදල් ලබාදීමට මෙම ආයතනය මඟින් කටයුතු කරනවා.

මේ යටතේ මෙම වර්ෂයට රුපියල් මිලියන 100 ක් අපට වෙන් කර දී තිබෙනවා. විදේශ ආධාර ව්‍යාපෘති මේ රජය බලයට පැමිණියාට පසු. විදේශ ආධාර ව්‍යාපෘති රාශියක් පළාත් සභා මට්ටමෙන් අපේ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කිරීමට පියවර අරගෙන තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා]

(i) ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ ක්‍රියාත්මක වන දකුණු පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය US$ මිලියන 42.9ක් – රුපියල් මිලියන 3700 ක් – දී තිබෙනවා.

(ii) ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන අතුරු නැගෙනහිර වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සඳහා US$ මිලියන 32 ක් වෙන් වෙලා තිබෙනවා.

(iii) ජපන් රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ඌව පළාතේ වාරිමාර්ග ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහාත් රු. මිලියන 582 ක් වෙන් වෙලා තිබෙනවා.

(iv) ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා මහජන උපයෝගිතා අමාත්‍යාංශය හා මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය සඳහා US$ මිලියන 100ක් වෙන් වෙලා තිබෙනවා.

මීට අමතරව,

(i) ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ, දෙවෙනි පළාත් මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය තිබෙනවා ඒ සඳහා US$ 135ක් වෙන් කර දී තිබෙනවා.

(ii) උතුරු නැගෙනහිර කඩිනම් පුනරුත්ථාපන ව්‍යාපෘතිය ද නොබෝ කලකින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒකට US$ මිලියන 35ක් වෙන් කිරීමට නියමිතයි.

එසේම, මැද කඳුරට ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දනට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP ආයතනයේ) ආධාර යටතේ ශක්‍යතා අධ්‍යයන කටයුතු දත් කෙරීගෙන යනවා.

පළාත් පාලනය පිළිබඳව ඊළඟට අපට තිබෙන ඉතාම වැදගත් ආයතනයක් තමයි, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය.

පළාත් පාලනය සම්බන්ධයෙන් ද ඉතා පුළුල් මට්ටමේ කාර්යභාරයක් ඉටු කිරීමට මෙම අමාත්‍යාංශයට හැකිවී තිබෙනවා. ශ්‍රී ලංකාවේ පරිපාලන ව්‍යුහය තුළ ප්‍රධාන අඩුපාඩුවක් ලෙස පැවතුණු, ජාතික මට්ටමේ පළාත් පාලන පුහුණු හා පර්යේෂණ ආයතනයක් නොමැතිකමේ අඩුපාඩුව සම්පූර්ණ කරමින් අපේ ආණ්ඩුව බලයට පත් වෙලා 1999 දී මේ පළාත් පාලනය පිළිබඳ ජාතික ආයතනය පිහිටුවීමට කටයුතු කළා.

තවදුරටත් කථා කරනවා නම් පළාත් පාලන ආයතනවල කාර්යක්ෂමතාව දියුණු කිරීමේ අරමුණින් පළාත් සභාවල සහාය ඇතිව 1999 දී දීප ව්‍යාප්ත පළාත් පාලන කළමනාකරණ තරගයක් පවත්වා එම ආයතන උනන්දු කරවන ලද අතර, 2001 දී ස්වර්ණ පුරවර සම්මාන උළෙල පවත්වා ජයග්‍රාහී මහ නගර සභා, නගර සභා සහ ප්‍රදේශීය සභා සඳහා මුදල් සහ සහතික ලබාදීමේ කටයුත්ත කළා.

පළාත් පාලනය පිළිබඳ ජනාධිපති ප්‍රතිසංස්කරන කොමිසන් සභා වාර්තාව ක්‍රියාත්මක කිරීම. මෙය අද මේ රටේ මහත් විවාදයට තුඩුදුන් මුළු මහත් දේශපාලන ක්ෂේත්‍රයේ යෙදී සිටින සියලුම දේශපාලන පක්ෂවල අවධානයටත් මේ රටේ බුද්ධිමතුන්ගේ අවධානයටත් යොමු වූ කාරණයක් බව මා සඳහන් කරන්න ඕනෑ. පළාත් පාලන ක්ෂේත්‍රයේ දියුණුව සඳහා ඇති කළ යුතු ප්‍රතිසංස්කරණ ගැන කරුණු සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමිය විසින් පත් කලේ 1998දීයි. එහි වාර්තාව එළි දක්වූයේ 1999 දී අමාත්‍ය මණ්ඩලය විසින් එම යෝජනා සලකා බලා,

(i) ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ පිළිබඳව තවදුරටත් විමසා බලා කටයුතු කිරීම සඳහා 'අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක්' පත් කළා.

(ii) නීති ප්‍රතිසංස්කරණය පිළිබඳව තිබෙන නිර්දේශයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම සඳහා 'නෛතික ප්‍රතිසංස්කරණ කමිටුවක්' පත් කළා.

(iii) කෙටි කාලයක් තුළදී ක්‍රියාත්මක කළ හැකි කමිටු නිර්දේශ සම්බන්ධයෙන් තව දුරටත් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා 'අනිකුත් ප්‍රතිසංස්කරණ කමිටුවක්' පිහිටුවීමට නිර්දේශ කර තිබෙනවා.

(iv) කොමිෂන් සභා වාර්තාවේ සඳහන් මානව සම්පත් සංවර්ධන කටයුතු වහාම ක්‍රියාත්මක කිරීම සඳහා 'පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය' වෙත පවරා දී තිබෙනවා.

මේ සඳහා පත් කරන ලද අමාත්‍ය මණ්ඩල අනුකමිටුව මීට අදාළ නිර්දේශ සලකා බලා, තම වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, එහිලා විශේෂයෙන් 'මැතිවරණ ක්‍රමය' සම්බන්ධයෙන් නිර්දේශිත කොට්ඨාස ක්‍රමය යළි ඇති කිරීම සම්බන්ධ වූ නිර්දේශය ප්‍රතිපත්තිය පිළිබඳව පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවලට ඒ පිළිබඳව අදහස් දක්වීමේ අවස්ථාවක් සලසා දීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් යෝජනා කර අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. මෙයින් අපට භූගාක් දුරට ලැබුණු තොරතුරු අනුව අපි ලිඛිතව දේශපාලන පක්ෂ විමසීමේදී විශේෂයෙන් මේ රටේ සිටින කුඩා පක්ෂ බියක් පළ කළා, යළිත් කොට්ඨාස ක්‍රමයට ගියොත් සුළු ජාතීන්ට සහ කුඩා පක්ෂවලට අසාධාරණයක් වේවිය කියා. එම නිසා ඇමති අනුකාරක සභාව තුළ අදහස් දෙකක් ඇතුළත් කර ගත්තා. කැබිනට් අනුකාරක සභාවේ, කැබිනට් එකේ ඉන්න සුළු පක්ෂ නියෝජනය තිබෙන නිසා මේ යෝජිත කොට්ඨාස ක්‍රමය වාගේම සමානුපාතික ක්‍රමය කියන දෙකේම සම්මිශ්‍රණයක් සුදුසුය කියා තමයි කැබිනට් අනුකාරක සභාව නිර්දේශ කර තිබෙන්නේ.

අවසාන වශයෙන් මා විසින් මෙම ගරු සභාව වෙත සඳහන් කිරීමට බලාපොරොත්තු වන්නේ විමධ්‍යගත පරිපාලනය ශක්තිමත් කරමින් පළාත් සභා සඳහා අවශ්‍ය වූ සියලුම අත්දමේ සේවාවන් සැපයීමට මගේ අමාත්‍යාංශය ඇපකැප වී සිටින බවයි. අමාත්‍යාංශයේ එම අධිෂ්ඨානය පසුපස ඇත්තේ අතිගරු ජනාධිපතිතුමිය ඇතුළු අප රජය විසින් අනුගමනය කරනු ලබන සංවර්ධන උපාය මාර්ග පිළිබඳව ඇති විශ්වාසයයි. බලය බෙදාහැරීම හා පරිපාලනය විමධ්‍යගත කිරීම වර්තමාන ජාතික සංවර්ධනයේ උපාය මාර්ගයක් බව විශ්වාස කරනවා. අප රජය, ඒ සඳහා බිහිකර ඇති පළාත් සභා ව්‍යුහයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීමට කැපවී ඇති බව සතුටින් සඳහන් කරන්න ඕනෑ.

මෙහි ලා මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්ටත් ආයතනවල ප්‍රධානීන්ටත් අමාත්‍යාංශයේ ඉහළම නිලධාරියාගේ සිට කුඩාම කාර්යාල කාර්ය සහායකයා වෙනුවෙනුත් මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ වාගේම පළාත් සභාවල මහා අමාත්‍යවරු, අමාත්‍යවරු, ඒ වාගේම පළාත් ආණ්ඩුකාරවරු මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ ලේකම්වරු යන සියලු දෙනාගෙන්ම අපට මේ අමාත්‍යාංශය පවත්වා ගෙන යාමට ලැබෙන සහාය අති විශිෂ්ටයි. ඒ නිසා. ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම අප අමාත්‍යාංශය හා එකට බැඳී යන අමාත්‍යාංශයක් වන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් ජුනයිඩ් මහතා ඇතුළු, අතිරේක ලේකම්වරුන්, පළාත් දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම් වරුන්. යම් යම් කාරණාවලදී අපට සහාය වෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගත්තොත්, සමාන්තර සේවාවේ වැඩි හරියක් ඉන්නේ පළාත් රාජ්‍ය සේවයට අයත් නිලධාරීන්. එම නිසා ගැටුම් රහිතව අපේ අමාත්‍යාංශවල කටයුතු කර ගෙන යාමට ඒ අයගෙන් ලැබෙන සහයෝගය පිළිබඳව මගේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව මෙතැනින් නවතා, ඉතිරි වෙලාව පිළිතුරු කථාව සඳහා යොද ගැනීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටිමින්, මට කථා කරන්නට කාලය ලබා දීම ගැන නැවත වරක් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ.භා. 11.28]

**අමරා පියසීලි රත්නායක මහත්මිය**

*(திருமதி அமரா பியசீலி ரத்நாயக்க)*

(Mrs. Amara Piyaseeli Ratnayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන. ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ සාකච්ඡා කරන මේ අවස්ථාවේදී ඉතාමත් වැදගත් අමාත්‍යාංශ දෙකක් හැටියට මටත් අදහස් ප්‍රකාශ කරන්නට ඉඩ ලබා දීම පිළිබඳව මම සතුටු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යතුමා, ඉදිරියේදී කරන්නට සූදනම් වන කර්තව්‍යයන් පිළිදව විස්තරයක් කළා. ඇත්තෙන්ම එම සේවාවන් ජනතාවට, රටට ලබා දෙන්නට අදළ සියලු දෙනාම මහන්සි වෙනවා නම්, ඉතාම වැදගත් වෙනවාය කියා මම හිතනවා. ඒ වාගේ හොඳ සේවාවන් කිහිපයක් එතුමා ඉදිරිපත්කළා. ඒ සමගම මම එතුමාට තවත් යෝජනාවක් කරන්නට බලාපොරොත්තු වෙනවා. ආයතන සංග්‍රහයේ 32 වන පරිච්ඡේදයේ 1 වෙනි වගන්තිය අනුව මාණ්ඩලික ශ්‍රේණිවල සහ අධීක්ෂණ ශ්‍රේණිවල සහ අධීක්ෂණ ශ්‍රේණිවල රාජ්‍ය නිලධාරීන්ට ඡන්දය ප්‍රාචිච්චි කිරීම හැර වෙනත් කිසිදු ක්‍රියාකාරී දේශපාලන කටයුත්තක යෙදීම නීතියෙන් තහනම් වන අතර. එසේ කළහොත් ඔවුන් සේවයෙන් පහ කළ හැකියි. නමුත් 1997 පළාත් පාලන මැතිවරණයට මෙවැනි නිලධාරීන් විශාල පිරිසක් ඉදිරිපත්ව ජයග්‍රහණය කර, අදත් පළාත් පාලන සේවයේත්, රැකියාවේත් දෙකේම නියුක්ත වෙලා ඉන්නවාය කියා අපට දන ගන්නට ලැබී තිබෙනවා. ආයතන සංග්‍රහයට අනුව ගරු ඇමතිතුමා ඒ පිළිව තීරණයක් ගත්තොත් ඉතාමත් වැදගත් වන බවත් මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සමගම තවත් කරුණක් මම සඳහන් කරන්නට ඕනෑ. මට ලැබී තිබෙන කාලය අඩුයි. විශාම වැටුප් ක්‍රමය ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. විශ්‍රාම වැටුප් ලබාදීමේ ක්‍රමය වුණේ වැටුප සහ සේවා කාලය පදනම් කරගෙන යම්කිසි ප්‍රතිශතයකට විශ්‍රාම වැටුප සකස් කිරීමයි. එහිදී අවුරුදු 30ක සේවා කාලයකට සියයට 90ක විශ්‍රාම වැටුපක් නොලැබෙන නිසා 1991 ජනවාරි 1 වැනිද සිට අංක 44/90 දරන චක්‍රලේඛය ක්‍රියාත්මක වුණා. ඒ අනුව මාස 24ක විශාම පාරිතෝෂිකයක් සමග විශ්‍රාම වැටුපක් ලබා දුන්නා. එමගින් අවුරුදු 10-15 වගේ කායක් සේවය කළත්, සාධාරණය ඉටුවන ලෙසට විශාම වැටුප් ක්‍රමය සංශෝධනය කර තිබුණා. ඇත්තටම අද ඒක ආන්දෝලනයට ලක් වී තිබෙන කාරණයක්. අද ඒ ක්‍රමය වෙනස් කර තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරමින් නැවතත් අංක 44/90 චක්‍රලේඛයට අනුව විශ්‍රාම වැටුප් ක්‍රමය සකස් කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සමගම රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම ගැනත් අප කථා කළ යුතුව තිබෙනවා. වරින් වර දීමනා එකතු කළ බව අප පිළිගන්නවා. ඒක ඇත්ත. එහෙත් අපේ ඉල්ලීම තිබෙන්නේ රු. 2,000කින් රජයේ සේවකයන්ගේ වැටුංප් වැඩි කරන්නය කියන එකයි. රු. 2,000කින් වැටුප් වැඩි කරන්නය කියා ඉල්ලුවා වුණත් අද බඩු මිල රජයේ සේවකයන්ට දරා ගන්න බැරි තත්ත්වයකට පත් වී තිබෙනවා. ඇත්තටම රජයේ සේවකයකු වුණාම ඔහුගේ තත්ත්වයට අනුව, තනතුරට අනුව ජීවත් වන්නට සිදුවී තිබෙනවා.. ඒ නිසා රජයේ සේවකයාගේ ගෞරවය ආරක්ෂා කළ යුතුව තිබෙනවා. එම නිසා වැටුප රු. 2,000 කින් වැඩි කර, තවත් දීමනාවක් හැටියට රු. 1,000ක්වත් දීමට අවධානය යොමු කළොත් ඉතාමත් වැදගත් වන බව මම මතක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රජයේ සේවකයන්ට උසස්වීම් ලබා දීමේදී දක්ෂතාවත්, කැපවීමත් පදනම් කර ගෙන උසස්වීම් ලබා දෙන්නය කියා ඉල්ලා සිටිනවා. අයවැය ලේඛනය දෙවන වර කියැවීමේදී රජයේ සේවකයන් සඳහා රක්ෂණ ක්‍රම, නිවාස යෝජනා ක්‍රම, දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ක්‍රම වගේ දේවල් ඇති කරන්නට ගරු ඇමතිතුමා යෝජනා කර තිබෙනවා. ඇත්තෙන්ම අපි ඒවා අගය කරනවා. ඒවගේම අද හුඟාක් නිළධාරීන් පූල් එකේ ඉන්නවා. ඒ අයගෙන් සේවයක් ලබා ගන්නවාය කියා ගරු ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා මම පුවත්පතක දක්කා. එක පැත්තකින් බැලුවොත් ඇත්තෙන්ම ඒක රජයේ මුදල් නාස්තියක් තව පැත්තකින් බැලුවොත් දක්ෂ නිලධාරීන් සංචිතයෙන් ඉන්නවා. මම නිදර්ශනයකුත් පෙන්වන්නම්. ගරු අමාත්‍යතුමා සඳහන් කළා. ඩික්සන් නිලවීර ලේකම්තුමා පිළිබඳව. එතුමා එද පූල් එකේ හිටපු නිළධාරියෙක්. ඒ කියන්නේ සංචිතයේ හිටපු නිලධාරියෙක්: අපි ඒ සම්බන්ධයෙන් කථා කළා. ගරු අමාත්‍යතුමා අද සඳහන් කළා ඩික්සන් නිලවීර මැතිතුමාගෙන් උපදෙස් ලබා ගන්නා බව. ඒවාගේ දක්ෂ නිලධාරීන් මේ විධියට සංචිතයට අනුයුක්ත කරන්න එපා. මොකද, හැකියාවක්, පළපුරුද්දක් තිබෙන නිළධාරීන්ගෙන් අපි ඒ සේවය ලබා ගත යුතුව තිබෙනවා.

ඊළඟට , විමධ්‍යගත කිරීම ගැනත් මම කථා කරන්නට ඕනෑ. කොළඹ කාර්යාලවලින් කෙරෙන්නට තිබෙන වැඩ කටයුතු හුඟාක් දුරට ප්‍රාදේශීය මහලේකම් කාර්යාලවලට ලබා දීම පිළිබඳව ලොකු පිබිදීමක් තිබුණා. ඇත්තෙන්ම අදත් ඒ කටයුත්ත ක්‍රියාත්මක වෙනවා. විමධ්‍යගත කරන ලද විෂයයන් ඒ විධියට ක්‍රියාත්මක වන එක ඇත්ත. නමුත් දනට මෝටර් රථ පැදවීමේ බලපත්‍ර ලබා දීමේදී 'ට්‍රයල් බැලීම', ඒ කියන්නේ රථය පැදවීම පිළිබඳව දක්ෂතාවය බැලීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නැවත වරක් ඉහළට අරගෙන තිබෙනවා. එය ආපසු තිබුණු විධියටම විමධ්‍යගතව තිබෙන්නට කටයුතු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශාම වැටුප් ගෙවීමේ අංශය විමධ්‍යගත කරන ලද විෂයයක්. විශාම වැටුප් අද ගෙවන්නේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලවලිනුයි.

ඒක සත්‍යයක්. නමුත් පාරිතෝෂිකයත්, විශ්‍රාම වැටුප් ගෙවීමේදී ලබා දෙන විශ්‍රාම වැටුප් අංකයත් ලැබෙන තුරු, ඒ කාරණා දෙකම සඳහා අදළ ලියකියවිලි කොළඹ ප්‍රධාන කාර්යාලයට එවන්නට සිද්ධ වී තිබෙනවා. ඒ සඳහා මාස හයක් පමණ ගත වෙනවා. ගරු අමාත්‍යතුමාගේ කථාවෙන් කියැවුණා. එය මාසයකින් ලබා දෙනවාය කියන එක. එහෙම නම් හොඳයි. කෙසේ නමුත් ඇති වන ප්‍රමාදය වැළැක්වීමට නැවත වරක් ඒවා විමධ්‍යගත කර, විගණනය පමණක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට, ප්‍රධාන කාර්යාලයට තබා ගත්තොත් හුඟාක් දුරට කාර්යක්ෂම සේවාවක් ඉටු වේවිය කියා මා විශ්වාස කරනවා.

ඊළඟට ග්‍රාම නිලධාරීන් පිළිබඳව අපි කථා කළ යුතුයි. ග්‍රාම නිලධාරියාය කියන්නේ ජනතාවත් රජයත් සම්බන්ධ කරන නිලධාරියායි. මේ ග්‍රාම නිලධාරීන්ට පළමුවැනි ශ්‍රේණියට උසස්වීම් ලබා දීමේදී අවුරුදු 10ක සේවා කාලයකින් පසුව විභාගයක් පවත්වා උසස්වීම් ලබා දෙනවා. ලිපිකරු සේවය, ඒ වාගේම ග්‍රාම නිලධාරි සේවයට සමාන්තර සේවාවල නිලධාරීන් වසර 15ක සේවයෙන් පසුව විභාගයක් නොපවත්වාම පළමුවැනි ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. මම හිතන්නේ ඒ වරප්‍රසාදය ග්‍රාම නිලධාරීන්ටත් ලබා දෙන ලෙස ඔවුන්ගේ වෘත්තීය සමිති දෙකෙන්ම ඉල්ලීමක් කර තිබෙනවා. එම නිසා ඒ පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වෙනවා. මොකද, අනෙකුත් නිලධාරීන්ට ලබා දෙන වරප්‍රසාදය ග්‍රාම නිලධාරීන්ටත් ලබා දිය යුතුයි.

ඒ වගේම, අද හුඟාක් දුරට අපට දකින්නට තිබෙන කාරණයක් තිබෙනවා. සජිත් ප්‍රේමදාස ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කළා. සමහර නිලධාරීන් ඉන්නේ මධ්‍යම රජය යටතේයි. නමුත් ඒ අයගේ මාරුවීම් වගේ දේවල් පළාත් සභාවට ඕනෑ විධියට ක්‍රියාත්මක වී තිබෙනවා. ඊට හේතු වශයෙන් හුඟාක් දුරට පෙනී යන්නේ දේශපාලන සම්බන්ධකම් මත මාරුවීම් කර තිබීමයි. මේ නිසා හුඟාක් ග්‍රාම නිලධාරීන් අසීරු තත්ත්වයකට පත් වී තිබෙනවා. මම හිතන්නේ ග්‍රාම නිලධාරීන් තමන්ගේ කොට්ඨාසයේම සේවය කරනවා නම් විශාල සේවයක් ජනතාවට ලබා දෙන්න පුළුවන් කියලයි. ඉස්සර ආරච්චි මහත්වරු කියා කොටසක් සිටියා. ග්‍රාම නිලධාරියාට තමන්ගේ කොට්ඨාසයේ, එහෙම නැත්නම් යාව කොට්ඨාසයක සේවය කරන්න ලැබෙනවා නම් හොඳයි. එහෙම නැතිව සතියකට දවස් තුනක් කාර්යාලයේ ඉන්නැයි කිවවාට, මම හිතන්නේ ඔවුන්ගෙන් හොඳ සේවයක් ජනතාවට ලබා ගන්න පුළුවන් වන්නේ නැහැ. ජනතාවගේ පැත්තෙන් බැලුවොත් ග්‍රාම සේවා නිලධාරීන් දේශපාලන හේතූන් මත වෙනත් ප්‍රදේශවලට මාරු කිරීම සුදුසු නොවන බව අපි මතක් කළ යුතුයි. මොකද, තමාගේ කොට්ඨාසයේ සේවය කරනවා නම් පැය 24ම වුණත් ඔවුන්ගේ සේවය ලබා ගන්න පුළුවන්. එතකොට ඔහු සමාජයත් එක්ක එකට ගැටෙනවා. මරණයේදී, මඟුලේදී, උත්සවයකදී ආදී සෑම අවස්ථාවකදීම, ඒ වාගේම හදිසි අවස්ථාවලදීත් ක්‍රියා කළ යුතු පිරිසක් තමයි ග්‍රාම සේවා නිලධාරීන් කියන්නේ. තම ප්‍රදේශයේම සේවය කරනවා නම් මම හිතන්නේ ඒ අයට සතුටකින් තම සේවය කරන්නටත් පුළුවන් වෙනවා.

වයස අවුරුදු 55න් පසුව සේවය දීර්ඝ කිරීමේදී, හුඟාක් දුරට අවුරුදු 58න් පසුව සේවය දීර්ඝ කිරීමට [බාධා කිරීමක්] ඒක වෙනස් වෙනවාද? එහෙම නම් කමක් නැහැ. අනෙකුත් රජයේ සේවකයන්ට වාගේ වයස අවුරුදු 60 දක්වා සේවය දීර්ඝ කරන්නට අවස්ථාව ලබා දීම හුඟාක් වැදගත් වෙනවා.

ඒ වගේම, උපකරණ ප්‍රශ්නය ගැන අමාත්‍යතුමා සඳහන් කළා. උපකරණ සඳහා කාර්යාල දීමනා වැඩි කරනවාය කිව්වා. කොහොම වුණත් මීට පෙර මට මතකයි, ග්‍රාම නිලධාරි උපකරණ සැපයුවා. වසර පහෙන් පහට වෙන් කර ගෙන ඒවාට අලුත් උපකරණ ලබා දුන්නා. නමුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරා පියසීලි රත්නායක මහත්මිය]

අද අලුත් නිලධාරින්ට සිද්ධ වී තිබෙනවා, නිවෙස්වලින් උපකරණ ගෙනැවිත් ඒ සේවය කරන්නට. ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. මේක මම මෙතුමාට මීට ඉස්සරවෙලත් යොමු කළ ප්‍රශ්නයක්. මොකද? විධිමත් සේවයක් බලාපොරොත්තුවෙන් අප 1991දී කටුපොත සහ මාස්පොත ලේකම් කාර්යාල දෙකක් පිහිටවූවා. කුරුණෑගල, පඬුවස්නුවර, වාරියපොළ යන මැතිවරණ කොට්ඨාසවල ජනතාවට ඒ තුළින් වැඩි සේවයක් ඉෂ්ට කරන්න පුළුවන් වුණා. නමුත් අද වාරියපොළ ඉඳලා හැතැප්ම තුනක් තිබෙන බමුණාකොටුවේ පොහොර ගබඩාවකට මේ මාස්පොත ලේකම් කාර්යාලයෙන් ග්‍රාම සේවය කොට්ඨාස කිහිපයකුත්, කටුපොත මහ ලේකම් කාර්යාලයෙන් ග්‍රාමසේවක කොට්ඨාස කිහිපයකුත් ඇතුළත් කර තිබෙන නිසා ඒක නිකම් අර සංචාරක ලේකම් කාර්යාලයක් වාගේ තමයි අපට පෙනෙන්නේ. නියම නිලධාරියකුත් එතැන නැහැ. ඒ වාගේ තත්ත්වයක් තමයි එතැන තිබෙන්නේ. එම නිසා ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා. අද ජනතාව විහිළුවට පත් වී තිබෙනවා. මේ තුළින් –

ගරු රිචර්ඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

කටුපොත වහලද? කටුපොත කාර්යාලය වහන්නත් එපා, වෙනස් කරන්නත් එපා කියා මම අමාත්‍යාංශයට දන්වා තිබෙනවා.

අමරා පියසීලි රත්නායක මහත්මිය
(திருமதி அமரா பியசீலி ரத்நாயக்க)
(Mrs. Amara Piyaseeli Ratnayake)

නැහැ. වැහුවේ නැතිවාට එතැනට මාස්පොතිනුත් කැල්ලක් ගෙන ගිහින්. ජනතාව බමුණාකොටුව කියන තැනට හැතැප්ම 11ක් විතර දුර එන්න ඕනෑ. ඕනෑ නම් තමුන්නාන්සේට මම ඇඳලා පෙන්වන්නම්. ඒත් එක්කම මම හිතනවා –[බාධා කිරීමක්]

පළාත් සභාව පිළිබඳවත් පොඩ්ඩක් කථා කරන්න සිදු වෙනවා. මොකද? වයඹ පළාත් සභාවේ දූෂණ සොයා බලා කටයුතු කර නැහැ. වයඹ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවරයා පළාත් සභා අරමුදල් අයථා ලෙස පරිහරණය කර තිබෙනවා. 2001 වර්ෂයේ වැය කරන ලද මුදල රුපියල් දස ලක්ෂ 626යි. වාහන සඳහා රුපියල් දස ලක්ෂ 114යි. සංවර්ධන වැය සඳහා රුපියල් දස ලක්ෂ 1419යි. මේ අනුව පළාත් සභාවට වෙන් කර ඇති මුළු මුදලින් සංවර්ධනය සඳහා වැය කරනු ලබන්නේ සියයට 23.6ක් පමණි. මෙම මුදලින්ද දැනටමත් සියයට 50ක් පමණ කපා හැර ඇති බැවින් සංවර්ධනය සඳහා වයඹ පළාත් සභාවට වැය කළ හැකි වන්නේ සියයට 12ක් පමණි.

දීර්ඝ කාලයක් කාර්යක්ෂමව පාලනය කළ ඒ නිලධාරීන් මාරු කිරීම නිසා ප්‍රඥප්ති මඟින් පිහිටු වූ ඒ අධිකාරි හුහක් දුරට පිරිහී තිබෙනවා. මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය යන්ත්‍රෝපකරණ අධිකාරිය වාගේ ආයතන අද පිරිහීමට පත් වී තිබෙනවා. පළපුරුදු නිලධාරීන්, ප්‍රධාන ලේකම්තුමා යන අය සංචිතයට යවා තිබෙනවා. එපමණක් නොව, අතික් නිලධාරීන් මාරු කර පළපුරුද්දක් සහ පුහුණුවක්, අධ්‍යාපනයක් නැති අයට සභාපති වාගේ තනතුරු ලබා දීම නිසා පිරිහීමක් ඇති වී තිබෙන බව කනගාටුවෙන් මතක් කරනවා. මම හිතන විධියට ගරු අමාත්‍යතුමා අවධාරණයෙන් යුතුව ක්‍රියා කරන නිසා ඒවාට හොඳ පිළියම් යොදවන්නට පුළුවන් වෙයි කියමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ. භා. 11.41]

ඒ. රිස්වි සින්නලෙබ්බේ මහතා
(ஜனாப் ஏ. றிஸ்வி சின்னலெப்பே)
(Mr. A. Rizvi Sinnalebbe)

Mr. Deputy Chairman, today we are discussing the Votes of two very important Ministries, namely, the Ministry of Public Administration, Home Affairs and Administrative Reforms, and the Ministry of Provincial Councils and Local Government. Sir, the time allocated for these two important Ministries is not sufficient to give our proposals and make our comments. Any way we must thank Her Excellency the President for appointing an amiable and a very efficient Minister the Hon. Dr. Richard Pathirana as the Minister of Public Administration and Home Affairs, and also for ading the new subject of Administrative Reforms, which is a vital subject. The Hon. Richard Pathirana is a person who has done so much for the upliftment of the teachers and in the educational sphere of this country when he was the Minister of Education. Also, Sir, on the Floor of this House, we saw his commitment to this House and how non-communal he is. The amiable Hon. Minister also commended his Secretary, Mr. Junaid, a senior civil servant, who has been named by Her Excellency the President as Secretary of this Ministry. We wish to comment that we have the fullest confidence that the entire administrative set-up in this country will be reformed and an efficient service will be rendered to this country.

Since my time is limited I would refer to certain things which are very important as far as the present situation is concerned. Sir, we know that the Divisional Secretariat which come under the Ministry of Home Affairs perform a very important function. We must congratulate and thank our Hon. Prime Minister for appointing the Panambalana commission when he was the Minister of this Ministry. On representations made to the Commission, eight new divisional secretariats were approved in the year 1999. Under the present Minister, about eight new Divisional Secretariats were created on the approval of the Cabinet. Out of this, two Divisional Secretariats were established in Sainthamarudu and Navithanveli in the Ampara District at the request of the Ceylon Muslim Congress and the National Unity Alliance spearheaded by the late leader, Hon. M. H. M. Asharff. These were ceremoniously opened. The Sainthamarudu Divisional Secretariat was opened specially on 4th February, Independence Day. Lot of new thinking has got to be done when new Divisional Secretariats are created. The infrastructure, equipment, staff, et cetera has to be provided to these new Divisional Secretariates. I see that the Hon. Minister has taken necessary steps to provide these two new Divisional Secretariats with all the facilities that are needed to function smoothly. Sir, the Hon. Minister has approved two new buildings for these two Divisional Secretariats for the year 2001. We must be thankful to him. Construction work has already commenced. Foundation laying is started. Sir, the Government should not debar the construction of these two Divisional Secretariats. Construction work of the Sainthamaruthu Divisional Secretariat building also has commenced and some money also has been spent on that. So I urge the Hon. Minister to continue this work.

Sir, my Friend Mr. Mashoor Noordeen representing the Wanni District says that the people of Puttalam are facing a lot of problems. About 80,000 people who had been displaced from the Northern Province have been living in Puttalam for the past 10 to 12 years as refugees. These people have to be given an additional divisional secretary's office at least for them to get their work done. They cannot go back to their former places and they are being treated as strangers in the Puttalam District. We have asked the Governor of the North-East Province to look into this matter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

My Friend, hon. Thowfeek, representing Kinniya says that they too are facing problems in Trincomalee. They are having problems in the Divisional Secretariat in Kinniya. They are having problems in Kurinchakerny, Pulmoodai and Thoppur also.

Then Sir, coming back to the North-East Provincial Council.–

නියෝජ්‍ය සභාපතිතුමා
*(பிரதித் தவிசாளர் அவர்கள்)*
(The Deputy Chairman)

Hon. Member, could you please wind up ?

ඒ. රිස්වි සින්නලෙබ්බේ මහතා
*(ஜனாப் ஏ. றிஸ்வி சின்னலெப்பே)*
(Mr. A. Rizvi Sinnalebbe)

Please may I have two mere minute ? I am on a very important subject. I am speaking on the North-East Province. Sir, the Minister of Provincial Council, the Hon. Nandimithra Ekanayake is an able and experienced person and the Governor of the North-East Province Major-General Asoka Jayawardene is also doing a very efficienct job and we are very much thankful for the projects that had been implemented in the North East, especially the North-East irrigation project which we are doing at a cost of US$ 32.4 billion and also the North-East Rehabilitaiton Project which is costing us US$ 35 billion under the ADB scheme. This is the first time a Governor is heading a project. I am sure he will do an efficient job in this sphere.

And finally, winding up my speech, I must tell the Hon. Minister of Public Administration and the Governor of the North-East Province that there are five Ministries in the North-East Province Provincial Council and the ethnic imbalance of the employees in these offices has to be rectified. I urge that Muslim officers be appointed as Secretaries to some of these Ministries to rectify the ethnic imbalance. In the year 1980, in Kinniya, we have created special vacancies–

නියෝජ්‍ය සභාපතිතුමා
*(பிரதித் தவிசாளர் அவர்கள்)*
(The Deputy Chairman)

Hon. Member could you please wind up?

ඒ. රිස්වි සින්නලෙබ්බේ මහතා
*(ஜனாப் ஏ. றிஸ்வி சின்னலெப்பே)*
(Mr. A. Rizvi Sinnalebbe)

Yes. I am winding up.

Sir, in the year 1980 we held a special examination to recruit SLAS officers to the North-East Province. In order to cater to the minority community and the Tamil speaking people I urge the Hon. Minister to formulate a similar scheme to conduct a separate examination for the recruitment of SLAS officers to the North-East Province.

And also I must say a few words on the Grama Niladaris.

නියෝජ්‍ය සභාපතිතුමා
*(பிரதித் தவிசாளர் அவர்கள்)*
(The Deputy Chairman)

Hon. Member, please wind up. You have taken 2 minutes more.

ඒ. රිස්වි සින්නලෙබ්බේ මහතා
*(ஜனாப் ஏ. றிஸ்வி சின்னலெப்பே)*
(Mr. A. Rizvi Sinnalebbe)

Grama Niladaris are doing a lot of service but their salaries are very low. Their salary anomalies have to be rectified and also their grievances have to be looked into by the Hon. Minister.

Thank you very much.

[පූ. භා. 11.50]

මාවයි එස්. සේනාධිරාජා මහතා
*(திரு. மாவை சோ. சேனாதிராஜா)*
(Mr. Mavai S. Senathirajah)

*கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் நிர்வாக மறுசீரமைப்பு அமைச்சு மற்றும் மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சு ஆகிய இரண்டு அமைச்சுக்களுக்குரிய நிதி ஒதுக்கீடுகளின் குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகிறேன். இந்த ஒரு அமைச்சுகளின் விவாதங்களையும் நான் மிக உன்னிப்பாகக் கேட்டுக்கொண்டிருந்தேன். கௌரவ அமைச்சர் றிச்சட் பத்திரண அவர்கள் ஒரு மூத்த அரசியல்வாதி.*

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees

Order, please ! will an hon. Member propose the name of Mr. Ananda Munasinghe to take the chair?

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)

will an I move,

"That Mr. Ananda Munasinghe do now take the Chair."

ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
*(ஜனாப் இம்தியாஸ் பாக்கிர் மாக்கார்)*
(Mr. Imthiaz Bakeer Markar)
*විසින් සථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, +ආනන්ද මුණසිංහ මහතා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, திரு. ஆனந்த முனசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMETTEES *left the Chair and* MR. ANANDA MUNASINGHE *took the Chair.*

මාවයි එස්. සේනාධිරාජා මහතා
*(திரு. மாவை சோ. சேனாதிராஜா)*
(Mr. Mavai S. Senathirajah)

*கௌரவ தலைமை தாங்கும் உறுபினர் அவர்களே, கௌரவ றிச்சட் பத்திரண அமைச்சர் அவர்களை 1980 ஆம ஆண்டு எனக்கு நன்கு தெரியும். அவர் இந்த அவையிலே, தான் ஒரு இனவாதியல்ல; நேர்மையாகக் கடமை புரிபவன் என்று கூறியதை நான் முற்றுமுழுதாக ஏற்றுக்கொள்கிறேன். அதேபோல அன்புக்குரிய நண்பர் நந்திமித்ர ஏக்கநாயக்க அவர்களும் பல அனுபவங்களைக் கொண்டவர். இந்த நாட்டிலே மாகாண சபைகள்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මාවයි එස්. සේනාධිරාජා මහතා]

உருவாக்கப்பட்டதற்கான அவசியம் - முக்கியத்துவம் - அது இந்த நாட்டின் இனப்பிரச்சினைக்குத் தீர்வாகவும் அமைய வேண்டும் என்பதுதான். ஆனால் மாகாண சபைகள் அமைக்கப்பட்டு நீண்ட காலம் சென்ற பிறகும் இனப்பிரச்சினையைத் தீர்ப்பதில் இன்னும் அவற்றினால் பயன் கிட்டவில்லை. எனக்கு முன் பேசிய ஜனாப் றிஸ்வி சின்னலெப்பே அவர்கள் குறிப்பிட்டது போல, இந்த அமைச்சுகளின் விவாதத்தில் பேசுவதற்குக் கூடுதலான நேரம் எங்களுக்கு ஒதுக்கப்பட்டிருக்க வேண்டும். பத்து நிமிடங்களில் நாங்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளையெல்லாம் பேசிவிடுவது இலகுவானதல்ல.

அரசாங்க உயர பதவிகளில் இருக்கின்ற, குறிப்பாகப் பொது நிர்வாக அமைச்சின் செயலாளராக இருக்கின்ற ஜனாப் எம். என். யுனைட் பொன்றவர்கள் மிகவும் திறமை வாய்ந்த அனுபவம் மிக்கவர்கள். ஜனாப் யுனைட் அவர்களை எனக்கு நீண்டகாலமாகத் தெரியும். ஆனால், எதிர்காலத்தில் தமிழ் மக்கள் மத்தியிலிருந்தோ, முஸ்லிம் மக்கள் மத்தியிலிருந்தோ இப்படியான நிர்வாக சேவையின் உயர் தரங்களுக்கு உயர் அதிகாரிகள் கிடைப்பதென்பது அரிதாக இருக்குமென்று நான் இந்தச் சந்தரப்பத்திலே குறிப்பிட விரும்புகிறேன். எதிர்காலத்தில் அதற்கு வேண்டிய நடவடிக்கைகள் எடுக்கப்படாதுவிட்டால், இலங்கையின் நிர்வாக சேவையில் - அதிஉயர் பீடங்களில் - தமிழ் பேசுகின்றவர்கள் இல்லாத ஒரு நிலை ஏற்படும் என்பதை இன்று நான் அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டு வர விரும்புகிறேன். அதனை அமைச்சரவர்கள் அறிவார் என்றும் நான் நினைக்கிறேன்.

தேர்தலுக்குப் பின் சென்ற ஜனவரி மாதப் பிற்பகதியில் நானும் எனது கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களான திரு. ஆனந்தசங்கரி, திரு. சிவமகாராசா ஆகியோரும் உங்களுடைய அமைச்சிலே உங்களைச் சந்தித்து எங்கள் மகிழ்ச்சியைத் தெரிவித்துக்கொண்டு, ஒரு கருத்தை உங்கள் முன் வைத்தது உங்களுக்கு நினைவிருக்கலாம். அப்போது, 1997, 1998 ஆம் ஆண்டுகளில் கிராமசேவையாளர் நியமனம் பெறுவதற்காகப் பரீட்சை எழுதியவர்களின் ஒரு பகுதியனர் , அதாவது இன்னும் 14 பேர் கிராமசேவையாளர் நியமனம் பெறாமல் இருக்கின்றார்கள்; அவர்களுக்கு நீங்கள் நியமனம் வழங்க வேண்டும் என்றும், அதன் பின்னர் அமைச்சு எதிர்பார்ப்பதுபோல சமுர்த்தி ஊக்குவிப்பாளர்களை நியமிப்பதில் நாங்கள் ஆட்சேபனை தெரிவிக்கமாட்டோம் என்றும் உங்களிடம் குறிப்பிட்டு ஒரு கடிதத்தைக் கொடுத்திருந்தேன். ஆனால், நீங்கள்அது சம்பந்தமாக இன்னும் நடவடிக்கை எடுக்கவில்லை. அதற்கான பதிலும் எனக்கு இதுவரை தரப்படவில்லை. அவ்வாறு பரீட்சை எழுதிச் சித்தியடைந்து, நியமனம் பெறுவதற்குத் தகுதியுள்ளவர்களுக்கு நீங்கள் விரைவில் நியமனம் வழங்க வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்தில் நான் உங்களை வற்புறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

ගරු රිචඩ් පතිරණ මහතා
(மாண்புமிகு றிச்சட் பத்திரண)
(The Hon. Richard Pathirana)

How many more are left to be taken in?

මාවයි එස්. සේනාධිරාජා මහතා
(திரு. மாவை சோ. சேனாதிராஜா)
(Mr. Mavai S. Senathirajah)

There is a balance of 14.

அடுத்ததாக பொதுசன ஐக்கிய முன்னணி அரசாங்கத்தின் சென்ற ஆட்சிக்காலத்தில், புதிய பிரதேச செயலாளர் பிரவுகளை அமைப்பதற்காக திரு. பனம்பலன அவர்களின் தலைமையில் ஒரு குழு நியமிக்கப்பட்டது. அந்தக் குழுவுக்கு எமது சார்பில் பல கோரிக்கைகள் விடுக்கப்பட்ட போதிலும் கூட, அவை நிறைவேற்றப்படவில்லை; அக்கோரிக்கைகளை அக்குழு சிபாரிசு செய்யவில்லை. அவற்றில் முக்கியமானது, அம்பாறை மாவட்டத்திலுள்ள கல்முனைப் பிரதேசத் தமிழ் மக்களுக்கென தனியான ஒரு பிரதேசச் செயலகப் பிரிவு அமைக்கப்பட வேண்டும் என்று சுமார் 20 ஆண்டுகளாக விடுக்கப்பட்டு வரும் கோரிக்கையாகும். சென்ற இரண்டு மாதங்களுக்கு முன்னர் கூட இந்தக் கோரிக்கையை நிறைவேற்றித் தருமாறு கோரி அங்கு ஆண்களும் பெண்களுமாக ஆயிரக் கணக்கானோர் கூடி நீண்ட நாள்கள் உண்ணாவிரதம் இருந்தார்கள். அத்தகவல் அமைச்சருக்கும் எட்டியிருக்க வேண்டும். அக் கோரிக்கையை நான் இந்தச் சபையிலே மீண்டும் வற்புறுத்திக் கூற விரும்புகின்றேன். அமைச்சரைச் சந்தித்து இந்தக் கோரிக்கை பற்றிப் பேச்சுவார்த்தை நடத்துவதற்கும் நான் ஆயத்தமாக இருக்கின்றேன். சென்ற 1994 ஆம் ஆண்டு நடைபெற்ற பொதுத் தேர்தலில் நான் அங்கு போட்டியிட்ட போதிலும், சொற்ப வாக்குகளினால் தெரிவாக முடியாமல் போனேன். இம்முறை அந்தப் பகுதியிலேயிருந்து பாராளுமன்றத்திற்குத் தெரிவு செய்யப்பட்டிருக்கின்ற தமிழ்ப் பிரதிநிதியும் கூட அந்தக் கோரிக்கையை நிச்சயமாக ஆதரிப்பாரென நினைக்கின்றேன். அந்தத் தமிழ் மக்கள் சுமார் 20 ஆண்டு காலமாக விடுக்கும் அந்தக் கோரிக்கையை நிறைவேற்றி வைப்பதற்கு, அமைச்சர் அவர்கள் அமைச்சரவைக்கு சம்பந்தப்பட்ட விடயம் சம்பந்தமாகச் சிபாரிசு செய்ய வேண்டும் என்று நான் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

One Mr. Gunanayagam, a senior citizen and an ex-Chairman of the Village Council, Kaddaiparichchan in the Trincomalee District has written a letter to the Hon. Minister on the 26th of December 2000, with regard to the upgrading of the Ichchilampathai AGA's Division to the standard of a Divisional Secretariat. I will quote a portion of this letter, Sir, because it will be very useful to the Hon. Minister. This has been already approved by the Cabinet in 1993. Even the upgrading of the Kalmunai AGA's Division was approved. I am also aware that the present Secretary to the Ministry, Mr. Junaid, had recommended in 1993 to upgrade these two AGA's Divisions, particularly the (Ichchilampathai) Verugal AGA's Division and also the Kalmunai AGA's Division to the standard of Divisional Secretariats. This is what Mr. Gunanayagam has written to the Minister. I quote from his letter:

"In this connection, I wish to refer to letter No. 5/3/2/A/4/2(ii) of 20.09.93 from the Deputy Secretary-Interior, North-East Province to all Secretarits in the NEP etc. upgrading the A. G. AA Offices to Divisional Secretariats.

1. Verugal (Ichchalampathai–Trincomalee District (Part of Seruvila Pradeshiya Sabah)
2. Oddusuddan – Mullathivu District.
3. Kalmunai (Tamil Div.) – Ampara District.
4. Karathivu – Ampara District
5. Kandevalai – Kilinochchai."

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Mr. Senathirajah, you have two minutes more.

මාවෙෙ සෝ. සේනාධිරාජා මහතා
(திரு. மாவை சோ. சேனாதிராஜா)
(Mr. Mavai S. Senathirajah)

Sir, I started at 11.54 a.m. I started my speech only after you took the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

You started at 11.52 a.m., according to my time schedule.

මාවෙ සෝ. සේනාධිරාජා මහතා
(திரு. மாவை சோ. சேனாதிராஜா)
(Mr. Mavai S. Senathirajah)

You took the Chair after two minutes.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

I did not take that much of time.

මාවෙ සෝ. සේනාධිරාජා මහතා
(திரு. மாவை சோ. சேனாதிராஜா)
(Mr. Mavai S. Senathirajah)

Thank you, Sir. I will wind up. Therefore, I request the Hon. Minister to please submit a special memorandum to the Cabinet and get the approval of the Cabinet to upgrade these two AGA's Divisions, particularly Verugal, (Ichchilampathai) subdivision to a fully-fledged District Secretariat and also the Kalmunai subdivision to a Divisional Secretariat in the Ampara District –[*Interruption*]. Yes, I asked the people concerned to meet you and submit a memorandum. I think they fully discussed the matter and settled it.

Thank you very much

*[இடையீடு]* குறித்த விடயம் சம்பந்தமாக நாங்கள் பேசித் தீர்த்துக் கொள்ளலாம். பேசுவதற்கு இன்னும் குறுகிய நேரமே இருக்கின்றபடியால் சம்பந்தப்பட்ட வினாவுக்கு என்னால் இப்பொழுது பதிலளிக்க முடியாது. தேவையானால் இன்னொரு சந்தர்ப்பத்தில் பதிலளிக்கின்றேன். *[இடையீடு]* பல விடயங்கள் பற்றி நாங்கள் உங்களுடைய கட்சியுடனும் பேசியிருக்கின்றோம் என்பதை நான் உங்களுக்கு ஞாபகமூட்ட விரும்புகின்றேன்.

அடுத்து, இன்னுமொரு விடயத்தைப் பற்றியும் நான் அமைச்சருக்கு எடுத்துக் கூற வேண்டியிருக்கின்றது. ஒரு சிறந்த நிருவாகியான இளைப்பாறிய பிரதேசச் செயலக உத்தியோகத்தர் திரு. சந்திரராஜா அவர்களுக்குச் சேவை நீடிப்பு வழங்கப்படாத அதேவேளை, அவரை விட வயதில் மூத்த எத்தனையோ பேருடைய பதவிக் காலம் நீடிக்கப்பட்டு அவர்கள் இன்றைக்கும் அரசாங்கத் தொழில் துறைகளிலே கடமை புரிந்து கொண்டிருக்கின்றார்கள். எனவே, திரு. சந்திரராஜா அவர்களுக்கு சேவை நீடிப்பு வழங்க வேண்டும் என்று நாங்கள் சென்ற ஜனவரி மாதம் அமைச்சரிடம் வேண்டுகோள் விடுத்திருந்தோம். அப்போது, அந்த உத்தியோகத்தருடைய விடயத்தில் அரசியல் தலையீடில்லாத வகையில் தீர்மானம் மேற்கொள்வதாக அமைச்சர் கூறியதையிட்டு நாம் மகிழ்ச்சியடைந்தோம். ஆனால், இன்று வரைக்கும் அமைச்சர் அது சம்பந்தமாக நடவடிக்கை மேற்கொள்வதற்கு முயற்சி எடுக்கவில்லை. தற்போதைய அமைச்சரிடம் மட்டுமல்ல, அன்று பொது நிர்வாகத்திற்குப் பொறுப்பான அமைச்சராக இருந்த இன்றைய பிரதமரிடமும் குறித்த விடயம் சம்பந்தமாக நாம் முறையிட்டிருந்தோம். ஆனால், எத்தனையோ வயதில் மூத்தவர்கள் அரசாங்கச் சேவையில் இருக்கின்ற அதேவேளை, எங்களுடைய அந்தக் கோரிக்கை நிறைவேற்றப்படவில்லை. அதற்கு என்ன காரணமோ தெரியவில்லை. ஓய்வு பெற்றவர்களைத் தொடர்ந்தும் சேவையில் அமர்த்த வேண்டும் என்று நான் கூறவில்லை. வேலைவாய்ப்பில் இளைஞர்களுக்கு இடம் கொடுக்க வேண்டும். ஆனால், மக்களால் விரும்பப்படுகின்ற, சிறந்த நிர்வாகியான திரு. சந்திரராஜா போன்றவர்களுக்கு சேவை நீடிப்பு வழங்கி, இன்னும் ஓர் ஆண்டோ, இரண்டு ஆண்டுகளோ சேவையாற்றுவதற்கு அனுமதிக்க வேண்டும் என்று கேட்டு நான் விடை பெற்றுக் கொள்கின்றேன். வணக்கம்.

[ಅ. ಹಾ. 12.02]

එස්. තවරාජා මහතා
(திரு. எஸ். தவராஜா)
(Mr. S. Thavarajah)

Sir, since my time has already been pruned down I will confine my speech to an important matter which I would like to bring to the notice of the House. For the last three days there has been a hunger strike – [*Interruption*] – Please wait. There has been a hunger strike going on in front of the Jaffna Municipal Council by its employees. They have sent a memorandum addressed to the Hon. Douglas Devananda signed by 40 people and the memorandum with the signatures is here. It is a lengthy memorandum of two pages. Therefore I will table* this memorandum for inclusion in the HANSARD. I will tell this House what the main contents of the memorandum are. They state that they are midwives – most of them are women – and that they have been working in the Jaffna Municipal Council for more than eight years. They say that sometime ago their travelling allowance and other allowances were stopped by the Municipal Council. So they started – [*Interruption*] I am reading what is here. Please sit down.–[*Interruption*]– He has no right to tell me this. I am addressing the House. I am addressing the Chair. So they say that they have started a protest campaign wearing a black band on their arms.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ உறுப்பினர் ஒருவர்)
(An hon. Member)

Who?

එස්. තවරාජා මහතා
(திரு. எஸ். தவராஜா)
(Mr. S. Thavarajah)

The employees, 40 of them. And they say that they were not in a position to contact the Mayor because the Mayor was always in Colombo. So they had telephoned the Mayor and told him that they are starting a campaign to protest against the allowances being stopped. So according to the Memorandum, the Mayor has told them over the telephone that he will speak to the authorities and resolve the issue. But according to what they say what has happened subsequently is this. As the first step they have stopped the 26 casual employees from work. The second step was that they have stopped the balance 14 permanent employees from work. Altogether 40 people were sent out of employment.– [*Interruption*]. – I am reading what is in the memorandum.

---

*කථාව අවසානයේ පළ කර ඇත.
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Reproduced at end of speach.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වී. ආනන්දසංගරී මහතා
(திரு. வீ. ஆனந்தசங்கரி)
(Mr. V. Anandasangaree)

You are talking rubbish. Do not mislead the House.

එස්. තවරාජා මහතා
(திரு. எஸ். தவராஜா)
(Mr. S. Thavarajah)

You are misleading the community.

වී. ආනන්දසංගරී මහතා
(திரு. வீ. ஆனந்தசங்கரி)
(Mr. V. Anandasangaree)

Come out with the truth.

එස්. තවරාජා මහතා
(திரு. எஸ். தவராஜா)
(Mr. S. Thavarajah)

You are going all over and misleading the community, the world and the international community. Wait, I will come to it.

වී. ආනන්දසංගරී මහතා
(திரு. வீ. ஆனந்தசங்கரி)
(Mr. V. Anandasangaree)

Come to the subject.

එස්. තවරාජා මහතා
(திரு. எஸ். தவராஜா)
(Mr. S. Thavarajah)

Do not tell me what to speak. I know what to speak. I am addressing the Chair, not you. So these 40 employees are on a hunger strike for the last three days. I will read the demands. It is in Tamil. The first demand is to remove the Commissioner. The second demand is to dissolve the Council. These are their demands not ours. For the last three years this Council has not constructed a single culvert, road or building. We are controlling ten Local Government bodies. Go and see what is happening there. You can see how many roads have been constructed, how many community centres have been put up. You have put advertisements in the newspapers. But what have you done? Tell me, have you constructed a single culvert –

වී. ආනන්දසංගරී මහතා
(திரு. வீ. ஆனந்தசங்கரி)
(Mr. V. Anandasangaree)

Do you want those employees taken back?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Please do not disturb him. He has limited time.

එස්. තවරාජා මහතා
(திரு. எஸ். தவராஜா)
(Mr. S. Thavarajah)

Sir, there is inefficient management there.

Sir, I read in today's newspapers – unfortunately I was not here yesterday morning – that the hon. Anandasangaree, whilst speaking on the Votes of the Ministry of Foreign Affairs, had requested the Minister of Foreign Affairs to talk to the LTTE and resolve the ethnic issue rather than going round the world requesting the international community to ban the LTTE. I kindly request Mr. Anandasangaree – he just returned after a European tour – to go to Jaffna and tell Mr. Raviraj how to run the administration of the Jaffna Municipality. Please do that rather than saying these things in the House.

වී. ආනන්දසංගරී මහතා
(திரு. வீ. ஆனந்தசங்கரி)
(Mr. V. Anandasangaree)

You are transporting your cadres, your stooges, to participate in the *Satyagraha*!

එස්. තවරාජා මහතා
(திரு. எஸ். தவராஜா)
(Mr. S. Thavarajah)

Sir, I am telling the Hon. Minister of Provincial Councils and Local Government that there is inefficient management and if they cannot run the Council, please, dissolve it and go for a fresh election. We will prove that we can run it effectively! We have done it; we have proved it! Go and see the work done in each and every corner of those villages. We have done the work that ten Pradeshiya Sabhas did. The Pradeshiya Sabha chairmen are there. They are with the people and they are serving the people. They are constructing roads; they are putting up community centres; they are putting up buildings. Kindly go and see those things – [*Interruption*]. You go and see! You are inefficient. You only talk. –[*Interruption.*] You cannot run a single municipality properly. See what you have done. You have thrown 40 employees out of their jobs! They are on a hunger strike today.

Sir, not only that. There is another demand from the United Ceylon Local Government Workers' Union. It is also demanding the same – remove the Commissioner; dissolve the Municipal Council. I am submitting* it to be included in HANSARD. Sir, these Tamil politicians are going round the world begging the international diplomatic community not to ban the LTTE. Please go and run the Jaffna Municipality first! Then, go and ask all these to be done. – [*Interruption.*] You cannot manage a single municipality, but, you go and beg something else to be done! – [*Interruption.*] I am addressing the Chair, not you! I am talking about the inefficient management of the Jaffna Municipality. You cannot run a single Municipality. So how are you going to lead the Tamils?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, look at my side and speak. You have one minute more.

*කථාව අවසානයේ පළ කර ඇත.
உரையினிறுதியில் தரப்பட்டுள்ளது.
*Reproduced at end of speech.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒස්. තවරාජා මහතා
(திரு. எஸ். தவராஜா)
(Mr. S. Thavarajah)

Sir, can you give me two minutes from Mr. Sivalingam's time?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

I have already given you more time.

ඒස්. තවරාජා මහතා
(திரு. எஸ். தவராஜா)
(Mr. S. Thavarajah)

Okay, Sir. I will touch on one more point.

අපේ වාසනාවකට අතිගරු ජනාධිපතිතුමිය අපේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමා අද මහ ආණ්ඩුවේ පළාත් සභා අමාත්‍යවරයා හැටියට පත් කර තිබෙනවා. පළාත් සභා සම්බන්ධව පළපුරුද්දක් තිබෙන අමාත්‍යවරයකු මහ ආණ්ඩුවේ පළාත් සභා සහ අමාත්‍යවරයා හැටියට පත් කළ එක එතුමිය ගත් හොඳ තීරණයක් කියායි, මම හිතන්නේ. ඒ නිසා යම්කිසි විධියකින් කැබිනට් මණ්ඩලයේදී කිව්වොත් "ඉල්ලා තිබෙන මුදල වැඩියි, ඒක කපන්න ඕනෑ" කියා මධ්‍යම පළාතට නම් ප්‍රශ්නයක් නැහැ, අපේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමා දැන් මහ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ සිටින නිසා. නමුත් අනෙක් පළාත් සම්බන්ධයෙන් එහෙම දෙයක් ගැන කතා කරන්න කෙනෙක් නැහැ. ඒ නිසා මගේ යෝජනාව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන්ට කැබිනට් මණ්ඩලයට සහභාගී වීම සඳහා අවස්ථාවක් ලබා දෙන්න ඕනෑ කියන එකයි. නැත්නම් ඒක කරන්න බැහැ.

අද අප දන්නවා, පාසල්වල ගුරු හිඟය ගත්තොත් එතුමාගේ ආයතන පිළිබඳව ඒ අවශ්‍යතාව පිළිබඳව පළාත් සභාවේ මන්ත්‍රීවරු කතා කරන බව. එකේදී අප පළාත් සභා කැබිනට් මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කරනවා. අපේ පළාත් සභාවෙන් අප අනන්ත අප්‍රමාණ කැබිනට් පත්‍රිකා මහ ආණ්ඩුවට ඉදිරිපත් කරනවා. නමුත් මහ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයෙන් අනුමත වන්නේ ඉතාම සුළු මුදලක් පමණයි. කපන්න ඕනෑ හැම එකක්ම කපනවා.

පළාත් සභාවල සමහර මූලික රෝහල්වලට හෙදියන් 200ක් අවශ්‍ය නම් ඉන්නේ 100යි. නමුත් මහ ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යතුමාට පුළුවන් සමහර ප්‍රධාන රෝහල්වල එක ඇඳට එක හෙදිය ගණනේ හරි දමලා කැබිනට් පත්‍රිකාව අනුමත කර ගන්න. මොකද හිඟය ගත්තොත් ඒ එතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර එතුමාම ඒ ගැන කතා කරන නිසයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමනි, ඔබතුමා පළාත් සභාවක ප්‍රධාන අමාත්‍යවරයකු හැටියට හිටියා. පසුගිය අවුරුදු 1 1/2 තුළ පළාත් සභාවෙන් අපේ මධ්‍යම පළාතේ අතිවිශාල සේවයක් කළා අපට මතකයි. අද මම අවංකව කතා කරනවානම් මම කනගාටු වෙනවා. මධ්‍යම පළාත් සභාවේ අමාත්‍යවරයකු හැටියට සිටින විට මම මීට වඩා විශාල සේවයක් කළා. ඒ සේවය මීට වඩාත් පලදායි ලෙස කරන්න පුළුවන්, පළාත් සභා අමාත්‍යාංශය තුළින් තව තවත් ඒ අවශ්‍ය බලතල සහ සම්පත් ලබාදෙන්න තමුන්නාන්සේට පුළුවන් නම්. ඒ නිසා ගරු ඇමතිතුමනි, පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන්ට කැබිනට් මණ්ඩලයලට සහභාගි වී පළාතේ ප්‍රශ්න සාකච්ඡා කිරිම සඳහා අවසරය ලබා දිය යුතුය කියා මම යෝජනා කරනවා. ඒ වගේම හැකියාවක් ඇත්නම් පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන්ටත් මේ උත්තරීතර පාර්ලිමේන්තුවටත් සහභාගි වන්නට පුළුවන් නම්, එය ඉතාමත් වටිනවා. එවිට පළාතේ ප්‍රශ්න පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට පුළුවන්. අපි පළාත් සභාවේ විපක්ෂයේත් සිටියා; ආණ්ඩු පක්ෂයේත් සිටියා. අපි උගුරු ලේ රහ වන තුරු බෙරිහන් දෙමින් කෑ ගැහුවා. නමුත් ඒ ප්‍රශ්න එතැනින් ඉවර වෙනවා. එම නිසා පළාත් සභාවේ කථා කරන ප්‍රශ්න ගැන මේ උත්තරීතර පාර්ලිමෙන්තුවේදීත්, ඒ වගේම කැබිනට් මණ්ඩලයේදීත් කථා කරන්නට යම්කිසි නියෝජිතයෙක් සිටිනවා නම් තමයි, ඒකේ වටිනාකම තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පිළිබඳව මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

ඊළඟට විදේශාධාර ගැන කියන්න කැමතියි, විදේශ ආධාර කෙළින්ම පළාත් සභාවලට ලබා ගන්න බැහැ. මධ්‍යම පළාත් සභාවට ජපන් රජය සමඟ අත්වැල් බැඳගෙන, ගිවිසුමකට එළඹ යම්කිසි ආධාර මුදලක් ලබා ගන්න අවශ්‍යයි කියා අපි හිතමු. නමුත් පළාත් සභාවට ඒ සඳහා බලතල නැහැ. එම නිසා පළාත් සභා අමාත්‍යාංශය හරහා ඒ ආධාර මුදල් ලබා ගන්නට අපට සිද්ධ වෙනවා. දැනටමත් මේ වන විට විදේශ ආධාර ලැබුණු දේවල් පිළිබඳව, ගරු ඇමතිතුමා නිකුත් කර තිබෙන මේ පොත් පිංචේ සඳහන් වී තිබෙනවා. නමුත් විදේශ ආධාර ලබා ගන්නට ඒ පළාත් සභාවට මීට වඩා හැකියාවක් තිබෙන බව අපි පෞද්ගලිකවම දන්නවා, විදේශ ආධාර ලබා ගැනීමේදී පළාත් සභාවට සෘජුව මේ රටවල් සම්බන්ධීකරන්ය කර ගෙන, ඒ රටවල් සමඟ කටයුතු කරන්නට, අවස්ථාවක් තිබෙන්වා නම්,

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)
සමා වන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

මධ්‍යම පළාත ගැන මම තව එක යෝජනාවක් ඉදිරිපත් කරනවා. මේ රටේ වැඩියෙන්ම විදේශ ආදායමක් ලැබෙන තේ කර්මාන්තය සිදු වන්නේ මධ්‍යම පළාතේයි. අපේ තේ කොළ ඔක්කොම කොළඹට ගේනවා. කොළඹට ගෙනැවිත් බ්‍රෝකරවරුන් මඟින් රුපියල් මිලියන දහස් ගණනක් හොයනවා. නමුත් අපේ පළාතට සත පහක්වත් ලැබෙන්නේ නැහැ. අපේ ආදායම අපි මහ ආණ්ඩුවට දෙනවා. නැත්නම් බස්නාහිර පළාත් සභාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මහින්දනන්ද අලුත්ගමගේ මහතා]

ඒක අය කරනවා. අපේ සම්පත් පිටට යනවා. නමුත් අපේ පළාත් සභාවට මුදල් නැහැ. එම නිසා අපේ සම්පත් පිටට යද්දී ඒ පළාත් සභාවට යම්කිසි ආදායමක් ලැබෙන වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන් නම් එය ඉතා වටිනවා.

අවසාන වශයෙන් උතුරු නැගෙනහිර පළාත් සභාව ගැනත් වචනයක් කියන්නට ඕනෑ. ඇමතිතුමනි, උතුරු නැගෙනහිර පළාත් සභාවේ වැඩි වශයෙන් සේවය කරන්නේ විශ්‍රාම ගිය අයයි. සේවකයන් නැහැයි කියා නියමිත වයස් සීමාව පැනපු අය තමයි, හැම වෙලාවේම ඒ තැන්වල වැඩ කරන්නේ. ඒ පළාතේ සේවයට යන්න ඕනෑ තරම් මිනිස්සු කැමැත්තෙන් ඉන්නවා. එම නිසා උතුරු නැගෙනහිර පළාත් සභාවේ සේවයේ සඳහා ඒ අය යැවීමේ වැඩ පිළිවෙළක් සංවිධානය කරන්නය කියා මම යෝජනා කරනවා. ඒක ජාතික සමඟිය සඳහාත් හොඳ වැඩ පිළිවෙළක් වෙනවා. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් හැම කෙනකුම වාගේ ඒ පළාතේ සේවයට යවන්න පුළුවන් නම්, ඒ පළාතේ සේවය කරන්න කැමැත්තෙන් සිටින අය ඉන්නවා. නැත්නම් එකම පිරිස විශ්‍රාම ගිය පසුත් හැරමිටි අරගෙන කාර්යාලවල සේවයට යනවා. ඒ අයගෙන් වැඩක් වෙන්නේ නැහැ; සේවයක් බලාපොරොත්තු වෙන්න බැහැ. එම නිසා ඒ පිළිබඳව කටයුතු කරන්නය කියා ඉල්ලා සිටින අතර, පළාත් සභාවෙන් පාර්ලිමේන්තුවට පැමිණි මට මේ අමාත්‍යාංශය ගැන කථා කරන්නට විනාඩි පහක් පමණක් ලබා දීම ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

අපේ පළාත් සභාවේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමා, අද පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වශයෙන් පත් වී සිටීම ගැන මම සන්තෝෂ වෙනවා. එතුමාට පළාත් සභාවලට සේවය කිරීම සඳහා ශක්තිය හා ධෛර්යය ලැබේවාය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 12.54]

ජයතිලක පොඩිනිලමේ මහතා
(திரு. ஜயதிலக பொடிநிலமே)
(Mr. Jayatilake Podinilame)

ගරු සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගේත්, නන්දිමිත්‍ර ඒකනායක ඇමතිතුමාගේත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ විවාදයට සහභාගි වන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

විශේෂයෙන්ම පළාත් සභා ක්‍රමය තුළ වර්ෂ ගණනාවක්ම සේවය කර, ඒ අත්දැකීම් තුළින් ලබා ගත් කරුණු කිහිපයක් මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට මම අදහස් කරනවා. පළාත් සභා ක්‍රමයෙන් බලාපොරොත්තු වූ ප්‍රතිඵල ඇත්ත වශයෙන්ම ලබා ගන්නට බැරි වුණාය කියා, මේ අවස්ථාවේදී අලුත්ගමගේ නියෝජ්‍ය ආමාත්‍යතුමාගෙන් කියැවුණා. එද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ පළාත් සභා ක්‍රමය ඇති කළේ - ඉන්දු -ලංකා ගිවිසුම ක්‍රියාතමක් කළේ - මේ රටේ උතුරු නැගෙනහිරට යම්කිසි විසඳුමක් ලැබේය කියන බලාපොරොත්තුව ඇතිවය. නමුත් ඒ බලාපොරොත්තුව ඉෂ්ට නොවුණේ, වර්ධරාජා පෙරුමාල් මැතිතුමාගේ ඒකාධිපති තීරණය නිසා බව අපි කවුරුත් පිළිගන්නවා. එතුමා ඒකීය රාජ්‍යයන් ප්‍රකාශයට පත් කළේ නැත්නම්, මේ ගිවිසුමේ ප්‍රතිඵල මීට වඩා වෙනස් වන්නට ඉඩ තිබුණා. රජයට උතුරු නැගෙනහිර පළාත පවරා ගෙන කටයුතු කරන්නට සිද්ධ වුණේ ඒ නිසා බව අප කාටත් පිළිගන්නට සිද්ධ වෙනවා.

ගරු සභාපතිතුමනි, සමහර පළාත් සභාවල ආදායම් තත්ත්වය අඩුයි. සමහර පළාත්වල ආදායම් එකතු කිරීමේ ප්‍රතිඵල ඉතාමත් හොඳට පවතිනවා. බස්නාහිර පළාත් සභාව වගේ ඒවාට හොඳ ආදායම් තිබෙනවා. මේවා ක්‍රියාත්මක කරන්න පුළුවන්. සංවර්ධන වැඩවලට මුදල් යොදවීම ඉතාම පහසු කාරණයක් වී තිබෙනවා. උදාහරණයක් හැටියට මම කියන්නම්, මම හිටපු සබරගමුව පළාත් සභාවේ ආදායම් තත්ත්වය ඉතාමත් අඩුයි. ඒ පළාත් සභාවට 2001 වර්ෂය සඳහා රජය විසින් රුපියල් මිලියන 1050ක් දෙන්න පොරොන්දු වී තිබෙනවා. 2001 වර්ෂයේ මේ මුදල රුපියල් මිලියන 800 දක්වා අඩු කර තිබෙනවා. රුපියල් මිලියන 800කට අඩු කළත් මේ දක්වා මේ මුදල තවමත් මුදා හැර නැති බව මට දැනගන්නට ලැබී තිබෙනවා. මේ නිසා පළාත් සභාව බොහොම අමාරුවෙන් තමයි ක්‍රියාත්මක කරන්නට සිද්ධ වී තිබෙන්නේ.

ඊළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවකයන්ට වැඩි සැලකිල්ලත්, පළාත් රාජ්‍ය සේවකයන්ට අඩු සැලකිල්ලත් දක්වන බවට සේවක සේවිකාවන් අතර ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම මා මෙය දක්ක දෙයක්. මේකට හේතුවක් තිබෙනවා. රජයේ නිලධාරියෙක් තමන්ට අවශ්‍ය ණයක් හෝ ආපද ණයක් ලබා ගන්න ගියාම, අවුරුදු ගණනක් පොරොත්තු ලේඛනයේ ඉන්න සිද්ධ වෙනවා. මේ පොරොත්තු ලේඛනය ගැන බලන්න. 1997දී මාස 10ක් අත්තිකාරම් මුදලක් ඉල්លූ රාජ්‍ය සේවකයකුට තවමත් ඒ ණය මුදල් ලබා ගන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දිවා ආහාරය සඳහා රැස්වීම ප.ව. 1.30 දක්වා තාවකාලිකව අත්හිටුවනවා.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කථානායකතුමා [ගරු මේජර් ජනරාල් සරත් මුණසිංහ මහතා] ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி. ப. 1.30 மணி வரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மெஜர் ஜெனரல் சரத் முனசிங்ஹ] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p. m. and then resumed.*
MR. DEPUTY SPEAKER [THE HON..MAJOR–GENERAL SARATH MUNASINGHE] *in the Chair.*

ජයතිලක පොඩිනිලමේ මහතා
(திரு. ஜயதிலக பொடிநிலமே)
(Mr. Jayatilake Podinilame)

ගරු සභාපතිතුමනි, දිවා භෝජනයට සභාව කල් තැබීමට පෙර මම විස්තර කරමින් සිටියේ රජයේ සේවකයින්ගේ ප්‍රශ්නයක් පිළිබඳවයි. රජයේ සේවකයන්ට වගේම පළාත් රාජ්‍ය සේවකයන්ටත් සමාන අයිතිවාසිකම් තිබෙනවා. අත්තිකාරම් ලබාගැනීමේ ප්‍රශ්නයේදී පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට අවුරුදු ගණනාවක් බලාගෙන සිටින්නට සිද්ධවෙලා තිබෙන එක ගැනයි, මම මේ අවස්ථාවේදී විස්තර ඉදිරිපත් කළේ. මේ අයට ආපද ණය සහ අනෙක් ණය පහසුකම් ලබා දෙන්නට රුපියල් මිලියන 200ක් වත් අවශ්‍ය වෙනවා. මේ මුදල ලබා දුන්නොත් මේ අයට ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් මුදල් ලබා ගන්නට පුළුවන්කමක් ලැබෙනවා. එම නිසා ඒ ගැන මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

මම තවත් කාරණයක් ගැන මතක කරන්නට ඕනෑ. සබරගමුව පළාත් සභාවේ ලේඛන අනුව ඒ පළාතේ ඇබෑර්තු රාශියක් තිබෙනවා. අවුරුදු 10කට වැඩි කාලයක සිට මේ ඇබෑර්තු පුරවාගන්නට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒකට හේතුව වෙලා තිබෙන්නේ භාණ්ඩාගාරයෙන් අනුමතිය සහ මුදල් කොමිසමේ අනුමතිය ලබා නොදීමයි. මම මහ ඇමති වෙලා මේ පළාත පාලනය කරන විටත් මේ තත්ත්වය තිබුණා. 1994න් පස්සේ ඒ බාධක හැම එකක්ම තිබුණු නිසා ඒ කාලයේ මේ ඇබෑර්තු පුරවාගන්නට හැකියාවක් ලැබුණේ නැහැ. දැන් මේ පළාත් සභාව පවතින්නේ පොදු පෙරමුණු රජය යටතේ නිසා ඒ පුරප්පාඩු පිරවීම අපහසු වන එකක් නැහැ කියා මම හිතනවා. මේ පළාත් සභාවේ උපාධිධාරීන් 2700ක් පමණ ලියාපදිංචිවෙලා ඉන්නවා. මේ උපාධිධාරීන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහල යනවා. වර්ෂයෙන් වර්ෂය ඉහළ යනවා. සබරගමුව පළාතේ ලියාපදිංචි සංඛ්‍යාව වූ 2700ට වැඩි පිරිසකට උපාධිධාරී පත්වීම් දෙන්නට පුළුවන්. ඒ පත්වීම් දෙන්නට මම දන්නා තරමින් ඒ පළාත් සභාව තුළ ඇබෑර්තු තිබෙනවා. ජාතික පාසල්වලට අනුයුක්ත කරන්නට පුළුවන් සෞන්දර්ය ගුරුවරුන්ගේ ඇබෑර්තු 50ක් හා ඉංග්‍රීසි උපාධිධාරීන්ගේ ඇබෑර්තු 50ක් තිබෙනවා. ගණිත විද්‍යා උපාධිධාරී ඇබෑර්තු 40ක් හා ඉංග්‍රීසි උපාධිධාරීන්ගේ ඇබෑර්තු 50ක් තිබෙනවා. ගණිත විද්‍යා උපාධිධාරී ඇබෑර්තු 40ක්, සමුපකාර පරීක්ෂකවරුන්ගේ ඇබෑර්තු, ජනපද නිලධාරීන්ගේ ඇබෑර්තු මේ වගේ ඇබෑර්තු රාශියක් තිබෙනවා. අසහනයට පත්වෙලා සිටින උපාධිධාරීන් - සබරගමු පළාතේ විතරක් නොවෙයි - මුළු රට තුළම විශාල සංඛ්‍යාවක් ඉන්නවා. එහෙම නම් මේ ඇබෑර්තු මේ ආකාරයෙන් ටික ටික හෝ පුරවා උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ ක්‍රමය කඩිනම් කරන්නය කියන ඉල්ලීම මම මේ ගරු සභාවේදී කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, මගේ වෙලාව සීමිත නිසා පළාත් සභා ඡන්දය පිළිබඳව මතක් කරන්නට ඕනෑ. ඒ පිළිබඳව රජය විසින් ගන්නට යන තීරණය අපට දනගන්නට ලැබුණා. ග්‍රාමීය මට්ටමේ ජනතාවට ප්‍රාදේශීය සභාවලින් යම්කිසි සේවයක් සිද්ධ වුණා. දැනුත් සිද්ධ වෙනවා. ඡන්ද කල්දැමීම පිළිබඳව අපි සෑහීමකට පත්වෙන්නේ නැහැ. ඉතාමත් කඩිනමින් පළාත් පාලන ඡන්ද පැවැත්වීමට කටයුතු කරන ලෙස අපි ඉල්ලීමක් කරනවා. පොදු පාලන ක්‍රමයක් සෑම ප්‍රාදේශීය සභාවකම, නගර සභාවකම, පළාත් සභාවකම ඇති කරනවාය කියා. එහෙම නම් වයඹ පළාත් සභාව කෙරෙහි මම විශේෂ අවධානය යොමු කරවනවා. වයඹ පළාත් සභාවට අයිති පුත්තලම නගර සභාවේ නගරාධිපතිට විරුද්ධව තිබුණු චෝදනා හතළිස් ගණනක චෝදනා පත්‍රයක් මම ළඟ තිබෙනවා. වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා මේ ගැන පරීක්ෂණයක් පවත්වා මේ නගරාධිපතිවරයාගේ වැඩ තහනම් කළා. [බාධා කිරීමක්] ඔව්. විගණකාධිපතිතුමාගේ වාර්තාවෙන් පසුව මුදල් චෝදනා සහ අනෙකුත් චෝදනා සියල්ල සැලකිල්ලට අරගෙන එහිදී ඔප්පු වුණු කරුණු අනුව තමයි ඒ පුත්තලම නගර සභාවේ නගරාධිපතිවරයා ඉවත් කෙරුවේ. ඔහුව නැවත සේවයේ පිහිටුවන්න කියා අති ගරු ජනාධිපතිතුමිය විසින් එස්. බී. නාවින්න මැතිතුමාට යොමු කල ලිපියක් මම හැන්සාඩ්* ගත කරනවා. මට මෙම චෝදනා පත්‍රය දන් කියවන්න වෙලාවක් නැහැ ගරු සභාපතිතුමනි. මම මේ චෝදනා පත්‍රයක් සභාගත** කරනවා. මම දීර්ඝ කරුණු ඉදිරිපත් කිරීමක් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

වයඹ පළාත් සභාවේ ප්‍රසිද්ධ ටෙන්ඩර් ක්‍රමයෙන් තොරව සීමිත ටෙන්ඩර්වලට කොන්ත්‍රාත් ලබා දීම පිළිබඳව සඳහන් 1 සිට 9 දක්වා ලිපි 9ක් ඉදිරිපත් කරන අතර මම එය සභාගත** කරනවා. එම පළාත් සභාවක්, එම පළාත් සභාවේ වැඩ කටයුතු පිළිබඳවත් මීට වඩා අවධානය යොමු කරන්නය කියා ඉල්ලීමක් කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ පළාත් සභාවේ අඩුපාඩු සඳහා, විශේෂයෙන්ම සබරගමු පළාත් සභාවට ආවේනික වූ ප්‍රශ්නවලට කඩිනම් විසඳුමක් දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

සභාපතිතුමා
*(தவிசாளர் அவர்கள்)*
(The Chairman)

Mr. Sri Andrahennadi විනාඩි 10යි. [*Pause*] – Not here.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)

Sir, can you ask a Member from the Government side to speak.

සභාපතිතුමා
*(தவிசாளர் அவர்கள்)*
(The Chairman)

No, there is only one speaker from this side and that is the Hon. Minister and I think he should wind up the debate.

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ உறுப்பினர் ஒருவர்)*
(An hon. Member)

Sir, the Hon. Minister is at lunch.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)

Sir, then let Mr. Jayatilake Podinilame continue because he has not completed his speech.

සභාපතිතුමා
*(தவிசாளர் அவர்கள்)*
(The Chairman)

ජයතිලක පොඩි නිලමේ ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ජයතිලක පොඩිනිලමේ මහතා
*(திரு. ஜயதிலக பொடிநிலமே)*
(Mr. Jayatilake Podinilame)

මම තව කරුණු කිහිපයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ පළාත් පාලන ඡන්ද කල් දැමීම පිළිබඳව මම දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කිරීමක් කරන්න බලාපොරොත්තුව සිටියත්, කාලය මදි නිසයි එයට අවස්ථාව නොලැබුණේ. එහෙත් විනාඩි කිහිපයකින් මම කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

අපේ පක්ෂයේ ස්ථාවරය වෙලා තිබෙන්නේ පළාත් පාලන ක්‍රමය සහ ග්‍රාමීය පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමයි. ගමට පාලනය භාරදීමේ සංකල්පය අපේ පක්ෂයේ ස්ථාවරයක්. ගමේ අය පාලනයට හවුල් කරගෙන ග්‍රාමීය රාජ්‍ය ක්‍රමය ඉස්මතු කර මේ රට පාලනය කරන්නට අපේ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ක්‍රියා මාර්ගයක් ගෙන තිබුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේ ප්‍රාදේශීය සභා පිහිටුවීමේ පනත ඉදිරිපත් කර දන් එය ක්‍රියාත්මක වෙන්නේ. මෙහෙදී මේ ප්‍රාදේශිය සභා ඡන්දය කල් දැමීම නිසා ගමේ ජනතාවට මේ ඡන්ද ක්‍රමය ගැන වැටහීමක් නැති වෙන්න පුළුවන්. එම නිසා ඉක්මණින් මෙය ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එක් කර, ගමේ ජනතාවට ප්‍රාදේශීය සභා ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව ලබා දෙන්න කියන ඉල්ලීම මේ ගරු සභාවෙන් මා ඉල්ලනවා.

13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හැටියට ග්‍රාමීය කර්මාන්ත වලින් සියයට 90ක් පැවරී තිබෙන්නේ පළාත් සභාවලට, එම ග්‍රාමීය කර්මාන්ත අතර අත් යන්ත්‍ර කර්මාන්තය, පේෂ කර්මාන්තය, හස්ත කර්මාන්තය යන අංශවල සෑම නිෂ්පාදනයක්ම අද වෙළෙඳ පොළේ තිබෙනවා. නමුත් මේ සඳහා හරි හැටි අත දීමක් කර නැති නිසා මේ කර්මාන්ත අභාවයට යන්න පටන් ගෙන තිබෙනවා. ඒ නිසා පළාත් සභාවක් නියෝජනය කළ කෙනෙක් වශයෙන් මේ ග්‍රාමීය කර්මාන්තකරුවන්ට අවශ්‍ය පහසුකම් සපයා දීමේ වැඩ පිළිවෙළ මීට වඩා ක්‍රියාත්මක කරන්න වෙනවා කියා මම මතක් කරන්නට ඕනෑ. ඒ සඳහා මධ්‍යස්ථාන ඇති කරන්න වෙනවා. ඒවා සියල්ලම ඇති කර ගමේ කර්මාන්තකරුවන්ට මීට වඩා හොඳ සේවයක් සලසා දීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම කෙරෙහි ගරු අමාත්‍යතුමාගේ කාරුණික අවධානය යොමු වෙනු ඇතැයි විශ්වාස කරමින් මගේ කථාව අවසන් කරනවා.

*සභාමේසය මත තබන ලද ලියවිල්ල :
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*
*Document tabled :*

ශ්‍රී ලංකා ජනාධිපති
*இலங்கை சனாதிபதி*
President of Sri Lanka

2000 අගෝස්තු මස 29 දින

ගරු එස්. බී. නාවින්න මැතිතුමා,
වයඹ පළාත් සභා ප්‍රධාන අමාත්‍ය,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
කුරුණෑගල.

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි,

පුත්තලම් නාගර සභාවේ නගරාධිපතිට විරුද්ධ චෝදනා

2000 මාර්තු මස 14 වන දින පුත්තලම නගර සභාවේ විගණන කටයුතු සඳහා ගිය විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් එහි නගරාධිපතිතුමාට හා ඔහුගේ සේවකයින්ට විරුද්ධව කරන ලද චෝදනා පිළිබඳව ඔබ වෙත ලැබී ඇති වාර්තා අනුව ඔබ විසින් පුත්තලම් නගර සභාවේ නගරාධිපතිවරයාගේ සේවය අත්හිටුවා ඇත.

ඉහත කී නගරාධිපතිවරයාගේ සේවකයින් විසින් විගණන නිලධාරීන්ට පහර දුන්නේ යැයි කියන චෝදනාව පදනම් කරගෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක

---

*කථාව අවසානයේ පළ කර ඇත.
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Reproduced at end of speach.*

**පුස්තකාලයේ තබා ඇත.
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයතිලක පොඩිනිලමේ මහතා]

සභාවට විගණකාධිපති විසින් දන්වීමෙන් පසු කරුණු විමසීමක් කර ඇති බව පෙනේ. නමුත් නගර සභාවේ ගිණුම් පිළිබඳව විගණන නිලධාරීන්ට පරීක්ෂණයක් කිරීමට අවස්ථාවක් ඒ වන විට ලැබී නැත. කෙසේ වෙතත් නගරාධිපතිවරයාගේ සේවය අත්හිටුවා ඇත. අද වන තෙක් විගණන දෙපාර්තමේන්තුව, විගණන පරීක්ෂණ කටයුතු අවසන් කර නැත.

ඔබ විසින් පළාත් සභා පනතේ විධි විධාන යටතේ පත්කර ඇති පරීක්ෂණයද තුන් මසක කාලය අවසන් වී ඇතත් පරීක්ෂණය තවමත් අවසන් වී නැත.

කරුණු එසේ තිබියදී නගරාධිපතිවරයාගේ සේවය අත්හිටුවීම සාධාරණ නොවන බව මගේ හැඟීමයි. නගරාධිපතිවරයාගේ සේවය අත්හිටුවීමට පෙර එම නගර සභාව පිළිබඳව මූලික පරීක්ෂණයක් හෝ පවත්වා තිබිය යුතුව ඇතත්, එවැනි පරීක්ෂණයක් පවත්වා නොතිබීම අසාධාරණ යැයි මම අදහස් කරමි.

විගණකාධිපති විසින් නගර සභාවේ ගිණුම් පිළිබඳව පරීක්ෂණයක් පවත්වමින් තිබෙන බැවින්ද, ඔබ විසින් පත් කරන ලද පරීක්ෂණය අවසානවී නොමැති බැවින්ද තවදුරටත් නගරාධිපතිවරයාගේ සේවය අත්හිටුවා තිබීම සාධාරණ හා යුක්ති සහගත නොවන බැවින් ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙසත්, ඔහුට විරුද්ධව දැනට සිදු කරන පරීක්ෂණය ඉක්මණින් අවසන් කිරීමට කටයුතු කරන ලෙසත් දන්වා සිටිමි.

මෙයට – හිතවත්,
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග
ජනාධිපතිනි.

[අ. භා. 1.40]

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
*(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)*
(Mr. M. Joseph Michael Perera)

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යතුමාගේ විශේෂ අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු දෙකක් තිබෙනවා. පෑලියගොඩ නගර සභාවේ ඇති වී තිබෙන අති විශාල දූෂණය පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියා ගරු ජනාධිපතිතුමියට මන්ත්‍රීතුමන්ලා පිරිසක් පෙත්සමක් යවා තිබෙනවා. ටෙන්ඩර් කැඳවීමක් කරන්නේ නැතිව හිතවත් කෙනෙකුට ලක්ෂ 80ක පමණ ටෙන්ඩරයක් දීලා තිබෙනවා. ඒ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ විශේෂ අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තලාහේන පේරුව මීගමුව නගර සභාවට ඈඳෙන්න දැන් කටයුතු කරගෙන යන බව තමුන්නාන්සේ දන්නවා. ගරු අමාත්‍යතුමනි, ඒක අති විශේෂ කාර්යයක්. තමුන්නාන්සේ මේ පිළිබඳව අධ්‍යයනය කර තිබෙනවා. ගරු ආනන්ද මුණසිංහ මන්ත්‍රීතුමාගේ අනුමැතියත් මේ සඳහා ලැබී තිබෙනවා. මෙය, මීගමුව ආසනයේම තිබෙන කොටසක්. වත්තල ප්‍රාදේශීය සභාවටයි ඈඳ තිබෙන්නෙ. නමුත් මේ ප්‍රදේශයට අදාළවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලීසිය, අධ්‍යාපන කාර්යාලය යන මේ සියල්ලම සම්බන්ධ වන්නේ මීගමුවටයි. ඒ පිළිබඳව තමුන්නාන්සේගේ විශේෂ අවධානය යොමු කර, ඊළඟ මැතිවරණයට පෙර මේ කටයුත්ත කර දෙන්නය කියා මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා
*(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)*
(The Hon. Nandimithra Ekanayake)

දැනට ඒ පිළිබඳව කටයුතු කෙරීගෙන යනවා. ඒ ගැන මම සොයා බලන්නම්.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
*(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)*
(Mr. M. Joseph Michael Perera)

තමුන්නාන්සේට මම ස්තුතිවන්ත වෙනවා. ගරු අමාත්‍යතුමනි, මා එය නැවත මතක් කළේ, මේ සඳහා ගරු ආනන්ද මුණසිංහ මන්ත්‍රීතුමාගේ අනුමැතිය ලැබී තිබෙන නිසා, මේ කටයුත්ත ඉක්මනින් කරන්න ඕනෑ බැවිනුයි.

ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන්ම පළාත් පාලන ක්‍රමය තුළ නිසි සම්බන්ධීකරණයක් ඇති කිරීම වැදගත්ය කියන කාරණය තමුන්නාන්සේලාගේ පැත්තෙනුත්, අපේ පැත්තෙනුත් මතුවුණා. කරුණු කියැවුණා. ඒක අති විශේෂ දෙයක්. පළාත් පාලන ආයතන මට්ටමේ සම්බන්ධීකරණයක් පළාත් සභාවට නැහැ. පළාත් සභාවේ සම්බන්ධීකරණයක් රජය එක්ක නැහැ. මේක ඉතාම වැදගත් කාරණයක්. අඩු තරමින් පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් පළාත් සභාවේ රැස්වීමට හෝ, ඒ වාගේම පළාත් සභාවල මහ ඇමතිවරුන් කැබිනට් මණ්ඩලයට හෝ කැඳවීමේ විශේෂ සම්බන්ධතාවක් ඇති කර ගත්තොත් තමයි, පරිපාලන ව්‍යුහය සාර්ථක බවට පත් වන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට වඩා මම කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මට වෙලාව දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 1.42]

පී. පී. දේවරාජ් මහතා
*(திரு. பீ. பீ. தேவராஜ்)*
(Mr. P. P. Devaraj)

*கௌரவ தவிசாளர் அவர்களே, எனக்கு ஒதுக்கப்பட்டிருக்கின்ற குறுகிய கால அவகாசத்தில் ஒரு சில விடயங்களை மாத்திரம் நான் குறிப்பிட விரும்புகிறேன். முதலாவதாக, மாகாண சபை, உள்ளூராட்சி அமைச்சைப் பற்றி இங்கு பலரும் பிரஸ்தாபித்தார்கள். மாகாண சபைக்கும் மத்திய அரசுக்கும் இடையில் சரியான உறவுகள் நிலவவில்லை என்றும், மாகாண சபைக்குப் பல்வேறு அதிகாரங்கள் பகிர்ந்தளிக்கப்பட்டிருந்தபோதிலும் கூட, நடைமுறையில் அவை செயற்படுத்தப்படுவதில்லை என்றும் முன்னாள் முதல் அமைச்சர் அவர்களும் பிரதி அமைச்சர் மஹிந்தானந்த அளுத்கமகே அவர்களும் மிகத் தெளிவாகச் சுட்டிக்காட்டினார்கள். உதாரணத்துக்காக, சில மருந்து வகைகள் வாங்கும்போது ஏற்பட்ட தகராறை அவர் இங்கு குறிப்பிட்டார். எனவே, இந்த மாகாண சபை அமைச்சு எவ்வாறு செயற்படுகின்றது? மாகாண சபைகளுக்குக் கிடைக்க வேண்டிய உரிமைகள், சலுகைகள் என்பன கிடைக்காவிட்டால், நேரடியாக ஜனாதிபதி அவர்களிடம் செல்ல வேண்டியிருக்கின்றது; வேறு எங்கு சென்றாலும் இந்தக் காரியங்களைச் செய்ய முடிவதில்லை என்றும் அவர் குறிப்பிட்டார். இந்த நிலையில் மாகாண சபை அமைச்சர் ஒருவர் இருப்பதில் என்ன பிரயோசனம் என்று எனக்குக் கேட்கத் தோன்றுகிறது.*

*எனவே, இந்த விடயத்தை மாத்திரம் கூறிவிட்டு நான் மற்றைய விடயத்துக்கு வர விரும்புகிறேன். மாகாண சபைக்கும் அமைச்சருக்கும் உள்ள அதிகாரங்கள், அவர்களுக்கிடையே உள்ள தொடர்புகள் பற்றியும், மாகாண சபைக்குக் கொடுக்கப்பட்டிருக்கும் அதிகாரங்களைச் சரிவரச் செயற்படுத்துவதற்கு என்ன நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பது பற்றியும் சிந்திக்க வேண்டியிருக்கிறது.*

*பொது நிர்வாக அமைச்சோடு சம்பந்தப்பட்ட சில விடயங்களைப் பற்றி இங்கே சுட்டிக்காட்ட விரும்புகிறேன். மாண்புமிகு ரிச்சட் பத்திரண அவர்கள் மிகத் திறமையான ஓர் அமைச்சர். அவர் கல்வி அமைச்சராக இருந்தபோது, பல நல்ல காரியங்களைச் செய்து எல்லோருடைய பாராட்டுக்களையும் பெற்றிருக்கிறார். மலையகத்தில் நீண்ட காலமாகத் தமிழ் ஆசிரியர்கள் குறைபாடு இருந்து வந்தது. முதன்முதலில் இந்த அமைச்சர் அவர்களின் காலத்தில்தான் தமிழ் ஆசிரியர் குறைபாட்டை நிவர்த்தி செய்யக் கூடியதாக இருந்தது என்பதை நான் குறிப்பாகச் சொல்ல வேண்டும். அதற்காக அவருக்கு நாங்கள் எங்களுடைய பாராட்டுக்களை நிச்சயம் தெரிவித்துக்கொள்ள வேண்டும். அதேபோல அவர் பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், நிர்வாக மறுசீரமைப்பு அமைச்சிலும் தனது திறமையைக் காட்டுவார் என்று நினைக்கிறேன்.*

*தற்போது நுவரெலியா, பதுளை ஆகிய இரண்டு பகுதிகளுக்கும் கிராமசேவகர் நியமனங்கள் வழங்ககப்பட்டிருக்கின்றன. அந்தக் கிராமசேவர்களுக்குரிய வசதிகள் செய்து கொடுக்கப்படவில்லை என்று இங்கே முதலில் பேசியவர்களாலும் சுட்டிக்காட்டப்பட்டது.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

அதேவேளை, நுவரெலியாவிலும் பதுளையிலும் இன்னும் சில வெற்றிடங்கள் நிரப்பப்படாமல் இருக்கின்றன. There are some vacancies which are not filled. I think, Hon. Minister, you should look into that matter. I think there are seven vancancies in Badulla and a lesser number of vacancies in Nuwara Eliya. I do not know the reason why these vacancies are not filled. எனவே, அந்த வெற்றிடங்களையும் நிரப்புவதற்கு ஏற்பாடு செய்ய வேண்டும் என்று கேட்டுக்கொள்கிறேன்.

அடுத்ததாக, நுவரெலியா, பதுளை ஆகிய பகுதிகளில் உள்ள சில பிரதேச செயலகங்களில் தமிழ் மொழியை ஆவண மொழியாகப் பேணலாம் என்று தீர்மானிக்கப்பட்ட நேரத்தில், மற்றைய இடங்களிலும் வசதிகள் இருந்தால் அவ்வாறு செய்யப்பட வேண்டும் என்று கொள்கையளவில் ஏற்றுக்கொள்ளப்பட்டது. கொழும்பு மாவட்டத்திலே கணிசமான அளவில் தமிழ் பேசும் மக்கள் வாழ்கிறார்கள். கொழும்பு பிரதேச செயலாளர் பிரிவிலும் திம்பிரிக்கஸ்யாய பிரதேச செயலாளர் பிரிவிலும் ஆவணங்களைத் தமிழில் பேணுவதற்கு உடனடியாக ஏற்பாடுகளைச் செய்து, அங்கு தமிழ் பேசும் பிறப்பு, இறப்புப் பதிவாளர்களை நியமிப்பதற்கும் நடவடிக்கைகள் எடுக்க வேண்டும்.

இங்கு கணிசமான அளவு தமிழ் பேசும் மக்கள் முஸ்லிம் மக்கள் தமிழ் மக்கள் - வாழ்கின்றார்கள். ஆனால், அங்கு தமிழ் மொழியிலே தமது நடவடிக்கைகளை மேற்கொள்ளக் கூடிய வசதியில்லை. எனவே, அந்த வசதிகள் செய்யப்படல் வேண்டும். இதைப் போன்று மேலும் சில பிரதேசச் செயலகப் பிரிவுகளிலும் தமிழ் மக்கள் மிகவும் செறிவாக வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். நவரெலியா, பதுளைப் பகுதிகளில் எவ்வாறு தனது மொழிக் கொள்கையை அரசு ஏற்கெனவே அமுல் நடத்தியிருக்கிறதோ, அதே போன்று தமிழ் மக்கள் செறிவாக வாழும் பிரதேசங்களிலும் அக்கொள்கையை அமுல் நடத்துவதற்கு அரசு முயற்சி செய்வது அவசியம் என்று நான் கருதுகின்றேன்.

பிரதேசச் செயலாளர் பிரிவுகளைப் பொறுத்தவரையில், இந்தப் பிரதேச செயலாளர் பிரிவுகளில் மாற்றமேற்படுத்துவது பற்றி ஆராய ஓர் ஆணைக் குழு செயற்பட்டது. தனது விசாரணைகளை மேற்கொண்ட இந்த ஆணைக் குழு எந்தெந்தப் பிரதேசச் செயலாளர் பிரிவில் மாற்றங்கள் ஏற்படுத்தப்பட வேண்டும் என்பது பற்றிய ஒருசில முடிவுகளை எடுத்துள்ளது. நுவரெலியாவிலே மேலும் எத்தனை பிரதேசச் செயலாளர் பிரிவுகள் அமைக்கப்பட வேண்டும்; பதுளையிலே பரதேசச் செயலாளர் பிரிவு எப்படி அமைய வேண்டும்; கண்டி இரத்தினபுரி மற்றும் பல்வேறு இடங்களிலும் எவ்வாறு பிரதேசச் செயலாளர் பிரிவுகள் அமைய வேண்டும் என்பன பற்றி முடிவு செய்திருந்தது. அந்த ஆணைக் குழு அந்தந்தப் பகுதிகளில் உள்ள மக்களின் தன்மை மற்றும் விகிதாசாரம் என்பவற்றைக் கவனத்திலெடுத்து அவற்றிற்கேற்றபடி பிரதேசச் செயலாளர் பிரிவுகள் அதிகரிக்கப்படல் வேண்டும் என்ற ஒரு முடிவையும் எடுத்திருந்தது. ஆனால், அந்த முடிவுகள் இன்னும் அமுல் நடத்தப்படாமல் உள்ளன. அதற்கு என்ன காரணமோ தெரியவில்லை.

தமிழ் பேசும் மலையக மக்களுடைய ஒரு முக்கிய கோரிக்கை என்னவென்றால், சம்பந்தப்பட்ட பிரதேசச் செயலாளர் பிரிவுக் காரியாலயங்களிலே தமிழ் பேசும் உத்தியோகத்தர்கள் கடமையாற்ற வேண்டும் என்பதாகும். குறிப்பாக, மலையகத்தைச் சேர்ந்த உத்தியோகத்தர்கள் அங்கு பணியாற்ற வேண்டும் என்பதாகும். ஒரு பிரதேசச் செயலாளர் பிரிவிலே சுமார் 70% சத வீதம் தமிழ் மக்கள் வாழ்ந்தால், அங்குள்ள பிரதேசச் செயலாளர் தமிழராக இருக்க வேண்டும். அதாவது, அவர் தமிழ் பேசுபவராக இருக்க வேண்டும். அதைவிடச் சற்றுக் குறைவான வீதத்தில் ஒரு பிரதேச செயலாளர் பிரிவில் தமிழ் மக்கள் வாழ்ந்தால், உதவிப் பிரதேசச் செயலாளர் தமிழராக இருக்க வேண்டும். அங்கு கடமை புரியும் ஏனைய உத்தியோகத்தர்களாகத் தமிழர்களும் இருக்க வேண்டும். இந்த நாட்டிலே பல்வேறு இனங்களுக்கிடையேயும் நல்லுறவை ஏற்படுத்துவதற்கு உண்மையிலே இந்த விடயங்கள் எல்லாவற்றையும் கவனத்தில் எடுத்துச் செயற்படுவது மிகவும் அவசியமானதாகும்.

தமிழ் பேசும் உத்தியோகத்தர்களில் பெரும்பாலானோர் சிங்கள மொழியையும் பேசக் கூடியவர்களாக இருப்பதை நீங்கள் அவதானித்திருப்பீர்கள். அரசாங்கம் பல இனத்தையும் சேர்ந்த உத்தியோகத்தர்களை அந்தந்தப் பிரதேசத்திற்கு ஏற்ற வகையில் நியமித்தால், அது இனங்களுக்கிடையில் நல்லுறவை ஏற்படுத்துவதில் மிக முக்கியமானதொரு அம்சமாகவிருக்கும் என்று நான் நினைக்கின்றேன். எனவே, அமைச்சர் அவர்கள் வெகு சீக்கிரமாக, இந்த விதமாகப் பிரதேசச் செயலாளர் பிரிவுகளில் மாற்றங்களை ஏற்படுத்த வேண்டும். எவ்வாறு நுவரெலியா, பதுளை போன்ற மாவட்டங்களிலே புதிதாகத் தமிழ் பேசும் கிராம உத்தியோகத்தர்கள் நியமிக்கப்பட்டார்களோ, அதேபோன்று மாத்தளை, கண்டி மற்றும் எங்கெங்கு எல்லாம் தமிழ் பேசும் மக்கள் செறிவாக வாழ்கின்றார்களோ, அந்தந்தப் பகுதிகளின் தன்மையை மனதிற் கொண்டு அதற்கு ஏற்ற படியாக மாற்றங்களை ஏற்படுத்த வேண்டும் என்று நான் அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்த உள்ளூராட்சி மன்றங்கள் பற்றிய ஒரு கருத்தை நான் இங்கு கூற வேண்டியுள்ளது. அதாவது உள்ளூராட்சி மன்றத் தேர்தல் முறையில் சில சீர்திருத்தங்கள் மேற்கொள்வதற்காக இப்பொழுது ஆலோசனைகள் பெறபட்டு வருகின்றன. மலையகத்திலும் மற்றும் இலங்கையின் பல்வேறு பிரதேசங்களிலும் சில இனத்தினர் சில இடங்களில் செறிந்தும் சில இடங்களில் பரந்தும் வாழ்கின்றனர். என்வே, சரியானமுறையில் தேர்தல் முறையை வகுக்காவிட்டால், உள்ளூராட்சிச் சபைகளில் சிறுபான்மை மக்களுக்குப் பிரதிநிதித்துவம் கிடைக்காது போய்விடும். அங்கு சிறுபான்மை மக்களின் பிரதிநிதித்துவம் உறுதிப்படுத்தப் படாவிட்டால், நாட்டில் சௌஜன்யம் நிலவாது; அந்த மக்களின் குறைநிறைகளைப் பற்றி உள்ளூராட்சிச் சபையில் எடுத்துச் சொல்வதற்கு அவர்களின் பிரதிநிதிகள் இருக்கமாட்டார்கள். எனவே, எந்த முறையில் மாற்றங்கள் ஏற்படுத்தப்பட்டாலும், அந்த முறை இந்த மக்களின் பிரதிநிதித்துவத்தை உறுதிப்படுத்தக் கூடியதாக இருக்க வேண்டும். இது பற்றிய விரிவான ஆலோசனைகளை நாங்கள் குறித்த ஆணைக்குழுவிடம் சமர்ப்பித்திருக்கின்றோம். தேர்தல் முறையில் என்னென்ன மாற்றங்களைச் செய்தாலும், அந்தந்தப் பகுதிகளில் கணிசமாக வாழும் சிறுபான்மை இனத்தவருடைய பிரதிநிதிகள் உள்ளூராட்சிச் சபைகளில் பிரதிநிதித்துவம் செய்யக் கூடிய வகையில் Voting system அல்லது தேர்தல் முறையிலுள்ள பிரிவுகள் அமைய வேண்டும். சிறுபான்மை மக்களுடைய பிரதிநிதித்துவம் குறித்த சபைகளில் இல்லாமல் போனால், இன சௌஜன்யம் நிலவாது; இனங்களுக்கிடையில் நல்லுறவு ஏற்படாது. எனவே, உள்ளூராட்சி மன்றங்களுக்கான தேர்தல் முறையில் மாற்றங்கள் செய்யும் போது, இந்த விடயங்கள் எல்லாவற்றையும் அமைச்சர் அவர்கள் கவனத்தில் எடுத்துக் கொள்ள வேண்டும் என்று கேட்டு, என்னுடைய பேச்சை முடித்துக் கொள்கின்றேன். நன்றி.

[අ. භා. 1.50]

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**

*(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சர்)*

(The Hon. Nandimithra Ekanayake – Minister of Provincial Councils and Local Government)

ගරු සභාපතිතුමනි, මේ ඉදිරිපත් වුණු අදහස් ගැන කෙටියෙන් හෝ පිළිතුරු ලබා දෙන්නට අවස්ථාවක් ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ අවස්ථාව සලසා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පළමුවෙන්ම මම කියන්නට ඕනෑ, අපේ මුස්ලිම් හා දෙමළ මන්ත්‍රීවරු වැඩි වශයෙන් අදහස් දක්වූයේ උතුරු - නැගෙනහිර පළාත් සභාව මුල් කර ගෙනයි. විශේෂයෙන් අලිෂාහිර් මවුලානා මන්ත්‍රීතුමා උතුරු - නැගෙනහිර පළාත් සභාව පිළිබඳව කිව්වා. එහි සේවය කරන්නේ විශ්‍රාම ගිය නිලධාරීන් නිසා අලුතෙන් නිලධාරීන් පත් කිරීමට කටයුතු කරන්නැයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා]

කියා. මම බොහොම සංතෝෂයෙන් කියන්න ඕනෑ, අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. නමුත් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේණි බොහෝමයකම නිලධාරීන් පත් කිරීමේ බලය තිබෙන්නේ ඒ පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිසමටයි කියන එකත් මම මේ අවස්ථාවේ මතක් කර දෙන්න ඕනෑ. ප්‍රධාන ලේකම්වරයා හැරුණුකොට අනෙක් සියලුම පත්වීම් කෙරෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී තිබෙන බලතල අනුවයි. ඒ අනුව සමහරක් පත්වීම් පළාත් රාජ්‍ය සේවා කොමිසම මඟින්නුත් අනෙක් පත්වීම් කෙලින්ම අණ්ඩුකාරතුමා මඟින්නුත් කෙරෙනවා.

ඒ කෙසේ වෙතත් මේ ප්‍රදේශයට තිබෙන මූලික ගැටලුව නම් නිලධාරීන් හිඟවීමයි. විශේෂයෙන්ම මුස්ලිම් ජන කොට්ඨාශය ගැන කථා කළා, මුස්ලිම් නිලධාරීන්ගේ හිඟය, අඩුව පිරවීමට තරම්වත් මුස්ලිම් නිලධාරීන් නොමැති බව තමයි අපට වාර්තා වී තිබෙන්නේ. මේ නිලධාරීන් එක තනතුරකට වඩා වැඩි ගණනක වැඩ බැලීම ගැනත් සඳහන් කළා. ඒ සම්බන්ධයෙනුත් අපි අදාළ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් අපේ මුස්ලිම් ජාතික මන්ත්‍රීවරු ඉල්ලා සිටියේ ජාතීන් අතර සමබරතාවයක් ඇති වෙන විධියට මේ පත්වීම් කරන්නය කියන එකයි. ඒකටත් පිළිතුර එයමයි.

ඊළඟට මම කියන්නට ඕනෑ, මේ රජයේ සේවයේ පත්වීම් කෙරෙන ක්‍රම දෙකක් තිබෙනවා. එකක් රාජ්‍ය පරිපාලන සේවය යටතේ දීප ව්‍යාප්ත සේවාවන් යටතේ පත්වෙන නිලධාරීන්, අනෙක පළාත් රාජ්‍ය සේවාව යටතේ පත්වෙන නිලධාරීන්. මේ සියලුම කටයුතු වලදී අපේ අමාත්‍යාංශයට හැකියාව තිබෙන්නේ තමුන්නාන්සේලාගේ අදහස් ඒ ඒ අමාත්‍යාංශය වෙත යොමු කිරීමත්, ඒ සම්බන්ධීකරණය ගොඩ නඟන්න කටයුතු කිරීමත් පමණයි. ඒ හැරුණු කොට ඒ අදළ කිසිම නිලධාරියෙක් – පළාත් පාලන කොමසාරිස්වරුන් ගැන කථා කළා, – ඒ පත්වීම් කිසිවක් මගේ අමාත්‍යාංශය යටතේ කරන්න බැරි බව මම බොහොම කරුණාවෙන් තමුන්නාන්සේලාට මතක් කර දෙන්න ඕනෑ. මොකද, සම්පූර්ණයෙන්ම මෙය විමධ්‍යගත විෂයයක් යටතේ ක්‍රියාත්මක වෙන විෂයයක්. ඒ නිසා මම ඒ ගැන මීට වඩා යමක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

විශේෂයෙන් ප්‍රාදේශීය සභාවල සභාපතිවරු, උප සභාපතිවරු සේවයෙන් ඉවත් කිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් වුණා. මහරගම, කොලොන්නාව යන ප්‍රාදේශීය සභාවල සභාපතිවරු ඉවත් කිරීමේ බලය තිබෙන්නේ මගේ අමාත්‍යාංශයටවත්, මටවත්, මගේ නිලධාරීන්ටවත් නොවෙයි. විමධ්‍යගත විෂයයක් වශයෙන් ඒ බලය සම්පූර්ණයෙන්ම තිබෙන්නේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ධූරයටයි. පළාත් පාලන අමාත්‍ය ධූරය සැබවින්ම හොබවන්නේ ප්‍රධාන අමාත්‍යවරයයි. ඉතින්, ඒ ක්‍රියාමාර්ග ගෙන තිබෙන්නේ විගණකාධිපතිගේ හා වෙනත් නොයෙකුත් චෝදනා පිළිබඳව ඉදිරිපත් වන කරුණු පරීක්ෂා කිරීමෙන් අනතුරුවයි.

ඒ වගේම වයඹ පළාතේ පුත්තලම නගර සභාවේ සභාපතිවරයා පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙනුත් කියන්නට ඕනෑ. ඔහුගේ වැඩ තහනම් කර තිබෙන්නේ විගණකාධිපති ඉදිරිපත් කළ කරුණු හා චෝදනා සැලකිල්ලට අරගෙන බව. ඊට පසුව ඊට විරුද්ධව නැවතත් ඉදිරිපත් වුණු කරුණු සලකා බලා මූලික පරීක්ෂණය සඳහා මාසයකුත් කල් ගත වුණාට පසුව ඔහුව නැවත සේවයේ පිහිටුවා තිබෙනවා. කෙසේ වෙතත් පනතේ විධි විධාන යටතේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයකු පත් කර මෙම පරීක්ෂණය නිම කර තිබෙනවා. ඒ අනුව සභාපතිවරයා පිළිබඳව වහාම තීරණයක් ගැනීමට කටයුතු කර තිබෙනවා.

ඊළඟට මම මගේ විෂය පථයෙන් පොඩ්ඩක් ඈතට ගිහින් මට සහයෝගය දුන් අමාත්‍යවරුන්ට සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ටත්, මෙම සභාවේ කරුණු ඉදිරිපත් කළ සියලු දෙනාටත් මගේ ස්තූතිය පුද කරන්නට ඕනෑ.

මේ සම්බන්ධීකරණය ගොඩ නැඟීම සම්බන්ධයෙන් මහින්දනන්ද අලුත්ගමගේ නියෝජ්‍ය අමාත්‍යතුමා අදහස් ඉදිරිපත් කළා. ජේයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමාත් ඒ සම්බන්ධයෙන් කථා කළා. ඇත්තෙන්ම කැබිනට් එකට මහා අමාත්‍යවරුන්ට එන්නට අවස්ථාවක් සලසා දෙන්නැයි කිව්වා. ඒ පිළිබඳව ප්‍රතිපත්ති තීන්දුවක් ගැනීමේ හැකියාව තිබෙන්නේ අපට නොවෙයි. අපි ඒ කරුණුත් අතිගරු ජනාධිපතිතුමියට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ප්‍රාදේශීය මට්ටමෙන් සම්බන්ධීකරණය කෙරෙන ආයතන කිහිපයක් තිබෙනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තිබෙනවා. මේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිත්වය උසුලන්නේ ඒ දිස්ත්‍රික්කයේ දේශපාලන නායකයෙක්, ඒ කියන්නේ කැබිනට් අමාත්‍යවරයෙක් හෝ මේ පාර්ලිමේන්තුවට නියෝජනය කරන නියෝජ්‍ය අමාත්‍යවරයෙක්. ඊළඟට ඒ පළාත නියෝජනය කරන ප්‍රධාන අමාත්‍යවරයා අනිවාර්යයෙන්ම සම සභාපතිත්වයට පත් වෙනවා. ඒ නිසා එතැනදී ඒ ප්‍රදේශයේ කටයුතු පිළිබඳව සාකච්ඡා කර තීන්දු ගැනීමේ හැකියාව තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මුල් කර ගෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව ඊට පහළ තලයේ තිබෙනවා. ඒ අදළ කොට්ඨාසයේ ඉන්නා සියලුම ප්‍රාදේශීය සභා සභාපතිවරු ඇතුළු නගරාධිපතිවරු, ඒ වගේම ඒ හා සමාන්තර ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් යන මේ සියලු දෙනාම ඒ කමිටුවට රැස් වෙනවා. පළාත් සභා මන්ත්‍රීවරුත් සහභාගී වෙනවා.

ඒ නිසා ඊට පල්ලෙහා තලයේ යම් යම් තීන්දු ගැනීමේ අවස්ථාව, ප්‍රමුඛත්වය හඳුනා ගැනීමේ අවකාශය, එතැන තියෙනවා. එතැනින් ඉහළට තමයි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තියෙන්නේ. ඒ නිසා ඒ පැත්තෙන් සම්බන්ධීකරණය පිළිබඳව ඒ තරම් ගැටලුවක් නැහැ කියා මම හිතනවා. කනගාටුවට කාරණය, ඒ රැස්වීම් සඳහා ඒ මන්ත්‍රීවරු හුඟ දෙනකු සහභාගී නොවීමයි. එසේ සහභාගී වනවා නම් මේ ප්‍රශ්න මෙපමණ දුරට එන්නේ නැතුව එහිදීම විසඳා ගන්න හුඟාක් දුරට පුළුවන්කම තිබෙන බව මම ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ අදහස් දක්වූ සියලු දෙනාටම – හුඟ දෙනකු බොහොම හොඳ අදහස් දක්වූවා. – අවසාන වරට මම නැවතත් ස්තූතිවන්ත වනවා.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ගැන කථා කළා. විශ්‍රාම වැටුප් ප්‍රමාද වීමට එක හේතුවක් වී තිබෙන්නේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේම දුර්වලකම නොවන බව මම මගේ අත්දැකීමෙන් කියන්න ඕනෑ. මොකද ? යම්කිසි සේවයක නිරතවන නිලධාරියකු විශ්‍රාම ගියාට පස්සේ ඒ අදළ දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය කඩදසි, ලිපි ලේඛන, වාර්තා ආදිය කලට වේලාවට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවනවා නම්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රමාදයෙන් තොරව ඒ කටයුතු කරන්න පුළුවන්. ඒ සඳහා දක්ෂ අධ්‍යක්ෂවරියක් සහ කාර්ය මඩුල්ලක් එතැන ඉන්නවාය කියන එකත් මතක් කරමින්, මේ අවස්ථාවේදී සියලුම මන්ත්‍රීවරුන්ට, නිලධාරීන්ට, අමාත්‍යාංශයේ සියලුම සේවක මහත් මහත්මීන්ට මගේ අවංක ආදර ස්තූතිය පුදකරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා

[අ. භා. 1.56]

**ගරු රිචර්ඩ් පතිරණ මහතා (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

*(மாண்புமிகு றிச்சட் பத்திரண - பொதுநிர்வாக, உள்நாட்டு அலுவல்கள், நிருவாக மறுசீரமைப்பு அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)*

(The Hon. Richard Pathirana – Minister of Public Administration, Home Affairs and Administrative Reforms and Leader of the House of Parliament)

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශය සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් කරුණු දක් වූ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මගේ ස්තූතිය මම පිරිනමන්න කැමැතියි. කාලය සීමිත නිසා සමහර මන්ත්‍රීවරුන්ට මෙහිදී පිළිතුරු දෙන්න අපහසු වුවත් අවශ්‍ය පිළිතුරු ලියා පදිංචි තැපෑලෙන් එතුමන්ලා වෙත එවන බවත් මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයක ටෙලිෆෝන් බිල්පත් වගයක් ගැන සුනිල් හඳුන්නෙත්ති ගරු මන්ත්‍රීතුමා කිව්වා. හිටපු නියෝජ්‍ය අමාත්‍යතුමකු ලබා ගත් ටෙලිෆෝන් පණිවුඩ ගැන කථාවකුත් එතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිව්වා. මම තමුන්නාන්සේට කියන්න කැමැතියි, මම දන් දිවා භෝජනය ගන්නා අතරේ මගේ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිතුමාට කිව්වා, කිසිම දෙයක්, කිසිම මුදලක් නීති විරෝධී ලෙස වක්‍රලේඛවලට පටහැනිව වියදම් කරන්න එපාය කියා. මට හෝ කිසිම නිලධාරියකුට හෝ එහෙම වියදම් කළොත් අනිවාර්යයෙන්ම මම ඒ අයට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනවා. මම තමුන්නාන්සේට ඒ සහතිකය දෙන්නම්. මම අවුරුදු හයක් මේ රටේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට හිටියා. කවදාවත් කිසිම දවසක මට අයිති නැති දෙයක් මම අරගෙන නැහැ. මට මාසයකට තිබෙන පෙට්‍රල්වලට දෙන වියදමවත් මම කවදාවත් සම්පූර්ණයෙන්ම අරගෙන නැහැ. අදත් මම ගන්නේ නැහැ. බස්නාහිර පළාතෙන් පිටත අමාත්‍යවරයකුට පෙට්‍රල්වලට රු. 70,000ක් තිබෙනවා. ඒකෙන් රු. 35,000ක් වත් මම ගන්නේ නැහැ. ඒ වාගේම ඒ අවුරුදු හයටම මම කවදාවත් හෝටලයකට ගිහින් කෑම කාලා අමාත්‍යාංශයට බිලක් එව්වා නැහැ. අවුරුදු හයටම කවදාවත් එව්වා නැහැ. මට ඕනෑ නම් කොළඹ ඕනෑම හෝටලයකින් කෑම ගෙන්වා ගන්න පුළුවන්. නමුත් මම එහෙම ගෙන්වා ගෙන නැහැ. හෝටලයකට ගිහින් කෑම කාලා බිලක් අත්සන් කරලා කවදාවත් අමාත්‍යාංශයට එව්ලා නැහැ, ඒ අවුරුදු හයටම. ඉදිරියටත් මම ක්‍රියා කරන්න බලාපොරොත්තු වන්නේ ඒ විධියටම තමයි. මම ඒක කියන්න ඕනෑ.

මගෙන් වරදක් වනවා නම්, මගේ නිලධාරීන්ගෙන් වරදක් වනවා නම් කියන්න තමුන්නාන්සේලා ඕනෑම කෙනකුට අයිතියක් තිබෙනවා. එහෙම වුණා නම් මම පිළිගන්නවා. මගේ වැරදි නැහැයි කියා මම කියන්නේ නැහැ. වැරදි ඇති, ඕනෑතරම්. අමාත්‍යතුමා මේක වැරදියි කියා තමුන්නාන්සේලාට කියන්න පුළුවන්. දේවරාජ් මන්ත්‍රීතුමාත් දන් ඒ වාගේ දෙයක් කිව්වා. දෙමළ භාෂාව කථා කරන ප්‍රදේශවල දෙමළ භාෂාව දන්නා නිලධාරීන් ඉන්න ඕනෑ. එහෙම නැත්නම් කසාද බඳින්න ඇවිත් නම කිවුවාම දන්නේ නැහැ, වයස කිවුවාම දන්නේ නැහැ. ඒක ලොකු ප්‍රශ්නයක්. එම නිසා මම ඔබතුමාට කියන්න කැමැතියි, මගේ කාලයේදී මම තමුන්නාන්සේලාගේ ඒ අසාධාරණයට ලක් වුණු අයගේ ප්‍රශ්න විසඳ දෙන බව. ඒක මම පැහැදිලිවම කියනවා. භාෂාව නිසා කිසි කෙනකුට අසාධාරණයක් වන්න මම ඉඩ තියන්නේ නැහැ. අධ්‍යාපන අමාත්‍ය ධුරය දරන කාලයේත් මම එහෙම ඉඩ තිබ්බේ නැහැ. දේවරාජ් මන්ත්‍රීතුමා දන්නවා. එතුමන්ලාගේ හිටපු නායක දිවංගත තොණ්ඩමන් මැතිතුමා මට බොහොම ආදරයෙන් හිටියා. මොකද ? එතුමා කිවුව හුඟාක් දේවල් මම ඉෂ්ට කර දුන්නා. ඒ පළාතට ගිහින් ඉස්කෝල දියුණු කරන්න, ඒ දුප්පත් කම්කරුවන්ගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න පුළුවන් විධියටයි මම වැඩ කළේ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමාත් කරුණු කීපයක් මට කිව්වා. මම ඒවා ලියා ගත්තා. වක්‍ර ලේඛයක් ගැන කිව්වා. ඒ වාගේම වාහන ගෙන්වීම පිළිබඳ ප්‍රශ්නයක් ගැනත් කිව්වා. මගේ පර්මිට් එකත් මා ළඟ තවම තිබෙනවා. මේ අයවැය ලේඛනයෙන් ගත්ත තීරණය නිසා මගේ පර්මිට් එකටත් මට වාහනයක් ගෙන්වන්න බැරි වුණා. ඒක මා ළඟ තවම තිබෙනවා. හැබැයි, පත්තරවල තිබුණා. ඔන්න අයවැය ලේඛනයේ රහස් දැන ගෙන අමාත්‍යවරු පර්මිට්වලට වාහන ගෙන්වන්න කටයුතු කළාය කියා. මගේ පර්මිට් එක ඕනෑ කෙනකුට හෙට වුණත් දෙන්නම්. මා ළඟ තිබෙනවා. ඕනෑ කෙනකුට දෙන්නම්, පුළුවන් නම් වාහනයක් ගෙන්වා ගන්න. මම එහෙම කියන්නේ මොකද ? මා මේ අමාත්‍ය ධුරයේ ඉන්නතුරු, මහජන නියෝජිතයෙක් හැටියට ඉන්න තුරු මහජන මුදල් හෝ වෙනත් විෂමාචාරයක් මම කරන්නේ නැති බව මතක තියා ගන්න. මම තමුන්නාන්සේලාට ඒ සහතිකය දෙන්නම්. කවද හරි එහෙම කළොත් අහන්න. මේ වැඩය කර තිබෙනවා නේද මහත්මයා, හොඳ නැහැ නේද ? කියා පැහැදිලිව අහන්න. මම, මා ගැන කියනවා. වෙන අය ගැන කියන්න මට බැහැ. මම කොහොමද වෙන කෙනෙක් ගැන කියන්නේ ? [බාධා කිරීමක්] නැහැ. මම හිටපු සංවිධායකතුමා තමයි, දන් සභානායකම මට දී තිබෙනවා. මම ගැන මට කියන්නට පුළුවන්. මම කොහොමද වෙන කෙනෙක් ගැන කියන්නේ ? තමුන්නාන්සේලාට කියන්න පුළුවන්ද ? බැහැ නේ ? තමුන්නාන්සේලාට පුළුවන්ද, වෙන කෙනෙක් ගැන සහතිකයක් දෙන්න ? බැහැ. මම හොරකම් කරන්නේ නැතිව, මහජන මුදල් විනාශ කරන්නේ නැතිව වැඩ කරනවාය කියා මම කියන්නට කැමැතියි. ඒ වාගේම මම මේ සභාවේ ඉන්නකම්, මම මේ ඇමතිධුරය දරනකම්, විපක්ෂයේ වුණත් ආණ්ඩු පක්ෂයේ වුණත් ඕනෑම කෙනෙකුගේ දුක් ගැනවිල්ලක් තිබේ නම් ඒ ගැන සලකා බලා සාධාරණය ඉෂ්ට කරන්නට කැමැතියි. එවැනි දේ ගැන මෙතෙක් කල් විපක්ෂයේ කෙනෙක්ය කියා බලා නැහැ. මම අධ්‍යාපන ඇමති ධුරය දරු කාලයේදීත් එහෙමයි. ඉදිරියටත් එහෙමයි, තමුන්නාන්සේලාගේ දුක් ගැනවිල්ලක් තිබෙනවා නම් මට ඒක කිව්වොත් මම ඒකට විසඳුමක් ලබා දෙනවා. මේ පාර්ලිමේන්තුවෙන් ගියායින් පසුවත් ගරු සභාපතිතුමනි, අප එකිනෙකා හමු වෙනවා. එහෙම හමු වුණාම මූණ බලා සිනාසෙන්න ඕනෑ. මේක ඇතුළේ රණ්ඩු වෙලා හතුරන් වගේ යන්න වැඩක් නැහැ නේ ? මම වැඩ කරන්නේ එහෙමයි. ඒක නිසා මම තමුන්නාන්සේලාට කියන්නට කැමැතියි, අපට රණ්ඩු වෙන්නට උවමනාවක් නැහැ. මගේ අමාත්‍යාංශය ගැන නම් කිසිම රණ්ඩුවක් වෙන්න ඕනෑ නැහැ. ඕනෑ දෙයක් කියන්න. [බාධා කිරීමක්]

මේ අවස්ථාවේදී මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, අනික් සියලුම නිලධාරීන්ටත්, – සියලු නිලධාරීන්ගේ නම් කියන්න බැහැ – දෙපාර්තමේන්තු ප්‍රධානීන්ටත්, විශේෂයෙන්ම පරිපාලන අධිකාරියේ ලේකම් ඩික්සන් නිලවීර මැතිතුමා ඇතුළු සියලු දෙනාටත් මට ලබා දෙන සහයෝගය ගැන මගේ ගෞරවයක් ස්තුතියක් පුද කරන්නට කැමැතියි. ඉදිරියේදී වඩාත් හොඳින් කාර්යක්ෂමව මේ අමාත්‍යාංශයේ වැඩ කරන්නට මට සහයෝගය ලබා දේවිය කියා බලාපොරොත්තු වෙමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. ස්තුතියි.

"590 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 36,34,96,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

590 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 25,75,75,000

"590 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 25,75,75,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

590 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

591 වන ශීර්ෂය.– විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 19,31,20,55,000

"591 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 19,31,20,55,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

591 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 31,00,000

"591 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 31,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

591 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

602 වන ශීර්ෂය.– රෙජිස්ට්‍රාර් ජනරාල්

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 13,52,09,000

"602 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 13,52,09,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

602 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 3,72,15,000

"602 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 3,72,15,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

602 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

605 වන ශීර්ෂය.– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 13,21,44,000

"605 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 13,21,44,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

605 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 30,66,50,000

"605 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 30,66,50,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

605 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

606 වන ශීර්ෂය.– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 18,60,45,000

"606 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 18,60,45,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

606 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 99,00,000

"606 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 99,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

606 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

607 වන ශීර්ෂය.– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 14,27,95,000

"607 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 14,27,95,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

607 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 2,17,00,000

"607 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 2,17,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

607 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

608 වන ශීර්ෂය.– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 21,83,03,000

"608 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 21,83,03,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

608 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 1,39,00,000

"608 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 1,39,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

608 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

609 වන ශීර්ෂය.– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 10,97,63,000

"609 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 10,97,63,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

609 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 1,49,00,000

"609 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 1,49,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

609 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

611 වන ශීර්ෂය.– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 7,18,54,000

"611 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 7,18,54,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

611 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 4,49,00,000

"611 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 4,49,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

611 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

612 වන ශීර්ෂය.– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 17,73,01,000

"612 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 17,73,01,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

612 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 4,20,00,000

"612 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 4,20,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

612 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

613 වන ශීර්ෂය.– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 14,55,92,000

"613 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 14,55,92,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

613 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 4,63,00,000

"613 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 4,63,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

613 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

614 වන ශීර්ෂය.– දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 11,16,68,000

"614 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 11,16,68,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

614 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 1,70,50,000

"614 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 1,70,50,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

614 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

615 වන ශීර්ෂය.–දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කච්චේරිය, යාපනය

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 10,40,06,000

"615 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 10,40,06,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

615 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 1,60,00,000

"615 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 1,60,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

615 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

616 වන ශීර්ෂය.–දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කච්චේරිය, මන්නාරම

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 3,47,59,000

"616 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 3,47,59,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

616 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 59,00,000

"616 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 59,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

616 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

617 වන ශීර්ෂය.–දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කච්චේරිය, වව්නියාව

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 3,72,42,000

"617 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 3,72,42,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

617 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 90,00,000

"617 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 90,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

617 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

618 වන ශීර්ෂය.–දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කච්චේරිය, මුලතිව්

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 2,32,66,000

"618 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 2,32,66,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

618 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම්,
රු. 10,00,000

"618 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම් සඳහා රු. 10,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

618 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම්, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

619 වන ශීර්ෂය.–දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කච්චේරිය, කිලිනොච්චිය

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම්,
රු. 3,38,20,000

"619 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 3,38,20,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

619 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1 වන වැඩ සටහන.- සිවිල් පරිපාලනය - මූලධන වියදම,
රු. 25,50,000

"619 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 25,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

619 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

621 වන ශීර්ෂය.-දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කච්චේරිය, මඩකලපුව

1 වන වැඩ සටහන.- සිවිල් පරිපාලනය - පුනරාවර්තන වියදම,
රු. 8,96,00,000

"621 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 8,96,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

621 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.- සිවිල් පරිපාලනය - මූලධන වියදම,
රු. 1,54,00,000

"621 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,54,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

621 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

Question, "That the sum of Rs.9,741,800,000, for Head 550, Programme 7, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 550, Programme 7, Capital Expenditure, ordered to stand part of the Schedule.

320 වන ශීර්ෂය.– විදුලි බල හා බලශක්ති අමාත්‍යවරයා

1 වන වැඩ සටහන. – සිවිල් පරිපාලනය – පුනරාවර්තන වියදම,
රු. 2,04,00,000

*தலைப்பு 320. – மின்வலு, சக்தி அமைச்சர்*

*நிகழ்ச்சித் திட்டம் 1. – சிவில் நிருவாகம் – மீண் வருஞ் செலவு*
*ரூபா 2,04,00,000*

HEAD 320, MINISTER OF POWER AND ENERGY

Programme 1.– Civil Administration – Recurrent Expenditure,
Rs. 20,400,000

[අ.භා. 2.02]

**පී. දයාරත්න මහතා**
*(திரு. பீ. தயாரத்ன)*
(Mr. P. Dayaratne)

ගරු සභාපතිතුමනි, 'වැඩ සටහන රුපියල් 10කින් අඩු කළ යුතුය'යි මම යෝජනා කරනවා.

විදුලි හා බලශක්ති අමාත්‍යාංශය ගැන කතා කරන මේ අවස්ථාවේදී මා බලාපොරොත්තු වෙන්නේ විදුලිබල මණ්ඩලය සහ විදුලිය කටයුතු පමණක් සාකච්ඡා කරන්නටයි. මේ අමාත්‍යාංශය යටතේ තිබෙනවා, ඛනිජ තෙල් සංස්ථාවත්, ඛනිජ තෙල් සංස්ථාවේ හිටපු සභාපතිතුමා අපේ මන්ත්‍රීවරයෙක්. ඒ නිසා ඒ පිළිබඳව එතුමා කථා කරනවා ඇතිය කියා මා හිතනවා.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේට මතක ඇති, 'ජනාධිපතිනියනි, මොකද වෙන්නේ ? කියන වැඩ සටහන යටතේ පෙබරවාරි 15 වැනිද අතිගරු ජනාධිපතිනිය 'ලක්හඬ' ගුවන්විදුලි සේවයේ කථාවක් කළා. මේ වැඩ සටහන මෙහෙය වූයේ අයිටීඑන් එකේ සභාපතිතුමායි. එකේදී එතුමා ජනාධිපතිතුමියගෙන් මෙන්න මෙවැනි ප්‍රශ්නයක ඇසුවා: 'ජනාධිපතිනියෙනි, මේ වෙලාවේ රූපවාහිනියෙන් මේ රූපවාහිනි වැඩ සටහන් නරඹනවා, ගුවන්විදුලියෙන් මෙය අසනවා. මේ සියල්ලටම වැදගත් වෙන්නේ විදුලිය. විදුලි අර්බුදයක් අද මේ රටේ තිබෙනවා. මේ සම්බන්ධයෙන් කාරණා කිහිපයක් සඳහන් කරනවා, ජනතාව මගින් තොරතුරු දැනගෙන නැත්නම් මොන ආකාරයෙන් හරි විදුලි බල මණ්ඩලයේ ආකාර්යක්ෂමතාවය නිසා නැත්නම් නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදිකිරීම දේශපාලන තීන්දුවක් මත නවත්වා තිබෙනවා. අද මේ විදුලි අර්බුදයට හේතු මොනවාද කියා කරුණාකරලා කියන්න.

එතුමිය ඒ ප්‍රශ්නයට මෙහෙම උත්තර දෙනවා. ' විදුලි බල මණ්ඩලය ඔවුන්ට අවශ්‍ය කාර්යය හරිහැටි කෙරුවේ නැහැ. විදුලි බල මණ්ඩලය දූෂණයෙන් පිරිලා. ලංකාවේ වැඩිම දූෂිත ආයතන 3ක් තිබෙනවා. ඒවායින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකක්, විදුලිබල මණ්ඩලය. විදුලි බල මණ්ඩලයේ සේවය කරන, අම්මාට, තාත්තාට රුපියල් 500, රුපියල් 1000 ආදායම් තිබුණ අය අද කොළඹ හතේ තට්ටු තුනේ හතරේ ගෙවල් දෙක තුන ගහලා තිබෙනවා. ඒ ඇත්ත කථා කරනකොට බොහොම මිනිසුන් තරහ වෙනවා. හෙට 'ස්ට්‍රයික් එකක්' යන්න පුළුවන්. නමුත් ජනතාව ඇත්ත දැනගන්නට ඕනෑ. හදපු මිනිසුන්ගේ එව්‍රස් පවා මගේ ළඟ තිබෙනවා. විදුලි බල මණ්ඩලය ඔවුන්ගේ කාර්යය හරි හැටි ඉටු කළේ නැහැ. කොටින්ම එපමණයි.

තාප බලාගාර කථාවක් නැහැ, එතැන, අනන්ත, අප්‍රමාණ පෞද්ගලික අංශ, රජයේ සත පහක්වත් වියදම් වෙන්නේ නැති පෞද්ගලික අංශයේ විදේශ කොම්පැනි අඬ අඬා ඉන්නේ විදේශ ආයෝජන අවශ්‍යයි කියලා. මේ රටට අපට ඩොලර් අවශ්‍යයි. ඔවුන්ගේ වියදමින් 'බීඕඕ', 'බීඕටී' පදනම මත ව්‍යාපෘති කරන්න ඇවිත් යෝජනා කළාම, මේවායින් පගා ගහන්න බැරි නම් ඒවා යට ගහනවා. ඒ අපට කර තිබුණු ඉල්ලීම් ටිකට හරියට ඉඩ දුන්නා නම්, මේ වන කොට විදුලි බල අර්බුදයක් නැහැ

Mr. Chairman, First of all I would like to say a few words on the BOO/BOT.

This country is in an economic crisis one reason being that the Ministry of Power and Energy has failed to provide electricity cheaply. The CEB is on a Rs. 5.5 billion overdraft as at yesterday. At the end of the month it is expected to go over Rs. 6 billion. CEB has no plan to recover this sum in the near future. You will remember sir the price of electricity went up by 100 per cent from 1994 to 2001 and now another 25 per cent is going to be added. The 25% per cent increase in electricity charges imposed recently, might well be the first of the price increases the Government will be forced into making because of its failure even, as up to date, to have a clear policy of ensuring to the nation, cheap thermally generated electricity. further, for considerations best known to those involved, the Government has failed to select those who offered to provide cheaper electricity, when they had the choice of doing so. I will revert to this later.

Another aspect I am going to deal with is the failure of the Government to meter about 250,000 consumers and to get them to pay for what they consume. The Government does not seem to have realized that this failure imposes on other consumers the obligation to pay more than they need to.

Sir, now let us discuss about thermal power generation by the private sector which was introduced to this country recently. Initially the Government entered into power purchase agreements with two parties. One was Asia Power,a foreign company and the other was Lakdhanavi,a local company. Asia Power had been given land and other concessions. Lakdhanavi was given none. Nevertheless, the price per unit for energy from Asia Power was 30 per cent higher than that of Lakdhanavi.

Shortly thereafter, in the latter part of 1977, the Government called for bids from the private sector to establish two medium- term power plants. Lakdhanavi was not allowed to did. Even an offer by another party with the participation of Lakdhanavi was not taken up for evaluation. though the price offered was the cheapest of all the offers received.

The CEB always selects the offer with the highest price. Apparently the price per unit, which is so crucial for electricity consumers, particularly to the industrial sector consumers, is not so important to the authorities, as the other considerations which influenced their decision making.

The unfortunate part of the episode is that the two envisaged thermal power plants awarded to a favoured party are yet to be commissioned even though four years have lapsed. Moreover, these plants are not likely to be commissioned for yet another two years.

I now understand that one of these plants is to be set up just four kilometres away from the Sacred Sri Mahabodhi at Anuradhapura. I cannot understand why with all the land available in the country, a site close to a Sacred area is selected. Had the offer of Lakdhanavi, who established their first medium term power station within ten months of signing the power purchase agreement, been accepted the two power plants would have by now been operating for more than two years. This would have saved more than Rs. 4000 million to the Ceylon Electricity Board, as the CEB would not have had to resort to expensive thermal generating options. Even in resorting to expensive therma, generating options the Government had been foolhardy.

As an emergency arrangement in early 2000, the Government hired 58 MW of generating plants from a foreign company called Aggreko. The plants were originally hired for six months, which was later extended to ten months. They are likely to be extended even beyond ten months.

CEB has paid Rs. 1,440 million a hire charges for these machines. In addition CEB provides at its own expense fuel, lubricants, and operating staff. CEB also pays the cost of shipping the machines to and from Sri Lanka. All the minuses are for the CEB and pluses are for the contractors.

According to the current world market prices for small high-speed generators similar to those hired from Aggreko, would have cost CEB only Rs. 800 million for 60 MW of generators, if purchased outright. In fact at the time CEB had more than Rs. 3,500 million in hand and the machines could have been easily purchased. These would have been available with CEB as standby for future use.

Another interesting thing is that at the time CEB also signed a contract with Lakdhanavi (Pvt.) Ltd., the local company, for 21 MW of emergency power for the same ten months period. The cost to the CEB for one MW of plant from Aggreko was Rs. 24.8 million whilst that paid to Lakdhanavi was only Rs. 12.8 million – nearly half.

Again in January 2001, CEB awarded a further 40 MW of emergency power contract to Aggreko. This emergency supply was acquired through a process that ensured only Aggreko would supply the required capacity.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. දයාරත්න මහතා]

Letters calling for offers were sent on 21st December 2000, whilst the closing date was just a week later on 28th December 2000, With the Christmas vacation intervening, this could hardly be termed reasonable time to submit bids. The bid letters required that the plant capacity of 40 MW should be operating by 31st January 2001. Only aggreko was able to make this promise. Lakdhanavi submitted a substantially cheaper bid but requested six weeks to commission the plant. This offer was not accepted on the grounds that the plants were required by 31st january 2001. The offer of Aggreko was accepted, but they did not generate a single unit even by end February 2001 which I am sure, the Hon. Minister will vouch for one full month after the due date. In all probability Lakdhanavi would have commenced generation earlier if they were awarded the contract and that at a substantially lower cost to the CEB.

I have information that the Aggreko machines were already unloaded at the Colombo Harbour at the time is signed the Contract with CEB. this is very interesting. I hope this will give an insight into matters that are escalating the electricity price in this country. I am told that in this horse-trading the BOI played a dominant role, by passing the Minister, the Ministry of Power & Energy and the Ceylon Electricity Board in determining who should or should not supply energy, without any regard to te cost thereof. I wonder who was behind it if the Hon. Minister in charge was not –

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Order, please! Mr. Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.*
*அதன் பிறகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதிச் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)

There is another similar contract. This is for the Combined Cycle Power Plant. Two plants were to be purchased. One is by the CEB under OECF assistance. This would have cost only 5.16 rupees per unit and another tender was awarded to Alstom- Marubeni, which is a joint venture, at 9.15 rupees per unit. When the tender was closed on 14th July, 1999 five bidders participated. Mitsui corparation was the lowest at the opening. Their price was Rs. 5,793 million.

However, a Cabinet - Appointed Tender Board headed by the Secretary to the President, Mr. K. Balapatabendi recommended that the award be given to Alstom - Marubeni at Rs. 8,155 million. This is Rs. 2,415 million higher than Mitsui's opening price, Indeed the difference is colossal. According to official documents, Mitsui was rejected because their tender had several major deviations and deficiencies. However, the official records clearly show that Alstom – Marubeni also had numerous major deviations or deficiencies which have been systematically covered-up by the authorities during the evaluation in order to prop-up the Alsotm-Marubeni Tender. An impartial investigation would reveal this brazen cover-up. In fact the extent of the cover-up is so bizarre that even at the last moment certain important documents presented were revised and amended. Having eliminated the lowest bidder, the CATB eventually short listed two other most conforming bidders namely Alstom-Marubeni and Sumitomo for final evaluation. It is significant, that at the very beginning the Secretary to the President, Mr. Balapatabendi, was appointed as the Tender Board Chairman in place of a very senior public servant who had already been nominated by the Cabinet. During our time, we always appointed an eminent engineer to a Cabinet Tender Board of this matter. We had people like Professor K. K. Y. W. Perera and Dr. Kulasinghe who were always present to advise us on technical committees like this. It is also significant that Mr. Balapatabenidi gave instructions officially, that the final a ward recommendation had to be finalized before he left for UK on 6th October, 1999. This short time-frame also contributed to not granting " a few days " time as pleaded by Sumitomo in their letter. It is learnt that Mr. Balapatabendi was received at the Heathrow Airport by Mr. Ronny Peiris who is known to be the agent for Alstom in the locomotive trade. This is how we purchased power plants.

Sir, there is another matter. It is the use of Liquid Natural Gas (LNG) for power generation, regarding which I have had a very good discussion with the Hon. Minister. Of course the Hon. Minister is convinced that it is going to be cheaper, and I say that it would be cheaper than diesel.

But I must tell you that you will have to get some engineers to evaluate. We have very good engineers who are very patriotic too. You must appoint one of them without appointing some outsider.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

I told you that we are studying it and that we will decide later.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)

If you are appointing the engineers, please appoint our own people. Do not appoint some consultant who will be bought over by some crooks who are close to the top people of this country. I noted with a lot of amusement the reference made in the Budget Speech by our Deputy Minister of Finance to the use of LNG for power generation. He said, I quote :

" In order to meet long term power requirements proposals are now being entertained to develop large-scale power plants based on Liquid Natural Gas and other alternative energy sources."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

This reminds me of the famous Queen of France-not the one who just returned to Sri Lanka-who asked her subjects to eat cake if they did not have bread. I am sure that the Hon. Minister will not ask us to do that. For countries, which do not have their own natural gas fields, generation by LNG will be far more costly than generation even by diesel oil. The reason is that Natural Gas has to be highly pressurized and brought down to a very low temperature to make it into Liquid Natural Gas (LNG) in the source country. It has to be carried in specialized ships where the temperature and the pressure are maintained and brought to a terminal in the country of usage for storage as a liquid under the self same conditions. One must also not overlook the fact that the risk of explosion and fire is quite high with LNG. I understand that price of LNG is presently about US $ 8 for a million British Thermal Units. The equivalent figure for crude oil is US $ 4.3 and for coal it is US $ 1.6. That means that a unit generated out of coal is about on fourth the price of a unit generated out of LNG. It is very hard to visualize how Sri Lanka could even think of buying LNG at a price comparable with that of coal or even oil. It appears that the fuel cost alone to generate electricity from LNG will be about Rs. 5 per unit. when you add the capital and the maintenance cost it will go up to eight rupees. At what price are we planning to sell electricity from LNG power plants? It must reach at least ten rupees per unit of electricity which is more than double the present price.

Sir, there is another very important matter. I will speak about some of these corrupt practices within the CEB. Really the CEB is now running on an overdraft of 6 billion rupees not because of these practices, but it is mainly because of the diesel generation. You are using auto-diesel which is very, very expensive. If it is furnace oil it would be still better. If you have no other alternative, I would kindly request the Hon. Minister to please go for heavier fuel machines without trying to buy auto-diesel plants at the last moment.

Then the other matter is with regard to meters. The CEB has accepted that more than 250,000 of its electricity consumers are without meters. They are sent bills only for a nominal number of units per month irrespective of their actual consumption. A part of the energy accounted for as lost to the CEB is due to this unmetered electricity supplies. It is estimated that more than one million units of electricity are given free each day and the loss in revenue to the CEB is 150 million rupees per month. If these supplies were metered the CEB could have had additional revenue to meet the cost of emergency generation that is as high as 12 rupees per unit.

Sir, I would kindly request the Hon. Minister to look into an alternate site for the coal powered station. If you do not have this in four years' time we will be spending an extra 29 million rupees a day approximately by 2004 and approximately 39 to 40 million rupees a day by 2005. This is just because we are using a lighter fuel when we can easily use coal in a coal-fired power station. But can we afford this? All our industries will go for a six, especially those like glass, plastics and cement. All these industries are high energy consuming industries. If these things are not run by electrical energy we will have Indian cement and Indian plastics coming into the country. Therefore this will have to be done. I am sure the Hon. Minister, Dr. Sarath Amunugama will agree with me because he has been one person who has been fighting for a long time to get this going. You will need 20,000 megawatts by 2020 and we have only 2000 megawatts now. So how are you going to add the balance 18,000 megawatts without coal? You will need four coal-fired power stations within the next 18 years unless you have an atomic power plant.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

The United National Party has declared that they are against the coal plant in Norachcholai. It that your view also?

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)

No. Why are you-

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

I am telling you that it is so.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)

Why are you worried about what the United National Party said? You have a Government, you have a Ministry –

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

You are part of the UNP. I cannot understand. Once you openly declared that it should not be done.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)

No, but there are three other -

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

Now you are talking of coal power.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)

Hon. Minister, you are on the wrong track.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

Mr. Azwer, what do you say?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member, please wind up.- [*Interruption*]-

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)
Mr. Azwer, do not pretend not to hear me. Please answer.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)
You are taking my time.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Please wind up, hon. Member. You have only two minutes more.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)
You can take my time. Do not worry.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)
There are three other sites. Why worry about Norachcholai? Go for one of the others. Move fast and get it done.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)
Hon. Member, enviromentally it cannot be done in a hurry. It takes two year to -

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)
I know all that.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)
We have got the approval. But the UNP demonstrated against it when we went there. We called you for a discussion with the Committee, but you never came. We called you three times, but you did not come.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)
I am asking you one question.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)
I might agree with some of the other things you said. But regarding this I cannot understand what you are saying.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)
Please give me a reply.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)
I agree with what you as an individual are saying. What about your party?

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)
You do not need the UNP to do this job.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)
Your deputy leader is here. Mr. Jaysuriya what do you say? What is your stand on the Coal Power Plant?

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)
Hon. Minister, I am asking you one question. You can reply. If you cannot have this project at Norochcholi, that is a different matter. There are three other sites. What have you done with regard to investigating into those three sites? You have not done anything. You are going to ask some foreigners to come here and generate power and take our money away. - [*Interruption*].

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member, could you please wind up your speech now?

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)
There are two other sites that have been selected, one in Trincomalee and the other in Hambantota. Your Government had rejected that on various grounds and we could not pursue that any more. The Norachcholai Project was started by your Government when you were the Minister - I cannot remember whether it was you or Mr. Chandra Bandara. Money from Japan was obtained by you in 1992.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)
It is available.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)
But when the PA Government is trying to do it, you all take a political stand and say, "No, it cannot be done." What is it that you are talking about now?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)

You do not have to worry about us. You have got a majority. You have a target. You are in power.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

No. There is a contradiction.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Member, could you please wind up your speech?

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

Sir, give him some of my time. It is okay because I took his time. I cannot understand the contradictory stand he is taking what are they saying? - [*Interruption*] I hope we had a discussion to get through this.

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)

I am not talking about Norachcholai. I am asking for a Coal -fired Power Station to be installed somewhere. [*Interruption*]. Take the four years and do it.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

I cannot bring coal and erect it here. [*Interruption*] we have found a suitable place for it. Technically, everybody says is is okay. But the UNP says that is cannot be done. You are asking us to put up a coal - fired power plant.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

The President definitely said during election time that she is not going to do it in Norachcholai. What are you saying as a Member of her Cabinet? -[*Interruption.*]

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

What are you saying and what did the hon. Member who spoke - [*Interruption*]

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)
(Alhaj A. H. M. Azwer)

He was referring to other places, not to Norachcholai. Even the Bishops say today that they cannot compromise their treaty. - [*Interruption*].

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

කීර්ති මාවැල්ලගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

What about the UNP which you are a part of? You are a part of the UNP. Say what your stand is. [*Interruption*].

[අ. භා. 2.27]

කීර්ති සුරංජිත් මාවැල්ලගේ මහතා
(திரு. கீர்த்தி சுரஞ்ஜித் மாவெல்லகே)
(Mr. Keertthi Suranjith Mawellage)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින මේ අවස්ථාවේදී විවාදයට භාජනයවන්නේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂයයි. අපේ මේ පළමුවන අයවැය ඉදිරිපත් කළ දවසේ සිට අද දක්වා පාර්ලිමේන්තුව තුළ අයවැය විවාදයේදීත් ඉන් අනතුරුව, කාරක සභා අවස්ථාවන්වලදීත් ඒ ඒ අමාත්‍යාංශ පිළිබඳව විවාද කරන අවස්ථාවලදීත් නිරන්තරයෙන්ම කථා කළ සහ කථා කරන්නට හේතු භූත කර ගත් අමාත්‍යාංශයක් තමයි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය.

විශේෂයෙන්ම බලශක්තිය මතම ඛනිජ තෙල්වල මිල ඉහළ යාම පිළිබඳව, ඒ අනුසාරයෙන් අනිකුත් අංශවල මිල වැඩිවීම පිළිබඳව, එය නිෂ්පාදනයට බලපාන ආකාරය පිළිබඳව, අපි පසුගිය අයවැය විවාදයේදීත් කාරක සභා අවස්ථාවලදීත් දිගින් දිගටම සාකච්ඡා කළා. ඇත්ත වශයෙන්ම මෙම අයවැය විවාදයේදී මේ අමාත්‍යාංශය ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදීත් එය ඉතාමත්ම වැදගත් වැය ශීර්ෂයක් බව එයින්ම වැටහෙනවා.

අපේ මෙවර අයවැයේදී වෙළෙඳ ශේෂයේ හිඟය තව තවත් වැඩි වෙන්න ප්‍රධාන හේතුවත් වුණු, ආනයන ප්‍රමාණය වැඩි වීමේ හේතුව නිසා ආනයන ප්‍රමාණයේ ගණනයට ඇතුළත් වුණු, ඛනිජ තෙල් මිල ඉහළ යාම සහ ඛනිජ තෙල් ප්‍රමාණය වැඩි වීම දිගින් දිගටම රටට බලපා තිබෙන බව මම මේ අවස්ථාවේදී මෙම ගරු සභාවට පැහැදිලි කරන්නට කැමැතියි. අපේ රටට දවසකට තෙල් බැරල් 70,000ක් පමණ අවශ්‍ය වෙනවා. ඒ අනුව තෙල් බැරල් 70,000ක් පිටරටින් ආනයනය කරන්නට සිද්ධ වී තිබෙනවා. රටේ මුළු ආනයනවලින් ආනයන මිලෙන් දහයෙන් එකක් වෙන් කරන්න සිද්ධ වී තිබෙන්නේ රටට අවශ්‍ය ඛනිජ තෙල් ආනයනය කරන්නටයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මේ ගත වුණු අවුරුදු දෙක තුළ අපේ රටේ ආර්ථිකයට දැඩි ලෙස බලපාන මේ ඛනිජ තෙල්වල මිල එහා මෙහා වීම පිළිබඳව මම කෙටියෙන් කරුණු පැහැදිලි කරන්න කැමැතියි.

1999 මුල් භාගයේදී තෙල් බැරලයක මිල ඇමරිකන් ඩොලර් 10.05යි. 2000 මුල් භාගයේදී තෙල් බැරලයක මිල ඇමරිකන් ඩොලර් 27.30යි. 2000 අග භාගයේදී තෙල් බැරලයක මිල ඇමරිකන් ඩොලර් 32.50යි. මේ අන්දමට 1999 දී සහ 2000දීත් ඛනිජ තෙල් මිලෙහි ඇති වුණු දැඩි බලපෑම මම හිතන්නේ අපේ රටේ සමස්ත ආර්ථිකය වසා ගෙන සමස්ත ආර්ථිකයටම ගැටලු ඇති වන තත්ත්වයෙන් ඉස්සරහට ආ බව මම අමුතුවෙන් කියන්න අවශ්‍ය වන්නේ නැහැ. දැන් අද මේ වන විටත් ඛනිජ තෙල් සංස්ථාව ඛනිජ තෙල් විකුණන්නේ තමන් ඒ වෙනුවෙන් වැය කරන මුදලට වඩා අඩු මිලකට. මම සඳහන් කරන්න කැමැතියි, 1994 දී ඩීසල් ලීටරයක් රුපියල් 11.40ට විකුණන විට අපි එක් ලීටරයකින් ශත 28ක ලාභයක් ලැබුබව. දැන් 2000 වන විට රුපියල් 24.50කට ඩීසල් ලීටරය විකුණන විට රුපියල් 1.61ක පාඩුවක් විඳගන්න සිද්ද වී තිබෙනවා. අද ඩීසල් ලීටරයක් රුපියල් 24.50 බැගින් විකුණන විටත් තවදුරටත් එක් ලීටරයකින් රුපියල් 1.61ක පාඩුවක් විඳගන්න සිද්ධ වි තිබෙනවා.

භූමිතෙල් ගත්තොත් 1994දී භූමිතෙල් ලීටරය රුපියල් 9.50ට විකුණන විට රුපියල් 1.43ක ලාභයක් තිබුණා. අද රුපියල් 18.40 බැගින් භූමිතෙල් ලීටරය විකුණන විටත් අපට රුපියල් 5.72ක පාඩුවක් විඳගන්න සිද්ධ වී තිබෙනවා. ඇත්ත වශයෙන්ම රුපියල් 18.40ට අද රුපියල් 5.72ක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කීර්ති සුරංජිත් මාවැල්ලගේ මහතා]

පාඩුවක් දරා ගන්න සිද්ධ වී තිබෙනවා. එම නිසා මේ තත්ත්වය ඉතා බරපතල විධියට අපේ රටේ සෑම අංශයකටම බල පා තිබෙන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ. ඛනිජ තෙල් මිල ඉහළ යාම පමණක් නොවෙයි, පසුගිය අවුරුදු 6ක කාලය සංසන්දනය කර බැලුවොත් ඛනිජ තෙල් පාවිච්චි කරන ප්‍රමාණයේ ද අති විශාල වර්ධනයක් සිද්ධ වී තිබෙනවා. පෙට්‍රල්, භූමිතෙල් පැත්තකින් තබා, ඩීසල් අංශය විතරක් ගත්තොත්, ඩීසල් මෙට්‍රික් ටොන් 1,96,153ක් 1994දී ලංකාවට ආනයනය කළා. අවුරුද්දෙන් අවුරුද්ද මේ ප්‍රමාණය වැඩි වී ගිහින්, 2000 වනකොට ඩීසල් මෙට්‍රික් ටොන් 10,12,842ක් ආනයනය කරනවා. 1994 සිට 2000 වනකොට ඩීසල් ආනයන ප්‍රමාණය සියයට 416කින් වැඩි වී තිබෙනවා. ඒ සඳහා ගෙවන මුදල 1994දී රුපියල් දශ ලක්ෂ 15,57,372යි. අවුරුදු පතා වැඩි වෙමින් ඇවිත් 2000 වන කොට රුපියල් දස ලක්ෂ 1,93,72,304ක් ගෙවා තිබෙනවා. එනම් 1994 සිට 2000 වනකොට සියයට 1143 ගුණයකින් ඩීසල්වලට ගෙවන ආනයන වියදම වැඩි වී තිබෙනවා. මේ ආනයනය කරන ඩීසල් ප්‍රමාණය වෙනුවෙන් අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න සිද්ධ වී තිබෙනවා. මේ වාගේම තමයි, පෙට්‍රල්. මේ වාගේම තමයි භූමි තෙල්. මේ තත්ත්වය දරාගෙන තමයි, ඛනිජ තෙල් සංස්ථාවට අද තමන්ගේ කටයුතු කර ගෙන යන්න සිද්ධ වී තිබෙන්නේ. මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, මේ තත්ත්වය මෙහෙම තබාගෙනත්, බල ශක්ති ක්ෂේත්‍රය දියුණු කර, ඉදිරියට ගෙන යන්න ඉතා වැදගත් පියවර කීපයක් අමාත්‍යාංශය ගෙන තිබෙන බව. ඛනිජ තෙල් සැපයුම් ව්‍යාපෘති පිළිබඳව, අලුත් වැඩ සටහන්, අලුත් සංවර්ධන ව්‍යාපෘති රාශියක් මේ වන කොට ආරම්භ කර ක්‍රියාත්මක කර තිබෙනවා. සමහර ඒවා අවසන් කර තිබෙනවා. සමහර ඒවා තවමත් අවසන් අදියරේ පවතිනවා. මම ගරු සභාවේ අවධානය සඳහා එයින් කීපයක් මෙම අවස්ථාවේදී සඳහන් කරන්නට කැමතියි.

ඒකක ධාරිතාව මෙට්‍රික් ටොන් 40,000ක් වූ බොර තෙල් ටැංකි 3ක් දැන් ඔරුගොඩවත්තේ අලුතින් ඉදිකර තිබෙනවා. ඒ වාගේම පිරිපහදු තෙල් සඳහා ඒකක ධාරිතාව මෙට්‍රික් 10,000 බැගින් වූ ටැංකි 6ක් කොළොන්නාවේ ඉදි කර තිබෙනවා. ඒකක ධාරිතාව මෙට්‍රික් ටොන් 5800 බැගින් වූ අතිරේක ටැංකි 6ක් සපුගස්කන්දේ ඉදිකර තිබෙනවා. මේ අවස්ථාව වන කොට කටුනායක ගුවන් යානා ඉන්ධන අංගනයක් ඉදිකරන්න අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා. වරායේ සිට කොළොන්නාව දක්වා සහ කොළොන්නාවේ සිට කැළණිතිස්ස දක්වා ඉන්ධන ප්‍රවාහන නළ මාර්ග දෙකක් ඉදි කරන්නට අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා.

ඒ වාගේම, වර්තමානයේ දිනකට තෙල් බැරල් 50,000ක ධාරිතාවක් වූ තෙල් පිරිපහදුව දිනකට තෙල් බැරල් ලක්ෂය දක්වා වැඩි කරන්නට අවශ්‍ය කටයුතු දැන් ඛනිජ තෙල් සංස්ථාව ආරම්භ කර ක්‍රියාත්මක කරගෙන යනවා.

සපුගස්කන්ද තෙල් පිරිපහදු මධ්‍යස්ථානයේ ධාරිතාව සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කර, අපේ රටේ වර්තමානයට විතරක් නොවෙයි, අනාගතයටත් බලපාන පරිදි ඛනිජ තෙල් ගබඩා කිරීම පිළිබඳව, තෙල් පිරිපහදු කිරීම පිළිබඳව, අලුත් තාක්ෂණය යොදා ගෙන ඒවා දියුණු කරන්නට අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. ඒ ඛනිජ තෙල් පැත්තෙන් හා බල ශක්ති පැත්තෙනුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ලැබී තිබෙන විනාඩි 10 ඇතුළත විදුලිබල ක්ෂේත්‍රය පිළිබඳව කථා කරන්නටත් විනාඩි කිහිපයක් ගන්නට කැමතියි. අද මේ අවස්ථාව වන කොට ලංකාවේ විදුලි බල සැපයුමේ විප්ලවීය වර්ධනයක් දකින්නට තිබෙනවා. 1994 සිට 2000 දක්වා සංසන්දනය කර බලන කොට, අතිවිශාල ප්‍රදේශයක් ආවරණය වන පරිදි විශාල පාරිභෝගික සංඛ්‍යාවකට විදුලි බලය ලැබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
*(பிரதித் தவிசாளர் அவர்கள்)*
(The Deputy Chairman)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය දැන් අවසාන වී තිබෙනවා.

**කීර්ති සුරංජිත් මාවැල්ලගේ මහතා**
*(திரு. கீர்த்தி சுரஞ்ஜித் மாவெல்லகே)*
(Mr. Keertthi Suranjith Mawellage)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විනාඩි දෙකක් කරුණාකර ලබා දෙන්නය කියා මම ඉල්ලීමක් කරනවා. 1994 දී 14,13,481ක් වුණු විදුලිබලය සැපයුණු පවුල් සංඛ්‍යාව 2000 වන කොට පවුල් 25,83,462ක් දක්වා වැඩි වී තිබෙනවා.

ඒ කියන්නේ අද රටේ මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 60කට විදුලි බලය සැපයෙනවා. 2005 වසර වන විට ඒ ප්‍රමාණය සියයට 80 දක්වා වැඩි කරන්නට අවශ්‍ය කටයුතු අමාත්‍යාංශය කර ගෙන යනවා. මම ඒ සංඛ්‍යා ලේඛන අඩංගු වාර්තාව හැන්සාඩ්ගත කරන ලෙස ඉල්ලා සිටිමින්, එය සභාගත කරනවා. ඒවගේම නිවාස වලට විදුලිබලය සැපයීම ගැනත් විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. 1994-2000 දක්වා කාලය සන්සන්දනය කර බලන විට සමහර දිස්ත්‍රික්කවල විදුලි බල සැපයුම ඉතා විශාල වශයෙන් වැඩිවී තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කය ඇතුළු සෑම දිස්ත්‍රික්කයටම අදාළ සංඛ්‍යාලේඛන මා ඉදිරිපත් කරනවා. ඒ සෑම දිස්ත්‍රික්කයකම 1994- 2000 දක්වා කාලයේ තිබුණු තත්ත්වයන් සමඟ සන්සන්දනය කර බලන විට අති විශාල වර්ධනයක් ඇති වී තිබෙනවා. දිස්ත්‍රික්ක දෙක තුනක් කෙරෙහි මෙම ගරු සභාවේ අවධානය යොමු කරවන්නට මම කැමතියි.1994 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ විදුලිබල සැපයුම සියයට 17යි. 2000 වසර වන විට කුරුණෑගල දිස්ත්‍රික්යේ විදුලිබල සැපයුම සියයට 50යි. සියයට 33කින් වැඩි වී තිබෙනවා. ඒ කියන්නේ. 1994 තිබුණ තත්ත්වය මෙන් තුන් ගුණයකින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ විදුලිබල සැපයුම වැඩි වී තිබෙනවා. කෑගල්ල දිස්ත්‍රික්කයේ 1994 දී තිබුණේ සියයට 24යි. 2000 වසර වන විට එය සියයට 50 දක්වා වැඩි වී තිබෙනවා. ඒ අවුරුදු හය ඇතුළත කෑගල්ල දිස්ත්‍රික්කයේ විදුලිබල සැපයුම දෙගුනයකින් වැඩි වී තිබෙනවා. 1994දී හම්බන්තොට දිස්ත්‍රික්කයේ විදුලිබල සැපයුම සියයට 21යි. 2000 වසර වනවිට එය සියයට 50 දක්වා වැඩි වී තිබෙනවා. ඒ අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ විදුලි බල සැපයුම සියයට 29කින් වැඩි වී තිබෙනවා. ඒ කියන්නේ දෙගුණයකටත් වැඩි ප්‍රමාණයකින් වැඩි වී තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ 1994 තිබුණේ සියයට 19යි. වසර 2000 වන විට සියයට 40 දක්වා වැඩි වී තිබෙනවා. ඒකියන්නේ දෙගුනයක් වෙලා තිබෙනවා. මොණරාගල දිස්ත්‍රික්කයේ සීයට 14 සිට 43 දක්වා තුන් ගුණයකින් වැඩි වී තිබෙනවා. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේත් දෙගුණයකින් වැඩි වී තිබෙනවා. ඒ වගේම විදුලිය පාරිභෝගික සංඛ්‍යාව ගත්තත් 1994 සිට 2000 අතර කාලය සන්සන්දනය කර බලන විට උතුරු පළාතේ 14 ගුණයකින් පාරිභෝගික සංඛ්‍යාව වැඩි වී තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
*(பிரதித் தவிசாளர் அவர்கள்)*
(The Deputy Chairman)

ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසාන කරන්න. ඔබතුමා වැඩිපුර විනාඩි දෙකක් කථා කර තිබෙනවා.

**කීර්ති සුරංජිත් මාවැල්ලගේ මහතා**
*(திரு. கீர்த்தி சுரஞ்ஜித் மாவெல்லகே)*
(Mr. Keertthi Suranjith Mawellage)

මේවාට අදාළ දත්ත අඩංගු ලේඛනය හැන්සාඩ් ගත කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒවගේම වතු නිවාස සඳහා විදුලි බල සැපයුම ගත්තොත් 1997 සිට 2000 දක්වා ගතවූ අවුරුදු තුන තුළ පොදු ජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ ගරු අනුරුද්ධ රත්වත්තේ ඇමතිතුමා විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වශයෙන් වතු නිවාස ලක්ෂයකට විදුලි බලය සපයා තිබෙනවා. ඒ කියන්නේ සියයට 60 දක්වා විදුලිබලය සපයා තිබෙනවා. ඒ සංඛ්‍යාලේඛන අඩංගු වාර්තාවත් මම හැන්සාඩ්ගත කරන ලෙස ඉල්ලා සිටිනවා.

---

*පුස්තකාලයේ තබා ඇත.
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වැඩිපුර විනාඩි දෙකකටත් වැඩියෙන් අර ගෙන තිබෙනවා.

කීර්ති සුරංජිත් මාවැල්ලගේ මහතා
(திரு. கீர்த்தி சுரஞ்ஜித் மாவெல்லகே)
(Mr. Keertthi Suranjith Mawellage)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වගේම ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 12, 073ක් වෙන් කර උපපොළ 1977ක් වැඩි දියුණු කර තිබෙනවා. මේ කරුණු තවදුරටත් විග්‍රහ කරන්නට ගියොත් අඩුම වශයෙන් තව පැය 1/2ක්වත් අවශ්‍ය වෙනවා. 1994 වන විට ඉතාම පහළ මට්ටමක තිබුණු විදුලිබල සැපයුම නිසා අන්ධකාරයෙන් පිරී තිබුණු ලංකාවේ විදුලිබල සැපයුම 2000 වසර වන විට සියයට 60 දක්වා වැඩි වූ අතර, 2005 වසර වන විට සියයට 80 දක්වා වැඩි කරන්නට අවශ්‍ය කටයුතු විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් සංවිධානය කර තිබෙන බව මම සඳහන් කරන්නට කැමැතියි. ඒ නිසා අද අපේ ගම්වලට එළිය ලැබෙන්නේ, ගම්වල ජනතාවගේ නිවාසවලට විතරක් නොවෙයි, කුඩා කර්මාන්තවලට අවශ්‍ය විදුලිබලය ලබා ගන්නට අවශ්‍ය ශක්තිය ලැබෙන්නේ මේ කෙටි කාලය තුළ විදුලිබල ක්ෂේත්‍රයේ සිදු වුණු අනභිබවනීය ශ්‍රේෂ්ඨ වැඩ කොටස නිසාය කියන එක මේ ගරු සභාවට මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.39]

පී. සෙල්වරාසා මහතා
(திரு. பீ. செல்வராசா)
(Mr. P. Selvarasa)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, காலத்திற்குக்காலம் மண்ணெண்ணெய் விலை ஏறிக்கொண்டு போகின்ற காரணத்தினால், வடக்கு - கிழக்கிலே சீவிக்கின்ற எமது மக்கள் மிகுந்த துன்பங்களை அனுபவித்துக் கொண்டிருக்கின்றார்கள். வடக்கு - கிழக்கிலே, குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்தில் un cleared area, cleared area என இரண்டு வகையான பிரதேசங்கள் இருக்கின்றன. un cleared area, அதாவது இராணுவக் கட்டுப்பாடில்லாத பகுதிக்கு மண்ணெண்ணெய்யை எடுத்துச் செல்வதிலே அங்குள்ள மக்கள் பல சிரமங்களை எதிர்நோக்கிக் கொண்டிருக்கின்றார்கள். இதனால் அவர்களுக்கு மின்சாரம் அவசியமாகத் தேவைப்படுகின்றது.

கௌரவ அமைச்சர் அவர்கள் அங்குள்ள un cleared area, மற்றும் cleared area க்களுக்கு இந்த அரசாங்கத்தின் கடந்த பதவிக் காலத்தின் போது ஆசிய அபிவிருத்தி வங்கி உதவித் திட்டத்தின் கீழ் பல இலட்சக்கணக்கான ரூபா செலவில் மின்சாரத்தை வழங்கியிருந்தார். அதற்காக நான் அமைச்சர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். இருந்த போதிலும், அங்குள்ள படுவான்கரைப் பிரதேசத்திலே உள்ள இராணுவ கட்டுப்பாட்டிலில்லாத பிரதேசமான கொக்கட்டிச்சோலை எனப்படும் கிராமத்திற்கு மின்சாரம் வழங்கப்படவில்லை. ஆனால், அங்கு இராணுவக் கட்டுப்பாட்டிலில்லாத பிரதேசங்களான வெல்லாவெளி, பழுகாமம் மகிழடித்தீவு போன்ற பகுதிகளுக்கு மின்சாரம் வழங்கப்பட்டிருக்கின்றது.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman)

Order, please! Will an hon. Member propose that Mr. Mano Wijeyeratne do take the Chair?

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

I move,

"That Mr. Mano Wijeyeratne do now take the Chair."

පී. දයාරත්න මහතා
(திரு. பீ. தயாரத்ன)
(Mr. P. Dayaratne)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, මනෝ විජේරත්න මහතා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, குழுக்களின் பிரதிச் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, திரு. மனோ விஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair and* MR. MANO WIJEYERATNE *took the Chair.*

පී. සෙල්වරාසා මහතා
(திரு. பீ. செல்வராசா)
(Mr. P. Selvarasa)

கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்தில் இராணுவக் கட்டுப்பாட்டிலில்லாத சில கிராமங்களுக்கு மின்சாரம் வழங்கப்பட்டுள்ள போதிலும், கொக்கட்டிச்சோலை எனப்படுகின்ற இராணுவக் கட்டுப்பாடற்ற கிராமத்திற்கு மட்டும் மின்சாரம் வழங்குவது மறுக்கப்பட்டுள்ளது என்பது பற்றியே நான் இப்பொழுது பேசிக் கொண்டிருக்கின்றேன். அங்கு மின்சாரம் வழங்குவதற்குத் தேவையான பணத்திற்கான காசோலை, கொழும்பிலுள்ள குறித்த தலைமையகத்திலே இருந்து மட்டக்களப்பிலுள்ள சம்பந்தப்பட்ட அதிகாரிக்குச் சென்றிருந்த போதிலும், அந்த பணத்தை குறித்த நோக்கத்திற்குப் பாவிக்க முடியாத ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கின்றது. நான் கடந்த மார்ச் மாதம் 3 ஆம் திகதி மட்டக்களப்பு கச்சேரியில் நடைபெற்ற அபிவிருத்திக் குழுக் கூட்டத்தில் நான் இந்த விடயம் சம்பந்தமாகப் பிரஸ்தாபித்திருந்தேன். இருந்தாலும். படைத் தரப்பினர் அந்தக் கிராமத்துக்கு மின்சாரம் வழங்கப்படுவதை மறுத்துவிட்டார்கள் ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் பாதுகாப்புப் பிரதி அமைச்சராகவும் மின்சாரம் வழங்குகின்ற பொறுப்பினையுடைய மின்வலு, சக்தி அமைச்சராகவும் இருக்கின்ற காரணத்தினால் தயவுசெய்து மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்த கொக்கட்டிச் சோலைக் கிராமத்திற்கு மின்சாரம் வழங்க அனுமதிக்கும்படி படைத்தரப்பினருக்கு உத்தரவிடுமாறு உங்களை விநயமாக வேண்டிக்கொள்ள விரும்புகின்றேன். ஏனென்றால், அதற்குரிய செலவுத் தொகைக்கான காசோலை அங்கு அனுப்பப்பட்டுவிட்டது. இன்னும் சில மாதங்கள் கடந்தால் அந்தத் தொகை மீண்டும் கொழும்புக்கே திருப்பி அனுப்பப்படக்கூடிய சாத்தியக்கூறு இருப்பதனால், தயவுசெய்து அந்த மின் விநியோகத்தை வழங்க நடவடிக்கை எடுக்குமாறு கேட்டுக்கொள்ளுகின்றேன்.

அடுத்ததாக கடந்த காலங்களில் உள்ளூராட்சித் திணைக்களத்தால் சில ஊழியர்கள் மின்சாரப் பகுதிக்காகச் சேர்க்கப்பட்டு, அத்திணைக்களத்தின் கீழ் கடமையாற்றிக் கொண்டிருந்தார்கள். அவர்களில் நிரந்தர ஊழியர்கள் மட்டும் மின்சார சபையால் உள்ளீர்க்கப்பட்டார்கள்.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

will you assure the security of my officers if they go to work at Kokkaddicholai?

පී. සෙල්වරාසා මහතා
(திரு. பீ. செல்வராசா)
(Mr. P. Selvarasa)

Yes, Sir. There is no problem there. They have already given electricity to the uncleared areas.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

That was after it was cleared.

පී. සෙල්වරාසා මහතා
(திரு. பீ. செல்வராசா)
(Mr. P. Selvarasa)

No, Sir! At the time when it was an uncleared area they went there and gave the electricity supply. Even the Vellaveli, Palukamam and Mahiladitivu areas are also under the control of the LTTE [ *Interruption.* ] No, Sir! Last year also they went there and gave electricity supply to Mahiladitivu village. [ *Interruption.* ] That is right, Sir. Before the election.

*உள்ளூராட்சித் திணைக்களத்தில் அமய அடிப்படையில் மின்சாரப் பிரிவில் வேலை செய்த ஊழியர்களை மின்சார சபை உள்ளீர்க்கவில்லை. இதற்கு உதாரணமாக வலிகாமம் கிழக்கைச் சேர்ந்த திருவாளர் தருமகுலசிங்கம் என்பவரை எடுத்துக்கொள்ளலாம். அவர் அமய அடிப்படையில் உள்ளூராட்சித் திணைக்களத்தில் மின்சார ஊழியராகச் சேர்ந்தவர். மின்சார சபையால் இவரைப்போன்ற பல ஊழியர்கள் உள்ளீர்க்கப்படாதிருக்கின்றார்கள். ஆகவே, இவர்களின் விடயத்தையும் கௌரவ அமைச்சராகிய நீங்கள் கவனத்திற்கொண்டு, அமய அடிப்படையில் வேலை செய்த உள்ளூராட்சி மின்சாரப் பகுதி ஊழியர்களையும் மின்சார சபையின் நிரந்தர ஊழியர்களாகச் சேர்த்துக்கொள்ள வழிவகுக்க வேண்டுமென்று கேட்டு விடைபெறுகின்றேன். நன்றி.*

[අ. භා. 2.45]

ජයසුන්දර විජේකෝන් මහතා
(திரு. ஜயசுந்தர விஜேகோன்)
(Mr. Jayasundara Wijekoon)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ මා කථා කරන්නේ ඉතාමත් සන්තෝෂයෙනුයි. හේතුව, අද ලංකාව පුරා ගමින් ගමට විදුලිය ගෙන ගොස් මුළු ලක්දිවම ඒකාලෝක කර තිබෙන අවස්ථාවක, විදුලි බලය වැනි අත්‍යවශ්‍ය කාරණයක් පිළිබඳව කථා කරන්නට ලැබීම සුවිශේෂ සිද්ධියක් වීමයි. ඒ අතරම පසුගිය කාලය තුළ ලංකාවේ විදුලිබල ශක්තිය වැඩිදියුණු කිරීමේලා විදුලිබල මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්‍ෂවරයා ලෙස සහභාගි වෙන්නට මටත් අවස්ථාවක් ලබා දීම ගැන ගරු අමාත්‍යතුමාටත්, අතිගරු ජනාධිපතිතුමියටත් මගේ ස්තූතිය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමැතියි. විදුලිබලය කියන්නේ අත්‍යවශ්‍ය, සුඛෝපභෝගී දෙයක් නොවෙයි. අද සියලු දෙනාටම එය අත්‍යවශ්‍ය දෙයක් බවට පත් වී තිබෙනවා. එවැනි යුගයක අපේ රටේ පවතින ඉල්ලුම අනුව විදුලිය සැපයීම සඳහා අවශ්‍ය විදුලිබල ධාරිතාව වැඩි කර ගැනීමට, 1994න් පසු පහළ වුණු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ රජය පසුගිය කාලය තුළ ඉතා ශීඝ්‍රගාමී ලෙස කටයුතු කර ඇති බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමැතියි.

1994දී මේ රජය මේ රටේ පාලනය භාර ගත් අවස්ථාවේදී අපේ රටේ විදුලිය ධාරිතාව ජල විදුලියෙන් මෙගාවොට්ස් 1135කුත්, තාප විදුලියෙන් මෙගාවොට්ස් 250කුත් ආදී වශයෙන් ඉතාම සුළු ප්‍රමාණයකුයි තිබුණේ. වර්ෂ 2000 වන විට මේ ප්‍රමාණය මෙගාවොට්ස් 2000 දක්වා වැඩි කරන්නට අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ තත්ත්වය ඇති කර ගැනීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉතාම පැහැදිලි වැඩ පිළිවෙළක් අරගෙන, අනාගතය ගැන ඉතා සැලකිලිමත් ලෙස සිතා, ඉදිරියේදී ඇති වන විදුලිය ඉල්ලුම සැපයීම සඳහා සුවිශේෂ වූ ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබෙනවා. ඒ අනුව තමයි අපි ජල විදුලියෙන් පමණක් යැපෙන්නට බලා නොසිට, තාප විදුලි බලාගාර රාශියක් ඇති කර, මෙගාවොට්ස් 250ක්ව තිබුණු තාප විදුලිය 1000 දක්වා වැඩි කරන්නට උත්සාහ කර තිබෙන්නේ. අද අපට ඉල්ලුමේ අවශ්‍යතාවයට සරිලන විදුලිබලයක් සපයන්නට සෑහෙන තරම් විදුලිබල ප්‍රමාණයක් තිබෙන නමුත් ඉදිරි කාලෙයදී මේ තත්ත්වය මැනවින් වටහා ගත යුතුයි. පක්‍ෂ දේශපාලනයෙන් තොරව, නිල් පාට, කොළ පාට බලන්නේ නැතිව ඉදිරි කාලය සඳහා අවශ්‍ය විදුලිය ධාරිතාවය සපයා ගැනීම සඳහා යුහුසුළුව ක්‍රියාමාර්ගයක් ගත යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම විදුලිය ගාස්තු නංවන්නට සිද්ද වී තිබෙන්නේ විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්ගේවත්, අමාත්‍යාංශයේවත් වරදක් නිසා නොවෙයි. ඉන්ධන ගාස්තු වැඩි වන්නට වැඩි වන්නට, තාප විදුලි බලාගාර ක්‍රියාත්මක වන්නට වන්නට අපේ රටේ විදුලිය ගාස්තු වැඩි කරන්නට සිද්ධ වී තිබෙනවා. මෙන්න මේ නිසා තමයි ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අපි ගල්අඟුරු බලාගාරයක් ඉදි කරන්නට නොයෙක් විට උත්සහා ගත්තේ. නමුත් යම් යම් අයගේ පටු දේශපාලන වාදභේද නිසාත්, යම් යම් අයගත් ක්‍රියාමාර්ග නිසාත්, අපට මේ වන විට මේ තත්ත්වයට එන්නට බැරි වී තිබෙනවා. ඒ නිසා අපි ඉදිරි කාලය තුළ මෙවැනි පියවරකට නොපැමිණියහොත්, විශේෂයෙන් ලාභදායීම ක්‍රමයක් හැටියට අද ලොව හඳුනා ගෙන තිබෙන ගල්අඟුරු බලාගාර ඉදි නොකළහොත් ඉදිරි කාලයේදී ඉල්ලුමට සරිලන පරිදි විදුලිය සපයන්නට නොහැකි තත්ත්වයක් ලක්දිවට උදා වන බව අපි ඉතා කනගාටුවෙන් ප්‍රකාශ කරන්නට කැමැතියි. අන්න ඒ නිසා, මේ ගල්අඟුරු තාප බලාගාරය වහාම ඉදි කළ යුතු කාලය දැන් උදා වී තිබෙන නිසා, නොරොච්චෝලේ හෝ වෙනත් කොතැනක හෝ එය ඉදි කරන ලෙස අපි විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

ඒ එක්කම, විදුලිබල අමාත්‍යාංශය ගැන කථා කරන විට අපි ඉතාම සන්තෝෂ වෙනවා. නගරයට මෙන්ම ගමටත් සමසේ සම්පත් බෙද දුන් අමාත්‍යාංශයක් ලෙස අපි මෙය හඳුන්වන්නට කැමැතියි. මම එහෙම කියන්නේ ඇයි? 1994 වන විට, අපේ රටේ දිස්ත්‍රික්කවලින් කොළඹ, ගම්පහ, කළුතර, මාතර, ගාල්ල වැනි දිස්ත්‍රික්ක කිහිපයක පමණයි විදුලිය පාරිභෝගික සංඛ්‍යාව සියයට 30කට වඩා වැඩි වී තිබුණේ. එහෙත් අද මේ වනවිට ලංකාවේ කිසිම ස්ථානයක – සියලුම දිස්ත්‍රික්කවල – විදුලිය එවැනි අඩු මට්ටමකින් පාවිච්චි වන්නේ නැහැ. සියලුම දිස්ත්‍රික්කවල සියයට 40ට වඩා වැඩි ප්‍රමාණයකට විදුලිය ලබා දී තිබෙනවා. ඒ ගැන අප ඉතාම සන්තෝෂ වෙනවා. විශේෂයෙන් කාගේවත් ඇස නොගැටෙන, පාලකයන්ගේ ඇස නොගැටුණු මොණරාගල, අම්පාර, හම්බන්තොට වාගේ දිස්ත්‍රික්කවල පවා විදුලි ධාරිතාවය නැත්නම් විදුල් සැපයුම වැඩි කරන්න කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ සියයට 13ක්ව පැවැති විදුලි පාරිභෝගික සංඛ්‍යාව සියයට 43 දක්වා වැඩි කරන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. යුද්ධයක් පවතිද්දි යාපනයේ පවා එද 1994දී සියයට 29ක්ව පැවැති ඒ විදුලි පාරිභෝගික සංඛ්‍යාව සියයට 40 දක්වා වැඩි කරන්නට අද අපට හැකි වී තිබෙනවා. මඩකලපුවේ සියයට 35ක්ව පැවැති විදුලි පාරිභෝගික සංඛ්‍යාව යුද්ධයක් පවතින අතරතුරදීත් සියයට 49 දක්වා වැඩි කරන්නට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය කටයුතු කර තිබෙනවා. ඒ වගේම 15,000කට අධික විශාල සේවක පිරිසක්, කොන්ත්‍රාත්කරුවන් යටතේ තවත් නොයෙක් තරාතීරමේ රැකියාවල නිරත වන, ඒ වාගේම නොයෙක් නිෂ්පාදනවල යොදෙන 7000ක පමණ අතුරු සේවක පිරිසක් සිටින, මේ රටේ පවුල් 22,000ක් පමණ ජීවිකාව ගෙන යන මේ ආයතනය දෙස බැලුවාම මේක වාණිජමය ආයතනයක් පමණක් නොවෙයි, සේවාවන් සපයන ආයතනයක් හැටියටත් අපට හඳුන්වා දෙන්නට පුළුවන්කම ලැබී තිබෙනවා.

ඒ අතරතුර පසුගිය කාලය තුල – 1994 සිට මේ දක්වා කාලය තුළදී – විදුලිබල ඉතිහාසයේ වැඩිම වේගයකින් ගමට විදුලිය ගිය අවස්ථාව හැටියට මෙය අපට හඳුන්වා දෙන්නට පුළුවන්. විශේෂයෙන් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි, පසුගිය කාලය තුළ කිලෝ මීටර් 40,000කට පමණ විදුලි රැහැන් ඇදලා තිබෙනවා. මෙයින් වැඩි සැර විදුලි යෝජනා ක්‍රම 2657කුත් අඩු සැර විදුලි යෝජනා ක්‍රම 16,737කුත් උප පොළවල් 3350කුත් ආදී වශයෙන් සකස් කර දී තිබෙනවා. 1950 අලුතෙන් විදුලිය බෙදන්න පටන් ගත්තත් 1994 දක්වා අවුරුදු 44ක් තිස්සේ මේ රටේ විදුලි පරිභෝගික සංඛ්‍යාව හිටියේ 14,13,481යි. අද මේ වන විට විදුලි පාරිභෝගික සංඛ්‍යාව 25,88,462 දක්වා වැඩි කරන්න විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ක්‍රියා කර තිබීම මේ රටේ ජනතාවගේ සතුටට කරුණක් වෙනවා. ඒ නිසා සම්පත් සමසේ බෙද හැරිය ආයතනයක් හැටියට අප මේ අවස්ථාවේදී විදුලිබල මණ්ඩලය හඳුන්වා දෙන්නට කැමැතියි. ඒ වාගේම විශේෂයෙන් විදුලිය ලබා දීමේදී විදුලිබල මණ්ඩලයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලධාරී මහත්වරුන්ගේ සහයෝගය ගැන අප සන්තෝෂ වෙනවා. රජය මුදල් සැපයූවත් මේ පවතින තාක්ෂණය අනුව ගමට විදුලිය ගෙන යාම සඳහා නිලධාරී මහත්වරු ඒ කටයුතු කළා. ඒ සඳහා විදුලිබල මණ්ඩලයේ සියලු නිලධාරී මහත්වරුන් ඇප කැපවී ඔවුන්ගේ සම්පූර්ණ සහයෝගය ලබා දී තමන්ගේ රාජකාරී හැටියට පමණක් නොව මේක සේවාවක් හැටියට සලකා මේ කාලය තුළ පවුල් ලක්ෂ 11ක් වැනි විශාල ප්‍රමාණයකට විදුලිය ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කර තිබීම ගැන ඒ නිලධාරීන්ට ස්තුති කරන්නට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම මම අර කලින් කිව්වා වාගේ ජල විදුලියෙන් හෝ තාප විදුලියෙන් ක්‍රියාත්මක කරනවා වෙනුවට ගල් අඟුරු වැනි විකල්ප යෝජනා ක්‍රමයකට නොගියොත් ඉදිරි කාලයේදී මේ වැඩි වන ඉල්ලුමට අනුව අපට විදුලිය සපයන්නට අවස්ථාවක් නොලැබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි. ඒ නිසා අනිවාර්යයෙන්ම ගල් අඟුරු බලාගාරයක් ඉදි කළ යුතුව තිබෙනවා. චීනය, ජර්මනිය වාගේ රටවල අග නගරවල ඕනෑ තරම් මේවාගේ බලාගාර ඉදිකර තිබෙනවා. මේවා නොරොච්චෝලේ හෝ වෙනත් තැනක වහාම ඉදි කළ යුතුයි. මේකෙදී එක් කෙනෙක් දෙදෙනෙක් විරුද්ධ වුණාට, කණ්ඩායමක් විරුද්ධ වුණාට ඒ ගැන නොසලකා මේ රටේ ජනතාව වෙනුවෙන්, කර්මාන්තකරුවන් වෙනුවෙන් මේ රටේ අනාගතය වෙනුවෙන් හිතලා අනාගතයට ආලෝකය ලබා දෙන්නට, අනිවාර්යයෙන්ම මෙවැනි විදුලි බලාගාරයනක් ඉදි කිරීමේ අවශ්‍යතාවය දත් උද වී තිබෙනවා. ඒ වාගේ අවස්ථාවකදී පක්ෂ භේද බලන්නේ නැතිව පාට භේද බලන්නේ නැතිව මේවාගේ කාර්යයන්ට සහයෝගය දෙන්නට ඕනෑ. ඉදිරි කාලයේදී විදුලි ඉල්ලුම සපයා දීම සඳහා, අවශ්‍ය විදුලි උත්පාදනය සඳහා මෙවැනි බලාගාරයක් සකස් කිරීම අප කාගේත් වගකීම හා යුතුකම වන බව මේ අවස්ථාවේදී සතුටින් මතක් කරනවා.

විශේෂයෙන්ම විදුලිබල අමාත්‍යතුමා ගැන සන්තෝෂ වෙනවා. ඈත දුෂ්කර පළාත්වලට – මොණරාගල, හම්බන්තොට, අම්පාර වැනි ප්‍රදේශවලට – සමයේ මේවා බෙදී යන ආකාරයට විදුලිය ලබා දීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් ගෙන තිබීම පිළිබඳව ගරු අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වෙනවා. නැවත වතාවක් ගරු ඇමතිතුමාටත්, විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්ටත් ගමට විදුලිය ගෙන ඒම පිළිබඳව ගමේ ජනතාවගේත් මගේත් ස්තුතිය පිරිනමමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 2.55]

**බිමල් රත්නායක මහතා**
*(திரு. பிமல் ரத்நாயக்க)*
(Mr. Bimal Ratnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට සම්බන්ධ වෙමින් අදහස් කීපයක් ගරු ඇමතිතුමාගේත්, නියෝජ්‍ය ඇමතිතුමාගේත් ඒ වාගේම මෙම ගරු සභාවේ අනිකුත් මන්ත්‍රීතුමන්ලාගේත් අවධානයට යොමු කරන්නට මම කැමැතියි.

මෙම වකවානුවේදී විදුලිබල මණ්ඩලය පිළිබඳවත්, බල ශක්තිය පිළිබඳවත් විශාල සංවාදයක් ඇති වී තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සංවාදයේදී බොහෝ විට මතු කරනු ලබන්නේ ලංකාවේ විදුලිබල අර්බුදයක් තිබෙනවාය කියන කාරණයයි. මම පිළිගන්නවා, යම් ආකාරයක අර්බුදයක් තිබෙන බව. හැබැයි, බොහෝ විට කථා කරන්නේ මේක බලශක්ති අර්බුදක්ය කියලා හඳුනා ගන්නවා වෙනුවට තනිකරම මේක විදුලිබලයට ලඝු කරලයි. මා කියන්නේ, ලංකාවේ තියෙන්නේ බලශක්ති අර්බුදයක්. ඒක විදුලිබලය කියන බලශක්තියෙන් පමණක් විසඳ ගැනීමට තමයි, වැඩිපුරම අවධානය යොමු කරලා වැඩිපුරම ක්‍රියාමාර්ග සකස් කෙරෙමින් තියෙන්නේ. එම නිසා, දියුණු කළ යුතු රටක් හැටියට – මම දන්නේ නැහැ, දියුණු වෙනවාද කියලා – විදුලිබලය ගැන පමණක් යොදවන මේ අවධානය ඉන් එහාට අරගෙන හිතිල්ලා ඊට වඩා පළල් බලශක්ති අර්බුදයක් ලෙසින් කල්පනා කරලා ඒකට තියෙන විසඳුම මොකක්ද කියලා ඒ අනුව ඉස්සරහට යන්නට කියලා මම ඉල්ලා සිටිනවා.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, ලංකාවට ඛනිජ තෙල් ගෙන්වනවා. ඒ ඛනිජ තෙල්වලින් සියයට 70ක්ම පාවිච්චි කරන්නේ ප්‍රවාහනයටයි. එතකොට ලංකාවේ බලශක්තිය පැත්තෙන් ගත්තාම ප්‍රවාහන ක්ෂේත්‍රයට අතිවිශාල මුදලක් වෙනා කරන්න වෙනවා. එම නිසා අපි මේ ප්‍රවාහන ක්ෂේත්‍රය විධිමත් කිරීමක් තුළින් පවා බලශක්ති සංරක්ෂණයට යම් ආකාරයක උදවුවක් වෙනවා. එම නිසා මම මුලින්ම කියන්න කැමතියි, ආකල්පමය විධියටම මේ විදුලිබල අර්බුදයේ සිට බලශක්ති අවශ්‍යතාවන්ට විසඳුම් සොයා ගන්නේ කොහොමද කියන තැනට යන්න ඕනෑය කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන කෙටි කාලය ඇතුළත මම තවත් කාරණයක් ගැන කියන්න කැමැතියි. විදුලිබල අර්බුදයට ප්‍රධාන හේතුව විධියට ආණ්ඩුව පැත්තෙනුත් විදුලිබල මණ්ඩලයේ සමහර නිලධාරීනුත් කරුණු රාශියක් දක්වනවා. ඊට හේතු වූ ප්‍රධාන කරුණු දෙක තමයි, එකක් නියඟය : අනික් එක බොර තෙල් මිල වැඩි වීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඇති වී තිබෙන විදුලිබල අර්බුදයට අර කලින් කියපු හේතු බලපා නැහැයි කියා මම කියන්නේ නැහැ. නමුත් ඊට වඩා ප්‍රධාන හේතු ගණනාවක් තිබෙනවා. ලංකාවේ ප්‍රධාන බලශක්ති ප්‍රභව හැටියට අපට ගන්න පුළුවන්, ජලවිදුලිය, ඛනිජ තෙල් සහ වියළි දර. මේවායින් උත්පාදනය කරන බලශක්ති ධාරිතාවෙන් අතිවිශාල ප්‍රමාණයක් නාස්ති වෙනවා. සමස්ත ජලවිදුලි උත්පාදනයෙන් සියයට 39යි, ප්‍රයෝජනයට ගන්නේ. ඛනිජ තෙල්වලින් සියයට 25.5යි, ප්‍රයෝජනවත් බලශක්තියක් ලෙස උපයෝගී කර ගන්නේ. වියළි දරවලින් සියයට 39යි. මම පිළිගන්නවා, විද්‍යාත්මක හේතු නිසාත්, විද්‍යාවේ නොදියුණුකම නිසාත් බලශක්තියෙන් විශාල කොටසක් නාස්ති වන බව. ඒවා ලෝකයේ සෑම රටකටම පොදුයි. නමුත් මේක විශේෂ තත්ත්වයක්. ලංකාවේ ප්‍රධාන බලශක්ති ප්‍රභව සියල්ලගෙන්ම, ඒ සෑම එකකින්ම සියයට 50කට 60කට වැඩිය ඵල ප්‍රයෝජනයක් නොගෙන විනාශ වෙන තත්ත්වයක් තමයි තියෙන්නේ.

ලංකාවේ විදුලිබලාගාරවලින් මෙගාවොට්ස් 1600 ගණනක් නිෂ්පාදනය කරනවා. ඒකෙන් මෙගාවොට්ස් 1100 ගණනක් නිෂ්පාදනය කරන්නේ ජල විදුලියෙන්. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න කැමතියි – මේක වර්තමාන ඇමතිතුමාට අදාළ ප්‍රශ්නයක් නොවෙයි – මේ සංවර්ධන උපාය මාර්ග ඇතුළේ අපි විශාල උගුලකට හිර වී සිටින බව. ජලවිදුලිය නිෂ්පාදනය කරන්නය කියලා විශාල ජලාශ හැදුවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ජලාශවලින් බලාපොරොත්තු වුණු විදුලි උත්පාදන ධාරිතාවෙන් අඩුම ගණනේ සියයට 75ක්වත් – හතරෙන් තුනක්වත් – තවම සපුරන්නේ නැහැ. ප්‍රධාන හේතුව තමයි, ලංකාවේ විද්‍යාඥයින් එපා කිව්ව තැන්වල – ඉතාම විද්‍යානුකූලව එපා කිව්ව ස්ථානවල – මේ ජලාශ ඉදි කලා. හොඳම උදාහරණය සමනල වැව. සමනල වැව ව්‍යාපෘතියේ වියදම රුපියල් මිලියන 17,000යි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් විගණකාධිපතිතුමාගේ වාර්තාවේ සඳහන්ව තිබෙන ආකාරයට සමනල වැව ව්‍යාපෘතියේ කාන්දුව යම් ප්‍රමාණයකට වළක්වන්න වියදම් කර තිබෙනවා, රුපියල් මිලියන දහස්. නමුත් තවම සම්පූර්ණයෙන් අවසන් කර නැහැ. ඒකට ප්‍රධාන හේතුව තමයි, ලාංකීය විද්‍යාඥයන් දුර්වලයි කිව්ව තැන්වල ජලාශ ඉදි කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජල විදුලිය රඳා පවතින්නේ ජලය ලැබීම මතයි. ලංකාවට ජලය ලැබෙන ප්‍රධාන මාර්ගය වර්ෂාවයි. නමුත් මේ ජල විදුලි බලාගාර හදන්න කියා කඳුකරයේ අතිවිශාල කැළෑ ප්‍රමාණයක් හෙළි කළා. අද සිදු වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලාශ පහක් ඉදි කරන්න ගිහින් කඳුකරයේ කැළෑ ප්‍රමාණය සියයට 22 සිට සියයට 8 දක්වා බැස්ස එකයි. 1980 දී සියයට 22යි. මහවැලි ප්‍රොජෙක්ට් ඉවර වෙනකොට 8යි. අද මොකක්ද වෙලා තිබෙන්නේ ?

පොල්ගොල්ල ජලාශයෙන් සියයට 50ක් රොන්මඩ. කොත්මලේ ජලාශයෙන් සියයට 40ක් විතර රොන්මඩ. ඒ කියන්නේ කොච්චර වැස්සත් දත් වැඩක් නැහැ කියන එකයි. ජලාගවල ඒ ධාරිතාව රඳවා ගන්න බැහැ. වැරදි සංවර්ධන උපාය මාර්ග.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සාකච්ඡාව ආරම්භයේදී මම වික්ටෝරියා ජලාශය පිළිබඳව කියන්න කැමැතියි. වික්ටෝරියා ජලාශය පිළිබඳව අද ලංකාවේ බොහෝ දෙනාකුගෙන් ඇහුවොත් ඒ අය කියනවා, වික්ටෝරියා ජලාශයෙන් අක්කර ලක්ෂයකට විතර කුඹුරු වගා කරන්න වතුර දෙනවාය කියා. අප 9 වන පන්තියේ ඉගෙන ගන්නකොට සමාජ අධ්‍යයන පොතෙත් තිබුණා වික්ටෝරියා ජලාශයෙන් කුඹුරු අක්කර දස දහස් ගණනක් වගා කරනවාය කියා. ඒක සියයට සියයක අසත්‍යයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බිමල් රත්නායක මහතා]

ගරු ඇමතිතුමා දන්නවා ඇති වික්ටෝරියා ජලාශයෙන් එක කුඹුරු අක්කරයකට වතුර දෙන්නේ නැති බව. ඒක තනිකරම ජල විදුලි බලය සඳහා පමණක් හැදූ ජලාශයක්. හැබැයි, මොකක්ද කළේ ? ඒ ඉතාම සශ්‍රික කිඹුල්වල මහවැලි ජලාශ හදලා ඒවායෙන් වගා කරන බිම්වලින් ලැබෙන පලදාවට වඩා වැඩියි කොත්මලේ දුම්බර මිටියාවතේ ඒ යට වුණ ඉඩම්වල වටිනාකම කියා ගණන් බලා කියා තිබෙනවා. සමහර විද්‍යාඥයන් එහෙම තර්ක කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකාර්මික ජලාශ හදනවාය කියා ඒ වගේ අසත්‍ය ප්‍රකාශ කර විදුලි බලාගාර සඳහා තමයි, ජලාශ හැදුවේ. නමුත් අන්තිමට මොකක්ද වෙලා තිබෙන්නේ ?

දන් මා අතේ තිබෙනවා, ආචාර්ය එල්. ඩබ්ලිව්. මැදිවක කියන ආර්ථික හා භූ විද්‍යාඥයකුගේ පත්‍රිකාවක්. ජගත් වේලි කොමිසමට ඉදිරිපත් කළ ඔහුගේ සාක්ෂි බලන්න. ඔහු මොකක්ද කියන්නේ ? මම එය කියවන්නම්.

"බ්‍රිතාන්‍යයේ විදේශ සංවර්ධන අධිකාරියෙන් ලැබුණු අති විශාල මුදලක් මත මෙම වික්ටෝරියා වේල්ල හා විදුලි බලාගාරය ඉදි කරනු ලැබීය. මෙම වේල්ල හා බලාගාරයේ ටර්බයින ඉදිකරනු ලැබුවේ ඒ සඳහා සකස් කළ මහ සැළසුමේ ඇති මාර්ගෝපදේශයන් හා උපදෙස්වල සඳහන් උස හා ප්‍රමාණයට වඩා විශාලවය. මෙයට හේතුව වූයේ බලාගාරය සඳහා අවශ්‍ය ටර්බයින් යන්ත්‍ර ගෙන එනනු ලැබුවේ එවකට බ්‍රිතාන්‍යයේ සිටි දේශපාලනඥයෙකුට සම්බන්ධ සමාගමකින් විමය. මේ ටර්බයින් යන්ත්‍ර ක්‍රියා කිරීමට නම් වේල්ලේ උස වැඩි කළයුතුව තිබුණි. ඒ අනුව වේල්ලේ උස වැඩි කර ඇත්තේ මෙම ටර්බයින්වල අවශ්‍යතාවය අනුවය."

මේ මම කියන කතාවක් නොවෙයි. ලංකාවේ දුම්බර මිටියාවතෙන් පහළ වුණ අතිවිශිෂ්ට විද්‍යාඥයකු වන ආචාර්ය මැදිවක කියන්නේ. වික්ටෝරියා වේල්ලේ උස වැඩි කරන්නේ මහවැලි ගඟේ තිබෙන ජල ධාරිතාව බලා නොවෙයි. එය මාග්‍රට් තැචර් මහත්මියගේ පුතාගේ සමාගම. එයයි මෙයට ටර්බයින් දුන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්තිම තක්කඩි ආකාරයේ සංවර්ධන ව්‍යාපෘති අපට උගුල් බව පත් වීම නිසා තමයි අද අප විඳව විඳවා සිටින්නේ. ඉතින් අපට හැමදම ජල විදුලි අර්බුදයක් තිබෙනවා. තව අවුරුදු 100ක් ගියත් වික්ටෝරියා ජලාශයෙන් හෝ ඔය කියන ජලාශවලින් හෝ මේ තිබෙන අර්බුදවලට විසඳුමක් ලැබෙන්නේ නැහැ.

ඊළඟට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වර්තමාන අර්බුදය ගැන කියන්න කැමැතියි. දැන් අප උගුලේ වැටිලා තිබෙන්නේ. මේ ජලාශවල රොන්මඩ අයින් කරනවාය කියන එක අතිවිශාල වියදමක් වැය වෙන ඉවරයක් නොවන කර්තව්‍යයක් ගරු ඇමතිතුමනි. ඔබතුමා මේ අවුරුද්දේ එය අවසන් කළත් තව අවුරුදු තුනකට පස්සේ නැවතත් ඒ දේ සිද්ධ වෙනවා. මොකද? ලංකාවේ මධ්‍යම කඳුකරයේ පස ඉතා වේගයෙන් සෝදා යෑමට ලක් වෙනවා. ඒ නිසා නැවත නැවතත් මේක කරන්න වෙනවා. ඒ අනුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ඉවර නැති උගුලකට දමා තිබෙනවා, මේ විදුලිබල වැඩ පිළිවෙළ හරහා. මේවාට යන වියදම කාගෙන්ද එකතු වෙන්නේ? මේ වියදම තමයි, අපේ විදුලි බිලට එකතු වෙන්නේ. මේ රොන්මඩ ඉබේ අස්වෙන්නේ නැහැ නේ. ඒවා අස් කරන්නට සමාගම්වලට ටෙන්ඩර් දුන්නාම ඒ වියදම අපේ විදුලි බලයේ කොටසක් විධියට අය වෙනවා.

ලංකාවේ නිපදවන විදුලි බලයෙන් සියයට 70ක්ම පාවිච්චි කරන්නේ විදුලි බලය පාවිච්චි කරන අයගෙන් සියයට 9යි. ලංකාවේ කොළඹ සිටින මිනිසුන්ට විදුලිය දෙන්නට කෙල්දෙණියේ සිටින මිනිසුන් තමන්ගේ පාරම්පරික ඉඩකඩම්, තමන්ගේ සංස්කෘතිය, තමන්ගේ ඉතිහාසය කැප කළා. නමුත් මම වගකීමෙන් කියනවා, තවමත් ඒ ප්‍රදේශවල ජනතාවගෙන් සියයට 60කට ආසන්න ප්‍රමාණයකට විදුලිය නැහැ කියා. ජලාශය හදන්නට ඒ අයගේ ඉඩම් ගත්තා. හැබැයි, කෙල්දෙණියේ ජනතාව, මේ ප්‍රදේශවල ජනතාව තවමත් සිටින්නේ අන්ධකාරයේයි.

ඊළඟට අමාත්‍යතුමාගේ අවධානය යොමු විය යුතු ප්‍රධාන කාරණය තමයි, විදුලි බලය සම්ප්‍රේෂණය කරද්දී වන විශාල නාස්තිය. මම මීට කලිනුත් මේ පිළිබඳව කිව්වා. උත්පාදිත විදුලියෙන් සියයට 25කට ආසන්න ප්‍රමාණයක් නාස්ති වෙනවා.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

මන්ත්‍රීතුමා එය සියයට 17යි. සියයට 17යි 18යි කියා තක්සේරු කර තිබෙනවා.

බිමල් රත්නායක මහතා
(திரு. பிமல் ரத்நாயக்க)
(Mr. Bimal Rathnayake)

නැහැ.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

ඊට වැඩියි. මම අඩුයි කියනවා නොවෙයි. තිබිය යුත්තේ සියයට 12යි නමුත් 18ක් -

බිමල් රත්නායක මහතා
(திரு. பிமல் ரத்நாயக்க)
(Mr. Bimal Rathnayake)

මම ළඟ සංඛ්‍යා ලේඛන තිබෙනවා. මම මහ බැංකු සංඛ්‍යා ලේඛන උපුටා දක්වන්නේ. 1990 දී මේ 'ලොස්' එක සියයට 19යි. 1991දී සියයට 17යි. 1992දී සියයට 17.6යි. 1995දී සියයට 18යි. 1996දී සියයට 18යි එම ඉතාම වගකීමෙන් කියනවා, මහ බැංකු වාර්තාව අනුව 1999දී මෙයට සියයට 20.7යි ගරු ඇමතිතුමා, එහෙම නම් මහ බැංකු වාර්තාවත් එක්ක ඔබතුමා ප්‍රශ්නය ඇදෙන්න. මම මහ බැංකු වාර්තාවෙන් උපුටා ගත්ත සටහන් කියවන්නේ. අමාත්‍යතුමාට අවශ්‍ය නම් පුස්තකාලයෙන් දැන් එය ගන්නට පුළුවන්. මම ඉතාම අභියෝගාත්මකව කියන්නේ මෙය සියයට 20.7යි කියා. මේක අතිවිශාල නාස්තියක්. මේක ඇමතිතුමාගේ වැරැද්දක් කියා, මම කියනවා නොවෙයි. මේ නාස්තිය අඩු කරන්නේ නැතිව ලංකා විදුලිබල මණ්ඩලයේ අර්බුදයට උත්තර සොයන්නට අපට බැහැ.

ඊළඟට විදුලිබල මණ්ඩලයෙන් ලැබෙන ලාභයෙන් විශාල ප්‍රමාණයක් දැන් ලෙකෝ එකට දෙමින් යනවා. ඒ කියන්නේ ලංකා විදුලි පෞද්ගලික සමාගමට යනවා. විදුලිබල මණ්ඩලයේ භාෂාවෙන් කියනවා නම් 'ගෝල්ඩන් බෙල්ට්' කියන වැඩියෙන්ම විදුලිය භාවිතා වන ප්‍රදේශයේ පවා විදුලිය බෙදහැරීම මෙන්න මේ ආයතනයට පවරමින් යනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මන්ත්‍රීතුමා, තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

බිමල් රත්නායක මහතා
(திரு. பிமல் ரத்நாயக்க)
(Mr. Bimal Ratnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වෙලාව බලා පටන් ගත්තේ. මම හිතන්නේ මට ඉවර කරන්නට තිබෙන්නේ 3.13ටයි. තවම 3.10යි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මමත් මෙතැන වෙලාව බැලුවා. එම නිසා ඔබතුමා තව විනාඩියකින් කථාව අවසාන කරන්න.

බිමල් රත්නායක මහතා
(திரு. பிமல் ரத்நாயக்க)
(Mr. Bimal Ratnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන කෙටි වෙලාව ඇතුළතදී මම ඉදිරිපත් කළේ විදුලිබල මණ්ඩලයේ එක පැතිකඩක් පමණයි. මේවාට විසඳුම් ලැබිය යුතුයි. ඊළඟට මම කියන්නට කැමතියි. විදුලිබල මණ්ඩලයේ විතර වංචා දූෂණ මම දන්නා තරමින් ලංකාවේ වෙනත් කිසිදු ආයතනයක නැති බව. මට ලැබී තිබෙන කෙටි වෙලාව ඇතුළත තවත් කරුණක් කිව යුතුයි. ලංකාවේ විදුලිබල මණ්ඩලයේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටස් අයිති ´ලක්දනව්´ ආයතනයට බලාගාරයක් ඉදි කරන්නට දුන්නේ නැහැ. ඔවුන්ට සුදුසුකම් තිබියදී, ඔවුන් අඩු මිලට සපයද්දී, ඔවුන්ට දුන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් සියලුම ලිපි ලේඛන මා ළඟ තිබෙනවා. මම ඒවා හැන්සාඩගත* කරනවා. අවුරුදු 3ක් ප්‍රමාදවෙලා තමයි, විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමා නැවත ´ලක්දනව්´ ආයතනයට කියන්නේ,´ දැන් ඇවිල්ලා බලාගාරයක් හදන්නට ආරම්භ කරන්න´ කියලා. වර්තමාන විදුලිබල අර්බුදයට ප්‍රධාන පාර කැපීම කරන්නට එක හේතුවක් තමයි, ´ලක්දනව්´ කියන විදුලිබල මණ්ඩලයේ කොටස් හිමි ආයතනයට විදුලි බලාගාර ආරම්භ කරන්නට ඉඩ නොදීම.

අනිත් කරුණ තමයි, විදුලිබල මණ්ඩලයේ ගිණුමේ රුපියල් මිලියන 6000ක අතිරික්තයක් තිබුණා. අපි දන්නා විධියට අද ඒක රුපියල් මිලියන 5000ක ඍණ අගයක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒක රුපියල් මිලියන 5000 ද, 4000 ද, 5500 ද කියා විවිධ තර්ක තිබෙනවා. නමුත් අතිවිශාල ප්‍රමාණයක්. මා සතුව තිබෙනවා, රුපියල් මිලියන 150ක චෙක් එකක්. ලංකා විදුලි බල මණ්ඩලයට ලැබිය යුතු රුපියල් මිලියන 150 ක චෙක් එකක් මගේ ළඟ තිබෙනවා. කලින් සිටි මූල්‍ය කළමනාකාරවරිය එම චෙක් එක දෙන්නේ නැතිව දවස් 12ක් ලාච්චුවක දමා තිබෙනවා. අංකයත් සහිත එම චෙක් එක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම සභාගත* කරනවා. දවස් 12 ක් මේ චෙක් එක එකවුන්ට් එකට දන්නේ නැතිව හිටියා. මෙන්න මේ වාගේ ඉතාමත් සරල කාරණා–

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා කථාව අවසන් කළොත් හොඳයි.

බිමල් රත්නායක මහතා
*(திரு. பிமல் ரத்நாயக்க)*
(Mr. Bimal Ratnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට තව විනාඩි දෙකක් දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
මම ඔබතුමාට වැඩිපුර කාලය ලබා දී තිබෙනවා. කමක් නැහැ. ඉක්මනින් කථාව අවසන් කරන්න.

බිමල් රත්නායක මහතා
*(திரு. பிமல் ரத்நாயக்க)*
(Mr. Bimal Ratnayake)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා. මේ වාගේ අති විශාල වංචා සිදු වෙනවා. රුපියල් මිලියන 45 ක මුදලින් හැදූ බංගලාව ගැන මම කියන්න යන්නේ නැහැ. සිදු වී තිබෙන වංචා ගැන බලන විට මේවා පොඩි වංචාය කියා කියන්න පුළුවන්. රුපියල් මිලියන 150 ක චෙක් එකක් එකවුන්ට් එකට දන්නේ නැතිව දවස් 12 ක් ලාච්චුවක දමා ගෙන හිටියා. මම මතකීමෙන් යුතුවයි, කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන විදුලි බල අර්බුදයට අනෙක් හේතුව තමයි, ටෙන්ඩර් ඉදිරිපත් කළ එක් සමාගමක ඒ ටෙන්ඩර් පත්‍රිකාව නැති කර, එය නැති වුණායැයි කියන එක අපි දන්නා තරමින් නම් අදාළ නිලධාරීන් පගාව අරගෙනයි, ඒක කර තිබෙන්නේ. අන්තිමේදී අවුරුදු දෙක හමාරකින් ඒ ව්‍යාපෘති පරක්කු වුණා. දැන් තමුන්නාන්සේලා පටන් ගන්න හදන compine cycle එක හරියට ක්‍රියාත්මක වුණා නම්, දැන් එය පටන් ගෙන ක්‍රියාත්මක වන්නට කාලය හරි. විදුලි බල මණ්ඩලයට සම්බන්ධ තවත් විශේෂ කාරණා තිබෙනවා. ඒවා ගැන මම කලිනුත් කිව්වා. මුදල් නොගෙවූ, විදුලි බිල් නොගෙවූ අති විශාල තක්කඩි සමාගම් ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම මම ඒ පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත් කිව්වා. ලක්ෂ්මන් බිල්ඩින් එකෙන් රුපියල් මිලියන 14 ක විදුලි බිලක් ගෙවන්නේ නැතිව තිබෙනවා. 2000 ඔක්තෝබර් මාසයේ 26 වැනි දින බිල අනුව රුපියල් මිලියන 14 ක විදුලි බිලක් තිබෙනවා.

---

*කථාව අවසානයේ පළ කර ඇත.
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Reproduced at end of speach.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඇමතිතුමාට දැන ගැනීමට අවශ්‍ය නම්, ඔබතුමාට ඔය විස්තර සභාගත කරන්නට පුළුවන්.

බිමල් රත්නායක මහතා
*(திரு. பிமல் ரத்நாயக்க)*
(Mr. Bimal Ratnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම නොරොච්චෝලේ ගැනත් එක තත්පරයකින් කියා මගේ කථාව අවසන් කරන්නම්. නොරොච්චෝලේ බලාගාරය ඉදිකළොත් එහෙම, එයින් සිදු වන පරිසර දූෂණය පැත්තකින් තබන්න. කිලෝ මීටර් පහක් දිගට මුහුදේ කණු ගහන්න ඕනෑ. මොකද ? breakwater එකක් හදන්න ඕනෑ නැහැයි කියලයි, ආණ්ඩුව තර්ක කරන්නේ. breakwater එකක් නැතිව මුහුදේ කිලෝ මීටර් පහක් දිගට කොන්ක්‍රීට් කණු ඉදිකළොත් එහෙම –

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න. මොකද ? දැන් නොරොච්චෝලේ ගැන කියන්නට ගියොත් තත්පරයකින් කියන්න බැහැ. කථා කරන්නට තව මන්ත්‍රීවරුන් ගණනාවක් ඉන්නවා.

බිමල් රත්නායක මහතා
*(திரு. பிமல் ரத்நாயக்க)*
(Mr. Bimal Ratnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කෙටියෙන් මට ඉවර කරන්න පුළුවන්. මෙය විශේෂ කාරණයක් නිසාත්, ආණ්ඩුව විශාල වශයෙන් පෙනී සිටින කාරණයක් නිසාත් මම කියන්නේ මේකයි. කිලෝ මීටර් පහක් දිගට මුහුදේ කොන්ක්‍රීට් කණු සිටුවන්නට ලංකාවේ කිසිදු සමාගමකට හැකියාවක් නැහැ. මේවා ඔක්කොම පිටින් ගෙන්වන්නට ඕනෑ. මේකට Conveyor belt එකක් දන්න ඕනෑ. ගල් අහුරු නැව්වලින් ගේන්නේ. මේක නඩත්තු කරන්න විතරක් අති විශාල වියදමක් දරන්න සිදු වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා දැන් කථාව අවසන් කරන්න.


බිමල් රත්නායක මහතා
*(திரு. பிமல் ரத்நாயக்க)*
(Mr. Bimal Ratnayake)
එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේකයි. නොරොච්චෝලේ බලාගාරය හැදීම විශාල උගුලක් බව අපි කියනවා. ලංකාවේ ජනතාව අති විශාල ණය බරකට යටත් කරන වැඩ පිළිවෙළක් බවත් අපි කියනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. තවත් ඵලදායී යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්නට තිබුණත්, ඒ සඳහා මට කාලය නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
උපදේශක කාරක සභාවේදී ඔබතුමාට ඒ කරුණු ඉදිරිපත් කරන්නට පුළුවන්.

බිමල් රත්නායක මහතා
*(திரு. பிமல் ரத்நாயக்க)*
(Mr. Bimal Ratnayake)
හොඳයි. බොහොම ස්තුතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නිහඬ වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*සභාමේසය මත තබන ලද ලේඛන :
சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்றுக்கள் :
*Statements tabled :*


MINISTRY OF IRRIGATION & POWER

14 August, 1998.

Attorney General.
Department of Attorney General

Dear Sir,

ELIGIBILITY OF LAKDHANAVI PRIVATE LIMITED FOR PARTICIPATING IN A PRIVATE POWER PLANT PROJECT

The Project Committee evaluating proposals received for 2 x 20 MW Medium Term Power Plants has noticed that a Company named Lakhanavi (Pvt) Limited has also made an offer for the project jointly with others.

It is noticed that the Lakdhanavi (Pvt) Limited is a Limited Liability Company registered under the Companies Act, with major share holding by Lanka Transformers Limited. Lanka Transformers Limited is a Joint Venture Company formed under a Joint Venture Agreement between the Ceylon Electricity Board (CEB) and National Industri A/S of Narway.

The Government of Sri Lanka, through the Policy Directives published for the Power Sector, states that only private parties could build thermal power plants in Sri Lanka in the future, unless otherwise datermined by the Government on a case by case basis depending on the circumstances and national importance.

The Poject Committee is not certain to consider Lakdhanavi (Pvt) Limited as a private developer eligible under the above policy, since CEB being a statutory body established under the Ceylon Electricity Board Act No. 17 of 1969, has an indirect ownership of 47.3% of Lakdhanavi.

The Project Committee therefore has decided to obtain your considered view and advise on the eligibility of Lakdhanavi (Pvt) Limited participating in this powe : project as a private develper, in line with the Government Policy Directives on Power Sector.

I appreciate your advise on this matter, at your earliest.

Following documents are annexed herewith for your reference.

1. A copy of the Government Policy Directives on Power Sector.
2. Relevant clause of the joint Venture Agreement for Lanka Transformers Limited, between the CEB and National Industri A/S of Norway.
3. A copy of the report on Lakdhanavi Private Limited furnished to me by the Chairman, Ceylon Electricity Board.
4. A Copy of the letter dated 13th July 1998, by the Director, Lakdhanavi (Pvt) Limited, forwarding a legal opoinion on related subject.

Yours faithdully.
Ananda S. Gunasekera
Addl. Secretary (Power & Energy)
and
Chairman, Project Committee
2 x 20 MW Thermal Power Plant on Medium Term on BOO

Secretary, M/I&P
Chairman, CEB

21st October, 1998.


Secretary,
Ministry of Irrigation & Power,
500, T. B. Jayah Mawatha,
Colombo 10.

ELIGIBILITY OF LAKDHANAVI PRIVATE LIMITED FOR PARTICIPATING IN A PRIVATE POWER PLANT PROJECT

I refer to your letter of 14th August, 1998.

It would appear from the material made available to me that Government of Sri Lanka does not directly hold any shares Lakdhanavi (Pvt.) Limited. Furthermore, the majority shares the said Company, i.e., 68 % are held by another limited liability Company called Lanka Transforers Limted. In this background am of the opinion that even though the majority shareholder Lanka Transformers Limited is the Ceylon Electricity Board (CEB) this fact by itself does not categorize Lakdhanavi (Pvt.) Limited as a public sector organization.

However, the contents of the "Power Sector Policy Directions seem to confirm that the policy of the Government in relation power sector is to ensure participartion by the private sector the exclusion of any organization in which the Government has direct or indirect interest. Thus, even though as a matter law Lakdanavi (Pvt.) Ltd. could be categorized as private sector, in view of the presence of the CEB through Lanka Transformers Ltd., the question could arise as to whether is proper to permit the said Company to participate in the biddin process. Since, this is primarily question of policy I would suggest that an appropriate decision be taken even at this stage by the authorities concerned.


SEYLAN BANK LIMITED
MILLENNIUM BRANCH
CORPORATE BANKING
ACCOUNT PAYEE
7287 - 086
2000 / 12 / 21
Pay Ceylon Electricity Board Or Bearer
Rupees One hundred & fifty million Only
Rs. 150,000,000/-
LANKA ELECTRICITY CO. (PVT) LTD.
CHAIRMAN/GENERAL MANAG

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අ. භා. 3.12]

ගරු එම්. සී. ගොපල්ලව මහතා (සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.சீ. கொபல்லாவை - பண்பாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. M. C. Gopallawa – Minister of Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරම්පරා තුනක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ පවුලක කෙනෙක් වන ඔබතුමා මූලාසනය දරන අවස්ථාවේ මට කථාවක් කරන්නට අවස්ථාව ලැබීම ගැන මගේ සන්තෝෂය මම ප්‍රකාශ කරනවා.

මේ අවස්ථාවේදී මම බලාපොරොත්තු වන්නේ විවේචනයක් කිරීමට නොවෙයි. පසුගිය අවුරුදු හය තුළ විශේෂයෙන්ම ලග්ගල මැතිවරණ කොට්ඨාසයටත්, මාතලේ දිස්ත්‍රික්කයටත් විදුලි බලය ලබා දීම පිළිබඳව රත්වත්තේ මැතිතුමාට මගේ ස්තුතිය පුද කරන්නට ඕනෑ. මම දෙවැනි වතාවට මන්ත්‍රීධුරය භාර ගන්නා විට, සියයට 17ක් විතර ගම්වලට විදුලි බලය ලබා දී තිබුණා. නමුත් මේ වන විට ගරු රත්වත්තේ මැතිතුමාගේ සහයෝගය නිසා සියයට 60ක් පමණ ගම්වලට විදුලි බලය ලබා දී තිබෙනවා. ඒ වගේම තවත් වැඩ කොටසක් කෙරෙමින් පවතිනවා. එම නිසා මම හිතනවිධියට එතුමාගේ ඉලක්කය වී තිබෙන්නේ 2005 වන විට විදුලි බල අවශ්‍යතාවය සියයට 100ක්ම සම්පූර්ණ කරන්නටයි. පසුගිය කාලයේ තිබුණු ආකාරයටම ගරු ඇමතිතුමාගේ සහයෝගය තවදුරටත් ලග්ගල මැතිවරණ කොට්ඨාසය කෙරෙහි පවතිනවා නම් 2003 වන විට සම්පූර්ණයෙන්ම අපට විදුලි බලය ලබා දෙන්නට පුළුවන් තත්ත්වයක් තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ.

ඉතාමත් අර්බුදකාරී අවස්ථාවල තමයි, රත්වත්තේ මැතිතුමා මේ අමාත්‍යාංශය භාර වී තිබෙන්නේ. පසුගිය අවුරුදු දෙක තුළ කෑ ගැහුවේ කුමක් කියමින්ද කියා මට මතකයි. 'ජලයෙන්ම විදුලිය ලබා ගන්නට බලා සිටිනවාය; ඒ නිසා විදුලියේ අඩුපාඩුකම් තිබෙනවාය; ඒ නිසා විදුලිය කපනවාය' කියා චෝදනා කළා. ඉන් පසුව එතුමා thermal power වලින් විදුලිය උත්පාදනය කරන්න කටයුතු කළා. දැන් මම හිතන විදියට සියයට 30ක් පමණ thermal power වලින්ද සියයට 68ක් පමණ ජලාගාරවලින්ද විදුලි නිෂ්පාදනයක් බලාපොරොත්තු වෙනවා. මේ විධියට කළාමත් මිල වැඩි කරනවාය කියා ඊළඟට චෝදනාවක් එනවා. ඒ වාගේම මිල අඩුවෙන් තිබෙන ගල් අඟුරු ගෙනත් මෙහේ විදුලිය නිෂ්පාදනය කරන්න යන විටත් ඒක කරන්නත් එපාය කියා උද්ඝෝෂණ එනවා. එහෙම නම්, මේ සභාවේ තමුන්නාන්සේලා කියන හැටියට මොකක්ද කරන්න ඕනෑ කියා මට නම් තේරෙන්නේ නැහැ.

එහෙම වුණත් මේ විවේචන සියල්ලක්ම විඳ දරාගෙන ගරු අමාත්‍යතුමා ක්‍රමානුකූල ගමනක් යන බව අපට සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න පුළුවන්. ඒක නිසා කොයි කොයි ප්‍රදේශවලින් නොයෙක් බියවල් පෙන්නුවත්, විදුලිය සැපයීම වැඩි වේවි. ඒ වාගේම විදුලිය ඉල්ලන කට්ටියත් වැඩි වේවිය කියන එක මේ අවස්ථාවේදී මම මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම මගේ ආසනයට අදාළ කාරණා දෙකක් ගැන ගරු අමාත්‍යතුමාට මතක් කරන්නට ඕනෑ. එකක්, මහනුවර දිස්ත්‍රික්කයේ ඉතාමත් දුෂ්කර ගම්මාන දෙකක් වන කයිකාවලටත්, මීමුරයටත් විදුලිය ලබා දීම ගැනයි. මූලික විදුලි පද්ධතියට ටෙන්ඩර් 'කෝල්' කර කොන්ත්‍රාත්කාරයකුටත් දුන්නා. මීමුරයටත්, කායිකාවලටත් මේ විදුලි රැහැන් යන්නේ මගේ ආසනය මැදිනුයි. ඒ අතර සැතපුම් 9ක් තිබෙනවා. සම්පූර්ණ කැලේ මැදින්, කඳු මුදුන්වලින් තමයි මේක යන්නේ. මේ හේතුව නිසා ඒ කටයුත්ත ටිකක් පමාවී තිබෙනවා. කොන්ක්‍රීට් කණු කැලේ උඩට උස්සාගෙන යන්න බැහැයි කියා ගන්න ගන්න කොන්ත්‍රාත්කාරයා කියනවා. මේ කණු උස්සාගෙන යන්න තිබෙන්නේ නකල්ස් 'රේන්ජ්' එක උඩටයි. ඒ නිසා මෙම කොන්ත්‍රාත්තුව ගන්න ගන්න මනුෂ්‍යයා මේක අත් හැර දා යන තත්ත්වයක් තිබෙන්නේ. ඒකෙන් මේ වැඩේ දැන් අවුරුදු 2ක් පමණ ප්‍රමාද වී තිබෙනවා. මේ සම්බන්ධයෙන් කෙළින්ම විදුලි රැහැන් අදින්න මාර්ගයක් තිබේද කියා මා දන්නේ නැහැ. කෙළින්ම විදුලිබල මණ්ඩලය මඟින්වත් මේ කටයුත්ත භාරගෙන කළොත්, අවසන් කරන්න පුළුවන් වේය කියා මා අදහස් කරනවා. නැත්නම් ටිකක් ඇදි ඇදී යන්න ඉඩ තිබෙනවා. මොකද, සම්පූර්ණයෙන්ම ඉතාමත් ලොකු කඳුකරයක් තිබෙන නිසා.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

ලී කණු ගෙන යන්න පුළුවන්. [බාධා කිරීමක්]

ගරු එම්. සී. ගොපල්ලව මහතා
(மாண்புமிகு எம். சீ. கொபல்லாவை)
(The Hon. M. C. Gopallawa)

එහෙම නම් හොඳයි. තමුන්නාන්සේ කියනවා නම්, ලී කණු ගෙනත් තිබෙනවා කියා මා ඉතාමත් සන්තෝෂ වෙනවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ உறுப்பினர் ஒருவர்)
(An hon. Member)

අමාත්‍යතුමා, මෙහේ හිටිය අලි සංඛ්‍යාව දැන් අඩුයි.

ගරු එම්. සී. ගොපල්ලව මහතා
(மாண்புமிகு எம். சீ. கொபல்லாவை)
(The Hon. M. C. Gopallawa)

අලින්ටත් යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ உறுப்பினர் ஒருவர்)
(An hon. Member)

කොට ඇදපු අලි දැන් නැහැ.

ගරු එම්. සී. ගොපල්ලව මහතා
(மாண்புமிகு எம். சீ. கொபல்லாவை)
(The Hon. M. C. Gopallawa)

'කොට ඇදපු අලි නැහැ'යි කියනවා. ඔක්කොම මේ පැත්තට ඇවිල්ලා. [බාධා කිරීම්] ඒක නිසා ගරු අමාත්‍යතුමනි, ලී කණු දාන්න අවසර දෙනවා නම්, ඒ වැඩේ කෙරේවි යයි මා විශ්වාස කරනවා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමා මිනිපේ පියවර 3 සහ 4 ගැන හොඳටම දන්නවා. මේ මුල්ලේ සිට එහා මුල්ලට සම්පූර්ණයෙන් කිලෝ මීටර් 38කට සෑහෙන ප්‍රමාණයක දැන් විදුලිය ලබාගෙන තිබෙනවා. මේ අනුව නිවාස හත් අට දාහකට විදුලිය ලබා දී තිබෙනවා. ඒ අයට බිල් ගෙවීම සඳහා සහ සැපයුම් ඉල්ලීම සඳහා සැතපුම් 40ක් පමණ දුර ගෙවා හසලකට යන්න සිදුවී තිබෙනවා. කරුණාකර පුළුවන්කමක් තිබෙනවා නම්, හෙට්ටිපොළට විදුලිබල මණ්ඩලයේ පොඩි කාර්යාලයක් ලබා දෙනවා නම් ඒක අපට ප්‍රයෝජනවත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දිගින් දිගට කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මට වේලාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ඉතාමත් වගකීමක් ඇතිව, විවේචනවලට ලක් වෙමින්, අමාරු කාලයක මේ කටයුත්ත සාර්ථකව කරගෙන යන ගරු අමාත්‍යතුමාට ඒ සඳහා තව තවත් ධෛර්‍යය ලැබේවාය කියමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 3.18]

දහම් විමලසේන මහතා
(திரு. தஹம் விமலசேன)
(Mr. Daham Wimalasena)

Sir, the Government in its Budget Speech has taken up the position that one of the reasons for the current economic crisis is the high price of crude oil. This has been repeated many times even during this Debate. The other reason is, of course, the high cost of war. Both these matters come under the purview of the Hon. Minister.

However with the little time available to me, I would really like to refute this position. – [*Interruption.*] That is what I am saying. I will put forward certain figures which would surprise

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දහම් විමලසේන මහතා]

you. You said that in the year 2000 you paid US Dollars 28 per barrel, whereas in 1998, you paid only US Dollars 13 per barrel. US Dollars 13 per barrel was the lowest price in ten years. It was unusually low and the CPC and the Government made massive profits and obtained of benefits from the very low price of crude oil. Now in 1998, with the low crude oil price of US Dollars 13, the Corporation made an operational profit of Rs. 8 billion and got a net profit of Rs. 5 billion. Then the Government also took Rs. 19 billion from the Corporation by way of taxes, levies and duties. You really ran the country in 1998 with the blackmarket profits obtained from the CPC. Now, is US Dollars 13 a reasonable price ? It was the lowest price in 10 years. In the year 2000, you paid US Dollars 28 per barrel. But do you know that the CPC in previous years had paid much more than that ? In 1980, 1981, 1982, 1983, 1984 and 1985, it had paid much more than US Dollars 28 per barrel of crude oil in all those five or six years. Do you know that we had to pay as much as US Dollars 36 per barrel in the 1980s – almost 10 dollars more than you ever paid – but the economy did not crash nor did the CPC. But you cannot absorb high prices for even, one year. I will give you the details. In 1980 and 1981, we paid US Dollars 28 per barrel. In 1982, we paid US Dollars 32.24 per barrel. In 1983, we paid US Dollars 33.12 per barrel. In 1984, we paid US Dollars 30.97 per barrel, that is almost US Dollars 31 ; and in 1985, we paid US Dollars 29.3 per barrel [*Interruption.*] The quantity of crude oil processed by the refinery is limited. There is only a very marginal difference.– [*Interruption.*] Even now you are buying almost two million tons. That is all you can process – [*Interruption.*] Yes, but you can purchase only the quantity of crude oil that can be processed at the refinery.

Can you expect the price to remain at US Dollars 13 per barrel every year? It is not possible. US Dollars 28 per barrel is the price we paid for many years since the 1980s. In fact we paid much more than that. Can you rightly expect the price of a barrel of crude oil which went down to US Dollars 13 in 1998, to remain at that price? US Dollars 13 is the price we paid in 1978. That was 23 years ago, and I repeat that we paid much more than US Dollars 28 –, about which you are complaining – for more than five years in the 1980 to 1985 period. So, I do not think that this is something that you can give as an excuse because everyone knows that the price of crude oil goes up and down and that we have no control over it. So we have to come up with some other solution and I would like to suggest that rather than imposing –

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

Hon. Member, the consumption of refinde oil has also gone up.

දහම් විමලසේන මහතා
(திரு. தஹம் விமலசேன)
(Mr. Daham Wimalasena)

Yes, I accept that.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

So many more millions of tons of refined oil are imported to this country, the price of which is also higher than what you quoted.

දහම් විමලසේන මහතා
(திரு. தஹம் விமலசேன)
(Mr. Daham Wimalasena)

Yes. But also one of the reasons for the importation of more quantities of refined oil is that you have gone in for almost 100 per cent fuel-generated thermal power plants. That is another mistake in my opinion.

Sir, I wish to make a suggestion, which I believe will bring some sort of stability to the Corporation's financial operations. I would suggest that you establish a standard price taking into account the selling prices of the refined products and all operating expenses so as to have a reasonable profit to the CPC. If the price of crude oil is lower than the standard price, the savings thus accrued should be transferred to a special fund, and the money should be invested for the benefit of the Corporation. If the price goes up within a range the money lying in the fund should be utilized to meet the additional cost.

What has happened every year whichever Governmant was in power when the Corporation made huge profits following on the lowering of the oil price, the Government took the money away. I think this is ridiculous and it must be stopped. Therefore, I suggest that you fix a standard price. I think even in this Budget you have calculated at a standard price of US Dollars 25 per barrel. If you can come to an arrangement with the Treasury you would not have the Corporaton suffering like this where when it makes a profit, you take that profit away, and when it makes a loss, you recover it from the people.

You buy crude oil on a government to government basis or from oil corporation to oil corporation basis. There may be a case where you can buy a certain percentage from tha spot market. This is something that I have looked into, and I think there is a case. I would suggest that you look into this possibility. You have more expertise and are more up-to-date than I. [*Interruption*]. I do not think you have bought crude oil in the spot market. I doubt that very much. You may have bought refined products.– [*Interruption.*] I am talking about buying crude oil in the spot market.

Finally, with regard to the Corporation, I would like also to point out that the number of employees in the Corporation now stands at over 7,000. The staff cost per year is Rs. 1,491 billion, which works out to over Rs. 100 million a month. There is no doubt that the Corporation is highly overstaffed. I can remember the time when the number of employees of the Corporation did not exceed 5,000. I think that should be about the number that you should have. You have staff far in excess of your requirement. The activities of the Corporation have

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

not increased. You have in fact given up certain activities of the Corporation like the lubricant business. So I think that is another aspect that you will have to look into.

Getting back to the Ceylon Electricity Board and the power sector, there are some shocking information that my Coloeague, Mr. Dayaratne, revealed earlier. I am not going to touch on those matters.

We developed almost all the major sources of hydro power – we set up 600 Megawatts of - hydro power in less than 10 years. But what is most unfortunate is that you, after six years in Government are still struggling to put up the first power plant based on hydro-power, the Kukule Ganga hydro-power plant which will bring 70 Magawatts of power. But what is unfortunate is that the potential for hydro-power is less. There is no more potential, no more or hardly any major projects.

So, you have to go for other sources of power and I would go back to what Mr. Dayaratne said. The major alternative is coal power. There is no doubt that coal power is necessary to this country. What we are not agreeing is the site. Coal power is necessary because it is the cheapest source of power that is available.Energy is such an important issue for the people of this country that it is something that deserves to be discussed even at antin future years all party confoerence. so that we can go ahead in future years with our schemes and not let the people live in darkness.

What you have done instead of going in for alternative power like coal power, mini hydro power. dendro power and even power based on garbag as you have taken the easy route, the expensive route, with power plants based on diesel and oil fuelled gas turbines. Today you are paying Rs. 12.50 per Kilowatt hour to Aggreko and losing billions of money every year. Why do you not develop the mini hydro? I know the potential is not much. But it has been estimated in your own Master Plan that there will be a potential of 300 Magawatts of power from mini hydro but only 30 Magawatts of power is being developed or to be developed. So there is plenty more. What went wrong? Why was it not developed? It was because that you paid only Rs. 2.75 per kilowatt hour for power developed in mini hydro. You increased it to Rs. 4.00 only last month, I think. Why are you paying Rs. 12.50 a Kilowatt hour to Aggreko and paying only Rs. 4.00 for mini hydro power? Why can you not help to developed local resources? The pucrchase price of mini hydro power was increased only recently to Rs. 4.00. I think if you increase it to Rs. 6.00 or even Rs. 5.00, you will have many more developers coming in here for the development of mini hydro power. There is 37.5 Magawatts of mini hydro power potential in the Mahaweli areas and the Mahaweli Authority itself has plans for development if the price is right.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

Order, please! will an hon Member please propose that Alhaj A. H. M. Azwer do take the Chair?

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anurudha Ratwatte)

I move,

"That Alhaj A. H. M. Azwer do take the Chair."

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)

Before that I rise to a point of Order, Sir.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anuruddha Ratwatte)

No. Please take the Chair.

අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා
*(அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர்)*
(Alhaj A. H. M. Azwer)

Sir, I have to raise a point of Order. Can I raise the point of Order from the Chair? [*Interruption.*]

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anuruddha Ratwatte)

Please take the Chair.

ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මහතා
*(கலாநிதி கருணாசேன கொடிதுவக்கு)*
(Dr. Karunasena Kodituwakku)

*විසින් සථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව මනෝ විජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, திரு. மனோ விஜேரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, அல்ஹாஜ் ஏ. எச் எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. MONO WIJEYERATNE *left the Chair and* ALHAJ A. H. M. AZWER *took the Chair.*

දහම් විමලසේන මහතා
*(திரு. தஹம் விமலசேன)*
(Mr. Daham wimalasena)

Sir I hope you will not interrupt me. I appeal to the Minister and the Ministry to consider a better price for the developers of mini hydro-power plants.

Then there is what is called - may be it is little known in this country - dendro power. Dendro power is power based on wood. It highly developed in Europe and in the United States. Dendro power is something that can be developed in this country because in tropical countries growth of trees is much quicker than in temperate countries.

According to the Forestry Master Plan there are over 1,600,000 hectares of scrub and chena land. This land has to give some sort of forest cover. So, there is very good potential

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දහම් විමලසේන මහතා]

from dendro power. If you can, just cultivate one-third of this land, just 500,000 hectares of land, I think the potential for power is a massive 1200 megawatts of power. This is something, maybe, not even thought of in this country. But it is available abroad – power based on wood. Energy plantation, I think is a very potential answer to our problem. There is great potential for power in this country. But your Ministry is not even looking at this source of power. You are only looking at the thermal, diesel and oil based power.

Then also one has to look at anohter source of power, which will solve another problem. In Colombo we see all around us mountains and mountains of garbage. Now garbage is also a source of power. I have been old told that there is potential for 10 megawatts of power in Colombo alone from garbage. They have 250,000 tons of garbage every year in the Municipal area of Colombo. Then, what about the garbage in other areas such as Dehiwela, Mr. Lavinia, Moratuwa, Mahargama, et cetera. You go to most European countries you will see power produced from garbage. And, again the problem is the price you are prepared to pay them is not satisfactory. If you are prepared to pay Rs. 6, I think a lot of projects will come on to your table. On the question of garbage you will not only have power but you will have a better more environmentally acceptable Colombo.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anuruddha Ratwatte)

Are you also suggesting an increase in our selling prices ?

දහම් විමලසේන මහතා
*(திரு. தஹம் விமலசேன)*
(Mr. Daham Wimalasena)

Well, you are now paying much more to oil based power. You are paying much more than that – [*Interruption*]. I am suggesting a source of power, which will be much less than what you are paying – [*Interruption*] Is Rs. 5 too high. I think you can easily pay Rs. 5. If you do not develop this source of power, the alternative would be that, with the depreciation of the rupee and so forth, you will be paying much more for oil based power – [*Interruption*] Anyway, Hon. Minister, I would like you to seriously consider the prices for alternative source of power. Mini hydro –

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anuruddha Ratwatte)

It can be considered. But I want to point out another matter while you are speaking, that the selling price also we have to consider.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

Hon. Member, you have only half a minute.

දහම් විමලසේන මහතා
*(திரு. தஹம் விமலசேன)*
(Mr. Daham Wimalasena)

Thank you. With regard to coal power, while I am fully endorsing that coal power should be one of the answers to our power problem, I would also like to mention something, which has come recently to the light of people. In the last two, three years there is some concern on this coal power issue, about the effect on the environment from coal power plants. I hear in the States near the coal plants, there has been an increased concentration of arsenic and mercury and it is reported that this is causing some sort of concern to those living close to the loal power plants. This is something that has to be investigated – [*Interruption*]. It is in the States. This is a new development. But I think a poor country like ours has no alternative but to go to coal power.

Thank you.

[අ. භා. 3.36]

විජය දහනායක මහතා
*(திரு. விஜய தஹநாயக்க)*
(Mr. Wijaya Dahanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම රජයේ පළමු වන අයවැයේ කාරක සභා අවස්ථාවේදී විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මෙම උත්තරීතර සභාවේදී මගේ අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ උත්තරීතර සභාවේ මගේ මංගල කථාව කරන අවස්ථාවද මෙය වෙනවා. පළමුවෙන්ම මා මේ පාර්ලිමේන්තුවට තෝරා පත් කර එවූ දෙනියාය ආසනයේ ප්‍රගතිශීලී ජනතාව ඇතුළු මාතර දිස්ත්‍රික්කයේ සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය මම මේ අවස්ථාවේ පුද කරනවා.

ඒ වගේම මට දේශපාලන මග පෙන්වූ, මට දේශපාලන පන්නරය ලබා දුන්, මගේ පියාණන් වූ 1960 හා 1970 කාලසීමාවන්වලදී මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ සුමනපාල දහනායක මැතිතුමා සහ මගේ මෑණියන් මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

ඒ වගේම 1990දී මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයකු වශයෙන් පත් කර මට මන්ත්‍රීවරයකු වීමේ අවස්ථාව ලබා දුන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මම ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වගේම මේ කාලය තුළ අපට නායකත්වය දෙමින් කටයුතු කරන අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය, සහ අග්‍රාමාත්‍යතුමා ඇතුළු සියලුම මැති ඇමතිවරුන් මම මේ අවස්ථාවේදී ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ආසනය ඉතාමත් දුෂ්කර ආසනයක්. ඒ වගේම අවුරුදු ගණනාවක් දේශපාලනඥයන්ගේ අවධානයට ලක් නොවුණු දුෂ්කර බල ප්‍රදේශයක්. පසුගිය අවුරුදු හය තුළ දැවැන්ත විදුලි යෝජනාක්‍රම ක්‍රියාත්මක කරමින් මේ ප්‍රදේශයට සංවර්ධනයේ දොරටුව විවෘත කර දුන් බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සලකා බැලෙන මේ අවස්ථාවේදී ඉතාමත් සතුටින් ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දෙනියාය බල ප්‍රදේශය බහුතින් භූලතින් සරුසාර වූ ප්‍රදේශයක්; තිල්වලා ගහත්, ගිං ගඟත් උරුම කර ගත් ඉතාමත් අහිංසක ජනතාවක් ජීවත් වෙන ප්‍රදේශයක්. මේ ප්‍රදේශයේ ජනතාවට සංවර්ධනයේ දොරටුව විවෘත කරදෙන්න අපට අවස්ථාවක් ලැබුණේ, පසුගිය අවුරුදු හය තුළ – 1994න් පසුව – ක්‍රියාත්මක කළ විදුලි යෝජනාක්‍රම තුළින් මේ ප්‍රදේශයට විදුලිය ලබා දීම නිසා බව මම මේ අවස්ථාවේදී ඉතාමත් සතුටින් ප්‍රකාශ කරනවා. ඒ සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා. එද මාතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිස්ත්‍රික්කයෙන් අඩුවෙන්ම විදුලිය ලබා දී තිබුණු මේ දෙනියාය බල ප්‍රදේශයට ඉතා විශාල දැවැන්ත විදුලි යෝජනාක්‍රම තුළින් විදුලිය ලබා දීම නිසා දෙනියාය ප්‍රදේශයේ ජනතාවට බරපතලම ගැටලුවක් වී තිබුණු විදුලිය සම්බන්ධ ප්‍රශ්නය අද මේ වන විට අවසන් වී තිබෙන බව මම ඉතාමත් සතුටින් කියනවා.

මේ තරම් ඉක්මනින් ඒ ගම්මානවලට විදුලිය ලැබේවිය කියා ඒ ප්‍රදේශවල ජනතාව කවදාවත් සිතුවේ නැහැ. ඒ නිසා ගරු අනුරුද්ධ රත්වත්තේ අමාත්‍යතුමාට මේ අවස්ථාවේදී මගේ විශේෂ කෘතඥතාව පළ කරනවා. එතුමා එකක් රුපියල් ලක්ෂ 75කට, 80කට වැඩි වටිනාකමින් යුත් විදුලි යෝජනාක්‍රම අපට ලබා දුන්නා. මම මේ අවස්ථාවේදී ඉතාමත් සතුටින් කියන්න ඕනෑ, එදා කුප්පි ලාම්පුවෙන් එළිය බැලූ ජනාව අද ඒ විශාල විදුලි යෝජනාක්‍රම ක්‍රියාත්මකවීම තුළින් විදුලිය ලැබීම නිසා නවීන යන්ත්‍රෝපකරණ පාවිච්චි කරනවා. ඒ නිවාසවල ගෘහ විදුලි උපකරන භාවිතා කරනවා. ඒ විතරක් නොවෙයි, අද මේ වන විට ඔවුන් ස්වයං රැකියා අවස්ථාවන්ද උදා කර ගෙන තිබෙනවා. නවීන තාක්ෂණයත් එක්ක සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පොදුජන එක්සත් පෙරමුණ රජයටත්, ගරු අනුරුද්ධ රත්වත්තේ අමාත්‍යතුමාටත් මගේ විශේෂ ස්තුතිය පුද කරනවා.

විදුලිබලය ගැන කථා නොකර අපට මේ ප්‍රදේශයේ සංවර්ධනය ගැන කථා කරන්නට බැහැ. ඒ නිසා ගරු අමාත්‍යතුමා මේ ලබා දුන් සහයෝගය පිළිබඳව මම එතුමාට අනේක වාරයක් ස්තුතිවන්ත වෙනවා. ගරු අමාත්‍යතුමාගේ උපදෙස් අනුව අපි මේ වන විට තවත් යෝජනා රාශියක් සැලසුම් කර ඒවායේ මැනුම් කටයුතු අවසන් කර තිබෙනවා. මේවා ඉතාමත් ඉක්මනින් ක්‍රියාත්මක වේවි කියා ඒ ප්‍රදේශයේ ජනතාව බලාපොරොත්තු රාශියක් හිස මත දරාගෙන ඉන්නවා. ගරු අමාත්‍යතුමාට සහ නියෝජ්‍ය අමාත්‍යතුමාටත් විදුලිබල මණ්ඩලයේ නිලධාරී මහතුන්ටත් මම මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා. පසුගිය කාලය තුළ එතුමන්ලා කෙරෙහි අප තැබූ විශ්වාසය ඒ ආකාරයෙන්ම එතුමන්ලා අපට ආරක්ෂා කර දී තිබෙනවා. ඒ වාගේම ගරු අමාත්‍යතුමාත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් ඇතුළු මේ රජය කෙරෙහි ඉදිරියටත් ඒ ප්‍රදේශයේ ජනතාව විශාල බලාපොරොත්තු රාශියක් තබාගෙන සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ඉතාමත් සතුටින් මා කියනවා, ඉතාමත් විශාල වැඩ කොටසක් දැන් අවසන් කර තිබෙනවා. මේ දෙනියාය දුෂ්කර ආසනයේ ඉතිරි වෙලා තිබෙන වැඩ කොටස ගරු අමාත්‍යතුමන්ලාගේ සම්පූර්ණ ආශීර්වාදය යටතේ අපට ඉතාමත් ඉක්මණින් කර ගෙන යන්න පුළුවන්කමක් තිබෙනවායි කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිය ගැන කථා කරනකොට මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය, ඒ වාගේම අවට ඉතාමත් දුෂ්කර ගම්මාන ඇති හස්මන, කඹුරුපිටිය, ඒ එක්කම අකුරැස්ස ගැනත් කථා නොකර බැහැ. එම ප්‍රදේශවලත් මේ ආකාරයෙන් විදුලිබලය ඉතාමත් අඩු මට්ටමක තිබී ගරු අමාත්‍යතුමාගේ මැදිහත්වීම යටතේ පසුගිය අවුරුදු හය තුළ මේ විදුලි යෝජනාක්‍රම ක්‍රියාත්මක කර විශාල වැඩ කොටසක් දැන් අවසන් කර තිබෙනවාය කියා මම හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තුළින් පසුගිය කාලය තුළ මේ ගම්මාන දියුණු වීම නිසා අද ඒ ප්‍රදේශයේ ජනතාවට යහපත් ආදායම් මාර්ග ලබා ගන්නත්, ඒ එක්කම යහපත් අනාගතයක් උදාකර ගන්නටත් පුළුවන් කමක් ලැබී තිබෙන බව මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා. ඒ වාගේම ඉදිරියේදී ඉතිරි විදුලි යෝජනා ක්‍රම ක්‍රියාත්මක වීම තුළින් ඒ ප්‍රදේශයේ මීට වඩා සංවර්ධනයක් ක්‍රියාත්මක වේවි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ එක්කම මම මේ අවස්ථාවේදී සඳහන් කළ යුතු තවත් දෙයක් තිබෙනවා. ගරු අමාත්‍යතුමා විසින් විදුලිය සම්බන්ධ අවශ්‍යතා සපුරාලීම සඳහා විශාල පරිමාණයේ විදුලි බලාගාර ඉදි කිරීමට යෝජනා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙනියාය බල ප්‍රදේශයේ විශාල ප්‍රමාණයේ දිය දහරාවන් භාවිතා කර ජල විදුලි බලාගාර ඉදි කිරීමේ හැකියාවක් තිබෙන බව මම මේ අවස්ථාවේදී ගරු අමාත්‍යතුමාට යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා. ගරු අමාත්‍යතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර, ඒ ප්‍රදේශයේම ජල විදුලි බලාගාර ඉදි කර, ඒ ගම්මානවලට විදුලිය ලබා දීමේ හැකියාව සම්බන්ධව සොයා බලා කටයුතු කරන්නය කියා මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මම එදා පාර්ලිමේන්තුවේ නොසිටියත්, පළාත් සභාව තුළ ඉඳගෙන ගරු අමාත්‍යතුමාගේ සහ පොදු ජන එක්සත් පෙරමුණු රජයේ සහයෝගය ලබාගෙන එම කාලය තුල ඒ ආකාරයේ සංවර්ධන ක්‍රියාදමයක් ඇති කරන්නට ලැබීම ගැන මම ඉතාමත් සතුටු වෙනවා. අද මා පාර්ලිමේන්තුව නියෝජනය කරන මේ අවස්ථාවේදී මාතර දිස්ත්‍රික්කයේ ඒ දුෂ්කර ගම්මානවල ජනතාව දහසකුත් බලාපොරොත්තු තබාගෙන සිටිනවා. පොදුජන එක්සත් පෙරමුණු රජය යටතේ ඒ දුෂ්කර ගම්මානවලට විදුලි බල අමාත්‍යාංශයෙන් විශාල වැඩ කොටසක් ඉටු කරවා දීමට මට හැකියාව ලැබෙයි කියා මම විශ්වාස කරනවා. ඒ සම්බන්ධව විශාල බලාපොරොත්තු රාශියක් තබා ගිනිමින්, මේ වැඩ ඉටු කරවා දීම සඳහා අපට සහයෝගය ලබා දුන් ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ අමාත්‍යතුමාත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් ඇතුළු සියලු දෙනාටමත් මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

තමුන්නාන්සේගේ මංගල කථාවට ස්තුතියි. ඊළඟට කථා කරන්නේ ගාමිණී ලොකුගේ ගරු මන්ත්‍රීතුමා. තමුන්නාන්සේට විනාඩි 15ක් තිබෙනවා.

ගාමිණී ලොකුගේ මහතා
*(திரு. காமினி லொகுகே)*
(Mr. Gamini Lokuge)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මේ රටේ ජනතාවට ඉතාම කිට්ටු සම්බන්ධතාවයක් තිබෙන, ජීවන වියදමට ඉතාම සමීප සම්බන්ධතාවයක් තිබෙන අමාත්‍යාංශක් කියා මම හිතනවා. එම අමාත්‍යාංශයේ එක අංශයක් හැටියට තිබෙනවා, විදුලිබල මණ්ඩලය. අනිත් පැත්තෙන් තිබෙනවා, තෙල් සංස්ථාව. මේ දෙකම අද ජනතාවගේ ජීවන වියදම කෙරෙහි බලපාන ඉතාම වැදගත් ආයතන දෙකක්.

මේ අමාත්‍යාංශය යටතේ නැතත් ඊළඟට ජීවන වියදමට කිට්ටු සම්බන්ධතාවයක් තිබෙන ආයතනයක් තමයි, සතොස ආයතනය. සතොස භාර අමාත්‍යතුමාත් දැන් මේ ගරු සභාවේ සිටිනවා. සතොස ආයතනය පාඩු ලබා තිබුණේ සතොස ආයතනයේ හිටපු නිලධාරීන්ගේ දූෂණ නිසායි කියා පසුගිය දවස්වල අමාත්‍යතුමා එහි ප්‍රතිශෝධනයක් කළා අපි දැක්කා. විදුලිබල මණ්ඩලයටත් විවිධ චෝදනා ගණනාවක් ඇති වුණා. වයස නිසා හෝ මොනවා නිසා හෝ එහි සභාපතිතුමාත් අස්වෙලා. එහිත් ප්‍රති සංවිධානයක් වුණාය කිව්වා.

ඊළඟට තිබෙන්නේ තෙල් සංස්ථාවයි. තෙල් සංස්ථාව පිළිබඳවත් විවිධාකාර චෝදනා තිබෙනවා. නමුත් තෙල් සංස්ථාව ගැන කථා කරනකොට අපි එක දෙයක් ගැන කථා කරන්න ඕනෑ. 1994දී තමුන්නාන්සේලා තෙල් සංස්ථාව භාර ගත් දවසේ සිට අද වෙනකන් බැලුවොත්, අමෙරිකානු ඩොලරය සියයට 77කින් වැඩි වෙලා තිබෙනවා. 1994 දී ඩොලරය රු. 49.23යි. අද ඩොලරය 87.44යි. සියයට ගණන බැලුවොත් සියයට 77කින් වැඩි වෙලා තිබෙනවා. තෙල් මිල ගැන දහම් විමලසේන මන්ත්‍රීතුමා කියපු නිසා මම ඒ ගැන තවදුරටත් පැහැදිලි කරන්නට යන්නේ නැහැ. තෙල් මිලත් එක එක ආකාරයට වැඩි වෙලා තිබෙනවා. නමුත් දහම් විමලසේන මන්ත්‍රීතුමා කිව්වා වාගේ 1993 ඉඳලා 2000 වනතෙක්ම තෙල්වලින් විශාල වාසිදායක තත්ත්වයක් තිබුණා. තෙල් බැරලයක මිල අඩු වීම නිසා තමුන්නාන්සේලාට විශාල වාසිදායක තත්ත්වයක් ලැබුණා. ඒ ලැබුණු වාසිදායක තත්ත්වයෙන් තමුන්නාන්සේලා පාරිභෝගිකයාට කිසිම සහනයක් දුන්නේ නැහැ. 1994 දී තමුන්නාන්සේලා රුපියල් බිලියන දහතුනකුත් ගණනක් රජයේ ගිණුමට බැර කළා. 1999 දී රුපියල් බිලියන 19කට 20කට කිට්ටු ගණනකුත්, 2000 දී රුපියල් බිලියන 22කුත් රජයේ ගිණුමට බැර කළා. 1996 දී තෙල් සංස්ථාව ලැබූ ලාබය රුපියල් බිලියන 164යි. 2000 දී ලැබූ ලාබය රුපියල් බිලියන 14යි. එහෙම නම් රජයේ ගිණුමට රුපියල් බිලියන 22ක් දුන්නාම රුපියල් බිලියන 08ක් පාඩුයි. එසේ තෙල් සංස්ථාවෙන් රජය ආදායම ලබනවා නම්, තෙල් සංස්ථාවට සහනයක් දීලා ජනතාවටත් සහනයක් දෙන්න ක්‍රියා කරන්නට තමුන්නාන්සේලා කල්පනා කරන්නට ඕනෑ. අද ඒක සිද්ධවෙන්නේ නැහැ. තෙල් සංස්ථාව පාඩු ලබන්නේ ඒකෙන් මුදල් අරගෙන තමුන්නාන්සේලා රජයේ ආදායමට විශාල මුදලක් බැර කරන නිසයි. 2000

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී ලොකුගේ මහතා]

දී විතරක් තමුන්නාන්සේලා රුපියල් බිලියන 22ක් රජයට දීලා තිබෙනවා. ලාබ ලබන කාලයේදීත් මුදල් දුන්නා. අලාබ ලබන කාලයේදීත් මුදල් දෙනවා. නමුත් ජනතාවට නම් සහනයක් වෙන්නේ නැහැ. ඒ අතරතුරදීම තමුන්නාන්සේලා තෙල් සංස්ථාවේ පාලන අධිකාරියේ වියදම් වැඩි කළ නිසා මේ පාඩුව තවත් වැඩි වුණා. දහම් විමලසේන මන්ත්‍රීතුමා කිව්වා වගේ තෙල් සංස්ථාවේ සේවකයන් සංඛ්‍යාව 7000 ක් 8000 ක් විතර වෙනවා. පේරාදෙනියේ ගබඩාව ගත්තොත් වෝර් ක්ලාක්ස්ලා අට දෙනෙක් ඉන්නවා. පුටු ගණනට වැඩියි 'ටයිපිස්ට්ලා' ඉන්නවා. මේ තත්ත්වය යටතේ මේ පාඩුව මේ බර උහුලන්න වෙන්නේ කාටද ? රටේ ජනතාවටයි.

ඊයේ පෙරේදා ඒ කියන්නේ මාර්තු 15 වැනිද තෙල් සංස්ථාවට තෙල් නැවක් ගෙනාවා. ඒ නැවේ ඩීසල් ටොන් 32,228 ක් තිබුණා. ගුවන් යානා තෙල් ටොන් 10,519 ක් තිබුණා. ඒ නැවෙන් තෙල් බාන විට තෙල් වෙනත් ද්‍රව්‍ය සමග කවලම් වීම නිසා එය ප්‍රමිතියට තිබිලා නැහැ. ඒ නිසා ඒ නැවේ ගෙනා ගුවන් යානා තෙල් භූමිතෙල්වලට විකුණන්නට වෙලා තිබෙනවා. සුපර් ඩීසල් සුපර් ඩීසල්වලට විකුණන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ. ඒක නොවෙයි ප්‍රශ්නය. මේ නැවේ තෙල්වල වටිනාකම රුපියල් මිලියන නවයයි. ඒ නැව ජනවාරි මාසයේ ආවාම ඒකෙන් තෙල් ගේන්න ඉඩ දෙන්නට එපාය කියා කියා තිබෙනවා. ඒකයි තිබෙන ප්‍රශ්නය. ජනවාරි මාසයේදී තෙල් සංස්ථාවට ඒ නැවෙන් තෙල් ගෙනෙල්ලා මේ දෙයම සිද්ධ වුණා. මේ නැව තෙල් ප්‍රවාහනයට සුදුසු නැති නැවක් හැටියට නම් කර – බ්ලැක් ලිස්ට් කර – තිබෙනවා. එහෙම කරලා තිබේද්දීත් තමයි, මේ නැවෙන් තෙල් ගෙනාවේ. ඒකෙන් වන පාඩුව විඳින්නට සිද්ද වෙලා තිබෙන්නේ තෙල් සංස්ථාවටයි. ඒකයි මේකෙ වැරැද්ද. සමහර විට නැවකින් ප්‍රවාහනය කරන විට යම් යම් විධියේ පාඩු සිද්ධ වෙනවා. ජනවාරි මාසයේදීත් මේකෙන් ගෙනාවා. ඒ වෙලාවෙත් පාඩු වුණා. එහෙම තියෙද්දී මේ සැරෙත් ගෙනාවා. දන් ආපසු ඊයේ ඉඳලා ඒ ගෙනා තෙල් බාරගන්න තීන්දු කළාය කියා මට ආරංචියි. එතකොට මේ ඩොලර් මිලියන නවයක පාඩුව දරන්නේ කවුද? මේක පළමුවැනි වතාවට සිද්ධ වුණා නම් මම තමුන්නාන්සේ කියපු දෙය පිළිගන්නවා. සමහර නැව්වල පොම්පවල යම් යම් දුර්වලකම්, Inter tank leakage නිසා යම් යම් දේවල් සිද්ධ වෙනවා. එහෙම සිද්ධ වෙච්ච එකක් දනගත්තාම නැවතත් ඒ නැවෙන්ම ගෙන්වනවා නම්, කලින් සිදු වූ සිද්ධියම ඒ නැවේ සිද්ධ වෙනවා නම්, කව්ද ඒකෙ වගකීම බාරගන්නේ? මෙන්න මේකයි තිබෙන ප්‍රශ්නය. පරිපාලන කටයුතු සිද්ධ වන්නේ ඒ විධියටයි.

බනිජ තෙල් සංස්ථාව පුදුම සංස්ථාවක්. තෙල් සංස්ථාවේ Flower Road කාර්යාලයට පුටු බංකු ගේනවිට, ගේනවා ඩබල් ඇඳන් දෙකකුයි, සිංගල් ඇඳන් හයකුයි, මිලියන 27ක බඩු. මම හිතාගෙන හිටියේ තෙල් සංස්ථාව වැඩ කරන ආයතනයක් කියලයි. මගේ ළඟ ඒවායේ 'ඉන්වොයිස්' තිබෙනවා. ඇමතිතුමාට බලන්න ඕනෑ නම් මම දෙන්නම්. Double Bed Complete with Spring mattress දෙකයි. එකකට 39458 ගණනේ රු. 78916යි. Single Bed Complete with spring mattress එකක් 25450 ගණනේ ඇඳන් 8 ට රු. 203,600යි. Bed-Side Table එකක් රු. 10,181 ගණනේ 12ට 1,22,172යි. කබඩ් එකක් 45823 ගණනේ 8ට රු. 366,584යි. මේ වගේ ලක්ෂ 27ක බඩු, ඇඳන් ඇතිරිලි ගෙන්වා තිබෙනවා. මම හිතන්නේ ගෙදර නිදා ගන්නේ නැතිව ඇති. ගරු අමාත්‍යතුමාට බලන්න ඕනෑ නම් මේ වවුචර් ඔක්කෝම මම දෙන්නම්. මේවා රටේ මහජනතාවගේ සල්ලි. වැඩියෙන් ටෙලිෆෝන් පාවිච්චි කරන්න එපාය කියලා ජනාධිපතිතුමිය කියනවා. කාර් වැඩිය පාවිච්චි කරන්න එපාය කියනවා. නමුත් තෙල් සංස්ථාවේ සභාපතිතුමා ප්‍රධාන කාර්යාලයට බඩු අරගෙන තිබෙන්නේ මෙහෙමයි.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ඕවා Circuit Bungalow එකකට යැවීම සඳහා ගෙනත් තිබෙන්නේ.

ගාමිණී ලොකුගේ මහතා
(திரு. காமினி லொகுகே)
(Mr. Gamini Lokuge)

නැහැ, නැහැ. ෆ්ලවර් රෝඩ් කාර්යාලයට. ෆ්ලවර් රෝඩ් කාර්යාලය සර්කිට් බංගලාවක්ද?

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

නැහැ, නැහැ. පෙට්‍රෝලියම් කෝපරේෂන් එකේ සර්කිට් බංගලා තිබෙනවානේ.

ගාමිණී ලොකුගේ මහතා
(திரு. காமினி லொகுகே)
(Mr. Gamini Lokuge)

නැහැ, නැහැ, නැහැ. තමුන්නාන්සේ වරද්දගෙන. තමුන්නාන්සේ කථා කරන්නේ හිතට එකඟව නොවෙයි. මම දන්නවා තමුන්නාන්සේ කථා කරන්නේ බේරුම් කර ගන්නය කියා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

නැහැ. හොඳට හොයලා බලන්නකෝ.

ගාමිණී ලොකුගේ මහතා
(திரு. காமினி லொகுகே)
(Mr. Gamini Lokuge)

මම මේ වවුචරය තමුන්නාන්සේට බලන්න දෙන්නම්. ෆ්ලවර් රෝඩ් කාර්යාලයට මේවා ගෙනත් තිබෙනවා. සර්කිට් බංගලාවලට ගෙනා බඩු ලැයිස්තු මා ළඟ වෙනමම තිබෙනවා. මාතරට ගෙනාපුවා වෙනම තිබෙනවා. නුවරට ගෙනාපුවා වෙනම තිබෙනවා. අනුරාධපුරයට ගෙනාපුවා වෙනම තිබෙනවා. තමුන්නාන්සේට ඕනෑ නම් ඒවායේ විස්තරත් වෙන වෙනම දෙන්නම්. නමුත් මේ බඩු ඔක්කෝම ගෙනාවේ ෆ්ලවර් රෝඩ් කාර්යාලයටයි. උඳුන් හතරේ ගෑස් ලිප් ගෙනත් තිබෙනවා. තව එතනට 'කුක්' කෙනකුත් දාලා තිබෙනවා. මන්නාරමේ හිටපු කුක් දන් මේ කාර්යාලයයේ ඉන්නේ. ඕනෑ නම් එතැන රෑට කන බොන අයත් මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කියන්නම්. තමුන්නාන්සේ ගැන මම කනගාටු වෙනවා. මම තමුන්නාන්සේට දේශයක් කියනවා නොවෙයි. අද තෙල් සංස්ථාවේ වන දේ මම කියන්නේ. විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමාට චෝදනාව ආවේ සමනලවැව බංගලාවක් හැදුවා කියලයි. ඒ අතරේ මෙන්න තෙල් සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ සිදු වන දේවල්.

ඊට අමතරව තවත් දේවල් මම තමුන්නාන්සේලාට කියන්නම්. හිතවතුන්ගේ ගෙවල් දහයක් විතර සංස්ථාව කුලියට අරගෙන ඒවා තමන්ගේ හිතවතුන්ට ලබා දී තිබෙනවා. ඕනෑ නම් මම නම් දෙන්නම්. නමුත් ඒ ගෙවල් දීලා තිබෙන අයගේ නම් මෙතැනදී කියන්න මම කැමති නැහැ. ඒවායේ මාසික කුලිය 40,000යි, 50,000යි, 58,000යි. සංස්ථාවේ හිතවත් තෝරා මහත්වරුන්ට, නිලධාරීන්ට පදිංචි වෙන්න ඒ ගෙවල් ලබා දී තිබෙනවා. මාසික පඩිය රු. 15,000යි. ගෙදරට කුලිය වශයෙන් 48,000ක් ගෙවන්න ඕනෑ. ඇමතිතුමා සෝදිසි කර බලන්න. මේ තත්ත්වයට තෙල් සංස්ථාව පත් වෙලා තිබෙනවා. මම තමුන්නාන්සේත් එක්ක වාදයක් කරනවා නොවෙයි. මේ වියදම් කරන්නේ මහජන මුදල්. අද තෙල් මිල වැඩි කරනවා. තමුන්නාන්සේලාට ඩීසල් මිල අඩු කරන්න පුළුවන්කමක් නැහැ. ගෑස් මිල අඩු කරන්න පුළුවන්කමක් නැහැ.

අනෙක් කාරණය තෙල් සංස්ථාවේ ගෑස් නිෂ්පාදනය කරනවා. තමුන්නාන්සේලා ගෑස් කොම්පැනියට ගෑස් කිලෝ එකක් රු. 22ක් මිල කරනවා. නමුත් ගෑස් කොම්පැනිය ඒ මිල ගණන් ගන්නේ නැහැ. ඒ ගොල්ලන් සංස්ථාවට ගෙවන්නේ රු. 19යි. දන් ප්‍රශ්නය තිබෙන්නේ, තෙල් සංස්ථාවද ගෑස් කොම්පැනිය පාලනය කරන්නේ එහෙම නැත්නම් ගෑස් කොම්පැනිය තෙල් සංස්ථාව පාලනය කරනවාද කියන එකයි. මම කියන එක අසත්‍ය නම් තමුන්නාන්සේ ගිහින් බලන්න. තමුන්නාන්සේලා ගෑස් කොම්පැනියට බිල් කරනවා අද කිලෝ එකක් රුපියල් 22 ගණනේ. නමුත් කොම්පැනිය ගෙවන්නේ රුපියල් 19 ගණනේයි. අද පෞද්ගලික අංශයේ තවත් ගැලවුම්කාරයෝ ඉන්නවා. අද අලුත් සමාගම් රුපියල් 22 බැගින් ගෑස් ගන්න කැමැත්තෙන් ඉන්නවා. නමුත් තමුන්නාන්සේලා ඒගොල්ලන්ට දෙන්නේ නැහැ. ඒගොල්ලන්ට දුන්නොත් ඒගොල්ලන් ගෑස් බෙද හැරීම පටන් අරගෙන ගෑස් කිලෝ එකකට රුපියලක් හරි දෙකක් හරි අඩුවෙන් මේ රටේ මහජනයාට දේවි. අද තමුන්නාන්සේලා තවදුරටත් ඒකාධිකාරය පවත්වා ගෙන යනවා. ඇයි ෂෙල් කොම්පැනියට ඔච්චර බය [බාධා කිරීමක්] දීලා නැහැ තවම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

දුන්නා. නමුත් ඒගොල්ලන් පාරිභෝගිකයන්ට විකුණන්නේ නැතිව වාහනවලට පාවිච්චි කරන්න යන නිසා මත භේදයක් තිබෙනවා agreement එකේ.

ගාමිණී ලොකුගේ මහතා
*(திரு. காமினி லொகுகே)*
(Mr. Gamini Lokuge)

ඉතින් වාහනවලට වික්කොත් ඒ වාහනකාරයා හරි අඩු මිලට දුවයිනේ. තමුන්නාන්සේලාට තිබෙන ප්‍රශ්නය මොකක්ද එයා වහානවලට විකුනනවාද පාරිභෝගිකයාට විකුනනවාද කියා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

මූලික ප්‍රතිපත්තිය ඒක නොවෙයිනේ. මූලික ප්‍රතිපත්තිය පාරිභෝගිකයන්ට ගෑස් ලබා දීමයි.

ගාමිණී ලොකුගේ මහතා
*(திரு. காமினி லொகுகே)*
(Mr. Gamini Lokuge)

නමුත් ගෑස් සමාගම පාරිභෝගිකයාට වැඩි ගණනට විකුණනවා. ඒ තමුන්නාන්සේලාගේ පාලනයක් නැහැ. ඇත්තෙන්ම තමුන්නාන්සේලාගේ පාලනයක් නැහැනේ. දැන් තමුන්නාන්සේලා ගෑස් කොම්පැනියට බිල් කරනවා රුපියල් 22 ගණනේ. ගෑස් කොම්පැනිය රුපියල් 19 ගණනේ ගෙවනවා. ඒ පාලනය තිබෙනවාද තමුන්නාන්සේලාගේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ගිහින් බලන්න. මම මේවා වගකීමක් ඇතිව කියන්නේ. අද මේකයි සිදු වන්නේ. තමුන්නාන්සේ ඒක ගැන කථා කරන්න ගියොත් සමහර වෙලාවට තමුන්නාන්සේගේ නියෝජ්‍ය ඇමතිකමටත් ප්‍රශ්නයක් ඇති වේවිද කියන එක ගැන මට සැකයක් තිබෙනවා. මොකද, ඊටත් ඉහළින් තමයි ඒ ඕඩරය එන්නේ. නැත්නම් ඕක වෙන්නේ නැහැ. තෙල් සංස්ථාවට බිල් කළාට පස්සේ කවදාවත් පාරිභෝගිකයාට dictate කරන්න දෙන්නේ නැහැ. නමුත් ගෑස් කොම්පැනිය විතරක් තමුන්නාන්සේලාට dictate කරනවා. ඒකයි අද මේ රටේ තෙල් සංස්ථාවට වෙලා තිබෙන්නේ.

තෙල් සංස්ථාවට බඩු ගත් ලේඛනය **හැන්සාඩ්** වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම table* කරනවා.

ලබා ගත් සියලුම භාණ්ඩවල විස්තර මේ ලැයිස්තුවේ තිබෙනවා. හුඟාක් භාණ්ඩ තිබෙනවා මම මේ කාරණා දෙකක් තුනක් විතරයි කිව්වේ.

ඊට අමතරව තවත් අරුම පුදුම සිදුවීමක් වෙලා තිබෙනවා තෙල් සංස්ථාවේ. තෙල් සංස්ථාවේ සමහර සේවකයෝ දැන් රිමාන්ඩ් එකේ ඉන්නවා. රිමාන්ඩ් කළේ ගිය අවුරුද්දේ ඡන්දය කාලයේ. අපි දන්නවා මොකක්ද වුණේ කියලා. ඡන්ද දවස්වල බෝම්බ ගහන්න ගිහින් රිමාන්ඩ් එකේ ඉන්නවා ඒ ගොල්ලන් ඔක්කොම ඉන්නේ විදුලිබල අමාත්‍යාංශයේ නිසා ඒ අයට පඩි ගෙවන්නය, ඒ අය සේවයට වාර්තා නොකළාට කමක් නැහැ කියලා, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිතුමා පෙබරවාරි මාසයේ 12 වැනිද ලිපියක් ලියනවා. මම ඉන් එක් ලියුමක කොටසක් කියවන්නම්. මෙන්න ඒක.

'ලේකම්,
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය,
අංක 493/1, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

මහත්මයාණෙනි,

ජී. එච්. එම්. ඩී. එච් බණ්ඩාර මහතා (14937)
බී – 4 ශ්‍රේණියේ යතුරු ලේඛක (සිංහල)

ඉහත නම් සඳහන් සේවක මහතාට විදුලිබල හා බලශක්ති අමාත්‍ය කාර්ය මණ්ඩලයෙහි සේවය සඳහා නිදහස් කරන ලෙස ඉල්ලා ඔබ විසින් එවා ඇති අංක එම්පී/පී/07 හා 2001.01.29 දින දරන ලිපිය හා බැඳේ.

ඒ අනුව 2001.10.16 දින සිට බලපැවැත්වෙන පරිදි බණ්ඩාර මහතාට ඔබ අමාත්‍යාංශයේ සේවය සඳහා නිදහස් කිරීමට කටයුතු කර ඇති බව දන්වමු.'

මෙයා රිමාන්ඩ් කළේ ඡන්දය කාලයේදීයි. තවමත් රිමාන්ඩ් එකේ. නමුත් දැන් අමාත්‍යාංශයේ වැඩ විධියටයි ගණන් ගන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා තමුන්නාන්සේට තව මිනිත්තුවක් ඉතුරු වෙලා තිබෙනවා.

ගාමිණී ලොකුගේ මහතා
*(திரு. காமினி லொகுகே)*
(Mr. Gamini Lokuge)

තමුන්නාන්සේලාට ඕනෑ තමුන්නාන්සේලාගේ ගෝලයාට කොහොම හරි පඩිය ගෙවන්නයි. මම මේ පෙන්වන්න හැදුවේ ඒකයි. නමුත් මේ රටේ කොතැන හරි බෝම්බයක් ගහලා රාජ්‍ය සේවකයෙක් රිමාන්ඩ් කළොත් ඒ නඩුවෙන් නිදහස් වෙලා එන තුරු ඒ පුද්ගලයාව interdict කරනවා. ඒකයි මේ රටේ නීතිය.

මට වෙඩි තියන්න මගේ ගෙදරට ආපු එක්කෙනාත් දැන් තමුන්නාන්සේලාගේ සංස්ථාවේ වැඩ. මීට ඉස්සෙල්ලත් මා ඒ ගැන කිව්වා. එයාට විරුද්ධව මිනීමැරුම් නඩුවක් ඉහළ උසාවියේ තිබෙනවා. ඔහු යුද හමුදාවෙන් පැනලා ආ කෙනෙක්. ඒ ගැන **හැන්සාඩ්** වාර්තාවේ තිබෙනවා. බලන්න. ඇමතිතුමා දන්නවා. එතුමාට මම ඔක්කොම කරුණු කියලා තිබෙනවා. [බාධා කිරීමක්] රාජකාරි කටයුත්තක යෙදිලා හෝ නැතිව හෝ මිනී මැරුම් නඩුවකට මේ රටේ රාජ්‍ය සේවකයෙක් හෝ සංස්ථා සේවකයෙක් අහු වුණොත් ඒ නඩුවෙන් නිදහස් වන තාක් එයාගේ සේවය තහනම් කරනවා. ආයතන සංග්‍රහය අනුව එහෙමයි. තමුන්නාන්සේලාට වෙන සංග්‍රහයක් තිබෙනවාද කියලා කවුද දන්නේ?

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තුවේත් ඉන්නවා ඒ වාගේ චෝදනාවලට ලක් වෙච්ච අය. නමුත් අපි ඒගොල්ලන් වැරදිකාරයන්ය කියලා සලකන්නේ නැහැ.

ගාමිණී ලොකුගේ මහතා
*(திரு. காமினி லொகுகே)*
(Mr. Gamini Lokuge)

නමුත් මම කියන්නේ ආයතන සංග්‍රහය අනුව. ආයතන සංග්‍රහය හදලා තිබෙන්නේ මේ රටේ රාජ්‍ය පරිපාලනයට [බාධා කිරීමක්] තමුන්නාන්සේ ආයතන සංග්‍රහය කියවන්න. තමුන්නාන්සේ ආයතන සංග්‍රහය කියවලා නැත්නම් මම බොහොම කනගාටු වෙනවා. මේ පාර්ලිමේන්තුවේ සේවකයෙක් මේ පාර්ලිමේන්තුවේ සිටියත් නැතත් ගමේදී කෝලාහලයක් වෙලා මිනීමැරුම් නඩුවකට සම්බන්ධ වුණොත්, ඒ නඩුව ඉවරවන තුරු වහාම ඔහුගේ සේවය තහනම් කරනවා. නඩුවෙන් නිදහස් වුණු ගමන් Back Wages එක්ක, reinstate කරනවා. එහෙම තමයි ආයතන සංග්‍රහයේ තිබෙන්නේ. තමුන්නාන්සේ ආයතන සංග්‍රහය දන්නේ නැත්නම් මට කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සේලාගේ [බාධා කිරීමක්]

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

සිද්ධ වී තිබෙනවා. නමුත් අපි පිළිගන්නේ නැහැනේ. සහෝදරත්වයෙන් අපි ඒවා පිළිගන්නේ නැහැ.

ගාමිණී ලොකුගේ මහතා
*(திரு. காமினி லொகுகே)*
(Mr. Gamini Lokuge)

මම කිව්වේ ඒක නොවෙයි. මම කියන පුද්ගලයා හිටියේ යුධ හමුදාවේ. යුධ හමුදාවේ ඉන්දැද්දි රාජකාරියෙන් පැනලා ඇවිත් වෙඩි තැබුවේ. වෙඩි තැබුවාට පසුවයි තමුන්නාන්සේලා සේවයට ගත්තේ. එහෙම නැතුව

---

*කථාව අවසානයේ පළ කර ඇත.
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Reproduced at end of speech.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමිණී ලොකුගේ මහතා]
සංස්ථාවේ සේවයේ යෙදී සිටිද්දී නොවෙයි. වෙඩි තැබුවාට පසුවයි සංස්ථාවේ සේවයට ගත්තේ. එහෙම නම් ඒ වෙඩි තැබීමට තමුන්නාන්සේලාගේත් සම්බන්ධයක් තිබෙනවා කියන එකයි ඒකෙන් පෙනෙන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලවේලාව අවසාන වී ඇති හෙයින්, තමුන්නාන්සේගේ කථාව දැන් අවසාන කරන්න.

*සභාමේසය මත තබන ලද ලැයිස්තුව
*சபாபீடத்தில் வைக்கப்பட்ட திரல் :*
*List tabled:*

ගාමිණී ලොකුගේ මහතා
(திரு. காமினி லொகுகே)
(Mr. Gamini Lokuge)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා කාලය ගන්නේ නැහැ. ගරු විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමනි, මම තමුන්නාන්සේට කියන්නේ, තමුන්නාන්සේ බොහොම කල්පනා කරනවා, මේ තෙල් සංස්ථාවේ වියදම් අඩු කර, ජනතාවට සහනයක් දෙන්න. තමුන්නාන්සේ ඒ උත්සාහයේ යෙදෙනවාය කියා මම පෞද්ගලිකව දන්නවා. එහෙම නම් ඒකට රුකුලක් දෙන්න මේ කරුණු පරීක්ෂා කර, මේ වාගේ අධික වියදම් අඩු කර, ජනතාවට සේවයක් දෙන්න ක්‍රියා කරන්න කියා ඉල්ලමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

D.V. S. Silva
Interior Decorators

No. 33, Nanda Mawatha,
Nugegoda, Sri Lanka
Tel : 94-1-811577, 826532
Telefax 94-1-820831

INVOICE

To : Ceylon Petroleum Corporation
No. 109, Rotunda Tower
Galle Road
Colombo 03.

Date : 10.03.2000
Invoice No. 002
Tender No. EP/P/165/99
Order No. 24561

| *No.* | *Description* | *Size in M.M.* | *Qty.* | *Rate Rs.* | *Total Rs.* |
|---|---|---|---|---|---|
| (A) | **Hon Minister** | | | | |
| A/1 | Executive Table (Mahagony) | 2100X1050X720 | 1} | 66,826 00 | 66,826 00 |
| A/2 | Mobile Pedestal (Mahagony) | 420X640X580 | 1} | | |
| A/3 | Side Teturn – Mahagony | 1400X550X670 | 1} | | |
| A/4 | Credenza – Mahagony | 2100X550X670 | 1 | 47,733 00 | 47,733 00 |
| A/5 | 5 Shell Cabinet W Glass Doors – Mahagony | 800X400X1880 | 2 | 93,560 00 | 187,120 00 |
| A/6 | Real Leather upholstered high back chair | | 1 | 20,047 00 | 20,047 00 |
| A/7 | Real Leather upholstered Visitor Chair | | 3 | 10,156 00 | 30,468 00 |
| A/8 | Two seater leather Sofa | 1460X930X850 | 2 | 13,365 00 | 26,730 00 |
| A/9 | Centre Table | 1200X600X420 | 1 | 8,908 00 | 8,908 00 |
| A/10 | Coffee Table | 700X700X420 | 2 | 6,362 00 | 12,724 00 |
| (B) | **Hon. Minister's Room-lobby Area** | | | | |
| B/1 | Single Seater Fabric Sofa | 740X710X740 | 5 | 8,017 00 | 40,085 00 |
| B/2 | Centre Table | 1200X600X420 | 1 | 8,908 00 | 8,908 00 |
| B/3 | Coffee Table | 700X700X420 | 2 | 6,362 00 | 12,724 00 |
| (C) | **Secretary to Hon. Minister** | | | | |
| C/1 | Executive Desk | 1800X800X720 | 1 | 37,803 00 | 37,803 00 |
| C/2 | Mobile Pedestal | 420X560X580 | 1 | 13,365 00 | 13,365 00 |
| C/3 | Side Return | 1100X480X670 | 1 | 11,072 00 | 11,072 00 |
| C/4 | Fabric Upholstered High Back Chair | | 1 | 13,540 00 | 13,540 00 |
| C/5 | Fabric Upholstered Visitor Chair | | 3 | 7,305 00 | 21,915 00 |
| C/6 | 5 Shelve Cabinet with Doors | 800X390X1880 | 1 | 73,702 00 | 73,702 00 |
| C/7 | Single Seater Fabric Sofa | 740X710X740 | 2 | 8,017 00 | 16,034 00 |
| (D) | **Conference Room** | | | | |
| D/1 | U'shaped Table | As per specs | 1 | 152,750 00 | 152,750 00 |
| I/5 | Fabric Upholstered Visitor Chair | | 3 | 7,300 00 | 21,900 00 |
| I/6 | 4 Shelve Cabinet with Doors | 800X390X1880 | 1 | 50,700 00 | 50,700 00 |
| (J) | **Reception area** | | | | |
| J/1 | Reception Table | 1400X800X720 | 1 | 22,250 00 | 22,250 00 |
| J/2 | Side Return | 1100X480X670 | 1 | 9,875 00 | 9,875 00 |
| J/3 | Fabric Upholstered Medium Back Chair – Black | | 1 | 14,255 00 | 14,255 00 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| No. | Description | Size in M.M. | Qty. | Rate Rs. | Total Rs. |
|---|---|---|---|---|---|
| (K) | **PA to Chairman** | | | | |
| K/1 | Executive Desk | 1600X800X720 | 1 | 17,475 00 | 17,475 00 |
| K/2 | Mobile Pedestal | 420X560X580 | 1 | 8,600 00 | 8,600 00 |
| K/3 | Side Return | 11000X480X670 | 1 | 12,219 00 | 12,219 00 |
| K/4 | Fabric Upholstered High Back Chair | | 1 | 13,540 00 | 13,540 00 |
| K/5 | Fabric Upholstered Visitor Chair | | 3 | 7,300 00 | 21,900 00 |
| K/6 | 4 Shelve Cabinet with Doors | 800X390X1880 | 1 | 50,700 00 | 50,700 00 |
| (L) | **02 Nos of Directors Room of Upper Level** | | | | |
| L/1 | Executive Desk | 1600X800X720 | 2 | 17,475 00 | 34,950 00 |
| L/2 | Mobile Pedestal | 420X560X580 | 2 | 8,600 00 | 17,200 00 |
| L/3 | Side Return | 1100X480X670 | 2 | 12,219 00 | 24,438 00 |
| L/4 | Fabric Upholstered High Back Chair | | 2 | 13,540 00 | 27,080 00 |
| L/5 | Fabric Upholstered Visitor Chair | | 4 | 7,300 00 | 29,200 00 |
| L/6 | 4 Shelve Cabinet with Doors | 800X390X1880 | 2 | 50,700 00 | 101,400 00 |
| (M) | **Security Accommodation Lobby** | | | | |
| M/1 | 3 Seater Lobby Chair | | 1 | 20,490 00 | 20,490 00 |
| M/2 | 2 Seater Lobby Chair | | 1 | 19,600 00 | 19,600 00 |
| M/3 | Centre Table | 1200X600X420 | 2 | 8,910 00 | 17,820 00 |
| (N) | **Army Officer & Police Officer** | | | | |
| N/1 | Executive Desk | 1600X800X720 | 2 | 10,690 00 | 21,380 00 |
| N/2 | Mobile Pedestal | 420X560X580 | 2 | 9,640 00 | 19,280 00 |
| N/3 | Side Return | 1000X480X670 | 2 | 4,965 00 | 9,930 00 |
| N/4 | Fabric Upholstered High Back Chair | | 2 | 14,255 00 | 28,510 00 |
| N/5 | Fabric Upholstered Visitor Chair | | 4 | 7,300 00 | 29,200 00 |
| | **Sub Total** | | | | 2,709,816 00 |
| | **Advance Paid** | | | | |
| | **Balance Due** | | | | |

D. V. S. Silva
Interior Decorators

No. 33, Nanda Mawatha,
Nugegoda, Sri Lanka

Tel : 94- - 1 - 811577, 826532
Telefax 94 - 1 - 820831

**INVOICE**

To : Ceylon Petroleum Corporation
No. 109, Rotunda Tower
Galle Road
Colombo 03

Date : 10.03.2000
Invoice No. : 001
Tender No. EP/P/166/99
Order No. 24560

| No. | Description | Size in M.M. | Qty. | Rate Rs. | Total Rs. |
|---|---|---|---|---|---|
| (A) | **Ground Floor Sitting Room** | | | | |
| A/1 | Single Seater Art Leather Sofa | 920X850X750 | 2 | 28,017 00 | 16,034 00 |
| A/2 | Three Seater Art Leather Sofa | 1960X850X750 | 1 | 14,000 00 | 14,000 00 |
| A/3 | Centre Table | 1200X600X420 | 1 | 8,908 00 | 8,908 00 |
| A/4 | Coffee Tables | 700X700X420 | 2 | 6,362 00 | 12,724 00 |
| (B) | **First Floor Sitting Room** | | | | |
| B/1 | Single Seater Art Leather Sofa | 920X850X750 | 2 | 8,017 00 | 16,034 00 |
| B/2 | Three Seater Art Leather Sofa | 1960X850X750 | 2 | 14,000 00 | 28,000 00 |
| B/3 | Centre Table | 1200X600X420 | 1 | 8,908 00 | 8,908 00 |
| B/4 | Coffee Tables | 700X700X420 | 2 | 6,362 00 | 12,724 00 |
| (C) | **Bed Rooms – for Both Floors** | | | | |
| C/1 | Double Bed complete with spring mattress | 2000X2000 | 2 | 39,458 00 | 78,916 00 |
| C/2 | Single Bed complete with spring mattress | 1000X2000 | 8 | 25,450 00 | 203,600 00 |
| C/3 | Bed Side Table | 700X700 | 12 | 10,181 00 | 122,172 00 |
| C/4 | Wardrobes | 1200X550X1800 | 8 | 45,823 00 | 366,584 00 |
| C/5 | Dressing Table with Stool | | 6 | 15,272 00 | 91,632 00 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| No. | Description | Size in M.M. | Qty. | Rate Rs. | Total Rs. |
|---|---|---|---|---|---|
| (D) | **Dormitory** | | | | |
| D/1 | Metal/Timber Framed bunk beds complete with mattress | 2000X1000 | 14 | 13,720 00 | 192,080 00 |
| D/2 | Wardrobes | 900X550X1800 | 14 | 45,823 00 | 641,522 00 |
| D/3 | Centre Table | 1200X600X420 | 1 | 8,908 00 | 8,908 00 |
| D/4 | Fabric Upholstered Lobby Chairs | | 4 | 24,990 00 | 99,960 00 |
| (E) | **Dinning Room** | | | | |
| E/1 | 8 Seater Dinning Table | | 1 | 14,561 00 | 14,561 00 |
| D/2 | Real Leather Uphostered Cantilever Chair-Black | | 30 | 10,156 00 | 304,680 00 |
| D/3 | Real Leather Upholstered High lever Chair-Black | | 1 | 20,050 00 | 20,050 00 |
| (E) | **PA to Hon. Minister** | | | | |
| E/1 | Executive Desk | 1600X800X720 | 1 | 17,475 00 | 17,475 00 |
| E/2 | Mobile Pedestal | 420X560X580 | 1 | 8,600 00 | 8,600 00 |
| E/3 | Side Return | 1000X480X670 | 1 | 12,219 00 | 12,219 00 |
| E/4 | Fabric Upholstered High Back Chair-Black | | 1 | 13,540 00 | 13,540 00 |
| E/5 | Fabric Upholstered Visitor Chair-Black | | 2 | 7,300 00 | 14,600 00 |
| E/6 | 4 Shelve Cabinet with Doors | 800X390X1880 | 1 | 50,700 00 | 50,700 00 |
| (F) | **Entrance Lobby** | | | | |
| F/1 | 3 Seater Lobby Chair | | 1 | 18,710 00 | 18,710 00 |
| F/2 | 2 Seater Lobby Chair | | 1 | 13,365 00 | 13,365 00 |
| F/3 | Centre Table | 1000X600X420 | 1 | 8,908 00 | 8,908 00 |
| F/4 | Side Table | 700X700X420 | 1 | 6,362 00 | 6,362 00 |
| (G) | **Chairman Room** | | | | |
| G/1 | Executive Desk | 1800X1050X720 | 1 | 18,710 00 | 18,710 00 |
| G/2 | Mobile Pedestal | 420X640X580 | 1 | 13,365 00 | 13,365 00 |
| G/3 | Side Return | 1400X550X670 | 1 | 11,072 00 | 11,072 00 |
| G/4 | Credenza | 2100X550X720 | 1 | 15,000 00 | 15,000 00 |
| G/5 | 5 Shelf Cabinet W Glass Doors | 800X400X1880 | 2 | 73,702 00 | 147,404 00 |
| G/6 | Art Leather Upholstered High Back Chair | | 1 | 13,540 00 | 13,540 00 |
| G/7 | Art Leather Uphostered Visitor Chair | | 3 | 7,300 00 | 21,900 00 |
| G/7 | Single Seater Art Leather Sofa | 920X850X750 | 2 | 8,017 00 | 16,034 00 |
| G/8 | Centre Table | 1200X600X420 | 1 | 8,910 00 | 8,910 00 |
| G/9 | Coffee Table | 700X700X420 | 1 | 6,362 00 | 6,362 00 |
| (H) | **Conference Room** | | | | |
| H/1 | 'U' shaped Table | As per specs | 1 | 152,750 00 | 152,750 00 |
| H/2 | Fabric Uphoisted Visitor Chairs | | 30 | 10,156 00 | 304,680 00 |
| (I) | **Secretary to Chairman** | | | | |
| I/1 | Executive Desk | 1600X8000X720 | 1 | 17,475 00 | 17,475 00 |
| I/2 | Mobile Pedestal | 420X560X580 | 1 | 8,600 00 | 8,600 00 |
| I/3 | Side Return | 1100X480X670 | 1 | 12,219 00 | 12,219 00 |
| I/4 | Fabric Upholstered High Back Chair | | 1 | 13,540 00 | 13,540 00 |

[අ.භා. 4.02]

මුතු සිවලිංගම් මහතා
(திரு. முத்து சிவலிங்கம்)
(Mr. Muthu Sivalingam)

சபைக்குத் தலைமைதாங்கும் கௌரவ அங்கத்தவர் அவர்களே, மின்வலு, சக்தி அமைச்சர் கௌரவ அனுருத்த ரத்வத்த அவர்களே, பிரதி அமைச்சர் சௌரவ பீலிக்ஸ் பெரேரா அவர்களே, இன்று உலகில் நாகரிகமடைந்த நாடுகளில் மின்சாரம் மக்களுடைய வாழ்க்கைக்கு மிகவும் அத்தியாவசியமாகத் தேவைப்படுகின்றதென்பது உலகறிந்த உண்மை. ஏனைய வளர்ச்சியடையும் நாடுகளில் ஆகக்குறைந்த அளவிலேயே அங்குள்ள மக்களுக்கு மின்சாரம் விநியோகிக்கப்பட்டு வருகின்றது. ஆனால். இலங்கையைப் பொறுத்தமட்டில். சமீப காலத்தில் இந்நிலைமையில் முன்னேற்றம் ஏற்பட்டிருப்பதைக் கண்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

மலையகத் தோட்டப்புறங்களில் 1998 ஆம் ஆண்டுவரை மின்சார சபையால் வழங்கப்படும் மின் விநியோகம் எந்த வகையிலும் மக்களுக்குக் கிடைப்பதாயிருந்திருக்கவில்லை. அவர்களில் ஒரு சிலர் மட்டும் தமது சொந்தச் செலவில் அல்லது வங்கிக் கடன்களைப் பெற்றுத் தமது வீடுகளுக்கு மின்சாரத்தைப் பெறக்கூடியதாக இருந்தது. கிராமங்களுக்கான இலவச மின்சார விநியோகத் திட்டத்தின்கீழ் தோட்டப் புறங்களையும் உள்ளடக்க வேண்டுமென நாம் பலமுறை கடந்த அரசாங்கங்களைக் கேட்டுக்கொண்டிருந்தாலும் கூட, அதில் அக்கறை காட்டப்படாமல் தோட்டப்புற மக்கள் நெடுங்காலமாகப் புறக்கணிக்கப்பட்டே வந்திருக்கிறார்கள். 1994 ஆம் ஆண்டில் இந்த அரசாங்கம் பதவியேற்ற பின்னர், 1995 ஆம் ஆண்டில் இன்றைய ஜனாதிபதி அவர்கள் காலஞ்சென்ற கௌரவ தொண்டமான் அவர்களை இந்த நாட்டு மலையக மக்களின் ஏகோபித்த தலைவரென்ற ரீதியில் அங்கீகரித்து, தோட்ட உட்கட்டமைப்பு அபிவிருத்திக்கென ஓர் அமைச்சை உருவாக்கி, அதன் பொறுப்பை அவரிடம் கையளித்ததன் மூலம் இதுகால வரை தோட்ட நிர்வாகங்களின் பொறுப்பிலிடருந்த சமூக நலப் பணிகளை அரசாங்கம் பொறுப்பேற்க வழிவகுத்தார். அது மிகவும் வரவேற்கத்தக்கது. அவ்வாறான ஓர் அமைச்சினை உருவாக்கியதன் மூலம் இந்த நாட்டின் ஏனைய நகரப்புற, கிராமப்புற மக்களைப்போன்று தோட்டப்புற மக்களின் வாழ்க்கை நிலையையும் மேம்படுத்த,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

அவர்களுடைய தேவைகளைக் கவனிக்க ஒரு வழிபிறந்தது. ஆகவே, ஜனாதிபதியவர்களுக்கு நான் தனிப்பட்ட முறையிலும் இலங்கைத் தொழிலாளர் காங்கிரசின் சார்பாகவும் மலையக மக்களின் சார்பாகவும் நான் எனது நன்றியைத் தெரிவித்துக் கொள்ளுகின்றேன்.

இன்று தோட்டக்கட்டமைப்பு அமைச்சின் மூலம் பல தோட்டங்களுக்கு மின் விநியோகம் வழங்கப்பட்டு வருகின்றது. கௌரவ அமைச்சரவர்களே, மின்சார விநியோகத்திற்காகத் தோட்டக் கட்டமைப்பு அமைச்சின் மூலம் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருந்தாலும், மின்வலு, சக்தி அமைச்சின் மூலம் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருந்தாலும் - இந்த ஆண்டில் மின்வலு, சக்தி அமைச்சின் மூலம் 10 கோடி ரூபா ஒதுக்கிக் கொடுக்கப்பட்டுள்ளது - வேலைகள் துரிதமாக நடைபெறுவதில்லை, அதற்குப் பொருள்கள் இல்லை, கம்பி இல்லை, தூண்கள் இல்லையென்று காரணம் கூறப்படுகின்றது. எனவே, தயவுசெய்து அமைச்சரவர்கள் இதில் கவனஞ் செலுத்தி, அந்தந்த வருடங்களுக்குரிய நிதி ஒதுக்கீடுகிலிருந்து தோட்டங்களுக்கு மின்சார, விநியோகம் வழங்கப்பட ஆவன செய்ய வேண்டுமென்று கேட்டுக்கொள்ளுகின்றேன்.

அடுத்ததாக ஏற்கெனவே மக்கள் தம் சொந்தச் செலவில் மின்சாரத்தைப் பெற்றுக்கொண்டுள்ள தோட்டங்களில் 'வோல்ரேஜ்' குறைவாக இருப்பதாகக் கூறப்படகின்றது. அதாவது மக்கள், 'டிரான்ஸ்போமர்' இல்லாத நிலையில் பல வீடகளக்கு மின்சாரத்தைப் பெற்றுக்கொண்டுள்ள தனால், கோட்டங்களில் உள்ள அந்த வீடுகளுக்கு முழுமையான அளவில் மின்சார ஒளி கிடைப்பதில்லை. அங்கு விளக்கும் வைத்து மின்சார விளக்கையும் போடுவதாக பகிடியாகக் கூறுவார்கள், ஆகவே அப்படிப்பட்ட தோட்டங்களின் மின்சார விநியோகத்தைப் பரிசீலனை செய்து, அவர்களுக்கு முழுமையான அளவில் மின்சாரம் கிடைக்கக்கூடிய வழிவகைகளை ஏற்படுத்திக்கொடுக்க வேண்டும்.

தோட்ட தொழிலாளர்களைப் பொறுத்த மட்டில், மாதாந்தம் ஒரு குடும்பத்தின் வருமானம் சராசரியாக இரண்டாயிரம் - மூவாயிரம் - ரூபாவை இன்னும் தாண்டவில்லை. நாளாந்தம் அதிகரிக்கும் பொருட்களின் விலையேற்றத்தால் அவர்கள் உழைக்கும் நாட்சம்பளம் முழுவதையுமே அன்றாடத் தேவைக்கான பொருட்களுக்காகச் செலவிட வேண்டியிருக்கின்றது. ஆகவே, மின்சாரம் போன்றவற்றுக்கான மேலதிகமான செலவுகளை அவர்களால் ஈடுசெய்ய முடியவில்லை. இதனால் சில தோட்டங்களில் நாம் மின் கம்பங்களை நாட்டி தோட்டங்களுக்கு மின்சாரத்தைப் பெற்றுக்கொடுத்துள்ள போதிலும், அங்குள்ளவர்கள் தமது சொந்த வீட்டிற்கான service connection ஐப் பெறக் கூடிய வாய்ப்பின்றி இருக்கின்றார்கள். அதனை இந்த நாட்டு மக்கள் எல்லோருமே தமது சொந்தப் பணத்திலேயே பெற்றுக் கொள்ளுகின்றார்கள். அதுதான் முறையும் கூட. ஆகவே, நான் இனாமாக வழங்குமாறு கேட்கவில்லை. ஆனால் அமைச்சர் அவர்கள் ஒரு வழியைப் பின்பற்றலாம். இப்பொழுது நீரை விநியோகித்தால் அதற்கு மீற்றர் பொருத்துகிறார்கள். நீர் விநியோகத்துக்காக அந்தந்த மாதத்துக்கு அறவிடும் பணத்துடன் சேர்த்து மீற்றருக்கான மொத்தத் தொகையிலிருந்து ஒரு குறிப்பிட்ட அளவு பணத்தை அதாவது 5 ரூபாவோ 10 ரூபாவோ என்று மாதாந்தம் அறவிடுகிறார்கள். அதேபோன்று வீட்டு மின்சாரத்துக்கான service connection ஐயும் அமைச்சே பொறுப்பேற்று ஒவ்வொரு வீடுகளுக்கும் மின்னிணைப்பைக் கொடுத்த பிறகு, மாதாந்தம் மின் கட்டணப் பட்டியலுடன் சேர்ந்து 100 ரூபாவோ 200 ரூபாவோ என்ற ரீதியில் இணைப்புக் கட்டணத்தையும் அறவிட்டுக்கொள்வது வசதியாக இருக்கும். இப்பொழுது வங்கிக் கடனைப் பெற்றுத்தான் மின்சாரத்தை மின் இணைப்பைப் பெறுகிறார்கள், உங்களுக்குத் தெரியும், வங்கிக் கடனுக்கு இப்பொழுது ஆகக் கூடிய உச்சநிலை வட்டியென்று, வீடு கட்டுவதற்கு அல்லது விவசாயம் செய்வதற்கு அல்லது மின் விநியோகத்துக்குப் பணப் தேவைப்பட்டால் வங்கியில் கடன் எடுக்க வேண்டியிருக்கின்றது. ஆனால், வங்கியில் இன்று வட்டி தலைகீழாக உயர்ந்திருக்கிறது. ஆகவே, அந்த வட்டிப் பளுவை அவர்களால் தாங்க முடியாத சூழ்நிலை இருக்கிறது. எனவே, இதனை அமைச்சர் அவர்கள் பரிசீலனை செய்து, வட்டியோடுள்ள இந்த வங்கிக் கடனை எடுக்கவிடாது, அரசாங்கமே பொறுப்பெடுத்து மின்சாரத்தை விநியோகித்து, அவர்களுடைய மாதாந்த மின்கட்டணப் பட்டியலுடன் அத்தொகையையும் கழித்துக்கொள்ள ஏற்பாடு செய்ய வேண்டும்.

நுவரெலியா, ஹற்றன், தலவாக்கலை, பதுளை, இரத்தினபுரி ஆகிய பகுதிகளிலுள்ள பெரிய பெரிய தோட்டங்களுக்கு இன்னும் மின்சாரம் கிடைக்கவில்லை. மின்சாரக் கட்டணமும் அதிகமாக உயர்ந்துவிட்டது. தோட்ட உட்கட்டமைப்பு அமைச்சுக்கு வருடாந்தம் 10 கோடி ரூபா மாத்திரம் மூன்றாண்டுகளாக ஒதுக்கப்பட்டு வருகிறது. அத்தொகை மூலம் முழுத் தோட்டங்களுக்கும் மின்சாரம் கிடைப்பதானால் இன்னும் பல வருடங்கள் ஆகலாம். ஆகவே, குறுகியகாலத்தில் தோட்டங்களுக்கு மின்சாரம் கொடுத்து முடிக்க ஒரு வழி கண்டுபிடிக்க வேண்டும். இன்னும் இரண்டு ஆண்டுகளிளாவது இது முழுமையாக நிறைவேற்றப்பட வேண்டும். சிலபேர் கூறுகின்றார்கள், இன்று கிராமத்தைவிட தோட்டங்களுக்கு வெகு விரைவில் மின்சாரம் கிடைப்பதாக. அது அப்பட்டமான பொய். மாற்றான்தாய் மனப்பான்மையுடன் தோட்டப்புறத்தைப் பார்ப்பதனால் மருண்டவன் கண்களுக்கு இருண்டதெல்லாம் பேய் போல அவர்களுக்குத் தோன்றுகின்றது. 1958, 1960 ஆம் ஆண்டுகளில் ஆரம்பித்து வைக்கப்பட்ட மின்சார விநியோகம் தோட்டத்துறை மக்களுக்கு இன்றுதான் கிடைக்கிறது. ஆகவே, மின்சார விநியோகத்தில் ஏற்படுகின்ற இப்படியான இடர்ப்பாடுகளை நீக்கி, வெகு விரைவில் சகல தோட்டங்களுக்கும் மின்சாரம் கிடைக்கக்கூடிய வாய்ப்பை ஏற்படுத்தித்தர வேண்டும். சில தோட்டங்களில் மின் விநியோகம் ஆரம்பிக்கப்பட்டபோதும், இன்னும் மீற்றர் பொருத்தப்படவில்லை. நான் கேள்விப்படுகிறேன். மீற்றர்கள் கைவசம் இல்லாத குறையென்று. எனவே, அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் உடனடியாக அக்கறையெடுத்து எந்தவித பாகுபாடும் இல்லாது, மீற்றர்களை இணைத்து வெகு விரைவில் அந்த மக்கள் மின்னொளியைப் பெறுவதற்கு வாய்ப்புப் பெற்றுக்கொடுக்குமாறு கேட்டு விடை பெறுகிறேன். நன்றி.

[அ. பா. 4.10]

ලකී ජයවර්ධන මහතා
(திரு. லகீ ஜயவர்தன)
(Mr. Lucky Jayawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ තිරසාර ආර්ථික සංවර්ධනයත්, සමාජ යහ පැවැත්ම ඉහළ නැංවීමට කටයුතු සැලැස්වීමත් ප්‍රධාන පරමාර්ථය කොට ගෙන කටයුතු කළ යුතු විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2001 වැය ශීර්ෂය පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම මෙම අමාත්‍යාංශය භාරව කටයුතු කරන අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා පළපුරුදු අමාත්‍යවරයෙකු වුවත්, ඒ වගේම නියෝජ්‍ය අමාත්‍යවරයා සහයෝගයෙන් කටයුතු කළ හැකි කෙනකු වුවත් එතුමන්ලාට මෙම අමාත්‍යාංශය තුළ වැඩ කර ගෙන යාමේදී විශාල ගැටලුවලට මුහුණපාන්නට සිදු වී තිබෙන බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. රටේ ඉහළම තැන්වලින් බලපෑම් ඇතිවීම තුළින් මෙම අමාත්‍යාංශයේ කටයුතු අඩාල වෙලා තිබෙනවාය කිව්වොත් නිවැරදියි. මොකද, අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වයට සෘජුවම බලපාන මෙම අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් තුළ, වර්තමානයේ ශ්‍රී ලංකාවාසී ජනතාවට දැඩි අපහසුතාවකට පත් වන්නට සිදු වී තිබෙන බව මතක් කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂ රජය පාලන කාලය අවසන් කොට පොදු පෙරමුණු රජය පාලන බලය ලබා ගත් 1994 වර්ෂයේ මේ රටේ පැවැති ජීවන වියදම් දර්ශකය 1527.4ක් වුවත්, පොදු පෙරමුණු රජයේ සය අවුරුදු පාලනයෙන් පසුව 2001 පෙබරවාරි මාසය වන විට එය 2842.8 දක්වා වර්ධනය වී ඇති බවත්, ඒ අනුව එය සියයට 100ක වැඩිවීමකට ළඟා වී ඇති බවත් ඉතා කනගාටුවෙන් වුවත් මතක්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලකී ජයවර්ධන මහතා]

කළ යුතු වෙනවා. මේ සඳහා මෙම අමාත්‍යාංශය තුළින් ලබා දී ඇති දයකත්වය ඉතා විශාල මට්ටමක පවතිනවාය කියන එක නිවැරදියි. විදුලිය, තෙල්, ගෑස් ආදියේ මිල අධික ලෙස වැඩිවීම තුළින් රටේ ජනතාවට ජීවන වියදම උසුලා ගන්නට බැරි තත්ත්වයක් උද වෙලා තිබෙනවාය කියන එක මතක් කළ යුතු වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මෙම අමාත්‍යාංශය තුළ තිබෙන දූෂණය, නාස්තිය, ඒ වගේම අකර්මණ්‍යතාව නැති කරන්නට කටයුතු කරන්නය කියා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. ලංකා විදුලිබල මණ්ඩලය 2000 සැමට විදුලිය දෙන්නට සැලසුම් ඇතිකර තිබුණත්, මම හිතන විධියට ඒ ඉලක්ක ඉටු වී නැහැයි කියන එක කනගාටුවෙන් මතක් කළ යුතු වෙනවා. මේ වැය ශීර්ෂය යටතේ අපට ලැබී තිබෙන 2001 ව්‍යාපාර සහ වැඩසටහන් නමැති පොතේ දක්වන ආකාරයට දනට මේ වන විට, ඒ කියන්නේ 2000 වසර අවසන් වන විට දිවයිනේ නිවාස සංඛ්‍යාවෙන් විදුලිය ලැබී තිබෙන්නේ සියයට 58කට පමණයි කියන එක මතක් කළ යුතු වෙනවා. විදුලිය නොමැතිවීමෙන් ග්‍රාමීය පෙදෙස්වල ජනතාව විශාල වශයෙන් කරදරයට පත් වෙනවා. ඒ වගේම විදුලිය ඒ අයගේ අවශ්‍යතාවක් වී තිබෙනවා. එ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කර ග්‍රාමීය පෙදෙස්වල විදුලිය ඉල්ලුම සපුරන්නට කටයුතු සලස්වන්නැයි මා විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. ඒ වගේම දේශපාලන භේදයෙන් තොරව ගමට විදුලිය ලබා දෙන්නැයි කියාත් ඉල්ලීමක් කරනවා. සමහර අය එක්සත් ජාතික පක්ෂයේ නම්, ඒ අයගේ ගේ ළඟට විදුලි කණුව එන කොට විදුලිය සැපයීම එතැනින් නවත්වනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ உறுப்பினர் ஒருவர்)*
(An hon. Member)
ගරු මන්ත්‍රීතුමනි, කවදාවත් එහෙම කරලා නැහැ.

ලකී ජයවර්ධන මහතා
*(திரு. லகீ ஜயவர்தன)*
(Mr. Lucky Jayawardena)
උඩුනුවර මැතිවරණ කොට්ඨාසයේ ඒ වගේ සිද්ධීන් ඇති වී තිබෙනවා. [බාධා කිරීමක්] හොඳයි, මම ඒක ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරවන්නම්.

ඒ ආකාරයේ දේවල් නැති කරන්නය කියා මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් තොරව විදුලිය ලබා දෙන්නට කටයුතු සලස්වන්නය කියා මම ඉල්ලා සිටිනවා.ඒ වගේම පසුගිය මැතිවරණ සමයන්හිදී අපේ ප්‍රදේශවල විදුලි යෝජනා ක්‍රම ඇති කරන්නට කණු ගෙන ගොස් දමා තිබෙනවා. නමුත් මෙතෙක් ඒවායේ වැඩ කටයුතු ආරම්භ වී නැහැ. ගෝනාඩිකවත්ත ජනපදයේ කණු 40ක් ගොඩ ගසා තිබෙනවා. නමුත් ඒ පිළිබඳව වැඩ පිළිවෙලක් මෙතෙක් ක්‍රියාත්මක වී නැහැ. ගරු අමාත්‍යතුමාගේ අවධානයට මම පාර්ලිමේන්තුවේදී ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයකුත් ඉදිරිපත් කළා. නමුත් ඒකට පැහැදිලි උත්තරයක් ලැබුණේ නැහැ. මම හිතන්නේ විදුලිබල මණ්ඩලය ඒ සම්බන්ධයෙන් බොරු උත්තරයක් තමයි සකස් කර දී තිබෙන්නේ. ඒකට වග කියන්න අමාත්‍යතුමාට බැහැ.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)
ඒකෙන් තමුන්නාන්සේ සෑහීමකට පත් වෙන්නේ නැත්නම් –

ලකී ජයවර්ධන මහතා
*(திரு. லகீ ஜயவர்தன)*
(Mr. Lucky Jayawardena)
ඒක තමයි මම මතක් කළේ.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)
අපි ඒක නැවත වරක් – [බාධා කිරීමක්]

ලකී ජයවර්ධන මහතා
*(திரு. லகீ ஜயவர்தன)*
(Mr. Lucky Jayawardena)
ඒ වගේ වැඩ කටයුතු කඩිනම් කරයි කියා බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් අද විදුලි බල මණ්ඩලය පිළිබඳව විශාල ආන්දෝලනයක් මේ රටේ තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ පවතින දූෂණ හා අකර්මන්‍ය පාලනය නිසා ඒ කරුමය අද විදුලි පාරිභෝගිකයාට විඳින්න වෙලා තිබෙනවා කියන එක කනගාටුවෙන් මතක් කරන්න ඕනෑ. 1994 පාලන සමය අවසන් වෙන කොට විදුලිබල මණ්ඩලය සතුව රුපියල් මිලියන 4,000ක තැන්පතුවක් තිබුණා. අද එය ණය අයිරාවක් බවට පත් වී, රුපියල් මිලියන 6,000ක ණය අයිරාවක් වී තිබෙනවා. මේ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කර, මේ පාඩුව නාස්තිය නැති කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

විදුලිබල මණ්ඩලයේ වැඩ පිළිවෙළ පිළිබඳව එද සභාව කල් තබන අවස්ථාවේදී ර. මූ. රත්නායක මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඉදිරිපත් කර, කථා කරන්නට යෙදුණා. විදුලිබල මණ්ඩලයේ සිදුවන අක්‍රමිකතා පිළිබඳව අවධානය යොමු කරන්නට ඕනෑ.

විදුලි කණු සඳහා ලී කණු 23,000ක් විදුලිබල මණ්ඩලයට දෙන්න දව සංස්ථාව සූදානම් කර තිබියදී, පින්ලන්තයෙන් කණු 40,000ක් ගෙනත් විශාල පාඩුවක් සිදුකර තිබෙනවාය කියන එක තමුන්නාන්සේ දන්නවා. ඒ වාගේ වැඩ තුළින් මේ වාගේ විපාක ජනතාවට විඳින්න සිදු වී තිබෙනවා, කියන එක මම මතක් කරන්න ඕනෑ. රුපියල් 3500කට රුපියල් 4000කට වාගේ ගන්න පුළුවන් කණුවකට රුපියල් 9000ක් වාගේ මුදලක් ගෙවා මේ වාගේ වැඩ කිරීම තුළින් ඇත්ත වශයෙන්ම විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් මොනදේ බලාපොරොත්තු වෙනවාද කියන එක පිළිබඳව මම මතක් කරන්න ඕනෑ. අද කොන්ක්‍රීට් කණු ගැන කථා කළොත්, විදුලිබල මණ්ඩලයේ කොන්ක්‍රීට් කණු විශාල ප්‍රමාණයක් මංමාවත්වල දමා ගොඩ ගසා තිබෙනවා. ඒවා පාවිච්චියට අරගෙන වැඩ කටයුතු කළොත්, විදුලිබල මණ්ඩලයේ තිබෙන මෙම ණය අයිරාව අඩු කර ගැනීමට පුළුවන් වෙනවා. එයින්ද ජනතාවට විඳින්න සිදු වෙන අයහපත් විපාකවලින් මහ හරින්න පුළුවන් වෙයයි කියන එක මම මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අද විදුලි මීටර පිළිබඳ විශාල ගැටළුවක් තිබෙනවා. මම හිතන්නේ ඒ විදුලි පාරිභෝගිකයන්ට මීටර් නැති නිසායි. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල විදුලිය පරිභෝජනය කරන අයගෙන් ඉතාම සුළුවෙනුයි අය කරන්නේ. නමුත් විදුලිබල මණ්ඩලය මීටරය සපයන්නේ නැතුව ඒ අයගෙන් වැඩි මුදලක් අයකරන බව මතක් කරන්න ඕනෑ. ඒ නිසා විදුලි මීටර් සකස් කර දෙන්න කඩිනමින් වැඩ පිළිවෙළක් සකස් කර දෙන්නය කියන එකත් මතක් කරන්න ඕනෑ. විදුලිබල මණ්ඩලය මගින් විදුලි මීටර් සම්බන්ධව වංචාවක් සිදුකර තිබෙනවා කියන එකත් අපට දන ගන්නට ලැබී තිබෙනවා. විදුලි මීටරයක් ඩොලර් 12කට ලබා ගැනීමට ඉන්දියාවත් සමග ගිවිසුමක් තිබුණත්, විදුලි මීටරයක් සඳහා ඩොලර් 14ක් ගෙවා ලබා ගත් බව අපට දන ගන්නට ලැබී තිබෙනවා. ඒ ආකාරයට විදුලිබල මණ්ඩලයේ නාස්තිය විශාල වශයෙන් වැඩි වී තිබෙනවා.

සමනලවැව ජලාශය අභියස රුපියල් කෝටි 5ක් පමණ වියදමින් ඉදිකර ඇති සුඛෝපභෝගී සංචාරක නිවාසයක් ගැන මාධ්‍ය මගින් අපට දනගන්නට ලැබී තිබෙනවා. සමනලවැව ප්‍රදේශයේ සංචාරක බංගලා 3ක් තිබියදීත්, මේ වාගේ නිවාඩු නිකේතනයක් ඇති කළේ කාගේ වුවමනාවටද කියන එක අපි ප්‍රශ්න කළ යුතු වෙනවා. විශේෂයෙන්ම මේ සංචාරක නිකේතනයට යන මාර්ගය සකස් කිරීමට පමණක් කෝටි භාගයක මුදලක්, එනම් රුපියල් ලක්ෂ 50කට අධික මුදලක් වියදම් කර තිබෙනවා කියන එක අපට දන ගන්න ලැබී තිබෙනවා. මේ වාගේ නාස්ති නැති කලොත් එය මේ රටට කරන සේවාවක් කියන එක අප මතක් කරන්න ඕනෑ. විශේෂයෙන් පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව 1994දී ජනතාවට පොරොන්දු දුන්නේ හැම කෙනෙකුටම විදුලිය ලබා දෙනවා කියලයි.

ඒ වාගේම තෙල් මිල අඩුකර, ජීවන වියදම අඩු කරනවා කියා එද පොරොන්දු දුන්නා. නමුත් පොදු පෙරමුණු ආණ්ඩුව බලයට පත් වුණාට පසුව, තෙල් මිල ඉතා අධික ලෙස වැඩි වුණා කියන එක අප අමුතුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිව යුතු වන්නේ නැහැ. අපේ දහම් විමලසේන ගරු මන්ත්‍රීතුමා මතක් කළ ආකාරයට, එද එක්සත් ජාතික පක්ෂ පාලන කාලය තුළදීත්, ලෝක වෙළෙඳපොළේ තෙල් මිල වැඩි වුණා. ඒ අවස්ථාවේදීත් නාස්තිය අඩු කර, වැඩි නොකර සාධාරණ මුදලකට ජනතාවට තෙල් ලබා දුන්නා කියන එක තමුන්නාන්සේට මම මතක් කරන්න ඕනෑ. පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව යටතේ 2000 පෙබරවාරි මාසයේ රුපියල් 13.20ට තිබුණු ඩීසල් ලීටරයට අද වෙනකොට රුපියල් 24.50 දක්වා වැඩි වී තිබෙනවා කියන එක මතක් කරන්න ඕනෑ. භූමිතෙල් ලීටරය 2000 පෙබරවාරි මාසයේදී රුපියල් 10.40කට තිබුණු එක අද වෙන කොට රුපියල් 18.40ක් බවට පත් වී තිබෙනවාය කියන එකත් මතක් කරන්නට ඕනෑ. මේ ආකාරයට ගෙල් මිල වැඩිවීම මේ රටේ ජනතාවගේ ජීවන වියදමට විශාල වශයෙන් බලපානවාය කියන එකත් අපි මතක් කළ යුතු වෙනවා. රටේ ජනතාවට ඉතාම වැදගත් මේ අමාත්‍යාංශය තුළින් මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර කටයුතු කරන්නය කියන එක මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම, පෙට්‍රල් ෂෙඩ් ගැන කථා කරන විට, රාත්‍රී කාලයේදී පෙට්‍රල් ෂෙඩ් වසා තිබෙනවාය කියන එක මතක් කරන්නට ඕනෑ. රටේ පවතින අයහපත් වාතාවරණය මත මම හිතන්නේ, රාත්‍රී 8.00න් පසුව පෙට්‍රල් ෂෙඩ් එකකින් තෙල් ලබා ගන්නට බැරි තත්ත්වයක් අද උද වී තිබෙනවා. ඒ නිසා මේ සඳහා ආරක්ෂක වැඩ පිළිවෙළක් හෝ යොද රාත්‍රී කාලයේදී පෙට්‍රල් ෂෙඩ් විවෘත කිරීමට වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියන එක මතක් කරන්න ඕනෑ. කොළඹ නගරයේත් රාත්‍රී කාලයේදී පෙට්‍රල් ෂෙඩ් විවෘත කර නැති බව කනගාටුවෙන් මතක් කරන්න වෙනවා. [බාධා කිරීමක්] ඔව්. රාත්‍රී කාලයේදී අපි ගමන් බිමන් යනවා. මහජන සේවකයන් හැටියට අපි අවදියෙන් ඉන්නවා.

සරත් ගුණවර්ධන මහතා
*(திரு. சரத் குணவர்தன)*
(Mr. Sarath Goonawardana)

මේ කාලයේ රාත්‍රී කාලයට තමයි බෝඩ් කඩන්න එන්නේ. රැටයි තලිබාන්ලා එන්නේ. තලිබාන්ලා එන විට අපි අවදියෙන් ඉන්න ඕනෑ.

ලකී ජයවර්ධන මහතා
*(திரு. லகீ ஜயவர்தன)*
(Mr. Lucky Jayawardena)

ඒ වාගේම, පෙට්‍රල් ෂෙඩ්වල තෙල් මැනීමේ කටයුතු සම්බන්ධයෙනුත් අක්‍රමිකතා සිදු වන බව කියන්නට ඕනෑ. පෙට්‍රල් ෂෙඩ්වල මිනුම් කටයුතු පිළිබඳව හරියාකාරව පරීක්ෂණ පවත්වන්නේ නැහැ. සමහර ෂෙඩ්වලින් රුපියල් 1000ක තෙල් ගහන විට වදින ප්‍රමාණය සමහර ෂෙඩ්වලින් තෙල් ගහනවිට වදින්නේ නැහැ. සමහර ඒවායේ ඒ ප්‍රමාණය අඩුවෙනුයි වදින්නේ. ඒ ආකාරයේ අක්‍රමිකතා සිදු වෙනවා. මේ පිළිබඳවත් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා.

මේ ආකාරයට මේ අමාත්‍යාංශය තුළින් අපි බලාපොරොත්තු වන වැඩ පිළිවෙළවල් ඉදිරි කාලයේදී ඇති කරන්නට ගරු අමාත්‍යතුමා උත්සාහ ගනීවිය කියා අපේ ලොකු විශ්වාසයක් තිබෙනවා. විශේෂයෙන්ම විශාල දියුණුවක් ඇති කිරීමට ගරු අමාත්‍යතුමා උත්සාහ කරනවා. තාප බලාගාරය පිළිබඳවත් විශාල ගැටලු තිබෙනවා. පී. දයාරත්න ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට තාප බලාගාරය ඇති කිරීම ගැන අපි කැමැතියි. නොරොච්චෝලේ එය පිහිටුවීම ගැන ජනාධිපතිතුමියත් විරුද්ධ වී තිබෙනවා. ඒ නිසා ඒ ගැටලුව විසඳ ගෙන, කොතැන හෝ තාප බලාගාරය ඉදි කරන්න ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා එද පොරොන්දු වුණා. විදුලිබල අවශ්‍යතාවය නැති කරන්න කාටවත් බැහැ. ඒ අවශ්‍යතාවය මණ්ඩලය තේරුම් අරගෙන, ඉදිරි කාලයේදී කටයුතු කරන්න ඕනෑය කියන එක මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අද ඉන්ධන ගැලපුම් ගාස්තු අය කර ගැනීම ගැන විශාල ආන්දෝලනයක් තිබෙනවා. මම හිතන්නේ විදුලි කාර්මිකයන් මේ පිළිබඳව උසාවියටත් ගොස් තිබෙනවාය කියන එක මතක් කරන්න ඕනෑ. රජයේ ආයතනවල විදුලි ගාස්තු අය නොකර ඉන්ධන ගැලපුම් ගාස්තු අය කර ගැනීම අසාධාරණයි කියන එක අද රටේ ජනතාවගේ මතය වී තිබෙනවා. ඒ වගේම, විශාල ව්‍යාපාරිකයන්ගෙන් මණ්ඩලයට අය විය යුතු මුදල් ලබා නොගෙන, ඒ බර මේ රටේ අහිංසක විදුලි පාරිභෝගිකයන් පිට පටවන තත්ත්වයක් ඇති වී තිබෙනවා. මණ්ඩලයේ අක්‍රමිකතා නිසා ඇති වන එවැනි දේවල් වැළැක්වීමට කටයුතු කරන්නය කියා අපි මතක් කරනවා. රජයේ ආයතනවලින් මම හිතන්නේ විදුලිය ගාස්තු විශාල වශයෙන් මණ්ඩලයට අය විය යුතුව තිබෙනවා. මේ මුදල් අය කර ගැනීමට වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියන එකත් අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ.

ඒ වගේම, විදුලිබල මණ්ඩලයේ සම්පත් විශාල වශයෙන්ද ඡන්ද ව්‍යාපාරයට යොද ගෙන තිබෙන බව මාධ්‍ය තුළින් අපට දැන ගන්නට ලැබී තිබෙනවා. විශේෂයෙන්ම අපි එය දැක තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා. මැතිවරණ කටයුතු සඳහා එද දීපු වාහන මේ දක්වා ආපසු භාර දී නැති බව 'දිවයින' පුවත්පතේ පළ කර තිබුණා. ඡන්ද වැඩවලට යොද ගත් විදුලිබල මණ්ඩලයට අයත් වාහන 30ක් පමණ ආපසු භාර දී නැහැ කියා ඊයේ පෙරේද පත්තරවල පළ වුණා. වරාය අධිකාරියෙත් ඒ වගේ දේවල් සිද්ධ වී තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ එවැනි සිද්ධි ඇති වී තිබෙනවාය කියන එක 2001.02.08 වැනි බ්‍රහස්පතින්ද 'දිවයින' පුවත්පතේ සඳහන් වී තිබෙනවා. මේ පිළිබඳව අවධානය යොමු කර, රටේ ජනතාවට අයිති සම්පත් පෞද්ගලිකව පරිහරණය කරන්නට කිසිවෙකුට ඉඩ දෙන්නට එපාය කියා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, ලංකා විදුලිබල මණ්ඩලයේ මාස දෙකක ඉන්ධන වියදම රුපියල් කෝටි 350ක් වූ බව 'දිවයින' පුවත්පතේ ප්‍රධාන සිරස්තලයක් වශයෙන් මාර්තු 29 වැනිද පළ කර තිබුණා. ලංකා විදුලිබල මණ්ඩලය පසු ගිය මාස දෙක ඇතුළතදී ඉන්ධන සඳහා පමණක් රුපියල් තුන්සිය පනස් කෝටියකට අධික මුදලක් වියදම් කර ඇතැයි මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් 'දිවයින' පුවත්පතට කියා තිබෙනවා. මේ ආකාරයට වියදම් කිරීම තුළින් යම් යම් දූෂණ, අක්‍රමිකතා ඇති වෙන්න පුළුවන්. ඒ පිළිබඳවත් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කර, ඒ වියදම් අඩු කර ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

විදුලි බිල ගැනත් කියන්න ඕනෑ. පොදු පෙරමුණු රජය බලයට පත් වුනාට පසුව විදුලිබල ගාස්තු වරින් වර වැඩි වුණාය කියන එක තමුන්නාන්සේලා දන්නවා. ඒ බර අද ජනතාවට විශාල වශයෙන් දැනී තිබෙනවා. ඒ වාගේම ගෑස් මිල විශාල වශයෙන් වැඩි වීම තුළින් අද ජනතාව විවිධාකාර අපහසුතාවන්ට පත් වී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේදී රුපියල් දෙසීය ගණනට තිබුණු ගෑස් සිලින්ඩරයකට අද රුපියල් 500ක මුදලක් ගෙවන්නට සිද්ධ වී තිබෙනවා. එද තමුන්නාන්සේලා ඇති කළ ඒ ගිවිසුම අනුව ඒකාධිකාරී වෙළෙඳම නිසා, ඒ තත්ත්වය උද වුණා කියන එක මේ රටේ ජනතාව දන්නවා. මේ වන විට ඒ ඒකාධිකාරී තත්ත්වය අවසන් වී තිබෙනවාය කිව්වත්, ඒ ඒකාධිකාරය තවම පවතිනවාය කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ නිසා කඩිනමින් තරගකාරී තත්ත්වයකට මේ ගෑස් ව්‍යාපාරය ගෙන ගොස් මේ රටේ ජනතාවට ඒ පහසුකම් සැලැසීමට මෙම අමාත්‍යාංශය තුළින් කටයුතු සලසන්නය කියා ඉල්ලා සිටින අතර, ඒ ආකාරයේ වැඩ පිළිවෙළක් මේ රටේ ජනතාවට ඇති කිරීමට ගරු අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, ඒ වාගේම විදුලිබල මණ්ඩලයේත් එයට අදළ අනෙකුත් ආයතනවලත් නිලධාරීන්ටත් අවශ්‍ය ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනවා.

[අ.භා.4.25]

ඒ. අඩෛකලනාදන් මහතා
*(திரு. ஏ. அடைக்கலநாதன்)*
(Mr. A. Adaikkalanathan)

*கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, இந்த மின்வலு, சக்தி அமைச்சின் நிதி ஒதுக்கீட்டு விவாதத்தில் பேச வாய்ப்பளித்தமைக்கு நன்றி கூறுகின்றேன். கௌரவ அமைச்சரவர்களே, எங்களுடைய வன்னி மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கே பம்பைமடு, சாஸ்திரிவபூழாங்குளம், செட்டிகுளம், செட்டிக்குள பிரதேசத்திலுள்ள இலுப்பைக் குளம், நேரியகுளம் போன்ற மக்கள் மீளக் குடியமர்த்தப்பட்ட கிராமங்கள் பல இருக்கின்றன. அங்கே மின்சாரப் பற்றாக்குறை நிலவுகின்றது. இன்று கிராமம் கிராமமாக மின்சாரம் வழங்கப்பட்டு வரும்போது, வன்னி மாவட்டத்தில் வவுனியாவில் இருக்கின்ற - [இடையீடு]*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. අඩෛක්කලනාදන් මහතා]

நன்றி. இந்தக் கிராமங்களுக்கு மின்சார விநியோகம் சம்பந்தமாக உடனடியான ஒரு தீர்வை நீங்கள் அளிக்க வேண்டுமென்று கேட்டுக்கொள்ளுகின்றேன். அது மட்டுமல்ல கௌரவ அமைச்சரவர்களே! வவுனியாவிலும் அவ்வாறான பிரச்சினை இருக்கின்றது.

மன்னாரில் வீதி ஓரமாக ஆரம்பத்தில் செய்யப்பட்ட பழைய வேலைகள் மீளவும் செய்யப்பட வேண்டியிருக்கின்றன. அங்குள்ள மின் கம்பங்களெல்லாம் சரிந்தும் பழுதடைந்தும் காணப்படுகின்றன. குறிப்பாக, பேசாலையிலிருந்து தலைமன்னாருக்குப் போகும் வழியில் சூறாவளியின் காரணமாகப் பழைய கம்பங்கள் சரிந்த நிலையில் காணப்படுகின்றன. [இடையீடு] மன்னாரில் வவுனியா, பம்பைமடுப் பகுதியில் அந்த நிலைமை இருக்கின்றது. அதுபற்றி நான் சமபந்தப்பட்ட அதிகாரிகளுடன் பேசியபோது, அவற்றை மீளமைக்க 20 மில்லியன் - 2 கோடி ரூபாய்க்கு மேல் - தேவைப்படுமென்று கூறினார்கள். உண்மையிலேயே இவற்றை மீளமைத்தால், மின்சாரம் ஒரு வித பிரச்சினையுமின்றி இலகுவாக விநியோகிக்கப்பட வாய்ப்பு இருக்கின்றது. அது மட்டுமல்ல, மன்னாரில் முருங்கனில் மின்சார சபையின் கிளை அலுவலகமொன்றைத் திறப்பதற்கும் ஆவன செய்ய வேண்டும். அங்குள்ள மின்சாரத் திணைக்களத்திற்கு வாகனங்கள் பற்றாக்குறையாக இருக்கின்றது; மேலும் சில வாகனங்கள் அங்கே தேவைப்படுகின்றன.

எனக்கு முன்னர் பேசிய மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் அவர்கள் uncleared area களிலும் மின்சார விநியோகம் வழங்கப்பட்டிருப்பதற்காக அமைச்சரவர்களுக்கு நன்றி கூறினார். அதுபோல், மடு பிரதேசத்திற்கும் மின்சாரத்தை வழங்க வேண்டுமென்ற கோரிக்கையை நான் முன்வைக்க விரும்புகின்றேன். மட்டக்களப்பிலுள்ள uncleared area களுக்கு மின்சாரம் வழங்கப்பட்டிருக்கின்றது. அதேபோல் மடு தேவாலயத்தைச் சுற்றியுள்ள இடங்களுக்கும் நீங்கள் மின்சாரத்தை வழங்கினால் உதவியாக இருக்கும். எல்லா வேலைகளும் அங்கு பூர்த்தி செய்யப்பட்டிருந்தும் மின்சார விநியோகம் நிறத்தப்பட்டிருக்கின்றது. ஆகவே, அதனையும் அமைச்சரவர்கள் கவனத்தில் எடுக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். [இடையீடு] ஆனால், சம்பந்தப்பட்ட இடத்தை நான் சென்று பார்க்க முடியாது. ஆனால், மட்டக்களப்பில் சென்று பார்க்க முடியாத இடங்களில் கூட மின் விநியோகம் வழங்கப்பட்டுள்ளது. [இடையீடு] எனவே, இங்கும் செய்தால் உதவியாக இருக்குமென்று கருதுகின்றேன்.

இன்னொரு முக்கிய விடயம் சம்பந்தமாகவும் நான் அமைச்சர் அவர்களுக்குக் கூற விரும்புகின்றேன். அதாவது எரிபொருள் pass நடைமுறை வவுனியாவிலும் மன்னாரிலும் அறிமுகப்படுத்தப்பட்டு வருகின்றது. ஏனைய பகுதிகளில் எரிபொருள் pass நடைமுறை இல்லை. எனவே, ஏன் இந்த pass நடைமுறை என்பதை நான் அமைச்சர் அவர்களிடம் கேட்க விரும்புகின்றேன். எரிபொருளுக்கு pass வழங்கும் நடைமுறையைத் தளர்த்துவதே நல்லதென்று நான் நினைக்கின்றேன். அங்கு cleared area வின் எல்லைகளைச் சுற்றிப் பாதுகாப்புப் படையினர் நிலை கொண்டிருக்கையில், அவர்களைத் தாண்டி cleared area க்கு அப்பால் எரிபொருள் எடுத்துச் செல்லப்படுகின்றது என்றால் பாதுகாப்பு ஒழுங்கிலுள்ள ஓட்டைதான் அதற்குக் காரணமாக இருக்க வேண்டும். எனவே, இராணுவக் கட்டுப்பாட்டிலுள்ள இடங்களில் எரிபொருள் விநியோகத்திற்குக் கட்டுப்பாடு விதிப்பதை, அதாவது எரிபொருள் விநியோகத்திற்கு pass முறை நடைமுறைப்படுத்துவதை அமைச்சர் அவர்கள் தளர்த்த வேண்டும். [இடையீடு] Thank you எரிபொருள் pass நடை முறையினால் cleared area விலே இருக்கின்ற விவசாயிகள் மிகவும் பாதிக்கப்படுகின்றார்கள்.

அது மட்டுமல்ல, அங்கு பெற்றோல் மற்றும் டீசல் விநியோகம் மட்டுப்படுத்தப்படுவதனால், அவை black market இலே கூடிய விலைக்கு விற்கப்படுகின்றன. அதாவது cleared area உள்ள பெற்றோல் நிலையத்தில் 50 ரூபாவுக்கு விற்கப்படுகின்ற ஒரு லீற்றர் பெற்றோல் அங்கு black market இல் 150 ரூபாவுக்கு விற்கப்படுகின்றது. அதேபோல 25 ரூபாவுக்கு விற்கப்படுகின்ற ஒரு லீற்றர் டீசல், black market இல் 60 - 70 ரூபாவுக்கு விற்கப்படுகின்றது. அங்குள்ள உண்மையான நிலைமையைத்தான் நான் இங்கு கூறுகின்றேன். [இடையீடு] In Vavunia and Mannar. எரிபொருளுக்கு pass முறை நடைமுறைப்படுத்தப்படுவதனால்தான் black market இலே எரிபொருள் கூடுதலான விலைக்கு விற்கப்படுகின்து. அங்கு black market இலே டீசல் ஒரு லீற்றர் 60 ரூபா என்று விற்கப்படுகின்றது. அதேபோன்று 19 ரூபாவுக்கு விற்கப்பட வேண்டிய மண்ணெண்ணெய் 22 ரூபாவுக்கு விற்கப்படுகின்றது. ஆகவே அமைச்சர் அவர்கள் இந்த விடயத்திலே கவனம் செலுத்தி ஆவன செய்ய வேண்டும். நாளை நடைபெறவுள்ள அமைச்சின் ஆலோசனைக் குழுக் கூட்டத்திலும் நாங்கள் இந்த விடயம் சம்பந்தமாக எடுத்துக் கூறவிருக்கின்றோம்.

அதுமட்டுமல்ல uncleared area விலே ஒரு மாத காலப் பகுதிக்குப் பாவிக்க ஓர் ஆளுக்கு ஒரு லீற்றர் என்ற அடிப்படையில் மண்ணெண்ணெய் விநியோகிப்பதற்கு அனுமதிக்கப்படுகின்றது. இந்தத்தொகை அதிகரிக்கப்பட வேண்டும். இன்று வன்னியின் கல்விநிலையைப் பொறுத்த வரையில், அங்கு எவ்வளவோ கஷ்டமான நிலைமை காணப்பட்ட போதிலும், அங்குள்ள மாணவர்கள் கல்வியில் ஓரளவு நல்ல நிலையில்தான் இருக்கின்றார்கள். அங்கு ஒரு நபருக்கு ஒரு மாத காலப் பாவிப்புக்கு ஒரு லீற்றர் மண்ணெண்ணெய்தான் விநியோகிக்க அனுமதிக்கப்படுகின்றது. [இடையீடு] Thank You. சிறு போகப் பயிர்ச்செய்கை ஆரம்பமாக இருக்கும் இவ்வேளையில், அரசாங்கம் அங்கு கூடுதலான அளவு மண்ணெண்ணெய்யை விநியோகிக்க அனுமதிக்க வேண்டும். இப்பொழுது 6 லீற்றர் மண்ணெண்ணெய்யை விநியோகிப்பதற்கு அரசாங்கம் அனுமதித்திருக்கின்றது என்று கூறப்படுகின்றது. எனவே, எங்களுடைய மக்களின் சார்பாக அமைச்சர் அவர்களுக்கு மிகுந்த நன்றியைக் கூறுவதற்கு நான் கடமைப்பட்டிருக்கின்றேன். ஆகவே, எரிபொருள் கட்டுப்பாட்டை மேலும் தளர்த்தி எங்களுடைய மக்களுக்கு நிவாரணம் வழங்க வேண்டும் என்று கேட்டுக் கொள்வதுடன் எனக்கு இங்கு பேசுவதற்கு வாய்ப்பு அளித்தமைக்கு நன்றியும் கூறி விடை பெறுகின்றேன்.

[අ. භා. 4.31]

ගරු ෆීලික්ස් පෙරේරා මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - மின்வலு, சக்தி பிரதி அமைச்சர்)

(The Hon. Felix Perera – Deputy Minister of Power and Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අමාත්‍යාංශයේ වැඩ කටයුතු කිරීම සඳහා ලබා දෙන ශක්තිය, ධෛර්යය සහ සහයෝගය ගැන අපේ ගරු අමාත්‍යතුමාට මම ඉතාමත් ස්තුතිවන්ත වනවා. ඇත්ත වශයෙන්ම අර්බුදයට ලක් වුණු අමාත්‍යාංශයක්ය කියා අද ලොකුවට කථා කළාට, මේ විවාදයට සහභාගි වුණු විධිය ගැන කල්පනා කර බලද්දී එලදායී විවේචනයක් වුණාය කියා මට නම් පෙනෙන්නේ නැහැ.

කෙසේ වෙතත්, අපේ ආණ්ඩුව යටතේ මේ අංශ දෙකේම විශාල දියුණුවක් ප්‍රගතියක් ලබා තිබෙනවාය කියා අපි කවුරුත් අද පිළිගන්නවා ඇති. ඒ සඳහා ඇති වුණු ආර්ථික ප්‍රශ්න පැත්තකට දමා සංවර්ධනය පැත්තෙන් බැලුවොත්, විශාල මෙහෙවරක් කර තිබෙන බව පෙනෙනවා.

1994 සිට 2000 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ විදුලි පාරිභෝගික සංඛ්‍යාව දළ වශයෙන් දශ ලක්ෂය දක්වා අපි වර්ධනය කර තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ තමුන්නාන්සේලා අවුරුදු 17ක් තුළ එකොළොස් ලක්ෂයක පාරිභෝගික සංඛ්‍යාවකට විදුලිය ලබා දී තිබෙනවා. ඒ ගැන අපි ස්තුතිවන්ත වනවා. අපිත් මේ සුළු කාලය තුළ දශ ලක්ෂයක පමණ සංඛ්‍යාවකට විදුලිබලය ලබා දී තිබෙනවා. ඒ වගේම මුළු නිවාස සංඛ්‍යාවෙන් සියයට 32කට පමණයි පසුගිය කාලයේ විදුලිබලය තිබුණේ. අපි ඒක සියයට 60 දක්වා වර්ධනය කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වාගේම, අපේ ගරු අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ආසියානු සංවර්ධන බැංකු අරමුදල්වලින් පමණක් රුපියල් මිලියන 525ක් වෙන් කර විශාල ප්‍රදේශයක් ආවරණය වන පරිදි එම කටයුතු සාර්ථකව ඉටු කර තිබෙනවා. තුන්වැනි අදියර සඳහාත් රුපියල් මිලියන 3200ක් වෙන් කර ගත්තා. ඒ වාගේම 1999 පළාත් සභා විශේෂ ව්‍යාපෘති 515කට රුපියල් මිලියන 515ක් යොදවා තිබෙනවා. පාරිභෝගිකයන් 37,000කට එයින් ප්‍රතිලාභ ලැබී තිබෙනවා. මම ඒවා විස්තරාත්මකව දිගටම කියන්න යන්නේ නැහැ. මිලියන 8605ක් ඒ ව්‍යාපෘති වෙනුවෙන් යොදවා විදුලිබලය උත්පාදනය කර නිවාස සංඛ්‍යාවකට – කුටුම්බ සංඛ්‍යාවකට – අපි ඒ ප්‍රතිලාභ ලබා දී තිබෙනවා. ඒ නිසා විශාල ප්‍රගතියක් ලබා තිබෙනවා. විශේෂයෙන්ම ගැමි විදුලිබල ව්‍යාපෘති යටතේ අපි විශාල සංවර්ධනයක් කර තිබෙනවා. ඒ ප්‍රදේශ අද දියුණු වී තිබෙනවා. ගරු අමාත්‍යතුමා අද මට සිතියමක් පෙන්වූවා. කොච්චර පරාසයකට අපි අලුතෙන් විදුලි බලය ලබා දී තිබෙනවාද කියන එක ඒකෙන් පෙනෙනවා. ඉස්සරට වැඩිය සියයට 32කින් ඉන්ධන පරිභෝජනය වැඩි වී තිබෙන බව අප දන්නවා. අද වාහන විශාල සංඛ්‍යාවක් පාරේ දුවනවා. ඒවා සංරක්ෂණය කරන්න ඕනෑ කියා ජනතා විමුක්ති පෙරමුණ – 'ජේවීපී' එක – කිව්වා. එතුමන්ලාගේ පස් අවුරුදු සැලැස්ම තිබෙනවා. ඒකේ ප්‍රධාන ගැටලුව වශයෙන් හඳුනාගෙන තිබෙන්නේ distribution පැත්තයි; ශක්තිය නැති කරන පැත්තයි. නමුත් නිෂ්පාදනය ගැන යමක් කියා නැහැ. ප්‍රධාන ගැටලුව වශයෙන් ඒක තමයි හඳුනාගෙන තිබෙන්නේ. පස් අවුරුදු සැලැස්ම පොත මම අද කියෙව්වා. මේ සම්බන්ධයෙන් ඒ අය දක්වන උනන්දුව, ඒ තුළ ගැබ් වී තිබෙන සැලැස්ම මොකක්ද කියා. මම බැලුවා, නමුත් ඒ පස් අවුරුදු සැලැස්මේ එහෙම දෙයක් පෙනෙන්න නැහැ. ඒ අය සම්පූර්ණයෙන් කියා තිබෙන්නේ රාජ්‍ය අංශය විසින් මෙය කරන්නට ඕනෑ කියායි. එතැනදී පටලවාගෙන තිබෙනවා. මොකද? අද අපට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ගෝලීයකරණය තුළ විවාහ වෙන්න සිදු වී තිබෙනවා.'ඒ තුළ ඉඳගෙන තමයි සංකල්ප, ආකල්ප අනික් පැත්තෙන් ක්‍රමවේද සහ මූලෝපායන් සකස් කරන්නට වෙලා තිබෙන්නේ. ඒ එක පැත්තක්.

අප මේවාගේ විශාල සංවර්ධනයක් කරද්දී අනික් පැත්තෙන් අපට විශාල පාඩුවක් වෙලා තිබෙනවා. 1998දී බොර තෙල් – crude oil – බැරල් එකක මිල ඩොලර් 13.50යි. 1999දී බොරතෙල් බැරල් එකක මිල ඩොලර් 19.44යි. 2000 වර්ෂයේදී බොරතෙල් බැරල් එකක මිල ඩොලර් 28.30ක් වී තිබෙනවා. ලෝකයේ තෙල් වෙළෙඳ පොළේ, තෙල් මිල දවසින් දවස වැඩි වෙනවා. ඔබතුමා විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ අරාබි රටවල් ගැන ඊයේ හොඳ කථාවක් කළා. ඔබතුමා අරාබියට බොහොම හිතවත් කෙනෙක්. ඔයගොල්ලන්ගේ උදවිය තමයි රටවල් 21ක් එකතු වී ඔපෙක් සංවිධානය මගින් නිෂ්පාදනය අඩු කර මිල වැඩි කරන්නේ. ගිය මාර්තු මාසයේ රැස් වී තව බිලියනයකින් තෙල් නිෂ්පාදනය අඩු කරන්න තීරණය කර තිබෙනවා. නිෂ්පාදනය අඩු කරද්දී මිල ඉහළ යනවා. නිෂ්පාදනය අඩු වෙන විට ලෝක වෙළෙඳ පොළේ තරගකාරී ඉල්ලුමක් එනවා. එහෙම ඉල්ලුම ඇති වුණාම විශාල මුදල් ප්‍රමාණයක් ඒ පැත්තට යනවා. නමුත් ඒකෙන් ඒ අය කරන්නේ මොකක්ද? එයින් ලැබෙන අතිරික්ත මුදල තෙල් ගවේෂණයට යොදවනවා. ඒ දවස්වල ඇමෙරිකාව තමයි මේකට මැදිහත් වුණේ. ඇමෙරිකාව ඒ අයගේ තිබුණු stocks ටික එළියට දමා සමතුලිත භාවයට ගෙනාවා. නමුත් අද ඒක කරන්නේ නැහැ. ඒ සල්ලි ටික වක්‍රව ඇමෙරිකාවට යනවා. ඒ අය ගවේෂණය කරද්දී ඇමෙරිකන් කොම්පැණිය විසිනුත් ගවේෂණය කරනවා. ඒ පැත්තට තල්ලු වන විට ගහලා බැන්දත් එකයි බැඳලා ගැහුවත් එකයි කියන එක එයින්ම සනාථ වන බව ප්‍රකාශ කරනවා. ඒ එක පැත්තක්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

OPEC සංවිධානයෙන් එය පාලනය වෙනවා. Cartel යයි හැඳින්වෙන සංවිධානයක්.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

ඔපෙක්. මම කියන්න යන්නෙත් ඒකයි. නමුත් අප කොපමණ කථා කළත් ජල විදුලි බලය ගන්න පුළුවන් ප්‍රමාණය අවම වී තිබෙන බව දන්නවා. දවසින් දවස ලබා ගන්න පුළුවන් ප්‍රමාණය අඩු වෙනවා. ලංකාව තිබෙන තාක් කල් කොපමණ උත්සාහ කළත් තව මෙගවොට් 500කට 600කට වැඩි ධාරිතාවක් ගන්න බැහැ. ගරු අමාත්‍යතුමා මෙගවොට් 300ක් ධාරිතාවක් ගන්න පුළුවන් කියනවා. හොඳයි, මෙගවොට් 500ක ධාරිතාවක් ගන්න පුළුවන් කියා අප උපකල්පනය කරමු. මේ මෙගවොට් 500 ධාරිතාව ගත්තත්, ඉල්ලුමට සරිලන සැපයුම දෙන්න විධියක් නැතිව යනවා. හැම අවුරුදු 7කට වරක් ඉල්ලුම දෙගුණයක් වෙනවා. එතකොට ඉල්ලුමට සරිලන ලෙස සපයන්නේ කොහොමද? අප ලයිට් දෙනවාද, නොදෙනවාද, මේ ප්‍රමාණයෙන් නතර වෙනවාද එහෙම නැත්නම් තව ඉදිරියට යනවාද කියන එකට විසඳුමක් දෙන්න ඕනෑ. එයට විසඳුමක් වශයෙන් තෙල්වලින් විදුලිය නිෂ්පාදනය කරන විට මිල වැඩි වෙනවා. විශේෂයෙන්ම ඔටෝ ඩීසල්වලින් තමයි පසුගිය කාලයේ emergency crisis වැය ශීර්ෂයෙන් වෙන් කළ මුදල්වලින් ගත්ත යන්ත්‍රෝපකරණ දිවෙව්වේ. නමුත් දැන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඩීසල් මිල වැඩි වන නිසා අපට ඒවා ඔරොත්තු නොදෙන තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ නිසා අපට කරන්න තිබෙන මූලිකම දේ තමයි ඒ සඳහා විකල්ප බල ශක්තියකට පරිවර්තනය වීම. තෙල්වලට ආසන්න බල ශක්තියකට පරිවර්තනය වෙන්න ඕනෑ. මේ ආසන්න බලශක්තිය මොකක්ද? ගල් අඟුරු. මේ ආසන්න බල ශක්තිය අප කවුරුත් පිළිගන්නවා. ජී දයාරත්න හිටපු ඇමතිතුමා ඒක පිළිගත්තා.

අපේ ලකී ජයවර්ධන මැතිතුමාට මම බොහොම ස්තුතිවන්ත වෙනවා. එතුමා ගල් අඟුරු විදුලි බලාගාර ඇති කරන්න කිව්වා. ඒක මම පිළිගන්නවා. එහෙම නම් ලෝක වෙළෙඳ පොළේ ගල් අඟුරු හැසිරෙන විධිය බලමු. ගල් අඟුරුවලින් electricity නිපදවීම ගැන මා ළඟ පොඩි ලියවිල්ලක් තිබෙනවා. පෝලන්තයේ විතරක් ගල් අඟුරුවලින් සියයට 96ක් විදුලි බලය නිෂ්පාදනය කරනවා. පෝලන්තය තමයි පාප් වහන්සේ ඉපදුණ රට, එතුමා කතෝලික ආගමේ නායකයා. මමත් කතෝලිකයෙක්. පෝලන්තය ගල් අඟුරුවලින් සියයට 96ක් විදුලි බලය නිෂ්පාදනය කරනවා. දකුණු අප්‍රිකාව ගල් අඟුරුවලින් සියයට 90ක් විදුලි බලය නිෂ්පාදනය කරනවා. ඕස්ට්‍රේලියාවේ ගල් අඟුරුවලින් සියයට 84ක් විදුලි බලය නිෂ්පාදන කරනවා. චීනය - චීනය ලෝකයේ බලවතා වෙන්න යන රට. - ගල් අඟුරුවලින් සියයට 80ක් විදුලි බලය නිෂ්පාදනය කරනවා. ඒ වාගේම චෙකොස්ලොවැකියාව ගල් අඟුරුවලින් සියයට 71ක් විදුලි බලය නිෂ්පාදනය කරනවා. ග්‍රීසිය ගල් අඟුරුවලින් සියයට 70ක් විදුලි බලය නිෂ්පාදනය කරනවා. අපේ අල්ලපු රට වන ඉන්දියාව ගල් අඟුරුවලින් සියයට 68ක් විදුලි බලය නිෂ්පාදනය කරනවා. ඇමෙරිකාව අඟුරුවලින් සියයට 56ක් විදුලි බලය නිෂ්පාදනය කරනවා. ඩෙන්මාර්කයේ සියයට 52යි. ජර්මනියේ සියයට 51යි. එංගලන්තයේ සියයට 40යි. යුරෝපා සංගමයේ රටවල් පහක් සමස්තයක් වශයෙන් ගත්තාම සියයට 15ක් ගල් අඟුරු භාවිතා කරනවා. දැන් අපි මේ තත්ත්වයට නොගියොත් අපේ රට අඳුරට පත් වෙන්න වෙනවා, අනාගතයේදී.

අපි හැමදම බලයේ ඉන්නේ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. හොඳයි, තව අවුරුදු 15කින් 20කින් මේ රටේ බලය එක්සත් ජාතික පක්ෂයට ගියාය කියමුකෝ. තව අවුරුදු 15කින් තමුන්නාන්සේලා බලය ගත්තාය කියමුකෝ. ඔබතුමන්ලා අවුරුදු 17ක් කළා. අපිත් බලාපොරොත්තු වෙනවා, අවුරුදු 21ක් විතර මේ රට පාලනය කරන්න. කෙසේ වෙතත් තබව අවුරුදු 15කින් ඔබතුමන්ලා බලය ගත්තත්, ඔබතුමන්ලාටත් මේ ප්‍රශ්නය උද්ගත වෙනවා. [බාධා කිරීමක්] ඒක තමයි, අපි මේ කියන්න යන්නේ. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා, තමුන්නාන්සේලාටත් එක්ක - තව අවුරුදු 15කින් විතර බලයට එන තමුන්නාන්සේලාටත් එක්ක - හොඳ විදුලිබල පද්ධතියක් ස්ථාපිත කර තබන්න. එම නිසා, පක්ෂ බේදය ගැන බලන්න එපා. දේශපාලන වාසි බලන්න එපා. වෙන කිසිම දෙයක් ගැන බලන්න එපා. යථාර්ථය ගැන කල්පනා කරලා ඒක කරන්න අපි සියලු දෙනාම එකඟ වෙමුය කියා මම ඉල්ලා සිටිනවා. මෙම සභාවේ ඉන්න පුත්තලම් දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් මේ සඳහා ප්‍රතිපත්තියක් වශයෙන් එකඟ වී තිබෙනවා. ඒ මොකද අපි අර්බුදයේ පතුලටම ගිහිල්ලා තමයි, මේක ගැන බලන්න ඕනෑ.

අපිට මිනිස්සු කිව්වා, මේක කරන්න එපාය කියලා. නමුත් එක් කියමනක් තිබෙනවා, චීනයේ. කෙනෙකුට ගමනක් යන්න කියනවා. තමන්ට පේනවා, ඒ ගමන යන්න බැහැයි කියලා. නමුත් 'කමක් නැහැ'යි කියලා බහුතරය සතුටු කරන්න ඒ ගමනේ යන්න පුළුවන් සීමාව දක්වා යන්න ඕනෑ. ඒ සීමාවෙන් එහා පැත්තේ ඇලක් තියෙනවා නම්, ගහක් තියෙනවා නම්, [illegible] එහාට පනින්න බැහැ. ඒ ඇල ළඟට ගිහිල්ලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

තමයි කියන්නේ, ඕක නේ මම වේලාසන් කිව්වේ යන්න බැහැයි කියලා. නොගියා නම් මා ද්‍රෝහියකු ලෙස සලකනවා, ඒකයි මම ගියේ කියලා. එතනට ගිහිල්ලාවත් අපි ප්‍රශ්නය තේරුම් ගනිමු. එතනට ගිහින් ප්‍රශ්නය තේරුම් අරගෙන යථාර්ථයට මුහුණ දෙන්න බලමු. ඒකයි මම කියන්න යන්නේ. අපි මේ ප්‍රශ්නය ගැනත් ඒ විධියට හිතමු. මේ ජනතා විරෝධයට ජනාධිපතිනිය සවන් දුන්නා. ගරු ඇමතිතුමාත් ඒ ගැන කල්පනා කළා. අපිත් කල්පනා කළා. අපි කැමති නැහැ, පල්ලිය කඩන්න. අපි කැමති නැහැ, කතෝලික ආගම විනාශ වෙනවාට එහෙම වෙනවා නම් මොහොතකටවත් අපි කවුරුත් කැමති නැහැ, මේක කරන්න. එකම ශුද්ධ ස්ථානයයි අපට තිබෙන්නේ. විද්‍යාත්මක පදනමක් මත ඒක අසත්‍යයි කියන්න, ඒක නැහැයි කියන්න බැරි නම්, කථාවට එහෙම නැත්නම් වෙනත් දේවල්වලට අපිට රැවටෙන්න බැහැ. උත්තර දෙන්න ඕනෑ. ඒ මොකද, 21 වන සියවසට අපි පා තබනවා. 21 වෙනි සියවසේදී අපට 'නැහැ', 'බැහැ' කියලා කියන්න බැහැ. 'බැහැ'යි කිව්වත්, ඒකට උත්තරයක් තියන්න ඕනෑ. ඒ උත්තරයට විද්‍යාත්මක පදනමක් තියෙන්න ඕනෑ. එහෙම පදනමක් නැතිව අපට පිළිගන්න බැහැ.

එම නිසා කතෝලිකයකු හැටියට මම කියන්න බලාපොරොත්තු වෙනවා, අපට අයිතියක් තිබෙනවා කියන්න, ඉල්ලීමක් කරන්න බලාපොරොත්තු වෙනවා, අතිගරු ජනාධිපතිතුමියගෙනුත්, අගමැතිතුමාගෙනුත් මේක ක්‍රියාත්මක කරන හැටියට. ඒ කාරණය මම අද මෙම ගරු සභාවේදී තමුන්නාන්සේලාට කියනවා. ඒ එක පැත්තක්. මා හිතන හැටියට අනිකුත් බොහෝ කාරණාවලට ඇමතිතුමා උත්තර දෙයි.

තෙල් මිල වැඩි වෙනවා. ඒක නවත්වන්න බැහැ. තමුන්නාන්සේලාගේ කාලයේදී ඉන්ධන මිල වැඩි වීමේ ප්‍රතිශතය බැලුවොත්, 1970දී පෙට්‍රල් ලීටරයක මිල ශත 84යි. ඒක 1978දී රු. 2.93ක් වුණා. 1997දී රු. 35ක් වුණා. අද මිල රු. 50යි. ඒ වගේමයි භූමිතෙල් මිලත්. මුලින්ම ශත 18යි. ඊටපසු ශත 77ක් වුණා. රු. 11.80ක් වුණා. අද මිල රු. 18.40යි. 1970 -1977 දක්වා අපේ කාලයේදී ඉන්ධන මිල සියයට 327කින් වැඩි වී තිබුණා. 1977 සිට 1994 දක්වා තමුන්නාන්සේලාගේ කාලයේ ඉන්ධන මිල වැඩි වීමේ ප්‍රතිශතය සියයට 1432යි. ඒකට එක්සත් ජාතික පක්ෂයට දෙස් කියන්න බැහැ නේ. ඒ අවුරුදු 17 ඇතුළත ඉන්ධන මිල සියයට 1432කින් වැඩි වෙලා. ඒකට රනිල් වික්‍රමසිංහ මහත්මයා මොකද කරන්නේ? ප්‍රේමදාස මහත්මයා මොකද කරන්නේ?

ර. මූ. රත්නායක මහතා
*(திரு. ஆர். எம். ரத்நாயக்க)*
(Mr. R. M. Ratnayake)

පාරිභෝගිකයන්ට ඒ කාලයේදී මිලදී ගැනීමේ හැකියාව තිබුණා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

ඒ කාලයේදී යුද්ධයක් තිබුණේ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා තමුන්නාන්සේලාට අපි භාර දුන්නේ දෙවුන්දරතුඩුවේ ඉඳන් පේදුරුතුඩුව දක්වා යන්න පුළුවන් රටක්. ඒ කාලයේදී මේ ගැටලු තිබුණේ නැහැ. හොඳයි අද මේ ප්‍රශ්නය කොහොමද නොරොච්චෝලෙට ආවේ? ත්‍රිකුණාමලයේ හදන්න බැහැ. හදන්න ජපානය උදවු කරන්නේ නැහැ. ඒ මොකද? ආයෝජකයා කල්පනා කරන්නේ තම ආයෝජනය සුරක්ෂිත තැනක ආයෝජනය කරන්නයි. අද එහෙම තත්ත්වයක් එහේ නැහැ. එහෙම තත්ත්වයක් තිබුණා නම්, ඒ ප්‍රශ්නය ඒ කාලයේදීම විසඳෙනවා. රටේ මේ කෙලවරේ ඉඳන් ඒ කෙලවරට යන්න පුළුවන් නිර්මල රටකුයි අපි තමුන්නාන්සේලාට භාර දුන්නේ. අපේ අවසානාවට හෝ තමුන්නාන්සේලාගේ අවසානාවට හෝ රටේ අවසානාවකට හෝ අද අපි මේ වගේ තත්ත්වයකට මුහුණ දී සිටිනවා. ඉතින් අපි මේ මුහුණ දී තිබෙන මේ ප්‍රශ්නයෙන් බේරෙන්න අපි පක්ෂ භේදයෙන් තොරව එකතු වෙමු. අප ඔබතුමන්ලාගේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔස්ලෝ නුවරට ගිහින් අපේ සාම සාකච්ඡාවට අද එතුමාගේ සහයෝගය ලබා දී තිබෙනවා. අපි කැමැති නැහැ එතුමාට බණින්න. මඩ පෝස්ටර්ස් ගහන්න කැමැති නැහැ. [බාධා කිරීමක්] කැමැති නැහැ කියන කට්ටියකුත් සිටිනවා නේ. ප්‍රශ්න විසඳන්න ඕනෑ. තමුන්නාන්සේලත් අපේ නොරොච්චෝලෙට සපෝට් එකක් දෙනවා නේ. [බාධා කිරීමක්]

දෙනවාය කියා කියනවා නේ. [බාධා කිරීමක්] ඔය කියන්නේ, කටින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකක් නොවෙයි හතරක් ගනිමු. ඒ හතර කළාට පසුව තමයි, මේ රටට විදුලි බලය ලබා දෙන්න පුළුවන්. ඒ විධියට විදුලි බලය ලබා දුන්නොත් මේ රට සංවර්ධනය වෙනවා. මොකද ? ඒක තමයි, රටක් සංවර්ධනය කරන්න මූලිකම මෙවලම.

අපි උදාහරණයක් ගනිමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලි බලය ගැන ලෙනින් මොකක්ද කිව්වේ? සමාජවාදය කියන්නේ විදුලි බලය කියලයි එතුමා කිව්වේ. ඒ කාලයේදී එහෙමයි ඒක විග්‍රහ කළේ.

අද මැද පෙරදිග රැකියා සඳහා කාන්තාවන් විශාල සංඛ්‍යාවක් යන බව තමුන්නාන්සේ දන්නවා. ඒ කට්ටිය ගිහින් මොනවාද ගෙනෙන්නේ. ෆ්‍රිජ් එකක් ගෙනෙනවා. කුකර් එකක් ගෙනෙනවා. වොෂින් මැෂින් එකක් ගෙනෙනවා. ඒ ඔක්කෝම ගමේ අය. [බාධා කිරීමක්]

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anuruddha Ratwatte)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා හොඳට කාන්තාවන් ගැන දන්නවා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳට කාන්තාවන් ගැන දන්නවාය කියා අපේ ගරු ඇමතිතුමා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ බඩු අරගෙන අර කාන්තාවන් ග්‍රාමීය ප්‍රදේශවලට යනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඒ ගැන දන ගැනීමේ අයිතිවාසිකමකුත් මට තිබෙනවා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

ඔව්. මම දන්නවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

මොකද? හතර දෙනෙක් පුළුවන් නේ?

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

අප ප්‍රාර්ථනා කරනවා හතේ සීමාව දක්වා යන්න පුළුවන් කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාන්තාවන් කවුද ? ඒ තමුන්නාන්සේලාගේ ප්‍රදේශවලට, ඈත ප්‍රදේශවලට යන ජනතාව. ඒ අයට තමන්ගේ යන්ත්‍ර උපකරණ පාවිච්චි කරන්න අපි අවස්ථාවක් දෙන්න ඕනෑ. මෙගා වොට්ස් 1,667ක් තබා ගෙන මේ රටේ මේ ගමන යන්න බැහැ. තවමත් සියයට 42කට විදුලිය ලබා දෙන්න බැරි වී තිබෙනවා ගරු ඇමතිතුමා. ඒ නිසා අපි එයට මොකක් හෝ විකල්ප වැඩ පිළිවෙළකින් විසඳුමක් ලබා දෙන්න ඕනෑ. අන්න ඒ සඳහා තමුන්නාන්සේලා දෙන සහයෝගය අනුව ඒ අදහස් රැස් කර ගෙන එක මතයකට එන්නය කියා මම යෝජනා කරනවා. ඉතින් අපි ඒකට තමුන්නාන්සේලාගෙන් විශාල සහයෝගයක් ඉල්ලා සිටිනවා.

අනෙක් පැත්තෙන් තමුන්නාන්සේලා කළ විවේචන ගැන මම පොඩ්ඩක් කතා කරන්න ඕනෑ. ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා කිව්වා, සේවකයන්ගේ අතිරික්තයක් ගැන. 1994දී පෙට්‍රෝලියම් කෝපරේෂන් එකේ සේවකයන් 4,500ක් හිටියා. අපේ කාලයේ ඒ සංඛ්‍යාව තව 1,500කින් වැඩි වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැන් ඒ සංඛ්‍යාව 7,000ක් පමණ වී තිබෙනවා. නමුත් අපේ පෙට්‍රෝලියම් කෝපරේෂන් එකේ Cadre එක exceed වෙලා නැහැ. [බාධා කිරීමක්] 1994දී තමුන්නාන්සේලාගේ කාලයේ එක සේවකයකු හැසිර වූ බැරල් ගණන 309යි. සේවකයන් වැඩිපුර ඕනෑ කරන්නේ ඇයි ? බිස්නස් එක වැඩි වන්න, වැඩි වන්න – ප්‍රසාරණය වන්න වන්න – වැඩි සංඛ්‍යාවක් අවශ්‍ය වෙනවා. විදුලි බලය තව ටිකක් දෙන්න දෙන්න, සියයට 42 සියයට 90 දක්වා වැඩි වන විට මේ සිටින සේවකයන්ගෙන් ඒ කටයුත්ත කරන්න බැහැ. මේ තිබෙන වාහනවලින් ඒක කරන්න බැහැ. තව සේවක සංඛ්‍යාවක් අවශ්‍යයි. ඒක තමයි, වෙළඳමක ප්‍රතිපත්තිය වී තිබෙන්නේ. ඒ අනුව බලද්දී අපි සේවක සංඛ්‍යාව වුවමනාවට වඩා වැඩි කර ගෙන නැහැ. හසුරුවන්න තිබුණු 309යේ බැරල් සංඛ්‍යාව මේ කාලය වෙද්දී 322 දක්වා ඉහළ නැඟ තිබෙනවා. [බාධා කිරීමක්]

ර. මු. රත්නායක මහතා
(திரு. ஆர். எம். ரத்நாயக்க)
(Mr. R. M. Ratnayake)

කොන්ත්‍රාත්කාරයෝ. බදුල්ල ඩිපෝ එක ගත්තොත් –

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මම මේ කතා කළේ පෙට්‍රෝලියම් කෝපරේෂන් එක ගැනයි. තමුන්නාන්සේලා කළ පලදායි විවේචන අපි ඉවසනවා. තමුන්නාන්සේලා කියන ඒවා ගැන අපි හොඳට සොයා බලනවා.

දැන් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමකු කිව්වා transmission loss එකක් ගැන. ඒ transmission loss එක ගැනත් මට යමක් කියන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම ඒ කියන තරම් loss එකක් අපේ නැහැ. generation loss එක තිබෙන්නේ සියයට 1යි. ඊළඟට transmission loss එක තිබෙන්නේ සියයට 4යි. Distribution loss එකක් තිබෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. ඒ කෙළවර සිට මේ කෙළවර දක්වා විදුලි බලය අරගෙන ආවාම ඒ ප්‍රමාණය පොඩ්ඩක් එහෙම වෙනවා. නමුත් ඉන්දියාව සමඟ සංසන්දනය කර බලද්දී අපි අඩුයි. අපි මේක තව ටිකක් උඩට ගෙනෙන්න උත්සාහ කරනවා. හොඳටම තේරෙනවා, අපේ Distribution loss එක කොළඹ city එකේ තිබෙන්නේ සියයට 10ක් බව. ඒ වගේම 'ලෙකෝ' එකේ සියයට 8 දක්වා අඩු කර ගෙන තිබෙනවා. මොකද, ලෙකෝ එකට කෙළවරටම අපි ගෙනැත් දෙනවා. එතැනින් එහා පැත්තට තමයි, ඒ අයගේ ප්‍රශ්නය පටන් ගන්නේ. එම නිසා සමස්ත ගණනක් කියලා නාස්තියක් විධියට පෙන්වන්නට එපා. අපි මේ නාස්තිය අවම කර ගන්නට උත්සාහ කරනවා. තවත් පැත්තකින් බලන විට මේ නාස්තියට හේතුවක් තමයි, කොකු ගහලා විදුලිය ගැනීම.

අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා කථා කරමින් කිව්වා, මන්නාරමට ලයිට් දෙන්න කියා. ගරු ඇමතිතුමා මන්නාරමට ලයිට් දීලා තිබෙනවා. කෙළවරට වන තුරු දීලා තිබෙනවා. Uncleared areas වලට දීලා තිබෙනවා. නමුත් ට්‍රාන්ස්ෆෝමර්ස් පුච්චලා දලා, ලයින්ස්වලට කොකු ගහලා අරගෙන අපට රුපියල් මිලියන කෝටි ගනණක පාඩුවක් තිබෙනවා. දැන් අපි ලයිට් දීලා පාඩු විඳින එක ඇත්තයි. අනිත් පැත්තෙන් බලන විට ලයිට් නොදී ඉඳපුවාම අපට මොකද වෙන්නේ ? ගිය වතාවේ එනම් 1996 Power cut එකෙන් විතරක් රුපියල් මිලියන 1531ක් අපට පාඩු වුණා. නමුත් ඒකෙන් ඇති වන අහේතිය, ආනිශංසය මොකක්ද ? ඒකෙන් ඇති වුණු ආනිශංසය තමයි, අපේ රට අඳුරු රටක් විධියට පෙනීයාම. අපි ඉලෙක්ට්‍රිසිටි දුන්නේ නැත්නම් කිසිම ආයෝජකයකු එන්නේ නැහැ. කොහොම හරි, කීයට හරි අරගෙන දෙන්නට ඕනෑ. රටක් වශයෙන් බලද්දී ඒකේ කිසිම අගතියක් නැහැ කියන එක මම ප්‍රකාශ කරන්නට ඕනෑ.

එහෙම නැත්නම් මොකද වෙන්නේ ? ඉලෙක්ට්‍රිසිටි දෙන්න බැහැ කිව්වොත් මොන ආයෝජකයා ද එන්නේ ? කවුද කර්මාන්තයක් අරඹන්නට එන්නේ ? එම නිසා වැඩි ගණනට හරි අරගෙන දෙන්නට ඕනෑ. පසුව ටිකක් බැලන්ස් කරගෙන, හදගෙන පාඩු නොවෙන විධියට අරගෙන යන්නට ඕනෑය කියන එක මම ප්‍රකාශ කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] අපි ඒකට යෝජනාවක් කර තිබෙනවා. අපි අවංකව ඇත්ත කථා කරමුකෝ. ඉස්පිරිතාලවල ලයිට් බිල ගෙවා නැහැ කියා ලයිට් කපන්නද ? ඔපරේෂන්ස් කරන්නේ කොහොමද ? පුංචි ළමයි කී දෙනකු මැරෙයිද ? ප්‍රසූතියට එන කාන්තාවෝ කී දෙනකු මැරෙයිද ? පොඩ්ඩක් ඉන්න. මම තේරුම් කර දෙන්න. එම නිසා අපි ඒවාට පොඩි සහන කාලයක් දෙනවා. ඒවායේ එකවරම ලයිට් කපන්නට බැහැ. මොකද, රටක් වශයෙන් කල්පනා කරද්දී එක එක තීන්දු ගන්නට බැහැ. නමුත් අපි දැන් ඒකට ක්‍රමවේදයක් හදන්නට යනවා. අපි Card Meter එකක් introduce කරන්නට යනවා. ඒ කියන්නේ සල්ලි ගෙවලා ගන්න සෙල් කාඩ් එක වගේ. ඒක අපි යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන්නට යනවා.

ඒ වගේම අපි නැවත වරක් විකල්ප බලශක්තිය උත්පාදනය කරන්නට ලැහැස්ති වෙනවා. දහම් විමලසේන මහත්මයා කුණු ගැන කිව්වා. ඒ 'ප්‍රොජෙක්ට්' එක දැන් අපි විදුලිබල මණ්ඩලයට ඉදිරිපත් කරන්නට යනවා. [බාධා කිරීමක්] මෙහෙමයි. වෙනත් රටවල රුපියල් 500කට 1000කට කාඩ් එකක් ගන්නට පුළුවන්. ඒ කාඩ් එක දැමූවම මීටරයේ ඒ කාඩ් එක තිබෙනවා. එතකොට කාඩ් එක පිච්චුනාම ටික ටික blink වෙගෙන එනවා. [බාධා කිරීමක්] මීටර් එකේ පෙන්වන්නේ. එතකොට තමන්ට අවශ්‍ය පරිදි පිරිමහගන්නට තමන්ට පුළුවන්. අනිත් පැත්තෙන් බලන විට රාජ්‍ය ආයතනවල මේ ප්‍රශ්නය ඇති වී තිබෙන්නේ මොකද ? මම සොයා බැලූ විට මට පෙනී ගියේ විදුලිය නැතිව, එහෙම නැත්නම් ආලෝකය නැතිව වැඩ කරන්නට පුළුවන් විධියට කිසිම රාජ්‍ය ආයතනයක construction එක හරියට සිදු වී නැති බවයි. නැහැ. නිර්මාණය කර නැහැ. ආලෝකය ඇතුළට එන විධියට අනාගතයේදී බිල්ඩින්ස් හදන්නට අපට හිතන්නට වෙනවා. අපේ කාර්යාලය ඉදිරිපිට තිබෙන මහවැලි බිල්ඩින් එක හොඳට හදලා තිබෙනවා. ලයිට් ඕනෑ නැහැ. වාතාශ්‍රය හොඳට එනවා. ඒවා හොඳට සැලසුම් කර තිබෙනවා. කවුද, අර ජෙෆ්රි බාවා කියන එක්කෙනා. නමුත් සමහර ඒවා එහෙම නැහැ. දැන් මේ ආයතනය බලන්න. මේ ආයතනයේ ලයිට් එකක් නැතිව ඉන්නට පුළුවන්ද ? කෝ ජනෙල් ? කෝ දොරවල් ? මොකද වෙලා තිබෙන්නේ ?

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ உறுப்பினர் ஒருவர்)
(An hon. Member)

ඒත් සැලසුම් කළේ ජෙෆ්රි බාවා.

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ඒක හරි. වෙන්න පුළුවන්. ජෙෆ්රි බාවා හැදුවේ තමුන්නාන්සේලගේ වුවමනාව මත. මේක හැදුවේ තමුන්නාන්සේලා නේ. ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ නිවැරදිව මේවා හදගන්නට ඕනෑ. ඉදිරියේදී මේවා කල්පනා කරන්නට වෙනවා. [බාධා කිරීමක්] උපදෙස් දුන්නේ කවුද දන්නේ නැහැ. ඉස්සර මේවා 'කන්සිඩර්' කෙරුවේ නැහැ. අනාගතයේදී මේවා 'කන්සිඩර්' කරන්නට වෙනවා.

බිමල් රත්නායක මහතා
(திரு. பிமல் ரத்நாயக்க)
(Mr. Bimal Ratnayake)

බිල්ඩින් එකක ප්ලෑන් එක පාස් කරද්දී බලශක්ති සංරක්ෂණ සහතිකයක් අනිවාර්යයෙන්ම ලබාගත යුතුයි කියා රෙගුලාසියක් ගෙනෙන්නට පුළුවන් නේ. ගොඩාක් කල්පනා කර කර ඉන්නට ඕනෑ නැහැ. ලෝකයේ රටවල් බොහොමයක එහෙම තිබෙනවා.

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මන්ත්‍රීතුමාගේ අදහස් බොහෝම හොඳයි. ඔබතුමන්ලාගේ පසු අවුරුදු සැලැස්මේ දැම්මේ නැද්ද දන්නේ නැහැ.

බිමල් රත්නායක මහතා
(திரு. பிமல் ரத்நாயக்க)
(Mr. Bimal Ratnayake)

දලා තිබෙනවා. උත්තර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මේකේ උත්තර තිබෙනවා. නමුත් මේ උත්තරවල ප්‍රධාන ගැටලුව වශයෙන් තෝරාගෙන තිබෙන්නේ වැරදි එකක්. ඒකයි, මම කියන්න යන්නේ. කෙසේ වෙතත් අපි හොඳ සැලැස්මක් ඇතිව යනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා අපේ ඇමතිතුමාට ශක්තිය, ධෛර්ය තිබෙනවා. ඇමතිතුමා පූර්ණකාලීනව නිලධාරීන් එක්ක ඒ කටයුත්ත හොඳට කර ගෙන යනවා. වැරදි තැන් තිබෙනවා. නමුත් ඒ වැරදි තැන් හදා ගන්නත් එතුමාම කියා දැන් ඕඩිට් එකක් යොදවා තිබෙනවා. මේ ඕඩිට් වාර්තා ආවම මේවා නිවැරදි කර යථාතත්ත්වයට ගෙනෙන්න අවශ්‍ය කටයුතු හොඳින් සිදු කරගෙන යන්න අපට පුළුවන්. තමුන්නාන්සේලා කියන මේ අර්බුදය අප විසින් නිර්මාණය කළ එකක් නොවෙයි කියන එක ප්‍රකාශ කරන්නට ඕනෑ. ඊළඟට මම කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට කථා කිරීමට තව මිනිත්තුවයි ඉතිරි වී තිබෙන්නේ.

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

හොඳයි. මම හරියට වෙලාවට කථාව අවසන් කරන්නම්.

ඊළඟට මේ විදුලි මීටර් හිඟය ගැනත් පොඩ්ඩක් කියන්නට ඕනෑ. විදුලි මීටර් හිඟය ගැන චෝදනාවක් තිබුණා. ඇත්ත වශයෙන්ම විදුලි මීටර් නැතිකම පාරිභෝගිකයාට පාඩුවක් විධියට තමයි අපේ ගරු මන්ත්‍රීතුමා කථා කළේ. නමුත් විදුලි මීටර් නැතිකමේ පාඩුව විඳින්නේ අපියි. පාරිභෝගිකයා නොවෙයි. මොකද විදුලි මීටර් නැතිකම නිසා ලයිට් දනවා නොවෙයි ලයිට් නානවා. [බාධා කිරීමක්] ඉන්න මම කියන්නම්. එම නිසා එහි පාඩුව ලබන්නේ අපියි. එම පාඩුව අවම කර ගන්න අපි කටයුතු කරනවා. විදුලි මීටර් 3,25,000ක් හිඟව තිබුණා. දැන් අපේ අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන් විසින් එය ලක්ෂය දක්වා අඩු කරගෙන තිබෙනවා. තව මාස ගණනකින් සම්පූර්ණයෙන්ම එය නිවැරදි කරන්න පුළුවන් වෙයි කියා අපි උපකල්පනය කරනවා. මොකද එහි ටෙන්ඩරර පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ඒ ටෙන්ඩර් පිළිබඳව ප්‍රශ්නයේදී ඇති වුණු කරුණු කාරණා අනුව තමයි ඒ වාගේ දේවල් සිදුවුණේ. ඒවාත් බලන්න ඕනෑ. [බාධා කිරීමක්] ඉන්දියාවෙන් නොවෙයි,

සුරනිමල් රාජපක්ෂ මහතා
(திரு. சுரனிமல் ராஜபக்ஷ)
(Mr. Suranimal Rajapakse)

ඒ ගෙන්වන්න තිබුණු ඒවා කැන්සල් වුණා.

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

කැන්සල් වුණා. ඒ ඩිපොසිට් අපි තබාගෙන තිබෙනවා.

සුරනිමල් රාජපක්ෂ මහතා
(திரு. சுரனிமல் ராஜபக்ஷ)
(Mr. Suranimal Rajapakse)

ඒ කැන්සල් වීමෙන් පසු අලුතෙන් නැවත ගෙන්වන්න ඕනෑ. ඒ සඳහා තවත් කාල සීමාවක් යයි.

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

දනටමත් ඉන්දුනීසියානු සමාගමක් විසින් මීටර් 5,00,000ක් සැපයීම පිණිස භාර ගෙන තිබෙනවා. එයින් මීටර් 4,00,000ක් දනටමත් ලංකාවට ඇවිත් තිබෙනවා.

බිමල් රත්නායක මහතා
(திரு. பிமல் ரத்நாயக்க)
(Mr. Bimal Ratnayake)

එම මීටර් පත්ලක්ෂයම ගැලපෙන ඒවාද ?

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

මෙහෙමයි. අපි මේක නියාමක ව්‍යාපෘතියක් වශයෙන් කරගෙන යනවා. අපේ ප්‍රධාන කාර්යාලය පිහිටා තිබෙන්නේ කොහේද ? දන් තමුන්නාන්සේලාත් කිව්ව විධියට රාජ්‍ය අංශවලින් තිබෙන හිඟය පියවා ගන්න කරන උපකාරයක් වශයෙන්, එහෙම නැත්නම් ඒවාට ඇති කරන ක්‍රමයක් වශයෙන් මෙම අත්හද බැලීමේ නියාමක ව්‍යාපෘතියක් විධියට තමයි card system එක පටන් ගන්න කියා අපි යෝජනා කරන්නේ. විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ නියාමක ව්‍යාපෘතියක් විධියට pilot project එකක් විධියට තමයි අපි එය ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නේ කියා ප්‍රකාශ කරනවා. එකපාර සෑම තැනම කරන්න බැහැ. තමුන්නාන්සේලාගේ කාලයේ වාගේ එද දවසින් පොඩි විට් එකකින් මුළු රටම වහන්න අපට බැහැ. ඒක මතක තබා ගන්න. [බාධා කිරීමක්] එහෙම කරන්න බැහැනේ. අපට එහෙම බලයක් නැහැ. තමුන්නාන්සේලාට තිබුණු බලය අපට නැහැ. ඉතිං අපි කරන්න යන්නේ ඒකට වැඩියේ වෙනස් දෙයක්. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාට ඒ වාගේ සුවිශේෂ බලයක් ඒ කාලයේ තිබුණා. චුට් විට් එකක් දීලා මුළු රටම වහන්න බලයක් තිබුණා. හැබැයි ඒ කාලයේ නම් ලයිට් හොඳට ඉතිරි වුණා. මොකද සවස 6.00න් පසුව කඩ වහනවනේ. අදත් ඒක තමයි මේ සවස 6.00න් පසුව තේ එකක් බොන්නවත් කඩයක් ඇරලා නැත්තේ. තවම ඒ බය මිනිසුන්ට තිබෙනවා. ඔන්න ඕකතමයි ඇත්ත.

බිමල් රත්නායක මහතා
(திரு. பிமல் ரத்நாயக்க)
(Mr. Bimal Ratnayake)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, මිනිසුන්ට අර ටෙලිෆෝන් කෝල්ස් ගන්නවා වාගේ තමන්ම ලයිට් කපා ගන්නවා, තමන්ම ලයිට් ගන්නවා, ඒ මට්ටමද දන් ඔය card system එක ගෙනෙන්න යන්නේ ?

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

බොහොම හොඳයි. එතකොට අරපිරිමැස්මක් එනවනේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please ! ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට දුන්නු ටයිම් මීටරය දන් අවසන් වී ගෙන යනවා. ඒ නිසා බාධා කරන්න එපා.

ගරු පීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ඊළඟට මේ ගෑස් ගැනත් පොඩ්ඩක් කියන්නට ඕනෑ. ගෑස් ගැන තමුන්නාන්සේලා සෑමදම චෝදනා නගනවා. අපි එල්. පී. ගෑස් විශාල ප්‍රමාණයක් භාර දී තිබුණා ෂෙල් කොම්පැනියට. ඊළඟට දන් LAUGFS Gas කියලා කොම්පැනියක් ආවා. ඒ කොම්පැනියටත් ගෑස් භාර දෙන්න අපි agreement අත්සන් කරන්න කටයුතු කළා. නමුත් එතැනදී අත්සන් කරන්නට යෝජනා කළත්, පෙර කොන්දේසිවලට එකඟවෙලා ටිකක් එහාට මෙහාට අදින්නට වුණා. මොකද ඒ අයගේ වුවමනාව තිබෙන්නේ කාර්වලටත් ගෑස් ගහන්නයි. නමුත් අපේ න්‍යාය පත්‍රයේ ප්‍රමුඛත්වය තිබෙන්නේ පාරිභෝගිකයාට ගෑස් දීමයි. එම ප්‍රමුඛත්වය දීමේ ප්‍රශ්නය නිසා අපි මේක ඇදගෙන යනවා. වැරදි තැන් නැවත වරක් නිවැරදි කර සකස් කරගෙන යනවා. අපි වැරැද්ද වැරැද්ද විධියට තබාගෙන [බාධා කිරීමක්] ගෑස් කොම්පැනිය,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සුරනිමල් රාජපක්ෂ මහතා
*(திரு. சுரனிமல் ராஜபக்ஷ)*
(Mr. Suranimal Rajapakse)

මාබිම අලුතෙන් ගෑස් සමාගමක් ඇති කරගෙන යනවා. දැන් එහි වැඩ කටයුතු සියයට 60ක් පමණ අවසන් කර තිබෙනවා. එය තමුන්නාන්සේලාගේ හිතවත් කමට දුන් එකක් කියලා මතයක් පවතිනවා. එහි වැඩ කටයුතු දැන් නතර වීගෙන යන තත්ත්වයක් පවතිනවා. මෙහි සැබෑ තත්ත්වය මොකක්ද ?

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

දැන් තමුන්නාන්සේ මගෙන් ලයිට් ඉල්ලලා, තමුන්නාන්සේට ලයිට් දුන්නොත් තමුන්නාන්සේගේ විපක්ෂයේ අය කියයි මේක හිතවත්කමට දුන්නයි කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, දැන් තමුන්නාන්සේට කථා කිරීමට තිබෙන වෙලාව අවසානයි.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

මේ හිතවත්කම කියන එක කොයි ආකාරයට විග්‍රහ කරනවාද කියලා මම දන්නේ නැහැ. හිතවත්කම කියන එක කොයි ආකාරයෙන් විග්‍රහ කරනවාද කියලා ඒකට වචනයක් කියන්න මම නම් දන්නේ නැහැ. අනෙක් එක, විදුලිය කපන කථාන්තරය ගැන කට්ටිය බොහොම ලොකුවට කෑගැහුවා. 'ඔන්න දැන් විදුලිය කපනවා, කපනවා' කියා ලවුඩ්ස්පීකර් දගෙන ගිහින් විශාල වශයෙන් කෑගැහුවා. නමුත් එහෙම කපන්නේ නැහැ.

ඇත්ත වශයෙන්ම තවත් කාරණයක් පිළිබඳව මම කරුණු පැහැදිලි කරන්නම්. [බාධා කිරීමක්] ඉන්න. බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඒක කපන ක්‍රමයක් තිබෙනවා නේ ? [බාධා කිරීමක්] නැහැ, එක පාරට කපන්නේ නැහැ. ඉස්සෙල්ලා warning letter එකක් යවනවා. ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු, කාර්යාලයට ගිහින් තම කලාපය තුළ තිබෙන පාරිභෝගික ගිණුම් අතුරින් හිඟ මුදල් රුපියල් දහසකට වැඩි ; මාස තුනකට වඩා පැරණි ගිණුම් හිමියන්ට පමණක් දැන්වීමක් දී, විදුලිය විසන්ධි කරනවා. notice එකක් දීලා, කාලයක් දීලයි, එහෙම කරන්නේ. එහෙම තමයි, කරන්නේ. [බාධා කිරීමක්] නැහැ. ඒ බොරා කථා කියන්න එපා ; අසත්‍ය කථා කියන්න එපා, ගරු මන්ත්‍රීතුමා. ඒ වගකීම අපි භාර ගන්නවා.

අපි, ජීඑස්ටී අය කරනවායි කියලාත් මේ අය කිව්වා. නමුත් ලංකාවේ සියයට 90ක් විදුලි පාරිභෝගිකයන්ගෙන් ජීඑස්ටී අය කරන්නේ නැහැ. මොකද ? නියම කර තිබෙන units ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකුයි, ඒ අය පරිභෝජනය කරන්නේ. ඒ නිසා කවදාවත් ඒ අය ඒ category එකට වැටෙන්නේ නැහැ. Defence Levy එක නම් කොහොමවත් ගන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, පාර්ලිමේන්තුව කල් තබන සමහර අවස්ථාවලදී, මේ පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාව යටතේ මේ yarns ටික ගැන තමයි, අද මම වචනයක් දෙකක් කථා කරන්න ඕනෑය කියා හිතා ගෙන හිටියේ. ඇත්ත වශයෙන්ම කියනවා නම් එහෙම එකක් නැහැ. [බාධා කිරීමක්] ර. මූ. රත්නායක මන්ත්‍රීතුමනි, සියයට 90ක් කීවාට සියයට 10ක් කියා හිතා ගන්නකෝ! සංඛ්‍යා ලේඛන අනුව බලන විට [බාධා කිරීමක්] ඒක තමයි. විදුලිය පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ සංගමයක් පිහිටුවාගෙන තිබෙනවා.

සුරනිමල් රාජපක්ෂ මහතා
*(திரு. சுரனிமல் ராஜபக்ஷ)*
(Mr. Suranimal Rajapakse)

තමුන්නාන්සේ සංගණනය කළේ –

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

ගම්පහ දිස්ත්‍රික්කයේ [බාධා කිරීමක්] පංතියේ කොටසක් ඉන්නවා. ඉන්න මම කියන්නම්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

සවන් දෙන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මිනිත්තු තුනක් වැඩියෙන් කථා කර තිබෙනවා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

මම මූලාසනයට ගරු කරමින්, ඒ වගේම අපේ ගරු ඇමතිතුමාට –

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anuruddha Ratwatte)

මගේ කාලයෙන් විනාඩි දෙකක් එතුමාට ලබා දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

හොඳයි. ගරු ඇමතිතුමාගේ කාලයෙන් විනාඩි දෙකක් ගන්න.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

මට තව ටිකක් කරුණු කියන්න තිබෙනවා. ඔය මන්ත්‍රීවරුන් කියන ගෘහස්ථ පාරිභෝගිකයන්ගෙන් සියයට 79ක් පාවිච්චි කරන්නේ ඒකක 90ට අඩු ප්‍රමාණයක්. ඔබතුමන්ලා මේ කරුණු දැන ගත්තා එක හොඳයි. ජේවීපී එකට සම්මන්ත්‍රණවලට ගියාම මේවා කියන්න පුළුවන්. ඒ අයගෙන් ජීඑස්ටී අය කරන්නේ නැහැ. ඒකක 90ට වැඩියෙන් පාවිච්චි කරන පාරිභෝගිකයන් සඳහා පමණක් ඒ අයගේ විදුලි බිලට ජීඑස්ටී ඇතුළත් කරනවා. කිසිම පාරිභෝගිකයකුගේ විදුලි බිලකට ආරක්ෂක බද්ද ඇතුළත් කරන්නේ නැහැ.

විදුලිය විසන්ධි කිරීමේ වැඩ පිළිවෙළ දෙකක් තිබෙනවා. ඒ දෙකේදීම පාරිභෝගිකයාට ප්‍රමුඛතාවය දී තමයි, විදුලිය විසන්ධි කිරීමේ වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ. එහෙම තමයි, කටයුතු සකස් කර තිබෙන්නේ. ඉංජිනේරුවන් ගිහින් ඒ පිළිබඳව සොයා බලා තමයි, ඒ කටයුතු කරන්නේ. [බාධා කිරීමක්] යසේන්ද්‍ර බක්මීවැව ගරු මන්ත්‍රීතුමා, අපි ඒ පිළිබඳව සොයා බලන්නම්. කරුණු කී පමණින් උත්තර දෙන්න අපහසුයි. උත්තරයක් බලාපොරොත්තු වෙන්නත් එපා. මේවා බොහොම සියුම් සංකීර්ණ ප්‍රශ්න. ඒ ප්‍රශ්න පිළිබඳව සොයා බලා උත්තර දෙන්න අපි කැමැතියි. තව අවුරුදු 15ක් අපි ආණ්ඩු පක්ෂයේ ඉන්නවා. පොදුජන එක්සත් පෙරමුණ තව අවුරුදු 15ක් පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ඉන්නවා. ඒ කාලය තුළ තමුන්නාන්සේලාට පිළිතුරු දෙනවා.

අපේ ඇමතිතුමාටත්, විදුලි බල මණ්ඩලයේ නිලධාරි මහත්වරුන්ටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අලුත් සභාපතිතුමාට මම සුබ පතනවා. විදුලි බල මණ්ඩලයට අලුතින් සභාපති කෙනකු පත් කර තිබෙනවා. එතුමාගෙන් විශාල සේවයක් සිදු වේය කියා මම විශ්වාස කරනවා. මේක කනපිට හරවයි කියා ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා.

Petroleum Corporation එකේ සභාපතිතුමාත් බොහොම පළපුරුදු කෙනෙක් ; දක්ෂ නීතිඥයෙක්. එතුමා spot market එකෙන් තෙල් මිල දී ගන්නා හැටි බලන විට, කිසිම අගතියක් කර නැති බව පෙනෙනවා. එතුමාටත් මගේ ස්තුතිය පිරිනමන අතර, නිලධාරීන්ටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. සවන් දීම ගැන බොහොම ස්තුතියි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

ස්තුතියි. ඊළඟට මේ ගරු සභාව අමතා කථා කරන්නේ කෙහෙලිය රඹුක්වැල්ල ගරු මන්ත්‍රීතුමායි.

[අ. භා. 5.04]

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක පැත්තකින් රටේ ජන ජීවිතයට ඉතාමත්ම වැදගත්, අනික් පැත්තෙන් රටේ ආර්ථිකයට සෘජුවම බලපාන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කතා කරමින් යම් දායකත්වයක් ලබා දීමට අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා.

නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා අයවැය විවාදය ආරම්භයේදී, වරින් වර ප්‍රකාශ කළා : ඉතාමත්ම බැරෑරුම්, ඒ වාගේම කිසියම් අර්බුදකාරී තත්ත්වයක රට තිබෙන අවස්ථාවක මේ අර්බුදකාරී අවස්ථාවෙන් ගොඩ ඒමට ගන්නා ලද යම් යම් පියවර රාශියක් ඇතුළත් කර ගෙන එන ලද අයවැයක්ය කියා. එහිදී ආණ්ඩු පක්ෂයේ අමාත්‍යවරුන් සහ මන්ත්‍රීවරුන් කිහිප දෙනකුත් එයට එකඟත්වය පළ කරමිනුයි අදහස් ප්‍රකාශ කළේ. ඒ වාගේම අද මේ සාකච්ඡා කරන වැය ශීර්ෂයට අදාළව රටේ සාමාන්‍ය ජනතාව අතර තිබෙන මතය නම් ඛනිජ තෙල් සම්බන්ධව, විදුලිබලය සම්බන්ධව යම්කිසි අර්බුදයක් තිබෙනවාය කියායි. නමුත් අපේ නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා එතුමාගේ කථාවේදී කිව්වේ, අපට එහෙම කිසිම ප්‍රශ්නයක් නැහැයි කියායි. මා මේ කියන්නේ මේ රටේ ජීවත් වන සාමාන්‍ය ජනතාව අතර පවතින මතයයි. මොකද ? ඒ මතය ඇති වෙන්න යම් යම් හේතු ඇති වී තිබෙනවා.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

ඕනෑ තරම් විදුලිබලය දෙන්න පුළුවන්.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

රටේ පැවැත්ම සඳහා, ආර්ථිකය සහ ජන ජීවිතය සඳහා ඒක සම්බන්ධයි.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
*(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)*
(The Hon. Felix Perera)

විදුලිය දෙන්න පුළුවන් ඕනෑ තරම්. ඒකට තිබෙන මූලාශ්‍රය සම්බන්ධ ප්‍රශ්නයක් තමයි, තිබෙන්නේ.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

මම කිව්වේ, මෙය ජන ජීවිතයට සෘජුවම බලපාන ප්‍රශ්නයක් බවයි. විදුලි ගාස්තු වැඩි වුණාම එය ගෙවීමට නොහැකිවීම ජන ජීවිතයට බලපානවා. ආර්ථිකයට බලපානවා. ඒත් එක්කම 'එහෙම ප්‍රශ්නයක් නැහැ'යි කියා නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වත් මම මේ කියාගෙන ආවේ, රටේ පවතින මතය නම්, යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා කියායි.

ජී. දයාරත්න හිටපු අමාත්‍යතුමා එතුමාගේ කථාව ආරම්භයේදීම ප්‍රකාශ කළා, 'අයිටීඑන්' එකේ, – ස්වාධීන රූපවාහිනියේ – මේ රටේ ජනාධිපතිතුමිය ඇවිත් කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන්. විදුලිබලය ගැන කථා කරන විට එතුමිය පැහැදිලිවම ප්‍රකාශ කළා, මේ රටේ හොර ආයතන තුනක් තිබෙනවාය, ඒ හොර ආයතන තුනෙන් එකක් තමයි, විදුලිබල මණ්ඩලය කියා. දූෂණය, නාස්තිය සම්පූර්ණයෙන්ම පිරුණු, එවැනි ප්‍රශ්න ගණනාවකට මැදි වුණු ආයතනයක් හැටියටයි එතුමිය විදුලිබල මණ්ඩලය හැඳින්වූයේ. එහෙම කිව්වේ, මේ රටේ නායිකාවයි. ඒ වාගේම අමාත්‍යතුමා – ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා –

ගරු මර්වින් සිල්වා මහතා
*(மாண்புமிகு மேர்வின் சில்வா)*
(The Hon. Mervyn Silva)

කවදාවත් මේ රටේ නායිකාව කියලත් නැහැ ; අනුරුද්ධ රත්වත්තේ අමාත්‍යතුමා කියලත් නැහැ. ඔය විධියට ද්වේෂසහගතව කථා කරන්නේ ඇයි ? කෙහෙලිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ අතින් දා ඔහොම කියන්න එපා. තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂයේ වැදගත් මන්ත්‍රීතුමෙක්.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, මම කියනකම් පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු මර්වින් සිල්වා මහතා
*(மாண்புமிகு மேர்வின் சில்வா)*
(The Hon. Mervyn Silva)

නැහැ. වැදගත් මන්ත්‍රීතුමෙක් හැටියට මම 'ඩිස්ටර්බ්' කරන්නේ නැහැ.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

මේ ප්‍රශ්නය මම නොවෙයි ගෙනාවේ. ජී. දයාරත්න මන්ත්‍රීතුමා. ඒ කියපු වචනවලින්, ඒ කියපු දිනවලින් සම්පූර්ණයෙන්ම කිව්වා. ඒ අවස්ථාවේ ගරු අමාත්‍යතුමාත් සිටියා ; නියෝජ්‍ය අමාත්‍යතුමාත් සිටියා. ඒකට උත්තරයක් දුන්නේ නැහැ. ජනාධිපතිතුමිය කළ ප්‍රකාශය ඒ ආකාරයෙන්ම මීට පැය 2කට පමණ පෙර මේ සභාවේ කියවුණා. ඒක දැන් හැන්සාඩ්ගත වෙලයි තිබෙන්නේ. ඒ අවස්ථාවේ ඔබතුමා සිටියේ නැහැ. ඒකයි. [බාධා කිරීම්] එවැනි ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශයෙන් පස්සේ පුවතපත්වල යම් සංවාදයක් ඇති වුණා ; වාදයක විවාදයක ස්වරූපයක් ඇති වුණා. මම ඒවා පුවත්පත්වලින් දැක්කා. අවසානයේදී පොදුජන එක්සත් පෙරමුණු රජයේ විදුලිබල හා බලශක්ති ඇමතිවරයා හැටියට අනුරුද්ධ රත්වත්තේ ඇමතිතුමා ප්‍රකාශයක් කළා. හොරකමක් තිබෙනවා නම් සම්පූර්ණයෙන්ම හොයලා බලන්න 'ඔඩිටර් ජෙනරල්ට' භාර දෙනවා කියා ලොකු අභියෝගයක් කළා.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anuruddha Ratwatte)

ඔඩිටර් ජෙනරල්ට භාර දුන්නා.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

එහෙම භාර දුන්නාට පස්සේ ඔඩිටර් මෙහෙම කියා තිබෙනවා. "The Sunday Times" of 25th March, 2001, states, I quote :

"Auditor General's report on shocking losses of CEB"

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anuruddha Ratwatte)

ඔය කියවන වාර්තාව ඒ භාර දුන් විශේෂ වාර්තාව නොවෙයි. ඊට කලින් කළ එකක වාර්තාවක්. තවම අර පරීක්ෂණය ඉවර නැහැ ; කරගෙන යනවා.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

You are referring to the Audit of 2000 or 1999. I am referring to the Audit of 1996/1997. It says, I quote a few lines –

"Details of huge financial losses incurred by the Ceylon Electricity board (CEB) have been disclosed by the Auditor General in his report for 1997 released last week, showing that the Board had not followed financial procedures in many instances or had bungled on contracts."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙහෙම කියන්නේ ඔඩිටර් ජෙනරල් කරපු ඔඩිට් එකක් සම්බන්ධවයි. මේකයි, ඔඩිට් වාර්තාව : මේ වාර්තාවේ ප්‍රශ්න ගණනාවක් ගැන සඳහන් කර තිබෙනවා. ටෙන්ඩර්වලදී යම් යම් වැරදි ක්‍රියා කර තිබෙනවා. එක පැත්තකින් රටේ ජනාධිපතිනිය මේවා කියනවා. අනෙක් පැත්තෙන් ඔඩිට් එකෙන් මේවා සනාථ කරනවා. එවැනි යම්කිසි අර්බුදයක් තිබෙනවා නම් – අර්බුදයක් නැහැයි කියා නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා. නමුත් මම කියන්නේ ඒ වගේ මතයක් රටේ තිබෙනවාය කියලයි. – විදුලිබල මණ්ඩලය හොර ගුහාවක් කියා රටේ ජනාධිපතිතුමිය කියනවා. රටේ ඔඩිටර් ජෙනරල් කියනවා මේක සම්පූර්ණ වංචාසහගත ආයතනයක් කියලා. එහෙම නම් මේ රටේ ජනතාව –

ගරු මර්වින් සිල්වා මහතා
*(மாண்புமிகு மேர்வின் சில்வா)*
(The Hon. Mervyn Silva)

ජනාධිපතිතුමිය එහෙම කියලා නැහැ. ඔය මඩ ගහන්න කියන්නේ.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

ඒ නිසා මේවා ගැන සොයා බැලීමට දන් අවස්ථාව ඇවිත් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

ගරු මන්ත්‍රීවරුනි, කවුරුවත් කාටවත් මඩ ගහන්න එපා.

ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා
*(மாண்புமிகு ஜெயராஜ் பர்னாந்துபுள்ளே)*
(The Hon. Jeyaraj Fernandopulle)

කකුළුවා පැටවුන්ට කියනවා, ඇදේට යන්න එපා; කෙළින් යන්නය කියා.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අපි වාද විවාද කරන එක නොවෙයි වැදගත් වන්නේ. මෙවැනි ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා නම්, මෙවැනි ප්‍රශ්නයකට මැදිහත් වෙලා තිබෙනවා නම් මේ රටේ ජනතාවගේ නාමයෙන් එය නිවැරදි කිරීමේ වගකීම භාර ගන්නයි, පාලකයන් හැටියට පාලක පක්ෂයකට සිද්ධ වන්නේ. වංචනිකයන් ඉන්නවා නම්, හොරුන් ඉන්නවා නම්, මේ ආයතනයට විනා කරන අය ඉන්නවා නම්, ඒ අය ආරක්ෂා කරන්න උත්සාහ කරනවා නම් එයට දායකත්වය ලබා දෙන පුද්ගලයන් හැටියට තමනුත් පත් වෙනවා. එහෙම නම් අපට තිබෙන්නේ මේ සම්බන්ධව නිවැරදිව, කල්පනා කරලා, ස්වාධීනව මේ ගැන හොයලා බලලා, අඩුපාඩු තිබෙනවා නම් ඒවා හදලා මේ රටේ සිටින එක්කෝටි අසූහත්ලක්ෂයක ජනතාවට සාධාරණය ඉෂ්ට කළ යුතුයි කියන එකයි, මගේ අදහස.

ඒ එක්කම ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, සියයට 33 සිට 52 දක්වා මේ රටේ විදුලිය නිෂ්පාදනය වැඩි කර රට පුරා බෙදා හැර තිබෙන බවට, මේ මුළු විවාදය තුළම ඉතාමත්ම බැරෑරුම් ලෙස, බොහොම ගාම්භීර ලෙස ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කරුණු ඉදිරිපත් කළා.

ගරු මර්වින් සිල්වා මහතා
*(மாண்புமிகு மேர்வின் சில்வா)*
(The Hon. Mervyn Silva)

සියයට 65 දක්වා.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

65 කියනවා, 53 කියනවා, 55 කියනවා. විදුලිබල මණ්ඩලයේ වාර්තාව අනුව නම් සියයට 52.15යි. [බාධා කිරීමක්] එහෙම නම් 'ඉලෙක්ට්‍රිසිටි බෝඩ්' එක අනෙක් වැරදි කරනවා වගේම මේ වාර්තාවත් වැරදි වෙන්න ඕනෑ.

ඒ නිසා ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිතුමන්ලා බොහොම දෙනෙක් එතුමන්ලාගේ කථාවලදී ආණ්ඩුව defend කළා. එහෙම ආණ්ඩුව ආරක්ෂා කරන්න ඉදිරිපත් කළ එක තර්කයක් තමයි, 'මේ තිබෙන අර්බුදය කොහේද තිබෙන්නේ, මේ වගේ කඩා වැටීමක් රටේ ආර්ථිකයේ නැහැ, විශාල සංවර්ධනයක් ඇති කර තිබෙනවා, එයට උදාහරණයක් හැටියට සියයට 39ක්ව තිබුණු විදුලිය මේ අවුරුදු හය ඇතුළත සියයට 52 දක්වා අපි වැඩි කර තිබෙනවා' යන්න. මේක ලොකු තර්කයක් හැටියටයි ගෙනාවේ. මම කියන්න කැමැතියි, 1977 එක්සත් ජාතික පක්ෂය මේ රට බාර ගන්නා විට මේ රටේ විදුලිය දී තිබුණේ සියයට නවයකට බව. 1994 වන විට එය සියයට 39 දක්වා වැඩි වී තිබෙනවා. එහෙම නම් එද අපි විශාල දියුණුවක් ලබා තිබුණා. මම හිතනවා එය සියයට 450ක පමණ වර්ධනයක්ය කියා. ප්‍රතිශතයක් හැටියට ගත්තොත් තත්ත්වය ඒකයි. ඒ එක්කම අපි මතක තබා ගන්නට ඕනෑ, එක්සත් ජාතික පක්ෂය 1977දී මේ රට බාර ගන්නා විට මේ රටේ තිබුණේ මෙගවොට් 286යි. එහෙම නැතිනම් 300කට ආසන්න ප්‍රමාණයක්. 1994 අපි තමුන්නාන්සේලාට. මේ රට බාර දෙන විට hydro ක්‍රමය යටතේ මෙගවොට් 1850ක් පමණ ධාරිතාවක් මූලික පද්ධතියට ලබා දී තිබුණා. එහෙම නම් එද ඒ පද්ධතියෙන් ලබා ගන්නට පුළුවන් වුණේ සියයට 35ක පමණ ප්‍රමාණයක් නම්, එතැනින් පස්සේ අද වන විට මෙගවොට් 1,700කට ආසන්න ප්‍රමාණයක් මේ අවුරුදු හයට ලබා ගෙන තිබෙනවා. එහෙම නම් ඒ අවුරුදු හය තුළ නව සියයට 30ක් දීමට තර්කානුකූලව හැකියාවක් නැහැ. එහෙම නම් මුල් ආරම්භයේ දී විදුලිය ලබා ගන්නා විට, ඒ ලබාගත්තා වූ විශාල කර්මාන්ත ශාලා, විශාල පද්ධති එක ඒකකයක් හැටියටයි මේ ප්‍රතිශතය ලබා ගෙන තිබෙන්නේ. උදාහරණයක් හැටියට ගත්තොත්, කර්මාන්තයකට විදුලිය දුන්නාම ඒකේ 500ක් වැඩ කරනවා නම්, විශාල ආයෝජනයක් කරනවා නම් ඒක එක unit එකක් හැටියට එහෙම නැතිනම් එක ඒකකයක් හැටියටයි ගණන් ගැනෙන්නේ. ඒ මගින් ග්‍රාමීය වශයෙන් ගෙවල් 500කට විදුලිය දෙන්න පුළුවන්. ඒ ගෙවල් 500කට විදුලිය දෙනකොට ඒකක 500ක් හැටියටයි ගණන් ගැනෙන්නේ. ඒක එක කාරණයක්.

'ඒඩීබී' එකෙන් අදියර 1, 2, 3 යටතේ මුදල් ලබා දෙන බව ගරු අමාත්‍යතුමා දන්නවා ඇති, 3 වන අදියරේ දී Rural Electrification Project එකකට මුදල් ලබා ගත්තාය කියා නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ප්‍රකාශ වුණා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ඒ Rural Electrification Project එක එන විට – LT, HT high tension කියන ඒ මාර්ග ඔස්සේ සියලු නගරවලට මුලින් විදුලිය බෙදා හැරීමට අවශ්‍යතාව තිබුණා. ඊට පසුව Transformers මාර්ගයෙන් ග්‍රාමීය ප්‍රදේශවල විදුලිය බෙදා හරින්නට කටයුතු කළා. මම මේ උත්සාහ කරන්නේ තර්කයක් ඉදිරිපත් කරන්නට නොවෙයි. විදුලිය සැපයීමේ වර්ධනයක් තිබෙනවාය කියා මෙතැන ලොකු වෙනසක් පෙන්වීමට උත්සාහ කරනවා නම්, මම හිතන්නේ ඒක නොමග යැවීමක්. අනෙක් පැත්තෙන් යම්කිසි ආණ්ඩුවක් රටක් පාලනය කරනවා නම්, ජලය, විදුලිය, මහාමාර්ග වැනි දේවල යම්කිසි වර්ධනයක් ඒ ආණ්ඩුව මගින් ඇති කරන්නට ඕනෑ. ඊට පසුව බලයට පත් වන රජය එතැන ඉඳලා ඒ කටයුතු ආරම්භ කරලා ඉදිරියට යනවා මිස එතැනින් ආ පස්සට එන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ සියයට 39කට විදුලිය දීලා තිබුනාය කියා අපි හිතමු. අපි ඒක සියයට 25කට බැස්සුවාය කියලා, අද පාලනය කරන අයට ඇවිත් කියන්න සිද්ද වෙනවා නම්, ඒක ඉදිරියට යන රටක ඉදිරියට ගෙන යන්නට උත්සාහ කරන රටක ප්‍රතිපත්තියක් වෙන්නට බැහැ. රජයක් හැටියට තමන් බලය ලබා ගත්තාම තමන්ගේ වැඩ පිළිවෙළක් ඉදිරියට ගෙන යනවා. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. අපි පසුගිය කාල පරිච්ඡේදය තුළම මේ ගරු සභාවටත්, මේ ගරු සභාවෙන් පිටතදීත් කරුණු ඉදිරිපත් කළේ මේ රටේ නාස්තිය වළක්වා ගන්නට කටයුතු කරන්නය කියලයි. අපි අනන්ත අප්‍රමාණ උදාහරණ ගෙනැල්ල පෙන්නුවා.

අද විදුලිබල මණ්ඩලය ගැන කථා කරද්දී ඒකෙ සිදු වී තිබෙන හුභාක් කරුනු සාධාරණීයකරණය කරන්න ගත් උත්සාහය මම හිතන්නේ තර්කානුකූල නැහැ කියලයි. මොකද හේතුව? උදාහරණයක් වශයෙන් ගත්තොත් අද විදුලිබල මණ්ඩලයේ Estimating, Service locations, Service connections, High tension lines, Low tension lines විදුලි රැහැන් ඇදීම. කනු සිටවීම, කානු කැපීම යන මේ සියලුම දේවල් කරන්නේ contract basis එකකටයි. එහෙම නැතිනම් කොන්ත්‍රාත් පදනම මතයි. සැතැප්ම ගණනක් ගැන කතා කරනවා. කථා කරලා රටේ පවතින සාමාන්‍ය ක්‍රමය අනුව විදුලිය ගෙන යන්නට contract basis එකක් අනුව තමයි කටයුතු කරන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙහෙලිය රඹුක්වැල්ල මහතා]

එහෙම නම් දහතුන් දහසේ සිට දහසය දහසකට ආසන්න ප්‍රමාණයක් දක්වා සේවකයන් වැඩි වීමට හේතුවක් අපි කොහෙත්ම දකින්නේ නැහැ. නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා, පද්ධතිය වැඩි වනවා, ඉල්ලීම වැඩි වනවා, ඒ අනුව සේවයනුත් වැඩි වන්නට ඕනෑය කියා. නමුත් 1994 තිබුණු ආයතනය මඟින් කරනු ලැබූ සියලුම සේවාවන් අද පෞද්ගලික අංශයට කොන්ත්‍රාත් පදනම මත දී තිබෙනවා නම් සේවකයන්ගේ අවශ්‍යතාව අඩු විය යුතුද, වැඩි විය යුතුද කියන ප්‍රශ්නයට උත්තර දෙන්නට සිද්ධ වනවා. කෙසේ වෙතත් සිදුවී තිබෙන්නේ සියයට 20ක පමණ ප්‍රමාණයකින් සේවක පිරිස වැඩි වීමයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ කථාව අවසාන කිරීමට කාලය ඇවිත් තිබෙනවා.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

විනාඩි 20ක් මට ලැබුණාද ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

ඔව්.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාට මම මේ ගැන අමුතුවෙන් කියන්නට ඕනෑ නැහැ. මට වඩා හොඳට එතුමා මේවා ගැන දන්නවා. විදුලිබල මණ්ඩලය වාහන 497ක් හයර් කර තිබෙනවා. විදුලිබල මණ්ඩලය වාහන 497ක් හයර් කර තිබෙන්නේ මොන පදනමක් මතද? එහෙම නම් විදුලිබල මණ්ඩලයට අයත්ව තිබූ වාහනවලට මොකද වුණේ? විදුලිබල මණ්ඩලයේ වාහනවලට වන දේවල් මට වඩා හොඳට අමාත්‍යවරයා දන්නවා. පසුගිය මැතිවරණයේදී මහනුවර කන්ද උඩරට මුළු මැතිවරණ ව්‍යාපාරයටම සම්පූර්ණයෙන්ම පාවිච්චි කරන්න ගෙනත් තිබුණේ ඒ වාහනයි. එක වාහනයක් අදත් තවමත් කඩුගන්නාව පොලීසියේ තිබෙනවා. ඒකේ නම්බර් ප්ලේට් එක නැහැ. ඒ වාහනය තවමත් කඩුගන්නාව පොලිසියේ තිබෙනවා ඒ ප්‍රදේශයේ circuit bungalows පහළොවක් තිබෙනවා. ඒ circuit bungalows පහළොවම ඒ මාස එක හමාර සඳහා සම්පූර්ණයෙන්ම 'බුක්' කරලයි තිබුණේ. මගේ නිවසට එහා පැත්තේ තිබෙන circuit bungalow එක ඒ මාස එක හමාරට පීඑස්ඩී එකට 'බුක්' කර තිබුණා. තත්ත්වය ඒකයි. මේවා හංගන්න දේවල් නොවෙයි යථාර්ථය ඒකයි, සත්‍යය ඒකයි. මේවායින් පිට පැනලා අපි තර්ක විතර්ක ඉදිරිපත් කරනවා නම්, මේ සභාව තුළ පමණක් අපට තර්ක විතර්ක ඉදිරිපත් කරන්න පුළුවන්. අපි දිනුවාය, එයා දිණුවාය, මෙයා දිණුවාය, – කවුරු හරි දිණුවාය – මෙම සභාව තුළ තර්ක විතර්ක ඉදිරිපත් කර අපට සිත සන්තෝෂ කර ගන්න පුළුවන්. නමුත් මෙතැනින් එහාට ගියාට පස්සේ මේ රටේ ඉන්න එක්කෝටි අසූපන්ලක්ෂයක ජනතාවට අපි වග කියන්නට වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
*(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔය හොඳ තර්කයෙන්ම අපි කථාව අවසාන කරමු.

කෙහෙලිය රඹුක්වැල්ල මහතා
*(திரு. கெஹெலிய ரம்புக்வெல்ல)*
(Mr. Keheliya Rambukwella)

මම විශ්වාස කරන ආකාරයට මේ රටේ ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශයක් වන මෙම අමාත්‍යාංශය පිළිබඳව කරුණු කීපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබීම සම්බන්ධව මම සන්තෝෂ වනවා. පොදුජන එක්සත් පෙරමුණේ ඉන්න ප්‍රබලම සාමාජිකයකු වන ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාත්, මේ රටේ නායිකාව හැටියට සිටින ගරු චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනියත් අතර, විදුලිබල මණ්ඩලය සම්බන්ධව තිබෙන පරස්පර විරෝධී අදහස් සමථයකට කරගෙන ජනතාව වෙනුවෙන් යම්කිසි සේවයක් කරන්නට කටයුතු කරන්නය කියා අවසාන වශයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. ස්තුතියි.

[අ. භා. 5.24]

ගරු එදිරිවීර වීරවර්ධන මහතා (නැගෙනහිර සංවර්ධන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ සහ ග්‍රාමීය නිවාස සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
*(மாண்புமிகு எதிரிவீர வீரவர்தன– கிழக்கின் அபிவிருத்தி, புனர்வாழ்வு, புனரமைப்பு, கிராமிய வீடமைப்பு அபிவிருத்தி பிரதி அமைச்சர்)*
(The Hon. Ediriweera Weerawardene – Deputy Minister of Development, Rehabilitation and Reconstruction of the East and Rural Housing Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම සම්බන්ධව මම මේ අවස්ථාවේ ඉතාම සතුටු වනවා. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළවල් ඉතාම සාර්ථකව කෙරුණු බව විශේෂයෙන්ම මේ අවස්ථාවේ දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන්ගෙනුත් අමාත්‍යවරුන්ගෙනුත් කියැවුණා. යම් යම් සුළු සුළු ප්‍රශ්න සම්බන්ධව, සංවර්ධනය කරා වේගයෙන් ගමන් කිරීමේදී ඇති වන ගැටලු සම්බන්ධව යම් විවේචනයන් ඇති වුණත් සමස්තයක් වශයෙන් අද රටේ අවශ්‍යතාව මත විශාල වැඩ කොටසක්, විදුලිබල හා බලශක්ති ගරු අමාත්‍යතුමා එතුමාගේ නියෝජ්‍ය අමාත්‍යතුමාත් සමඟ මේ රටේ උන්නතිය වෙනුවෙන් කර තිබෙන බව අද මෙම විවාදයේදී අපට පැහැදිලිවම දැන ගන්න ලැබුණා. අප රටේ ජන ජීවිතයට විශේෂයෙන්ම බලපාන, ඒ වාගේම සංවර්ධනයට බලපාන, විශේෂයෙන්ම ග්‍රාමීය සංවර්ධනයට බලපාන, රටේ ආර්ථිකයට බලපාන, විදුලිබලය ජනතාවට වැඩියෙන් ලබා දීම සඳහා විශාල වැඩ කොටසක් කිරීම සම්බන්ධව විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අමාත්‍යතුමාටත් මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

1994 දී පොදුජන එක්සත් පෙරමුණ ආණ්ඩුව භාර ගන්නා අවස්ථාවේදී, මේ රටේ විදුලිබල සැපයුම තිබුණු ආකාරය පිළිබඳව මම කියන්න සතුටුයි. විශේෂයෙන්ම 1977 විතර වෙන විට අපේ රටේ විදුලිය සැපයුණු නිවාස ප්‍රමාණය තුන් ලක්ෂයක් විතර වුණා. 1994 වන විට එය පහළොස් ලක්ෂය විතර දක්වා වැඩි වෙලා තිබුණා. පසුගිය එක්සත් ජාතික පක්ෂ රජය කාලයේදී වසර 17ක් තිස්සේම නිවාස දොළොස් ලක්ෂයකට විතරයි විදුලිය ලබා දීමට හැකි වෙලා තිබුණේ. ඒත් අපේ රජයට පසුගිය අවුරුදු හයක් වැනි කෙටි කාලයක් තුළ රටේ නිවාස තිස් ලක්ෂයකට පමණ විදුලිය ලබා දෙන්නට හැකියාව ලැබී තිබෙනවා. ඒ අන්දමින් විදුලිය අංශයෙන් අපේ රජය විශාල සංවර්ධනයක්, දියුණුවක් ලබා දී තිබෙනවා. 1977 වන විට අපේ රටේ විදුලිය තිබුණේ සියයට 7.5ක් පමණ ප්‍රමාණයකටයි. 1994 වන විට, ඒ පසුගිය 17 වසර තුළ, එක්සත් ජාතික පක්ෂ රජයට විදුලිය ලබා දෙන්නට හැකි වෙලා තිබුණේ සියයට 35කට විතර ප්‍රමාණයකටයි. නමුත් 1994දී පොදුජන එක්සත් පෙරමුණු රජය බලයට පත් වුණු පසු මේ කෙටි කාලය තුළ, විදුලිබල සැපයුම සියයට 60 දක්වා වැඩි කරන්නට අපේ ගරු ඇමතිතුමා ඇතුළු විදුලිබල අමාත්‍යාංශයේ සියලු දෙනාටම හැකියාව ලැබී තිබෙනවා. එය විශාල සංවර්ධනයක්. ඒ පිළිබඳ අපි බෙහෙවින් ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

මම මේ අවස්ථාවේදී මහනුවර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කරන්නට සතුටුයි. 1994 වන විට මුළු මහනුවර දිස්ත්‍රික්කයටම ලබා දෙන්නට හැකියාව තිබුණේ සියයට 52ක විදුලිය ප්‍රමාණයක් තමයි. නමුත් මේ වන විට ඒ ප්‍රමාණය සියයට 79 දක්වා වැඩි කරන්නට අපට හැකියාව ලැබී තිබෙනවා. එය විශාල සංවර්ධනයක්ය කියා මම මේ අවස්ථාවේදී හඳුන්වන්නට කැමැතියි. ඒ වාගේම රුපියල් මිලියන 1218ක වියදමින් මහනුවර දිස්ත්‍රික්කයට විදුලි යෝජනා ක්‍රම 3839ක් පසුගිය කාලය තුළ ලබා දී තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ තෙල්දෙනිය, උඩුදුම්බර වැනි දුෂ්කර ප්‍රදේශවල විශාල ජනාවාස තිබුණා. විශේෂයෙන්ම ඒ ජනතාව අවුරුදු ගණනාවක් තිස්සේ විදුලිය බලාපොරොත්තුවෙන් සිටියා. නමුත් විදුලිය ලැබුණේ නැහැ. කෙසේ වෙතත් ඒ ජනතාවට විදුලිය ලබා දෙන්නට අද අපට හැකියාව ලැබී තිබෙනවා. තෙල්දෙනිය ප්‍රදේශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සියයට හතලිහකටවත් විදුලිය ලබා දී නැහැ කියා ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා. මම එතුමාට කියන්නට සතුටුයි, තෙල්දෙනිය ආසනයේ සියයට 65කට 70කට ආසන්න ප්‍රමාණයකට විදුලිය ලබා දෙන්නට අපේ ඇමතිතුමාට හැකියාව ලැබී තිබෙන බව. මහනුවර දිස්ත්‍රික්කයේ එතරම් ප්‍රමාණයකට විදුලිය ලබා දී තිබෙනවා.

මා නියෝජනය කරන හාරිස්පත්තුව ආසනය ගැනත් යමක් කියන්නට සතුටුයි. 1994දී හාරිස්පත්තුව ආසනය තුළ විදුලිය ලබා දී තිබුණේ සියයට 42ක ප්‍රමාණයකටයි. හාරිස්පත්තුව ආසනය නියෝජනය කළේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු ප්‍රබල ඇමතිවරයකු වූ ඒ. සී. එස්. හමීඩ් මැතිතුමායි. එතුමාගේ කාලයේදී ලබා දීමට හැකියාව ලැබී තිබුණේ සියයට 42ක විදුලි බල ප්‍රමාණයක් විතරයි. නමුත් මම කියන්ට සතුටුයි, අද වන විට හාරිස්පත්තුව ආසනය පුරා සියයට 85ක ප්‍රමාණයකට විදුලිය ලබා දෙන්නට හැකියාවක් ලැබී තිබෙන බව. පසුගිය කාලය තුළදී විදුලිය ලබා දීමට එතුමා කළ උදව් උපකාර පිළිබඳව මම අපේ ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. විදුලිබලය ලැබීම නිසා අද ඒ ප්‍රදේශ විශාල සංවර්ධනයකට පත් වෙමින් තිබෙනවා. විශාල වශයෙන් ජනපද රාශියක් තිබෙන හාරිස්පත්තුව ආසනයේ කිලෝමීටර් 6, 7, 8 වගේ දුරට විදුලිය ලබා දීමට පසුගිය කාලයේදී අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ තුළින් ග්‍රාමීය සංවර්ධනය වගේම කර්මාන්ත සංවර්ධනත් ඇති වී තිබෙනවා. සුළු කර්මාන්ත කරන්නටත්, ස්වයං රැකියා කරන්නටත් අද අපි ඒ ප්‍රදේශයේ ජනතාවට හැකියාව ලබා දී තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව මා නැවත වරක් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම තවත් සුළු සුළු අඩුපාඩු කිහිපයක් අපේ ආසනයේත්, අවට ප්‍රදේශවලත් තිබෙනවා. ඉදිරි වර්ෂ කිහිපය තුළ ඒ අවශ්‍යතා ඉටු කර ගන්නට ලැබේවිය කියා මා බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් ඒ වාගේම විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්තුමා, විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමා, තෙල් සංස්ථාවේ සභාපතිතුමා ඇතුළු සියලුම නිලධාරීන්ටත් මම නැවත වතාවක් ස්තුතිවන්ත වෙනවා. මේ රටේ අවශ්‍යතා සලකා බලා, අවශ්‍ය විදුලිය හා බලශක්ති ප්‍රමාණය ලබා දෙන්නට කරන කාර්යය, ගන්නා උත්සාහය සම්බන්ධයෙන්. 2010 වන විට සියයට සියයකින්ම විදුලියෙන් ස්වයංපෝෂණය කරන්නට බලාපොරොත්තු වෙමින් යන මේ ගමන යන්නට, අප සියලු දෙනාටම ශක්තිය සහ ධෛර්යය ලැබේවිය කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 5.29]

උපාලි සමරවීර මහතා
(திரு. உபாலி சமரவீர)
(Mr. Upali Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට සම්බන්ධ වෙමින් මගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විදුලිබලය ගැන කථාකරනකොට, මේ රටේ ජල විදුලි බලාගාර ඉදි කළ ඒ නායකයන් ගැනත් යමක් සිහිපත් කළොත් හොඳයි කියා මම කල්පනා කරනවා. 1952 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂ රජය යටතේ, රජයේ වැඩ අමාත්‍යවරයා හැටියට හිටි ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා, එද ලංකාවේ පළමු වෙනි විදුලි බලාගාරය වන නෝටන්බ්‍රිජ් ලක්ෂපාන ජල විදුලි බලාගාරය ඉදිකර, ඒ තුළින් පළමුවෙන්ම ශ්‍රී පාදස්ථානයට විදුලිය ලබා දෙන්න පුළුවන් වුණා.

1978 වර්ෂයේදී 'ඔපෙක්' සංවිධානය විසින් ඉන්ධන මිල වැඩි කළ නිසා, එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ රජයට සිද්ධ වුණා, ජල විදුලි බලාගාරවලට මුල් තැන දෙමින් ඒ ජල විදුලි බලාගාර ක්‍රියාත්මක කරන්න. ඒ අනුව සමනළ කන්දේ සිට ත්‍රිකුණාමලය දක්වා නිසොල්මන්ව ගලා බැහැපු මහවැලි ගඟ හරස් කර, ජලාශ ඇති කර, කොත්මලේ විදුලි බලාගාරය, වික්ටෝරියා විදුලි බලාගාරය, රන්දෙනිගල විදුලි බලාගාරය, රන්ටැඹේ විදුලි බලාගාරය, මාදුරුඔය විදුලි බලාගාර ඉදි කළා. ඒ විතරක් නොවෙයි, කැනියොන් විදුලි බලාගාරයත්, සමනළ වැව විදුලි බලාගාරයත් ගරු ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාත්, ගාමිණී දිසානායක මැතිතුමාත් මුල් වී එද එක්සත් ජාතික පක්ෂ රජයෙන් ඉදි කළාය කියන එක අප මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ.

අද මේ විදුලි බලාගාරතුළින් නිෂ්පාදනය කරන ජල විදුලිය සඳහා එය පාවිච්චි කරන ඒ පාරිභෝගිකයන්ට ඉතාමත් අධික මුදලක් ගෙවන්න සිද්ධ වී තිබෙනවා. මම හිතන්නේ මේකට එක හේතුවක් තමයි, විදුලි බල මණ්ඩලයේ කළමනාකාරිත්වයේ සහ පරිපාලනයේ තිබෙන යම් යම් අඩුපාඩුකම්.

කෙහෙලිය රඹුක්වැල්ල ගරු මන්ත්‍රීතුමා මතක් කළා වාගේ, අද අපි දකින දෙයක් තමයි; අද විදුලි බල මණ්ඩලයේ ඉන්න ඒ සේවකයන්ට වැඩිය අද මේ වැඩ පවරා තිබෙන්නේ කොන්ත්‍රාත්කරුවන්ට වීම. ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රියාත්මක කිරීමේදී, මේ හැම දෙයකම වැඩ කටයුතු කරන්නේ, කොන්ත්‍රාත්කරුවන් විසිනුයි. උදහරණයක් ගත්තොත්, මම නියෝජනය කරන බදුල්ල දිස්ත්‍රික්කයේ. විදුලි බල මණ්ඩලයේ නිලධාරීනුත්, කාර්මික ක්ෂේත්‍රයේ උදවියත් කරන්නේ යම්කිසි ආපදවක් වුණ වේලාවට ගිහින් ඒවා සකස් කරන එකයි. එහෙම නැත්නම්. පුනරුත්ථාපන වැඩ කටයුතු කරන එකයි. ඒ හැරුණුකොට ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම සියල්ලක්ම කරන්නේ කොන්ත්‍රාත්කරුවන් විසිනුයි. මම හිතන්නේ මේ විධියේ වැඩ කොන්ත්‍රාත්කරුවන් විසින් කරන්න ගියාම, ඒ කොන්ත්‍රාත්කරුවන්ට විශාල මුදලක් ගෙවන්න, විදුලි බල මණ්ඩලයට සිද්ධ වෙනවා. එහෙම නම් ඒ බර පැටවෙන්නේත්, විදුලිය පරිහරණය කරන පාරිභෝගිකයන්ටය කියන එක මම මතක් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please : ගරු නියෝජ්‍ය කථානායකතුමා දැන් මූලාසනය ගන්නවා. මෙතෙක් වේලා මෙම ගරු සභාවේ සංවරතාව රැක්කා වගේම, එතුමාගේ සභාපතිත්වයෙනුත් සංවරය රැකගෙන යන්නට කියා තමුන්නාන්සේලාට ආයාචනය කරනවා.

උපාලි සමරවීර මහතා
(திரு. உபாலி சமரவீர)
(Mr. Upali Samaraweera)

ඔබතුමාගේ දේශනයට ගත වූ වේලාව මගේ වේලාවෙන් අඩුකරන්න එපා කියා මම ඉල්ලා සිටිනවා.

*අනතුරුව අල්හාජ් ඒ. එච්. එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, அல்ஹாஜ் ஏ. எச். எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே. பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* ALHAJ A. H. M. AZWER *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

We must all thank hon. Azwer because the House was very silent and well behaved. Thank you very much.

උපාලි සමරවීර මහතා
(திரு. உபாலி சமரவீர)
(Mr. Upali Samaraweera)

ගරු සභාපතිතුමනි, මම සඳහන් කරමින් සිටියේ අද විදුලිබල මණ්ඩලයේ වැඩ කටයුතු වැඩි කොටසක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් කෙරෙන නිසා ඒ යන වියදම පාරිභෝගිකයන්ගේ කරපිට පැටවෙන බවයි. අදහරණයක් ගතහොත් මා නියෝජනය කරන බදුල්ල දිස්ත්‍රික්කයේ අද විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කොන්ත්‍රාත්කරුවා වෙලා තිබෙන්නේ පළාත් සභාවේ ඉන්න විදුලිබල ඇමතිතුමාගේ පුතා. තාත්තා පළාත් සභාවෙන් මුදල් වෙන් කරනවා, විදුලිබල මණ්ඩලයට. පුතා තමයි ඒ කොන්ත්‍රාත් සියල්ලක්ම කරන්නේ. මෙතැනදී මම ගරු ඇමතිතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. මම පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට අවුරුදු 7ක් වැනි කාලයක් ඌව පළාත් සභාවේ සිටියා. අපි පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට කටයුතු කරන නිසා යම් යම් විදුලි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර දෙන්නය කියා ගම්වල උදවිය ඇවිත් අපෙන් ඉල්ලීම් කරනවා. මොකද, ඒ පළාත් සභාවේ ඇමතිවරයාගෙන් කරන විදුලි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී අසාධාරණකම් සිද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[උපාලි සමරවීර මහතා]

වෙනවා. සමහරවිට ඒ විදුලි රැහැන් අදින කොට එක්සත් ජාතික පක්ෂ ආධාරකරුවකුගේ ගෙයක් හරි තිබුණා නම් ඒ ගෙය මහ හැරලා කඳු උඩින් කැලෑ මැදින් ඒ විදුලි රැහැන් ඇදගෙන යනවා. එහෙම වෙලා එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ගෙවල් 10-15 මහ හැරුණ වෙලාවේදී ඒ උදවියට කියන්න කෙනෙක් නැති නිසා, මහජන නියෝජිතයන් විධියට අප වෙත ඇවිල්ලා ඒ ගැන ඉල්ලීම් කරනවා. අපට ඒ ඉල්ලීම්වලට ඇහුම්කන් දෙන්න සිද්ධ වෙනවා. පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට අපට ඒ කාලයේ ඉතාමත්ම සුළු මුදලක් – රුපියල් ලක්ෂ 5ක් නැත්නම් 6ක් විතර සොච්චමක් – තමයි ලැබුණේ. එහෙම නම් ඒකෙන් කරන්න පුළුවන් විදුලි යෝජනා ක්‍රම ඇත්තෙත් නැහැ. එතැනදී ඒ විදුලි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්න ගියාම, වැලිමඩත්, ඌව පරණගමත් විදුලි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්නේ වැලිමඩ ඩිපෝ එකෙන්. අපි උදහරණ හැටියට ගත්තොත් ගෙවල් 10කට විදුලිය ලබා දෙන්න ඇස්තමේන්තුවක් සකස් කරන්නය කියා වැලිමඩ ඩිපෝවට කිව්වාට පස්සේ ඒ උදවිය ඒ ගෙවල් දහයේ අවසාන ගෙදරට ඇස්තමේන්තුව හරි ගස්සනවා. වැලිමඩ ඩිපෝ එකෙන් ඒ ඇස්තමේන්තුව සකස් කළාට පස්සේ සාමාන්‍යයෙන් දල වශයෙන් රුපියල් 25,000ක විතර මුදලක් එයට ඇස්තමේන්තු කරනවා. ඊට පස්සේ පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට ඒකට මුදල් දෙන්න ගියාම විදුලිබල මණ්ඩලය කියනවා වැලිමඩ ඩිපෝ එකෙන් ඇස්තමේන්තු කරන ඒවාට පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදනවලින් අපට මුදල් ලබා ගන්න බැහැ; මේ ඇස්තමේන්තුව බදුල්ල ඩිපෝ එකෙන් කරවන්නය කියා. බදුල්ලේ ඩිපෝ එකට ඉල්ලීමක් කළාම ඒගොල්ලො හදනවා, අර රුපියල් 25,000ක ඇස්තමේන්තුව වෙනුවට ලක්ෂ දෙක හමාරක විතර ඇස්තමේන්තුවක්.

මෙන්න මේ විධියේ දේවල් සිද්ධ වන නිසා අර පළිගැනීම් චේතනාව හෝ සමහර වෙලාවට ඔය පොදුජන එක්සත් පෙරමුණේ සමහර පළාත් සභා ඇමතිවරු, මන්ත්‍රීවරු ඒ විදියේ කටයුතු කරලා ගෙවල් මහ හැරලා වැඩ කටයුතු කළාම කිසිම දවසක ඒ ගෙවල්වල ඉන්න අහිංසක උදවියට විදුලිය ලබාගන්නට බැරි වෙනවා. එම නිසා මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි, කරුණාකර මෙන්න මේ තිබෙන තහංචි ඉවත් කර දෙන්න; මොකද, පළාත් සභාවේ මන්ත්‍රීවරුන් කැමතියි ඒ අයට ලැබෙන ප්‍රතිපාදනවලින් මුදල් වෙන් කරලා ඒ විදුලි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්න.

සභාපතිතුමා
*(தவிசாளர் அவர்கள்)*
(The Chairman)

ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර දැන් කථාව අවසාන කරන්න. වෙලාව අවසානයි.

උපාලි සමරවීර මහතා
*(திரு. உபாலி சமரவீர)*
(Mr. Upali Samaraweera)

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මූලාසනයේ හිටපු මන්ත්‍රීතුමා සෑහෙන වෙලාවක් ගත්තා. එතුමා දේශනයක් කළා –

සභාපතිතුමා
*(தவிசாளர் அவர்கள்)*
(The Chairman)

නැහැ, ඒ ගැන විවාදයක් අවශ්‍ය නැහැ. මම කිව්වාම කරුණාකර කථාව ඉවර කරන්න. වෙලාව ඉවරයි.

උපාලි සමරවීර මහතා
*(திரு. உபாலி சமரவீர)*
(Mr. Upali Samaraweera)

මට තව විනාඩි දෙකක් දෙන්න.

සභාපතිතුමා
*(தவிசாளர் அவர்கள்)*
(The Chairman)

විනාඩියක් දෙන්නම්. එක විනාඩියක් දෙන්නම්. ඒකත් මට වෙනත් මන්ත්‍රීවරයකුගෙන් කපන්න වෙනවා. ප.ව. 6.00 වන තුරු විතරයි මේ විවාදය තිබෙන්නේ.

උපාලි සමරවීර මහතා
*(திரு. உபாலி சமரவீர)*
(Mr. Upali Samaraweera)

ඔබතුමා වෙලාව –

සභාපතිතුමා
*(தவிசாளர் அவர்கள்)*
(The Chairman)

හරියටම ප.ව. 5.40ට ඉවර වෙන්න ඕනෑ මේ විවාදය. හිටපු මන්ත්‍රීතුමන්ලාට –

උපාලි සමරවීර මහතා
*(திரு. உபாலி சமரவீர)*
(Mr. Upali Samaraweera)

මම කියන්න අදහස් කර ගෙන තිබුණු කරුණු ගොඩාක් මට කියන්න සිද්ධ වුණේ නැහැ. ඒ ගැන මම කනගාටු වෙනවා. කෙසේ වෙතත් මේ වචන ටික හරි [බාධා කිරීමක්] මොනවාද? විදුලිය වේගයෙන් හරි මට මේ කරුණු ටික කියන්න ලැබීම ගැනත්, අපේ ගම් පළාත්වල ජීවත් වන අහිංසක උදවියට වන අසාධාරණයක් ගැන මට මතක් කරන්න අවස්ථාව ලැබීම ගැනත් මම සන්තෝෂ වෙනවා. එහෙම නම් ඔබතුමාගේ ඉල්ලීම අනුව අකමැත්තෙන් වුවත් මම මගේ කථාව මෙයින් අවසාන කරනවා.

සභාපතිතුමා
*(தவிசாளர் அவர்கள்)*
(The Chairman)

බොහොම ස්තුතියි.

[අ. භා. 5.38]

එම්. එස්. සෙල්ලසාමි මහතා
*(திரு. எம். எஸ். செல்லச்சாமி)*
(Mr. M. S. Sellasamy)

*கௌரவ தவிசாளர் அவர்களே, நாட்டின் அதி முக்கிய தேவையான மின்வலு, சக்தி அமைச்சின் குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகிறேன். நாட்டு மக்கள் ஒவ்வொருவரினதும் அன்றாட தேவைகளில் மிக முக்கிய சக்தியாக விளங்குகின்ற மின்சாரம், எரிபொருள் என்பவற்றை நாட்டு மக்களுக்குப் பெற்றுக்கொடுக்க வேண்டிய கடமை இந்த நாட்டு அரசாங்கத்துக்கு இருக்கிறது. இதன் பிரகாரம் மக்களுடைய வாழ்க்கைக்கு அத்தியாவசியமான, நாட்டின் அபிவிருத்திக்கு முக்கியமான மின்சாரம், எரிபொருள் என்பவற்றை பெற்றுக் கொடுக்க வேண்டிய பொறுப்பைக் கௌரவ மின்வலு சக்தி அமைச்சர் அனுருத்த ரத்வத்தே அவர்கள் ஏற்றுக் கொண்டிருக்கின்றார். அதைவிட யுத்தத்தை நிறுத்த வேண்டிய பொறுப்பும் நாட்டில் சமாதானத்தை நிலைபெறச் செய்யவேண்டிய பொறுப்பும் அவருக்கு இருக்கிறது.*

*இந்த நாட்டில் மின்சார விநியோகம் ஆரம்பிக்கப்பட்டு, 1952 ஆம் ஆண்டிலிருந்து இன்றுவரை கிட்டத்தட்ட 48 ஆண்டுகளுக்கு மேலாகிய நிலையில், மின்சக்தி, எரிபொருள் என்பன பரிபூரணத்துவம் அடைந்திருக்க வேண்டிய ஒரு நிலையிருந்தும் இந்த நாட்டிலுள்ள மக்களில் அரைப்பங்கினர்தாம் இன்று மின்சாரப் பாவனையின் பயனை அனுபவித்துக் கொண்டிருக்கிறார்கள் என்பதை நான் கூறிக்கொள்ள வேண்டும். இந்த நாட்டில் இன்னும் ஐம்பது சதவீதமான மக்கள் மின்சாரத்தைப் பெறவேண்டியிருக்கிறது.*

*நாட்டில் வாழ்கின்ற மக்களுக்கு மாத்திரமல்ல, அவர்களுடைய வீட்டுப் பாவனைக்கு மாத்திரமல்ல, இன்று உலகத்தில் தொழில்நுட்ப விஞ்ஞானத் துறைகளில் பல்வேறு மாறுதல்களை ஏற்படுத்தவும் இந்த மின்சாரம் அத்தியாவசியமாகின்றது. பெரிய தொழில் துறைகள் மற்றும் இன்று இருக்கின்ற கம்பியூட்டர் பாவனை போன்ற பல விதமான சேவைகளுக்கும் மின்சாரம் அத்தியாவசியமானதொன்றாகக் கருதப்படுகிறது. இன்று நாட்டு மக்கள் மின்சாரம் இல்லாமல் வாழவே முடியாத ஒரு நிலை*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ஏற்பட்டு வருகிறது. இதன் அடிப்படையில்தான் ஐக்கிய தேசியக் கட்சி அரசாங்கக் காலத்தில் பல்வேறு நீர்த்தேக்கங்கள் உருவாக்கப்பட்டன. கொத்மலை, காசல்ரீ, விக்ரோறியா போன்ற நீர்த்தேக்கங்களை உருவாக்கிவிட்டால், இலங்கையில் உள்ள அத்தனை பேருக்கும் மின்சாரத்தை வழங்குவதுடன், இந்தியாவுக்கும் வழங்கக்கூடிய சக்தி இருக்குமென்று அந்த நேரத்தில் சொல்லப்பட்டது. ஆனால், அன்று அவ்வாறு சொல்லப்பட்டபோதும், இப்போதும் நமது நாட்டு மக்களில் அரைவாசிப் பேர் மின்சாரம் இல்லாது இருட்டில் வாழ்ந்து கொண்டிருக்கிறார்கள். ஒரு பகுதியில் உள்ள மக்கள் வெளிச்சத்தில் சந்தோசமாக வாழ்ந்து கொண்டிருக்கும்போது, இன்னொரு பகுதியிலுள்ள மக்கள் இருட்டில் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். இருட்டில் வாழ்ந்து கொண்டு எப்பொழுது எங்களுக்கு வெளிச்சம் வரும் என்று ஏங்கிக் கொண்டிருக்கின்ற அந்த மக்களுக்கு மின்சாரம் பெற்றுக்கொடுப்பதற்கு இன்னும் எத்தனை ஆண்டுகள் நமக்குத் தேவைப்படப் போகின்றன? அவ்வாறு அவர்களுக்கெல்லாம் மின்சாரத்தை வழங்கக்கூடிய சக்தியும் வலுவும் நமது கையில் இருக்கிறதா? அவ்வாறு செய்வதற்கு இன்னும் அதிகப்படியான நீர்த்தேக்கங்களை உருவாக்குவதற்கு நமது நாட்டிலே இடமில்லை. எமது நாட்டின் தரைப்பகுதி சக்தி இழந்துகொண்டிருக்கிறது. மண்ணில் நீர்க்கசிவு ஏற்படுவதுடன், மண் சிதைவும் உருவாகிறது. இவ்வாறான நிலையில் அதிகப்படியான நீர்த்தேக்கங்களை நம்மால் உருவாக்க முடியாது.

கௌரவ அமைச்சர் றொனி டி மெல் அவர்கள் தனது உரையின்போது என்ன சொன்னார்? "இந்த நாட்டின் பொருளாதாரம் பாதிக்கப்படுவது, ஆயுதம் வாங்குவதனாலும் - யுத்தம் தொடர்ந்தும் நடைபெறுவதனாலும் - எரிபொருள் விலை உயர்வினாலும் தான்" என்று அவர் குறிப்பிட்டார். அதாவது, யுத்தம் நடைபெறுவதாலும், எரிபொருள் விலை உயர்வினாலுமே இந்த நாட்டின் பொருளாதாரம் மிகப்பெரிய தாக்கத்தை எதிர் நோக்கியுள்ளது என்று குறிப்பிட்டார். ஒருபுறம் யுத்தம்! ஒருபுறம் எரிபொருள் விலையுயர்வு! இந்த இரண்டு காரணிகளாலுமே இந்த நாட்டில் வாழ்கின்ற ஒரு கோடியே எண்பது இலட்சம் மக்களும் துன்பத்தையும் வேதனையையும் அனுபவித்துக் கொண்டிருக்கிறார்கள். பொறுப்பு வாய்ந்த கௌரவ அமைச்சர் அனுருத்த ரத்வத்தே அவர்கள் இந்த நாட்டிலே நடைபெறும் யுத்தத்தை உடனடியாக நிறுத்துவதற்கு வழி வகை செய்தால்இன்னும் ஐம்பது வீதமான மக்களுக்கு மின்சாரத்தை வழங்குவதற்கு வேண்டிய சக்தியை நாம் பெற முடியும். யுத்தம் தொடர்ந்து கொண்டிருந்தால், அபிவிருத்திகளைச் செய்ய முடியாது; மின்சாரம் வழங்க முடியாது. அது மட்டுமன்றி இப்போது வெளிச்சத்தைப் பெற்றுக்கொண்டிருக்கின்றவர்கள் கூட இருட்டிலே வாழக்கூடிய ஒரு பயங்கரமான நிலைமை இந்த நாட்டில் ஏற்படலாம்.

இன்று நாட்டில் வரட்சி ஏற்படுகிறது ; மழையில்லை. காடுகள் அழிக்கப்படுகின்றன ; அதனால், ஏராளமான மலைகள் உள்ள பகுதிகளில், நல்ல மழை வீழ்ச்சி ஏற்படுகின்ற இடங்களில் கூட மழையில்லை. நுவரெலியா நகரம் இன்னும் எட்டு வருடங்களில் தண்ணீர் இல்லாத வரண்ட பூமியாக மாறப்போகிறதென்று சொல்கிறார்கள். நுவரெலியாவிலுள்ள மக்கள் வெளியிடங்களக்குக் குடியேற வேண்டிய காலமொன்று வரப்போகிறது. அப்படியானால், இந்த நாட்டில் யுத்தத்தினால் மக்கள் இடம் பெயர்ந்து அகதிகளாகயிருப்பது போல, வரட்சியின் காரணத்தினால் தண்ணீர் இல்லாது பல்வேறு பகுதிகளுக்கும் குடிபெயரக்கூடிய காலமொன்று ஏற்படக்கூடும். எனவே, ஒருவரையொருவர் குறை சொல்லிக் காலத்தைக் கடத்தாமல் அதாவது, ஐக்கிய தேசியக் கட்சி அப்படிச் செய்தது. பொதுசன ஐக்கிய முன்னணி இப்படிச் செய்தது, அந்தக் கட்சியினர்தாம் நாட்டைக் கெடுத்தார்கள். இந்தக் கட்சியினர்தாம் நாட்டைக் கெடுத்தார்கள் என்று பேசுவதை விட்டுவிட்டு, மிகவும் தீர்க்கதரிசனத்துடன், புத்திசாலித்தனமாக இந்த நாட்டிலுள்ள சகல மக்களுக்கும் செய்ய வேண்டிய கடமை என்ன என்பதை இரு பகுதியினரும் சிந்தித்துச் செயற்பட வேண்டிய காலகட்டம் இதுவாகும். அந்தக் கடமையை நிறைவேற்ற முடியாவிட்டால் நாம் மிகப் பெரும் மோசமான கட்டத்திற்குத் தள்ளப்படுவோம்.

அடுத்து, தோட்டப் பகுதியின் மின்சார விநியோகம் பற்றிய விடயம். தோட்டப் பகுதிக்கு மின்சாரம் வழங்குவதற்காக ஆசிய அபிவிருத்தி வங்கியின் மூலம் நிதி வழங்கப்படுகின்றது. ஆனால், இன்றைக்கு சுமார் 20% சத வீதமானவர்களுக்கு மட்டுமே அங்கு மின்சாரம் கிடைத்திருக்கின்றது. இன்னும் பெரும்பாலான தோட்டப் பகுதி மக்களுக்கு மின்சாரம் கிடைக்கவில்லை. வழங்கப்படும் மின்சாரம் கூட எப்படியுள்ளது? ஒரு தோட்டத்திற்கு முழுமையாக மின்சாரம் வழங்கப்படுவதில்லை. அங்கேயும் அரசியல் விளையாடுகின்றது என்பதை நான் அமைச்சர் அவர்களுக்குக் கூற விரும்புகிறேன். அங்கு கட்சி ரீதியாகவும் மின்சாரம் வழங்கப்படுகின்றது. 'அப்படியானபடியால் அரசாங்கத்தினுடைய பணம், குறித்த விடயத்தில் உரிய முறையில் செலவழிக்கப்படுகின்றது.' "என்ற நல்லெண்ணம் அந்தத் தொழிலாள மக்கள் மத்தியில் ஏற்படமாட்டாது.

எனவே, மின்சார விநியோக நடவடிக்கை தோட்டவாரியாகத் திட்டமிடப்பட்டு, வருடாவருடம் இன்ன, இன்ன பகுதிக்கு கொடுக்கப்படல் வேண்டும் என்ற அடிப்படையில் முழுமையாகக் கொடுக்கப்பட வேண்டும். வேலைத் திட்டத்திற்கான பணத்தை யாரும் கொடுக்கலாம். அதாவது எந்தவொரு அமைச்சும் கொடுக்கலாம்; எந்தவொரு பாராளுமன்ற உறுப்பினரும் கொடுக்கலாம். ஆனால், மின்சார விநியோகத்திற்குப் பொறுப்புள்ள அமைச்சர் என்ற வகையில் அமைச்சர் அவர்கள் குறித்த வேலைத் திட்டத்தை - Supervise - மேற்பார்வை - செய்ய வேண்டும். அதாவது, எல்லோருக்கும் - எல்லாக் கட்சிக்காரர்களுக்கும் மின்சாரம் கிடைக்கின்றதா என்ற வகையில் மேற்பார்வை செய்தல் வேண்டும். மின்சாரம் வழங்குவதில்லை. தண்ணீர் வழங்குவதில் கட்சிப் பாகுபாடு காட்ட முடியாது. தண்ணீர் எல்லோருக்கும் பொதுவானது. அதேபோன்று மின்சாரமும் எல்லோருக்கும் பொதுவானது. அந்த அடிப்படையில், பாகுபாடற்ற முறையில் தோட்டப் பகுதிகளில் மின்சார விநியோகம் நடைபெறுவதை உறுதிப்படுத்துவதற்கு அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும்.

ஏராளமான பகுதி, அதாவது கிட்டதட்ட 70% சதவீதமான தோட்டத் தொழிலாளர்கள் வாழும் தோட்டப் பகுதிக்கு இன்னும் மின்சாரம் கிடைக்காதிருக்கின்றது. எனவே, அங்கு மின்சார விநியோகத்தை ஏற்படுத்துவதற்கு அமைச்சர் அவர்கள் உரிய நடவடிக்கையை மேற்கொள்ள வேண்டும். பாதிப் பகுதிக்கு மின்சாரம் விநியோகிக்கப்பட்டும் பாதிப் பகுதிக்கு மின்சாரம் வநியோகிக்கப்படாமலும் அங்குள்ள் எத்தனையோ தோட்டங்கள் காணப்படுகின்றன. மாகாண சபைத் தேர்தல் காலங்களில் அங்கு ஒருசில மின் கம்பங்களை நடுவார்கள். தேர்தல் முடிந்த அப்புறம் அதை மறந்து விடுவார்கள். இந்த நிலைமை இருக்கக் கூடாது. அவ்வாறு மக்களை ஏமாற்றக்கூடாது. கோடிக் கணக்கான ரூபாக்களைச் செலவழிக்கின்ற அரசாங்கம், எல்லா மக்களும் பூரணமாக மின்னொளி பெற்று மகிழ்ச்சியாக வாழக்கூடிய ஒரு சூழ்நிலையை உருவாக்குவதற்கு வழி வகை செய்ய வேண்டும். இன்று நடைபெறும் யுத்தத்திற்கு ஒரு முடிவு கட்டி சமாதானத்தின் மூலம் இந்த நாட்டை அபிவிருத்தி செய்யுமாறு உங்களைக் கேட்டு விடை பெறுகின்றேன்.

ටී. මහේෂ්වරන් මහතා
(திரு. ரி. மகேஸ்வரன்)
(Mr. T. Maheshwaran)

கௌரவ தவிசாளர் அவர்களே, மின் வலு, சக்தி அமைச்சின் மீதான வரவு செலவுத் திட்டக் குழுநிலை விவாதத்தில் கலந்து கொண்டு பேசுவதற்கு சந்தர்ப்பம் தந்த தவிசாளர் அவர்களுக்கு முதலில் நன்றி கூறக் கடமைப்பட்டுள்ளேன். யாழ்ப்பாணக் குடாநாடு அரசின் கட்டுப்பாட்டின் கீழ் வந்த கடந்த ஆறு வருட காலத்தில் மின்வலு, சக்தி அமைச்சு அந்தக் குடாநாட்டுக்கு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. මහේෂ්වරන් මහතා]

இன்று வரை சீரான மின் விநியோகத்தை மேற்கொள்ளவில்லை. அங்கு மின்சார விநியோக வேலைகளை மேற்கொள்ளும் "கூல் எயார்" நிறுவனம், குடாநாட்டிலுள்ள சுமார் ஓர் இலட்சம் குடும்பங்களில் இருபத்தையாயிரம் குடும்பங்களுக்குக் கூடச் சீரான முறையில் மின்சாரத்தை வழங்கவில்லை. வட பகுதியில் பயன்படுத்தப்படுவதற்காக British அரசு ஏழு Generator களை அன்பளிப்பாக வழங்கியிருந்தது. அவற்றில் நான்கு Generator கள் கடந்த பல ஆண்டு காலமாக இராணுவத்தினரின் பாவனையில் இருந்தது. அவை இப்பொழுதும் திருப்பி ஒப்படைக்கப்படாத நிலையிலேயுள்ளன. இந்தக் "கூல் எயார்" நிறுவனம் 20 Mega watts மின்சாரத்தை யாழ்ப்பாணக் குடாநாட்டுக்கு வழங்குவதாக இந்த அரசுக்கு உறுதியளித்திருந்தது. ஆனால், 8 Mega watts மின்சாரத்தைக் கூட அந்த நிறுவனத்தினால் ஒழுங்காக யாழ் குடாதாக்குக்கு வழங்க முடியவில்லை.

மின்சாரம் மிகவும் முக்கியமாகத் தேவைப்படும் மாலை ஆறு மணியில் இருந்து இரவு பத்து மணி வரையிலான காலப் பகுதியில் கூட அங்கு மின்சார வெட்டு நிகழ்கின்றது. அங்கு மின் பிறப்பாக்கிகளைப் புதிதாகப் பொருத்துவதன் மூலம் யாழ் குடாநாட்டுக்குத் தேவையான மின்சாரத்தை இந்த அரசினால் இலகுவாக வழங்க முடியும்.

யாழ் குடாநாட்டில் தற்போது சனத்தொகை மிகவும் குறைந்து கொண்டு வருகின்றது. அங்குள்ள நிலைமையைப் பற்றி மின்சார சபையினர் தலைமையகத்திற்குத் தெளிவாக எடுத்துக் கூறியிருந்தனர். அங்கு மின்சார வேலைகளை மேற்கொள்ளுவதற்காக 1998 ஆம் ஆண்டு 450 மில்லியன் ரூபாவை ஒதுக்கும் படி இலங்கை மின்சார சபையிடம் கோரிக்கை விடுக்கப்பட்டது. ஆனால், மின்சார சபை இன்று வரை அந்தப் பணத்தை வட பகுதியின் மின்சார வேலைகளுக்காக வழங்கவில்லை.

கப்பல் கட்டணங்கள் குறைந்துள்ள போதிலும், அரசாங்கம் யாழ் குடாநாட்டில் எரிபொருளின் விலையை இன்னும் குறைக்கவில்லை. அங்கு ஒரு லீற்றர் பெற்றோல் 70 ரூபாவுக்கு விற்கப்படுகின்றது. இலங்கையின் ஏனைய மாவட்டங்களில் 50 ரூபாவுக்குக் விற்கும் இலங்கை பெற்றொலியக் கூட்டுத்தாபனம், யாழ்ப்பாணத்தில் இன்னும் எதற்காக அதனை 70 ரூபாவுக்கு விற்க வேண்டும்? இதற்குரிய காரணத்தை அமைச்சர் அவர்கள் இந்தச் சபையில் இன்னும் தெரிவிக்கவில்லை. இப்பொழுது கப்பல் கட்டணம் இன்னும் 60% வீதம் குறைந்திருக்கின்றது. ஆகவே, அங்கு எரிபொருள்களின் விலையை உடனடியாகக் குறைக்கும் படி மிகவும் தயவுடன் கேட்டுக் கொண்டு அமருகின்றேன். நன்றி. வணக்கம்.

[අ. භා. 5.48]

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே - மின்வலு, சக்தி அமைச்சரும் பாதுகாப்புப் பிரதி அமைச்சரும்)

(The Hon. General Anuruddha Ratwatte – Minister of Power and Energy and Deputy Minister of Defence)

ගරු සභාපතිතුමනි, මෙම වැය ශීර්ෂය යටතේ ඉතාමත්ම වැදගත් කරුණු රාශියක් ඉදිරිපත් කිරීම ගැන පළමුවෙන්ම මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ. එච්. එම්. අස්වර් ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ සිටි නිසා කිසිම කරදරයක් බාධාවක් නැතිව ඒ ගරු මන්ත්‍රීතුමන්ලාට කරුණු ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබුණා. ඒ සමගම මූලාසනයේ සිටි අස්වර් ගරු මන්ත්‍රීතුමාටත් මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා. කිසිම කරදරයක් බාධාවක් නැතිව මේ ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලාට බොහොම පැහැදිලිව අදහස් හුවමාරු කර ගන්නට අවස්ථාව ලැබීම ගැන ඒ ගැන නැවතත් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, මෙහිදී ඉදිරිපත් වූ කරුණු කිහිපයකට පිළිතුරු දෙන්නට මා කැමැතියි. අවසාන වරට කථා කළ ඊ. මහේස්වරන් ගරු මන්ත්‍රීතුමා සමහරවිට යාපනය ගැන දන්නේ නැතිව ඇති. එහි ඉන්නවා: ඒ කඩයට සීමා වෙලා ඉන්නවාද මම දන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ உறுப்பினர் ஒருவர்)
(An hon. Member)

පෙට්‍රල් ෂෙඩ් එකේ ඇති.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)
(The Hon. General Anuruddha Ratwatte)

ඒ පෙට්‍රල් ෂෙඩ් එකට සීමා වෙලා ඉන්නවාද කියන එකත් මම දන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ත්‍රස්තවාදීන් පාලනය කරන කාලයේ විදුලිය තිබුණේ සියයට 29දෙනාටයි. රජය නැවත අත්පත් කර ගන්නා විට කිසිම විදුලි එළියක් යාපනයේ තිබුණේ නැහැ. 1997 සිට මේ වන විට එය සියයට 40ක් දක්වා යාපනේ නිවාසවලට විදුලිය සපයා දී තිබෙනවා. මහේස්වරන් ගරු මන්ත්‍රීතුමා ඒ ගැන දන්නේ නැතිව ඇති. බොහෝ විට දන්නේ නැතිව වෙන්න ඇති. [බාධා කිරීමක්] මට අසත්‍ය ප්‍රකාශ කර පුරුද්දක් නැහැ. ඒ එතුමා වෙන්න ඇති. මට එහෙම කිසිම පුරුද්දක් නැහැ. ගිහින් මේවා සොයා බලන්න පුළුවන්. ගිහින් සොයා බලා කටයුතු කරන්න. බ්‍රිතාන්‍ය ආධාර ඇතිව මෙගවොට්ස් 10ක විදුලි බලාගාර ඇති කර ඇති අතර, විශේෂයෙන්ම මෙගවොට්ස් 20ක කූල් එයාර් ජෙනරේටර් එකකින් කන්කසන්තුරේ සිට ඒ ප්‍රදේශයට විදුලිය සපයනවා. තමුන්නාන්සේ යන්න, ගිහින් බලන්න. එහෙම නැත්නම් තමුන්නාන්සේගේ යහළුවන් කියනවා ඇති. ගරු සභාපතිතුමනි, ඒ අය තමයි බොහෝ විට මේවා විනාශ කරන්නේ. පසුගිය මැයි මාසයේදී මොකක්ද වුණේ කියා තමුන්නාන්සේ දන්නවා ඇති. කන්කසන්තුරේ කූල් එයාර් ජෙනරේටර් එකට ගැහුවේ කවුද ? මහේස්වරන් ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ මිත්‍රයෝ. කෙසේ වුවත් දැන් යාපනය දියුණු කර ගෙන යනවා. අවශ්‍ය ආකාරයට විදුලි බලය සපයන්නට දකුණු පාර දිගේ උඩහට මාන්කුලම් දක්වා National Grid එක ගෙන ගොස් තිබෙනවා. එතැනින් එහාට ගෙන යන්නට බැරි ඇයි ? අපේ වරදක් නිසා නොවෙයි. මහේස්වරන් ගරු මන්ත්‍රීතුමාගේ මිත්‍රයන්ගෙන් අහලා දැන ගන්නට පුළුවන් වේවි. එම නිසා ඉතා වැදගත් විවේචන ඉදිරිපත් කිරීම ගැන ගරු මන්ත්‍රීවරුන් හැම දෙනාටම මම නැවතත් ස්තුතිවන්ත වෙනවා. එතුමන්ලා විවේචන ඉදිරිපත් කළා. අපි ඒවාට ඕනෑකමින් ඇහුම්කන් දුන්නා. ඒවා පිළිපදින්න පුළුවන් අවස්ථාවල එය කරනවා.

ඒ වගේම අප කර ගෙන යන වැඩ සම්බන්ධයෙන් දෙපැත්තෙන්ම නොයෙකුත් ආකාරයේ ප්‍රශංසා ලබා දුන්නා. එම නිසා ඒ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශ ලේකම්තුමා සභාපතිවරුන් සහ අනිකුත් සියලුම නිලධාරීන්ටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද ? මේ කර ගෙන ගිය වැඩ කරන්නට පුළුවන් වුණේ අන්න ඒ අයගේ නොමසුරු සහයෝගය සහ උනන්දුව තිබුණු නිසයි. අඩුපාඩුකම් ඇති වෙන්න ඇති. මගේ අමාත්‍යාංශයේ වැඩ සම්බන්ධයෙන් නොයෙකුත් ආකාරයේ ප්‍රචාරයක් ඇති වී තිබෙනවා. මට ඒ ගැන සන්තෝෂ. නොයෙකුත් මාර්ගවලින් ඒවායේ හරි අවස්ථාවන් තිබෙනවා; වැරදි අවස්ථාවන් තිබෙනවා. නියම විධියට වැරදි පෙන්නුම් කර දුන් අවස්ථාවල අපි ඒවා නිවැරදි කර ගන්නට ක්‍රියා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව කරුණු දෙකක් තුනක් පිළිබඳව කථා කරන්නට තිබෙනවා. ගාමිනී ලොකුගේ ගරු මන්ත්‍රීතුමා කී දෙයක් ගැන සඳහන් කරන්න කැමැතියි. Hon. Member mentioned about the vessel that brought in crude oil. I agree with him that it was blacklisted in January. But due to an urgent requirement of the product, a company called Whittal undertook the responsibility of using this vessel to bring in oil here and if anything went short, they undertook to pay for it. They have done so. Out of 32,000 metric tons of crude oil which have been brought here,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

22,000 metric tons have been unloaded. It is good. for the balance, US Dollars 4,740 has been paid for by that company – so what he said was correct. I just want to clarify the position.

ගරු සභාපතිතුමනි, බනිජ තෙල් නීතිගත සංස්ථාව පිළිබඳ ලොකු ප්‍රශ්නයක් හැම තැනකම තිබෙනවා. එහි සේවකයන් වැඩිපුර ඉන්නවාය කියන ප්‍රශ්නය තිබෙනවා. අවුරුදු තුනෙන් තුනට වැඩ සම්බන්ධව තක්සේරුවක් කරනවා. අවශ්‍ය දේවල් මොනවාද, අවශ්‍ය සේවක සංඛ්‍යාව කොපමණද කියා තක්සේරුවක් කරනවා. හිටපු සභාපතිතුමාගේ කාලයේදී කිව්වා සේවකයන් 4200ක් සිටියා. කියා. ඔව්. එතකොට ඒ සිටි සේවක සංඛ්‍යාව ප්‍රමාණවත්. තෙල් නිෂ්පාදනය කරලා refine කරලා බෙදුවේ සීමිත ප්‍රමාණයක්. දැන් ඒක තුන් ගුණයකින් වැඩි වෙලා. 1997 සංස්ථාවට අවශ්‍ය සේවක පිරිස ගැන තක්සේරුවක් කරන කොට සේවක සංඛ්‍යාව 7200ක් කියා නියම වුණා. 1998 වන විට අපට සේවකයන් සිටියේ 7258යි. වැඩිපුර 58ක් සිටියා. නමුත් 2000 වන විට 7258 සිටි සේවක ප්‍රමාණය 7015ට බැහැලා අවශ්‍ය ප්‍රමාණය 200කින් අඩුයි. කවුරු හරි කියනවා නම් මෙහි සේවකයන් වැඩියෙන් ඉන්නවාය කියා ඒක වැරදි මතයක්. සමහර විට, අවුරුදු ගණනාවක් දශක ගණනක් තමන්ගේ සේවකයන් දමා ගෙන ඇවිත්, දැන් ඒක එහෙම කර ගන්න බැරිව, දැන් වෙනත් පිරිසක් එතැනට එනවාය කියා ඊර්ෂ්‍යාවෙන් මෙහෙම කියනවාද කියා මම දන්නේ නැහැ. සංස්ථාවට අවශ්‍ය ප්‍රමාණය ඉන්නවා. එතුමන්ලා කිව්වා වාගේ සමහර ප්‍රදේශවල වැඩි අය ඉන්න පුළුවන්. සමහර ඩිපෝවලට වැඩියෙන් ගිහින් ඉන්න පුළුවන්. දැන් ඒකත් සංස්කරණය කර, මාරුවීම් ලබා දීගෙන යනවා. හැම තැනටම අවශ්‍ය ප්‍රමාණය ඉන්න පුළුවන් විධියට වැඩි තැන්වලින් මාරු කර ගෙන යනවා. අපි වෙනසක් නොකර ඒ විධියට කර ගෙන යනවා. සේවකයන්ගේ කිසි ප්‍රශ්නයක් නැහැ.

අපේ සංස්ථාවේ turn over එකෙන් සේවකයන්ගේ පඩිනඩි සඳහා වියදම් වන්නේ සියයට 3යි. සේවකයන්ගේ පඩිනඩි ගැන මහා උද්ඝෝෂණයක් කරනවා. [බාධා කිරීමක්] ඔව්. ඊර්ෂ්‍යාවටයි එහෙම කරන්නේ.

එක්සත් ජාතික පක්ෂ රජය කාලයේදී ජනතාවට විදුලිය ලබා දුන්නාය කියා කෙහෙළිය රඹුක්වැල්ල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. 1977දී ඒ අය මේ රටේ පාලනය භාර ගන්නා විට විදුලිය සපයා තිබුනේ සියයට 9කට පමණක් බව එතුමා කිව්වා. මම මේ ගණන් ගැන සොයා බැලුවේ නැහැ. එතුමාට කිවූ ගණනමයි මම කියන්නේ. එක්සත් ජාතික පක්ෂයේ අවුරුදු 17ක් පාලන කාලය තුළදී සියයට 9ක්ව තිබුණු එක සියයට 39 දක්වා සියයට 30කින් වැඩි කර තිබෙනවාය කිව්වා. අවුරුදු 17ක් තුළ සියයට 30යි. එතුමාගේ ගණන්වලිනුයි මම මේ කියන්නේ. මගේ ගණන්වලින් නොවෙයි. නමුත් මේ අවුරුදු පහ තුළ - හය නොවෙයි - ගරු සභාපතිතුමනි, ඒ සියයට 39, සියයට 60 දක්වා වර්ධනය කරන්න අපට පුළුවන් වී තිබෙනවා. අවුරුදු පහකට සියයට 21යි; අවුරුදු දහහතකට සියයට 30යි. එතුමා පැහැදිලි අවබෝධයකින් ඒ ගැන කිව්වාද කියා මම දන්නේ නැහැ. තවත් කාරණයක් ප්‍රකාශ කළා. ඒ කාලයේදී විදුලිය දුන්නේ නගරවලටය කිව්වා. නගරවලට විදුලිය ඇද ගෙන ගියේ අහසින් වෙන්න ඇති. එක් නගරයක සිට තවත් නගරයකට යන විට මහ පාර දිගේ ගියේ නැත්නම් කෙළින්ම යන්න පුළුවන්ද? මහදී දෙන්න බැහැනේ. එහෙම නම් අහසින් යන්න ඇති. ඒ නිසා තේරුමක් නැතිව කළ ඒ ප්‍රකාශය අපට පිළිගන්න බැරි බව මා කියනවා.

තවත් කාරණා කිහිපයක් තිබෙනවා. විදුලිබල මණ්ඩලය පෞද්ගලිකකරණය කරන්න යනවාය කියා සමහරුන්ගේ අදහසක් තිබුණා. එවැනි කිසිම අදහසක් නැති බව මා කියන්න කැමැතියි. පෞද්ගලිකකරණය කරන්නේ නැහැ. නමුත් එය කොටස් වශයෙන් බෙද ගෙන යන බව මේ අවස්ථාවේදී මම කියන්නට ඕනෑ. Unbinding it, restructuring it, ඒ නිසා ඒ කාර්යය කරනවා මිසක්, පෞද්ගලිකකරණය කරන්න කිසි අදහසක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. රජයේ එවැනි තීරණයක් නැති බව මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරනවා.

සභාපතිතුමා
*(தவிசாளர் அவர்கள்)*
(The Chairman)

ගරු ඇමතිතුමා කාලය අවසානයි. කරුණාකර, කථාව අවසන් කරන්න.

ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා
*(மாண்புமிகு ஜெனரல் அனுருத்த ரத்வத்தே)*
(The Hon. General Anuruddha Ratwatte)

මේ සියලු දෙනාටම නැවත වරක් මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

"320 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,04,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

320 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 වන වැඩ සටහන.– සිවිල් පරිපාලනය – මූලධන වියදම,
රු. 17,00,000

"320 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 17,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

320 වන ශීර්ෂයෙහි 1 වන වැඩසටහන, මූලධන වියදම, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6 වන වැඩ සටහන.– යටිතල පහසුකම් සංවර්ධනය – පුනරාවර්තන
වියදම, රු. 69,81,94,000

"320 වන ශීර්ෂයෙහි 6 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 69,81,94,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

320 වන ශීර්ෂයෙහි 6 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6 වන වැඩ සටහන.– යටිතල පහසුකම් සංවර්ධනය – මූලධන වියදම,
රු. 16,06,93,00,000

"320 වන ශීර්ෂයෙහි 6 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 16,06,93,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

320 වන ශීර්ෂයෙහි 6 වන වැඩසටහන, මූලධන වියදම, උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

*"தலைப்பு 320, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 2,04,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 320, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

*நிகழ்ச்சித் திட்டம் 1.– சிவில் நிருவாகம் – மூலதனச் செலவு*
*ரூபா 17,00,000*

*"தலைப்பு 320, நிகழ்ச்சித் திட்டம் 1, மூலதனச் செலவுக்கான ரூபா 17,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 320, நிகழ்ச்சித் திட்டம் 1, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

*நிகழ்ச்சித் திட்டம் 6.– உட்கட்டமைப்பு அபிவிருத்தி – மீண்டுவருஞ் செலவு ரூபா 69,81,94,000*

*"தலைப்பு 320, நிகழ்ச்சித் திட்டம் 6, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 69,81,94,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 320, நிகழ்ச்சித்திட்டம் 6, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*நிகழ்ச்சித் திட்டம் 6. - உட்கட்டமைப்பு அபிவிருத்தி - மூலதனச் செலவு ரூபா 16,06,93,00,000*

*"தலைப்பு 320, நிகழ்ச்சித்திட்டம் 6, மூலதனச் செலவுக்கான ரூபா 16,06,93,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 320, நிகழ்ச்சித்திட்டம் 6, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Question, "That the sum of Rs. 20,400,000, for Head 320, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 320, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 1.– Civil Administration – Capital Expenditure, Rs. 1,700,000

Question, "That the sum of Rs. 1,700,000, for Head 320, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 320, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 6.– Infrastructure Development – Recurrent Expenditure, Rs. 698,194,000

Question, "That the sum of Rs. 698,194,000 for Head 320, Programme 6, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 320, Programme 6, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 6.– Infrastructure Development – Capital Expenditure, Rs. 16,069,300,000

Question, "That the sum of Rs.16,069,300,000, for Head 320, Programme 6, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 320, Programme 6, Capital Expenditure, ordered to stand part of the Schedule.

*එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.*

*කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2001 අප්‍රේල් 05 වන බ්‍රහස්පතින්ද.*

*நேரம் பி. ப. 6 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2001 ஏப்பிறல் 5, வியாழக்கிழமை.*

*It being 6 p.m. the Chairman left the Chair to report Progress.*

*Committee report Progress ; to sit again on Thursday 5th April, 2001.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

ගරු රත්නසිරි වික්‍රමනායක මහතා (අග්‍රාමාත්‍ය, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය)

*(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க - பிரதம அமைச்சரும் புத்தசாசன, சமய அலுவல்கள் அமைச்சரும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும்)*

(The Hon. Ratnasiri Wickramanayake – Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 'පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතුය'යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

*வினா விடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

## බෞද්ධ පුරා වස්තූන් ආරක්ෂා කර ගැනීම පිණිස සුදුසු වැඩ පිළිවෙලක්
## *பௌத்த தொல்பொருட் சின்னங்களைப் பாதுகாப்பதற்கான திட்டம்*
## SCHEME FOR PROTECTION OF BUDDHIST ARCHAEOLOGICAL MONUMENTS

[අ.භා. 6.00]

ර. මු. රත්නායක මහතා

*(திரு. ஆர். எம். ரத்நாயக்க)*

(Mr. R. M. Ratnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ දී විවාදය සඳහා පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

'ලෝක බෞද්ධ ජනතාවගේ සංස්කෘතික උරුමයක්ව පැවති ඇප්ඝනිස්ථානයේ 'බාමියන් බුදු පිළිමය ඇතුළු බුදු පිළිම විනාශ කිරීමට ඇප්ගන් තලිබාන්වරු ක්‍රියා කිරීම පිළිබඳව ලෝක බෞද්ධ ජනතාව පමණක් නොව, එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ලෝකයේ සියලුම රටවල් තම විරෝධය පළ කළද, තලිබාන්වරු එම විරෝධය ගණනකට නොගෙන එම පිළිම විනාශ කරන ලදී.

ඉදිරියේ දී ද, මෙවැනි තත්ත්වයක් ඇතිවීම වළක්වා ගැනීම පිණිස ලෝක බෞද්ධ රටවල නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ලෝක බෞද්ධ සම්මේලනයක් ශ්‍රී ලංකාව තුළ වහා පැවැත්වීමට කටයුතු කර, මෙවැනි බෞද්ධ පුරා වස්තූන් ආරක්ෂා කර ගැනීම පිණිස සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීමට වහා කටයුතු කිරීම සුදුසු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි.'

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමානයේ ඇෆ්ඝනිස්ථානය ලෙස භාවිතා කරන මෙම දේශය පුරාණයේ වයඹ දිග ඉන්දියානු රාජ්‍යයක් ලෙස ප්‍රකටව පැවැතිනි. ගාන්ධාර් දේශය ලෙස මෙය හඳුන්වන්නේය. මෙම දේශය හා ඇඳුණු තවත් මෙවැනිම ප්‍රදේශ වයඹ දිග ඉන්දියාවේ එමට පවතී. ඇෆ්ඝනිස්ථානයේ උතුරු මැද කොටසේ පෞරාණික නගරයක් වශයෙන් පවතින මෙම නගරය මුල් කරගෙන තවත් ක්ෂේම භූමි නගර ලෙස බාමියාන්, කැෂ්ගාර්, කුර්ෂාන්, හාමී, කුචා, යාර්කාන්ඩ්, ලොටාන්, මීරාන්, දන්ඩන් උලීක්, නියා. සවර් කාන්ඩ්, කරාශාර් බල්ක්, කාබුල් ආදී විශාල ප්‍රදේශයක් මේ ආකාරයට සම්බන්ධ වෙලා තිබෙනවා.

වැලිකඳු, ගිරිශිඛර, නිසරු බිම්වලින් ගැවසී මධ්‍ය ආසියාතුකරයේ පිහිටි නැගෙනහිර ආසියාව, අග්නිදිග ආසියාව, මධ්‍යම ආසියාව ආදියට අයත් රටවල් අන්තර් ශිෂ්ටාචාරය වර්ධනය වීමට තුඩුදුන් ආගමික හා වාණිජමය සංසිද්ධීන්වල මංපෙත් එළිපෙහෙලි කර ලොවට අයත් ඉපැරණි සංස්කෘතික දායාදයන් මෙම ප්‍රදේශය තුළින් නිර්මාණය වී ඇත. චීනයේ සිට යුරෝපයට යන සේද පාර – Silk Road – වැටී ඇත්තේ මෙම කොටසේය.

මෙම පෙදෙස් පුරාවිද්‍යාත්මකව සලකා බැලීමේදී ඉතිහාසඥයකු වූ මොහොමඩ් අල්මේරූනි ප්‍රකාශ කරන්නේ, පර්සියාව, ඉරාකය, සිරියාව, චීන ප්‍රදේශය බෞද්ධ රාජ්‍යයන් ලෙස පැවතී බවයි. වර්තමාන පුරාවිද්‍යාඥයන් ප්‍රකාශ කරන්නේ ඇෆ්ඝනිස්ථානයේ නැතහොත් ගන්ධාර් ප්‍රදේශයේ මුල් පදිංචිකරුවන් ඉන්දු ග්‍රීකයන් බවත් ඇලෙක්සැන්ඩර්ගේ ආගමනයෙන් පසු පදිංචි වූ බවත්ය. නමුත් බුදු සමයේ කපිල වස්තු නගරයේ විඩූඹභ විසින් එවන ලද ශාක්‍යවංශිකයන්ගේ ඝාතනයෙන් පසු පලා ආ ශාක්‍යවංශික පිරිසක් උද්‍යාන නැතහොත් ජලාලබාද් ප්‍රදේශයේ පදිංචිව සිටි බවත් හියුංසීයැං ඒ රටට යනවිට ශාක්‍යවංශික රජෙක් ඔහු පිළිගත් බවත් සඳහන් වේ. ඉන්දියානු මහාචාර්යවරයෙක් වන උපාසක මහතා මෙය සඳහන් කරයි.

නමුත් ථෙරවාදී බුදු දහම තුළ ප්‍රතිමා නිර්මාණය නොකළ අශෝක රජුගෙන් පසු කුෂාන ආධිපත්‍යයට යටත් වූ වයඹ දිග ඉන්දියාවේ කණිෂ්ඨ රජ පරම්පරාව යටතේ විශාල දගැබ්, විහාර, ආරාම, සංඝාවාස දිගින් හා උසින් ප්‍රතිමා නිර්මාණය වී බෞද්ධ පුනර්ජීවයන් ලැබී ඇත. තවමත් බාමියාන් ප්‍රදේශයේ කියවීමට නොහැකි වූ සෙල්ලිපි විශාල ප්‍රමාණයක් ඇති බව පුරාවිද්‍යාඥයන් සඳහන් කරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකල භික්ෂූන් සඳහා ආරාම කුටි 4000ක් පමණ වූ බව පාහියන් භික්ෂු සඳහන් කරයි. අලංකාර රන්, රිදී, කැටයම් සහිත ආරාමයක් අඩි 250 උසට නිර්මාණය කිරීමට වසර 80ක කාලයක් ගතවූ බව සඳහන් කරයි. ඇෆ්ඝනිස්ථානයේ ගවේෂණ කටයුතු කළ අබ්දුල් පසල් කියන පරිදි ගුහා 12,000ක් තිබුණි. එසේම බාමියාන් පෙදෙස් බුදු දහම ප්‍රචාරය කිරීම සඳහා මධ්‍යස්ථානයක් ලෙස 7 වන සියවස දක්වාම තිබූ බව සඳහන් කර ඇත. ගෝතමී නම් විහාරයක් තිබූ බවත් එහි මයායාන ධර්මය ඉගැන්වූ බවත් එහි ප්‍රධානියා බුද්ධසේන පඬිවරයා බවත් ඉන්දියානු හා චීන් ශිෂ්‍යයන් එහි ඉගෙන ගත් බවත් පාහියන් භික්ෂුව සඳහන් කරයි. බාමියන් පිළිබඳව වාර්තාවක් ප්‍රථමවරට ලෝකයා අතට පත් වුණේ ක්‍රි.ව. 630 හියුංසාං වාර්තාවෙනි. හිටි පිළිමය අඩි 173ක්ද අනික් පිළිමය අඩි 120ක්ද පමණ වේ. මෙම පිළිම දෙක අතර පරතරය සැතපුම් එකක් පමණ වේ.

නබිතුමාගේ අභාවයෙන් පසු දෙවැනි කලීෆා උමර් (රලි) නමැත්තා ක්‍රිස්තු වර්ෂ 632දී ආරම්භ කරන ලද මිත්‍යා දෘෂ්ටිකයන් නැසීමේ ඉස්ලාමීය ප්‍රතිපත්තිය මධ්‍යයේ මධ්‍යම ආසියාවේ ඉරානය, ඉරාකය, තුර්කිය හා උතුරු අප්‍රිකානු රටවල් විනාශ කරගෙන අෆ්ඝනිස්ථානයද ආක්‍රමණය කොට ක්‍රිස්තු වර්ෂ 8දී බාමියාන් පාලකයා පමණක් නොව බෞද්ධ භික්ෂූන් වහන්සේලාද මුස්ලිම් ආගමට හරවා ගන්නා ලදී. විහාර, ආරාම විනාශ කොට ඒ මත මුස්ලිම් දේවස්ථාන ඉදිකොට ඇත. මුස්ලිම් ආගම වැළඳ නොගන්නා ලද ජනයා සතුරන් සේ සලකා ඔවුන් සංහාරය කර ඇත.

ලක්ෂ ගණනක් වෙනත් රටවලට පැන ගිය බවත්, ක්‍රිස්තු වර්ෂ 1222දී ජේංගිස් ඛාන් විසින් දරුණු ජන සංහාරයක් කොට, ඇෆ්ඝනිස්ථානය මුළුමනින්ම මුස්ලිම් රාජ්‍යයක් බවට පත් කර ගන්නා ලද බවත් සඳහන්ව ඇත.

මෙම බාමියාන් බුද්ධ ප්‍රතිමා විනාශ කිරීමට වගකිව යුත්තේ තලෙයිබාන්වරු පමණක් වුවද දීර්ඝකාලීනව බැලීමේදී තලෙයිබාන්වරුන් බිහි කරන ලද්දේ පාකිස්ථානයේ හිටපු හමුද පාලක 'පෙශර්වෝර්හි' ආගමික පාසලයි.' වාර්තමාන තලෙයිබාන් රූකඩ නායකයා වන මොහොමඩ් ඔමාර් පවසන්නේ තම රටේ වැඩවලට කවුරුත් ඇඟිලි නොගැසිය යුතු බවයි.

2001 අප්‍රේල් මාසයේ 1 වන ද 'සිළුමිණ' පත්‍රයේ ඉතා වැදගත් ලිපියක් පළ වී තිබෙනවා. එහි මේ විධියට සඳහන් වෙනවා.

'තලිබාන්වරුන්ගේ නීච ක්‍රියා ඉස්ලාමය අනුමත කරන්නේ ද?'

ඒ ලිපිය ලියා තිබෙන්නේ අල්හාජ් එම්. එච්. එම්. ෂම්ස්. එතුමා මෙහෙම කියනවා.

'ඉස්ලාමීය පැරණි සමාජ සංස්කෘතික පදනම සියයට සියයක්ම පිළිපදින්නට වෙර දරන පිරිසක් නවීන යුගයට එරෙහිව, පැරනි ගෝත්‍රික සංකල්පයෙන් ඉස්ලාමය දෙස බලන පිරිසකි. අනුන් විනාශ කරන අතර තමාද මෙයින් විනාශයට පත්වනු නිසැකය.'

එපමණක් නොවෙයි, අද පාකිස්ථානයට අයත් ප්‍රදේශයක පිහිටි නාලන්ද මහා බෞද්ධ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් 12,000ක් පමණ සිටියා. ගුරුවරුන් 1,000ක් පමණ සිටියා. අද එය විනාශ කර දමා තිබෙනවා. සාංචි තොරණ මත තිබුණු ධර්ම චක්‍රය විනාශ කර දමා තිබෙනවා. ඒ මත චන්ද්‍ර ලාංඡනය තබා තිබෙනවා. බංගලාදේශයේ චිතගොන් කඳුකරයේ වසන බෞද්ධයන් දිනපතා අනේක වධ හිංසාවලට ලක් කරනවා. ඉන්දුනීසියාවේ බොරෝබුදර් විහාරයට බෝම්බ ගසා තිබෙනවා. තායිලන්තයේ දකුණු කොටස මුස්ලිම් රටක් කිරීමට කටයුතු කර ගෙන යනවා. ලාඕසය, කාම්බෝජය, වියැටය යන රටවල් ඇමෙරිකානු සංස්කෘතියට ගිල ගනිමින් තිබෙනවා. බෞද්ධ රටක් වූ වියට්නාමයේ බෞද්ධයන් ලක්ෂ ගණනක් මරා දමා, සංස්කෘතිය කෙලසා දමා විනාශ කර තිබෙනවා. පැරණි රාමඤ්ඤ දේශය බුරුමයෙන් වෙන් කර ගැනීමට ඇමෙරිකාව දනට ක්‍රියා කරගෙන යනවා.

දකුණු කොරියාවේ පැරණි වෙහෙර විහාරස්ථාන කඩා බිඳ දමමින්, ගිනි තබමින් මහා සංහාරයක් ආරම්භ කර තිබෙනවා. මහාචාර්ය ෆ්‍රැන්ක් සදෙස්ටෝ වාර්තා කර ඇති පරිදි බුද්ධ ප්‍රතිමා 750ක හිස් කඩා දමා තිබෙනවා. මුස්ලිම් මූලධර්මවාදී ආගමික නිකායයන් සහ ක්‍රිස්තියානි මූලධර්මවාදී නිකායයන් නොයෙක් විදේශ රටවලින් ලැබෙන ආධාරවලින් සංවිධාන අටවා ගෙන ශ්‍රී ලංකාවේද දිළිඳු බෞද්ධයන් ඒ ආගම්වලට හරවා ගැනීමේ උත්සාහයක්ද තිබෙන බව මෙහිදී අමතක කළ යුතු නොවේ.

ලෝකයේ සියලුම බෞද්ධ ආගමික නායකයන් එකට එක්ව යම් සම්මුතියකට එළඹීමට කාලය දැනටමත් ප්‍රමාද වැඩි බව පවසමින්, මෙම භාරධූර කාර්යය ඉටු කිරීමට බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය, අග්‍රාමාත්‍ය ගරු රත්නසිරි වික්‍රමනායක මහතාට ප්‍රඥව පහළ වේවා, ධෛර්යය ලැබේවාය කියා පතමින්, එතුමා මේ සම්බන්ධව පකිස්ථානයට ගොස් එහි නායකයන් සමඟ සාකච්ඡා කිරීම සම්බන්ධව එතුමාට ස්තුතිය පළ කරමින්, විපක්ෂය සහ රජය එක්ව මේ සම්බන්ධව ක්‍රියා කිරීමට වහාම කමිටුවක් පත් කරන මෙන් ඉල්ලා සිටිමින්, දේශීය වශයෙන් සිදු වන නිදන් වස්තු සෙවීම සඳහා බුදු පිළිම කැඩීම, බෞද්ධ දිළිඳු පවුල් මුදල් ආධාර මත අන්‍ය ආගම්වලට හැරවීම සඳහා කරගෙන යන විදේශ බලපෑම් නතර කර ලීමට බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය වහාම කඩිනම් වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතු බව සඳහන් කරමින්, මෙම යෝජනාවට තමුන්නාන්සේලාගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

[අ. භා. 6.05]

**සුරනිමල් රාජපක්ෂ මහතා**
*(திரு. சுரனிமல் ராஜபக்ஷ)*
**(Mr. Suranimal Rajapakse)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ර. මු. රත්නායක ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මම ස්ථිර කරනවා. තලේබාන්වරුන් ඇප්ගනිස්ථානයේ පමණක් නොවෙයි, ශ්‍රී ලංකාවේත් බිහිවෙමින් පවතිනවා. ඊයේ මධ්‍යම රාත්‍රී 10 පමණ, මීට වර්ෂ 30කට කලින් වේල්ස් කුමාරයා ලංකාවට පැමිණි අවස්ථාවේදී සිහිවටනයක් වශයෙන් පූංචි බොරැල්ලේ ඉදි කළ බෞද්ධ මධ්‍යස්ථානය, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් විනාශ කිරීම පිළිබඳව ලංකාවේ ජීවත් වන බහුතරයක් වූ සිංහල බෞද්ධ ජනතාව, ලංකාවේ ජීවත් වන තලේබාන්වරුන්ට සිය විරෝධය ප්‍රකාශ කරනවා. [බාධා කිරීම්]

එපමණක් නොවෙයි, ආනමඩුව ප්‍රදේශයේ මරියාගම ඉදි කරන ලද බුදු පිළිමයද 2001.03.17 වැනි දින පොදු පෙරමුණේ එක්තරා දේශපාලඥයකු විසින් විනාශ කර දමා තිබෙනවා. ඒ වාගේම නවවත්තේගම, රුපියල් කෝටි 150කට වඩා වටිනා හිටි බුදු පිළිමය සොරා ගෙන ගොස් තිබෙන බව පුරා විද්‍යාඥයා සඳහන් කර තිබෙනවා. පූංචි බොරැල්ලේ එම බෞද්ධ මධ්‍යස්ථානය පමණක් නොවෙයි, ඊළඟට පිටකොටුවේ බෞද්ධ මධ්‍යස්ථානයත්, ඊළඟට බොරැල්ලේ බෞද්ධ මධ්‍යස්ථානයත්, ලංකාවේ අනිකුත් බෞද්ධ මධ්‍යස්ථානත් මේ ආකාරයට විනාශ කරන්නට පියවර ගත්තොත් ලංකාවේ බෞද්ධගාමට සිදු වන්නේ කුමක්ද ? ගරු අග්‍රාමාත්‍යතුමා ලංකාවේ බෞද්ධ ජනතාව වෙනුවෙන් පකිස්ථානයට ගිහිල්ලා ඇෆ්ගනිස්ථානයේ ඒ බුදු පිළිම ආරක්ෂා කර ගන්නට ගත්ත වෙහෙස අනුවම හෙට උදේ පාන්දරින්ම පූංචි බොරැල්ලට ගිහිල්ලා ඒ බෞද්ධ මධ්‍යස්ථානය ආරක්ෂා කර දෙන්නට පියවර ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එද ඒ සුණුවිසුණු කරන ලද බුද්ධ මධ්‍යස්ථානයේ කොටසක් තමයි, අද මම මේ සභාවට ඉදිරිපත් කරන්නේ. මේක පුස්තකාලයේ තියන්න, ඉතිහාසයට එකතු වෙන්න. මේ විධියේ බෞද්ධ විරෝධී ක්‍රියාදමයන් ඇති කරන්නේ, ඒ විධියේ තත්ත්වයකට පත් වෙලා තියෙන්නේ, නාගරික සංවර්ධන ඇමතිතුමාට දෙවියන්ගේ භාල් කැවිලාද කියන්න මම දන්නේ නැහැ. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඒ ස්ථානයට ගියා. එතුමා අසීරු තත්ත්වයකට පත් වුණා. මහින්ද රාජපක්ෂ ඇමතිතුමා එම ස්ථානයට ගියා. එතුමා අසීරු තත්ත්වයකට පත් වුණා. [බාධා කිරීම්] මෙන්න මෙවැනි තත්ත්වයක් තමයි – [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

සුරනිමල රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා, මම කියන දේටත් පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා දැන් කථාව අවසාන කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සුරනිමල් රාජපක්ෂ මහතා
*(திரு. சுரனிமல் ராஜபக்ஷ)*
(Mr. Suranimal Rajapakse)

ඔබතුමාට සභාව පාලනය කර ගන්න බැරි වුණේ, කටහඬ කාගේද කියලා තීරණය කර ගන්න බැරි වුණ නිසයි. කරුණාකරලා, බෞද්ධ සිද්ධස්ථාන කඩා බිඳ දැමීම, සුණුවිසුණු කිරීම නවත්වන්නය කියලා අපි රජයෙන් ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

ඔබතුමාට මට ආරාධනා කරනවා. සභාව පාලනය කරන්න පුළුවන් නම් ඇවිත් පාලනය කරන්නය කියා.

[අ. භා. 6.09]

ගරු මංගල සමරවීර මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ මහජන උපයෝගිතා අමාත්‍යතුමා)
*(மாண்புமிகு மங்கள சமரவீர - நகர அபிவிருத்தி, நிருமாணத்துறை, பொதுப் பயன்பாடுகள் அமைச்சர்)*
(The Hon. Mangala Samaraweera – Minister of Urban Development, Construction and Public Utilities)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී මේ සාකච්ඡාවට සහභාගි වීමට බලාපොරොත්තු නොවුණත් ගම්පහ දිස්ත්‍රික්කයේ සුරනිමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා කිව්ව කාරණා ගැන මම ඉතා කෙටියෙන් කියන්න කැමැතියි. විශේෂයෙන්ම මම එතුමාට මුලින්ම කියන්න ඕනෑ සභාවක් පාලනය කිරීම මහර ආසනයේ හොර ඡන්ද දැම්ම තරම් පහසු නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාගරික සංවර්ධන කඩිනම් වැඩ පිළිවෙළේ එක් අංශයක් හැටියට අප විශේෂයෙන්ම කොළඹ නගරයේ ශීඝ්‍ර සංවර්ධනය සඳහා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ වැඩ පිළිවෙළ ඉතාමත් සාර්ථකව ඉදිරියට යන මොහොතක, විශේෂයෙන්ම ඒ අනවසර ඉදි කිරීම් තුළින් පාතාල ලෝකය සහ පාතාල ලෝකයට අනුග්‍රහය දක්වන දේශපාලනඥයන් තමන්ගේ ආදායම් මාර්ග අඩු වීම සම්බන්ධයෙන් වියරු වැටී සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කියන්න යන කාරණය එදත් කිව්වා. අප ගිය මාසයේ කොළඹ කොටුවේ ඔල්කොට් මාවතේ අනවසර ඉදි කිරීම් 868ක් ඉවත් කළා. මම ගිය වතාවේ වැරදි දෙයක් කිව්වා. එනම් මම කිව්වා ඒ එක කඩයකින් මාසයකට රුපියල් දහ ගණනේ දෙනවාය, කියලා. ඒ අය මට කිව්වා මාසයකට නොවෙයි දිනකට රුපියල් දහක් කොළඹ පාතාලයට ලබා දුන්නාය කියා. ඒ අනුව දවසකට කොටුවේ ඔල්කොට් පාරෙන් විතරක් රු. 8,60,000ක් අවම වශයෙන් පාතාල ලෝකයේ උදවිය ලබා ගන්නා. ඒ පසුබිම යටතේ තමයි, ඊයේ පුංචි බොරැල්ලේ සිදු වුණ සිද්ධියත් බලන්න ඕනෑ.

අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමේ තවත් අධියරයක් හැටියට කොළඹ පුංචි බොරැල්ලේ බෝධිය අවට තිබුණු අනවසර ඉදි කිරීම් අප ඉවත් කළා. ඇත්ත වශයෙන්ම නීත්‍යානුකූලව කරන කටයුත්තක් හැටියට 2001 මාර්තු 15 වැනි ද කොළඹ මහ නගර සභාව විසින් – Deputy Municipal Commissioner වාස් ගුණවර්ධන මහතා විසින් - 'දින 14ක් ඇතුළත අයින් කර ගන්න' ය කියන ලිපිය යවා තිබෙනවා. මම එය සභාගත* කරනවා. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කර ඊයේ අවට තිබුණු ගොඩනැගිලි ඉවත් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙතැනදී වගකීමෙන් කියන්න ඕනෑ ඒ ප්‍රදේශවල සිටින විශාල පිරිස් මෙම ස්ථානය පිළිබඳව ලිපි එව්ව බව. ඒවා හොර ලිපි නොවෙයි, Anonymous ලිපි නොවෙයි. කොළඹ 9, දෙමටගොඩ පදිංචි ඒකනායක යන අය ලිපියක් එවා තිබෙනවා. මේ වගේ ලිපි ගොඩක් තිබෙනවා. 'මෙය මුළු පාරත් අල්ලා ගෙන දැන් වර්ධනය වෙනවා. ඒක නවත්වන්න ඕනෑ. අප නම් බෝධිය තිබෙනවාට කැමැතියි. නමුත් අනෙක් ගොඩනැගිලි තිබෙනවාට අකමැතියි' කියන අදහසයි එම ලිපිවල සඳහන් වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට සම්බන්ධ සමරනායක කියන පුද්ගලයකු මෙහි පොඩි ඔෆිස් එකක් දමා ගෙන හිටියා. ඔහු තමන්ගේ ජේපීකම පාවිච්චි කර එල්ටීටීඊ එකට හොර පාස් පෝට් සැපයූ චෝදනාව උඩ ජේපීකමත් අහෝසි වෙලා හිරේ හිටියා.

අප ඉතා හොඳ බෞද්ධයෝ. මේ කතා කරන අය වගේ නොවෙයි. පත්තරවල සඳහන් නොකළාට අප උදේ බුදුන් වැඳලා පාර්ලිමේන්තුවට එන මිනිස්සු. නමුත් බුදු රජාණන් වහන්සේගේ නම විකුණලා ඉතාමත්ම පහත් නින්දනීය, පාතාල ලෝකයේ කටයුතු ගෙන යෑම සම්බන්ධයෙන් අප විරුද්ධයි. අන්න ඒ නිසා තමයි, අප ඒවා ඉවත් කළේ. ඉවත් කරන ඉස්සෙල්ලා අප ඒ සඳහා සැලසුම් හදලා තිබුණා. පුංචි බොරැල්ලේ ඒ ප්‍රදේශයේ අපේ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමා ඇතුළු නාගරික මන්ත්‍රීවරුන්ට අප කියා තිබුණා, 'භය වන්න එපා. මෙතැන සිටින පාතාල ලෝකය අප මෙතැනින් අයින් කරන්නම්. ඊට පස්සේ ඉතාමත්ම හොඳ - රනින් නොවෙයි - වැටක් ගහලා, හොඳ බෝධියක් හදලා ඒක අප ජනතාවට භාර දෙනවා 'ය කියා. එතැන තිබූ බුදු පිළිමයට කිසිම ප්‍රශ්නයක් වෙලා නැහැ. මෙය සම්පූර්ණයෙන් සභාව නොමඟ යැවීමක්. ඒ පැරණි බුදු පිළිමය ඒ ආකාරයටම තිබෙනවා. චෛත්‍ය තිබෙනවා. එය වටේ තිබෙන ගොඩනැගිල්ල පමණයි කැඩුවේ. අප ඒක හොඳට හදලා දෙනවා. ඊට අමතරව නව බුදු පිළිමයක් තිබුණා. ඒ බුදු පිළිමය ගෙනල්ලා තිබුණේ ඊයේ හවසයි. ඊයේ හවස තමයි ව්‍යාජ පාස් පෝට් විකිණූ කොටසේ එම අලුත් බුදු පිළිමය ගෙනල්ලා තබා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කුඩු විකුණන හැම කඩයකම බුදු පිළිමයක් තබා තිබෙනවා නම් ඒ නීති විරෝධී ජාවාරමට ඉඩ දෙන්න වෙනවා නේ. බුදු පිළිමය නිසා ඒ ජාවාරම අල්ලන්නත් බැහැ; එතැනට යන්නත් බැහැ. 'අපෝ, බුදු පිළිමය තිබෙනවා' කියා ඒ වැඩේ කර ගෙන යන්න දෙන්න වෙනවා. අප මොකක්ද කළේ? මෙම සිද්ධියේදී අප විශේෂයෙන්ම පොලිසියට ස්තුතිවන්ත වෙනවා. අපි ඒ අයට උපදෙස් දුන්නා, ඒ බුදු පිළිමය සුරක්ෂිතව ගෙනැවිත් නාගරික සංවර්ධන අධිකාරියේ තාවකාලිකව තැන්පත් කරන්නය කියා. මොකද, එහෙම නැත්නම් අපි ගියාට පස්සේ ඒක කුඩු කරලා, අර මන්ත්‍රීවරයා බොරුවට පෙන්වූවා වාගේ, අන්න බුදු පිළිම කුඩු කළාය කියා කියන්නට පුළුවන්. ඒ බුදු පිළිමය අංග සම්පූර්ණව ආරක්ෂිතව තිබෙනවා. ඉතා ඉක්මනින් අපි මේ බෝධිය පිළිබඳව කළයුතු දේ නිමකර එය ඒ අයට භාර දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සැබෑ තත්ත්වය මේකයි. අපි කනගාටු වෙනවා, ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමා ගැන. එතුමා හොඳ කතෝලිකයෙක්. හැබැයි, අද බෞද්ධාගම වෙනුවෙන් හොඳට පෙළපාළි ගියා. බොහෝම හොඳයි.

වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා
*(வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)*
(Dr. Jayalath Jayawardene)

I rise to a point of Order.

ඇමතිතුමා මගේ නම සඳහන් කරන්නට එපා.

ගරු මංගල සමරවීර මහතා
*(மாண்புமிகு மங்கள சமரவீர)*
(The Hon. Mangala Samaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, that is not a point of Order. [බාධා කිරීමක්] ඉතින් අද ගියා නේ.

වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා
*(வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)*
(Dr. Jayalath Jayawardene)

මගේ නම සඳහන් කරන්නට එපා.

ගරු මංගල සමරවීර මහතා
*(மாண்புமிகு மங்கள சமரவீர)*
(The Hon. Mangala Samaraweera)

බොහෝම හොඳයි.අපි ඔබතුමාට වඩා ආගම් වලට ගරු කරනවා. එම නිසා තමයි, කුඩුකාරයෝද, පාතාල ලෝකයද අපේ බුදුරජාණන් වහන්සේගේ නම විකුණාගෙන කනවාට අපි අකමැති. අපි ඒවාට ඉඩ දෙන්නේ නැහැ. අපි බොරු දේශපාලනය කරන්නට ඉඩ දෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. [බාධා කිරීමක්]

---

*කථාව අවසානයේ පළ කර ඇත.
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Reproduced at end of speach.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
දෙපැත්තේම අය වාඩිවෙන්න.

ගරු මංගල සමරවීර මහතා
*(மாண்புமிகு மங்கள சமரவீர)*
(The Hon. Mangala Samaraweera)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා බුද්ධ ශාසන ඇමතිතුමා හැටියට ඔබතුමා මේ පිළිබඳව, මොකක්ද සිද්ධ වුණේ කියා පරීක්ෂණයක් පවත්වන්න කියා මම ඉල්ලනවා. අපි හෙට උදේ සිටම වැඩ ආරම්භ කර බෞද්ධයින් හැටියට අපි සියලු දෙනාටම ආඩම්බර විය හැකි පාතාල ලෝකයෙන් තොර බෝධියක් ඉතාමත්ම ඉක්මනින් පුංචි බොරැල්ලේ හදන්නට පටන් ගන්නවාය කියා අවසාන වශයෙන් මම කියනවා. ස්තුතියි.

**සභාමේසය මත තබන ලද ලිපිය :*
*சபாபீடத்தில் வைக்கப்பட்ட கடிதம் :*
*Letter tabled :*

භාරකරු(ආගමික ස්ථානය) පුංචි බොරැල්ල බෝධිය
ආනන්ද රාජකරුණා මාවත(බෝධිරාජ විහාරය)
පුංචිබොරැල්ල හන්දිය

1957 අංක 15 දරන මහ නගර සභා(සංශෝධිත) පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත වූ මහ නගර සභා ආඥා පනතේ 43 අ (1) (1980 සංශෝධිත මුද්‍රණයේ 42 අ (1) ) වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි.

විධිමත් ආකාරයට කොළඹ මහ නගර සභාවෙන් ලබාගත් අවසරයක් නොමැතිව මහ නගර සභාව සතු ඉඩමේ පදික වේදිකාවේ/ මාර්ග රක්ෂිතයේ /රජයේ ඉඩමේ ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් මෙම දැන්වීම ලැබී දින 14ක් ඇතුලත කඩා ඉවත් කරන ලෙස 1957 අංක 15 දරන මහ නගර සභා (සංශෝධිත) ආඥා පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත මහ නගර සභා ආඥා පනතේ 43 අ (1) වගන්තිය (1980 සංශෝධිත මුද්‍රණයේ 42 අ (1) වගන්තිය) යටතේ ඔබට මෙයින් දන්වා සිටිනු ලැබේ.

මෙම දැන්වීම පරිදි ක්‍රියා කිරීමට ඔබ අපොහොසත් වූවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් නැවත දැනුම් දීමකින් තොරව ඉහත සඳහන් ස්ථානයේ අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමටත් ඒ සඳහා දරණු ලබන වියදම් ඔබගෙන් අයකර ගැනීමටත් ක්‍රියා කරන බව තව දුරටත් දන්වා සිටිනු ලැබේ.

ඉහත 43අ (1) (1980 සංශෝධිත මුද්‍රණයේ
42අ (1) වගන්තිය යටතේ වයථා පරිදි බලය පවරනු
ලැබූ නිළධාරි

A. P. P. N. VAZ GONAWARDHANA,
Deputy Municipal Commissioner,
(Engineering Services)
Colombo Municipal Council.

[අ. භා. 6.15]

විමල් වීරවංශ මහතා
*(திரு. விமல் வீரவங்ச)*
(Mr. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පළමුවෙන්ම සඳහන් කළ යුතුයි, ඇප්ඝනිස්ථානයේ තලේබාන් මූලධර්මවාදීන් විසින් ඉපැරණි බෞද්ධ බුදුපිළිම විශාල ප්‍රමාණයක් විනාශයට ලක් කිරීම පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කරන විට තලේබාන්වරුන් කියන්නේ කවුද කියා මුලින්ම පැහැදිලි කර ගත යුතු බව. ඇමරිකානු එක්සත් ජනපද රාජ්‍යය, ඇප්ගනිස්ථානයේ තිබිච්ච සෝවියට් කඳවුරට පක්ෂපාතී ආණ්ඩුව පරාජයට පත් කර ඊට ප්‍රතිවිරුද්ධව හදපු කල්ලිය තමයි, මූලධර්මවාදී තලේබාන්වරු කියා කියන්නේ. ඒ අයට යුද අවි දීලා, ඒ අය සතුටු කරලා ගොඩනැගූ මූලධර්මවාදය නිසා තමයි, ලෝකයේ බෞද්ධාගමිකයන් පමණක් නොවෙයි, සෙසු සියලු ආගමික ජනයාත්, ආගමක් ඇදහුවේ නැතත් මිනිස් ඉතිහාසයට ගරු කරන ඕනෑම කෙනකු වුව පිළිගන්නා විශාල නිර්මාණයක් අද අහිමි වී තිබෙන්නේ. දැන් ලංකාවේ දළදා මාළිගාව වගේ ස්ථානයක් නම් ලෝක උරුමයක් හැටියට නම් කර තිබෙනවා. නමුත් ඇප්ගනිස්ථානයේ ඒ බෞද්ධ පිළිම, ඒ මහා නිර්මාණයන් ලෝක උරුමයන් හැටියට නම් කර තිබුණේ නැහැ. ඒකත් බලපෑවා, මේ ඇතිවෙන්නට තිබුණු විනාශය වළක්වා ගැනීම සඳහා විශාල බාධාවක් හැටියට. එම නිසා අපි විශ්වාස කරනවා, මෙතැනින් එහාට මොන ආගමකට අයත් වුණත්, මිනිස් ශිෂ්ටාචාරයේ සහ මිනිස් ඉතිහාසයේ මහා යුගයක් සංකේතවත් කරන ඕනෑම ආගමික උරුමයන්, ලෝක උරුමයන් හැටියට සැලකිල්ලට ලක් කර ආරක්‍ෂා කළයුතුය කියා. එසේ ආරක්ෂා කරන ක්‍රියා පටිපාටියක් ලෝක පරිමාණයෙන් ආරම්භ විය යුතුයි, ඒ සඳහා ලංකාව හැටියට මේ රට පාලනය කරන උදවියට කරන්නට පුළුවන් බලපෑම සිදු කළ යුතුයි කියන අදහස අපි දරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අතරම පුංචිබොරැල්ල සිද්ධිය සම්බන්ධයෙන් මූලික අදහසක් ඉදිරිපත් කරන්නට වෙනවා. දැනට නොබෝ වෙලාවකට කලින් මමත් එම ස්ථානයට ගියා. ගරු නාගරික සංවර්ධන ඇමතිතුමා පවසන විධියට විනාශ වී තිබෙන්නේ තාප්පය පමණක් නොවෙයි අපි දන්නවා, ඒ තාප්පය මෑත කාලයේ ඉදි කළ තාප්පයක් බව.

ගරු මංගල සමරවීර මහතා
*(மாண்புமிகு மங்கள சமரவீர)*
(The Hon. Mangala Samaraweera)
ගොඩනැගිලි

විමල් වීරවංශ මහතා
*(திரு. விமல் வீரவங்ச)*
(Mr. Wimal Weerawansa)
ඇමතිතුමා, මට විනාඩි තුනයි තිබෙන්නේ. ඒ තාප්පය පමණක් නොවෙයි. අවුරුදු 100කට ආසන්න කාලයක් තිස්සේ තිබිච්ච, ඒ බෝධිරාජයාත් එක්ක සම්බන්ධ වෙච්ච ගොඩනැගිල්ලට, ඒකට සම්බන්ධ වෙච්ච බැම්මට පවා මේ කරපු සිද්ධියෙන් හානි සිද්ධවෙලා තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
*(மாண்புமிகு மங்கள சமரவீர)*
(The Hon. Mangala Samaraweera)
බුදු පිළිමය

විමල් වීරවංශ මහතා
*(திரு. விமல் வீரவங்ச)*
(Mr. Wimal Weerawansa)
ගරු නාගරික සංවර්ධන ඇමතිතුමනි, බුදු පිළිමය තිබෙන්නේ-

ගරු මර්වින් සිල්වා මහතා
*(மாண்புமிகு மேர்வின் சில்வா)*
(The Hon. Mervyn Silva)
අවංකව කථා කරන්න. [බාධා කිරීමක්]

විමල් වීරවංශ මහතා
*(திரு. விமல் வீரவங்ச)*
(Mr. Wimal Weerawansa)
කරුණාකර ඉන්න. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
නියෝජ්‍ය ඇමතිතුමා, පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න.

විමල් වීරවංශ මහතා
*(திரு. விமல் வீரவங்ச)*
(Mr. Wimal Weerawansa)
බුදු පිළිමයට හානි පැමිණිලාය කියලා නොවෙයි, මම කියන්නේ. බෝධියත් එක්කම සම්බන්ධ වී ඇති අවුරුදු 100කට ආසන්න ගොඩනැගිල්ල-

ගරු මංගල සමරවීර මහතා
*(மாண்புமிகு மங்கள சமரவீர)*
(The Hon. Mangala Samaraweera)
බුදු පිළිමයක කැබැල්ලක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විමල් වීරවංශ මහතා
(திரு. விமல் வீரவங்ச)
(Mr. Wimal Weerawansa)

නැහැ. මම කියන්නේ බුදු පිළිමයට හානි වෙලාය කියා නොවෙයි. නමුත් ඒ අවුරුදු 100කට ආසන්න කාලයක් තිස්සේ බෝධියත් එක්ක තිබුණු, මුල්ගලත් එක්ක සම්බන්ධ වී තිබුණු බිත්තිවලට පවා ඒ කළ අපරාධයෙන් හානි සිද්ධවී තිබෙනවා. මම හිතන්නේ නැහැ, අලුත් වැටක් ඉදි කිරීමෙන් පමණක් ඒ වෙච්ච පළුද්ද නිවැරදි කරන්නට පුළුවන් වෙයි කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනිත් කරුණ තමයි, අනවසර කඩයක් කඩන එකයි, යම් ආගමික ස්ථානයක් එක්ක බැඳිච්ච දෙයක් කඩනවාය කියන එකයි අතරේ ඉතා විශාල වෙනසක් තිබෙනවා. එතැන පාතාලයේ කටයුත්තක් කෙරුණා නම් පොලීසිය ලවා තාප්පය කඩන්නට කලින්, ඒක හෙළිදරව් කර, ඒ අය අත්අඩංගුවට අරගෙන, ඒක ලෝකයට අනාවරණය කරලා, ඒ අවට ජීවත්වෙන උදවියගේත් පිළිගැනීමක් ඇතිව ඇමතිතුමාට මේක--

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ඒ අවට ජීවත්වෙන පුද්ගලයින්ගෙන් ඔබතුමා ගිහිල්ලා අහලා [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

විමල් වීරවංශ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කථා කිරීමට තිබෙන කාලය අවසානයි.

විමල් වීරවංශ මහතා
(திரு. விமல் வீரவங்ச)
(Mr. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මෙතැන සිදු වෙලා තිබෙන තාප්පය කැඩීමේදී එය අනවසර තාප්පයක් හැටියට තිබෙනවා නම් එක පැත්තකින් විශාල ජන අනුමැතියක් ඇතිවයි එය සිදුවන්නට ඕනෑ. කඩයක් කඩන එකයි, බෞද්ධ ආගමික හෝ වෙනත් ආගමික ස්ථානයක යම් කිසි ඉදිකිරීමක් කඩන එකයි අතර ලොකු වෙනසක් තිබෙනවා. ඒ වෙනස ආණ්ඩුව සහ අදාළ බලධාරීන් සැලකිල්ලට ලක් කරලා නැහැ. මහ රෑ ඉතාමත් අත්තනෝමතික විධියට, අමන විධියට තමයි මේ කටයුත්ත කර තිබෙන්නේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

[බාධා කිරීමක්] හාමුදුරුවන් මැරුවෙත් මහ රෑ නේද ?

විමල් වීරවංශ මහතා
(திரு. விமல் வீரவங்ச)
(Mr. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය ආකාරයෙන් බාල විධියට මේ ප්‍රශ්නය සැලකිල්ලට ලක් කරන්න එපා. මේක සාමාන්‍ය කාලයක්. මේක සාමාන්‍ය තත්ත්වයක් යටතේ සිදු වුණු දෙයක්. [බාධා කිරීමක්] එතුමාට දෙයියන්ගේ හාල් කැවුණාට, එතුමාටයි, එතුමාගේ නියෝජ්‍ය ඇමැතිටයි පිස්සුද කියන්න මම දන්නේ නැහැ. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

විමල් වීරවංශ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කථා කිරීමට තිබෙන කාලය අවසානයි. කරුණාකර වාඩි වෙන්න.

විමල් වීරවංශ මහතා
(திரு. விமல் வீரவங்ச)
(Mr. Wimal Weerawansa)

කරුණාකර ඔබතුමා මේ ගැන සැලකිල්ලට ලක් කරන්න. මොකද මේ සිද්ධියෙන් පසුව එතැන මුස්ලිම් ජනයාට විරුද්ධව සිංහල ජනයා පොළඹවන ව්‍යාපාරයකුත් ක්‍රියාත්මක වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! විමල් වීරවංශ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

විමල් වීරවංශ මහතා
(திரு. விமல் வீரவங்ச)
(Mr. Wimal Weerawansa)

එම නිසා මේ අමන තකතීරු තීරණය ඉල්ලා අස් කර ගන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

ගරු එම්. සී. ගොපල්ලව අමාත්‍යතුමා. විනාඩි 3යි.

ගරු එම්. සී. ගොපල්ලව මහතා
(மாண்புமிகு எம். சீ. கொபல்லாவை)
(The Hon. M. C. Gopallawa)

ගරු කථානායකතුමනි, [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, කරුණාකර නිශ්ශබ්ද වන්න.

ගරු එම්. සී. ගොපල්ලව මහතා
(மாண்புமிகு எம். சீ. கொபல்லாவை)
(The Hon. M. C. Gopallawa)

මේ ගරු සභාවට ඉදිරිපත් වුණු යෝජනාවේ සඳහන් ඇෆ්ගනිස්ථානයේ තිබෙන බුදු පිළිම කඩා දැමීම සම්බන්ධව මුළු ලෝකයම අද විරෝධය පාලා තිබෙනවා. මෙවැනි අවස්ථාවක ආර්. එම්. රත්නායක ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවේ සඳහන් වුණේ බෞද්ධ ලෝකයට එකතු වෙලා මේ ගැන කරුණු ඉදිරිපත් කරන්න ලංකාවෙන් නායකත්වය ගන්නයි කියන ඉල්ලීමයි කියා මම හිතනවා. නමුත් මම හිතනවා, ඒක කෙලවර වුණේ පුංචි බොරැල්ලේ සිද්ධියෙන්. ඒ ගැන කථා කිරීම අපි නතර කරලා මූලිකව අද දින යෝජනාවේ සඳහන් වුණු දේ ගැන සලකා බලන්න කාලය ඇවිල්ලා තිබෙනවායි කියන එකයි මගේ මූලික අදහස. ඒ වාගේම මම හිතන්නේ ලෝකයේ තිබෙන බෞද්ධ රටවල් ඔක්කොම එකමුතු කරලා මේක කියන ගමන්ම – විමල් වීරවංශ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේක ලෝක උරුමයට ඇතුළත් කරලා නැහැ. ඒ රට ඉල්ලීමක් කරලත් නැහැ. යුනෙස්කෝ එකෙන් මේ වැඩේ කෙරිලත් නැහැ. ඒ නිසා ලෝකයේ බෞද්ධ රටවල් ටික එකමුතු කරගෙන ඒ අය සියලුදෙනාම එක හඬින් මේ ගැන කියා සිටිය යුතුයි කියා මම අදහස් කරනවා. ලෝකයේ අනිත් රටවල්වලත් සහයෝගය ලබා ගෙන මේක ලෝක උරුමයට යටත් කර ගැනීමෙන් මෙය ආරක්ෂා කරගන්න යම් කිසි කෙනෙක් සිටිනවා.

8 වෙනි ශත වර්ෂයේ සිට මෙය බෞද්ධ රටක් වශයෙනුයි තිබිලා තිබෙන්නේ. මෙහි දාගැබ් තිබිලා තිබෙනවා. පන්සල් තිබිලා තිබෙනවා. මේවා එකින් එක විනාශ වෙමින්, විනාශ වෙමින් ඒ රටේ රාජ්‍ය ආගම ඉස්ලාම් ආගම වුණු වෙලාවේ සිට ඒවායේ පිරිහීමක් ඇති වෙලා තිබෙනවා. ඒකෙනුත් දැන් අවසාන කැල්ලටයි අපි ඇවිත් සිටින්නේ. මේ බුදු පිළිම දෙකත් අවසාන කර කඩලා දමන තැනටයි අපි ඇවිත් තිබෙන්නේ. එම නිසා අපේ ගරු අග්‍රාමාත්‍යතුමා නායකත්වය අරගෙන, බෞද්ධ ලෝකය එකමුතු කර මේවා ලෝක උරුමයන් කරන්න කියා යුනෙස්කෝ ආයතනයෙන් ඉල්ලීමක් කරන්න කියන ඉල්ලීම මමත් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

බොහොම ස්තුතියි. ඊළඟට ගරු අග්‍රාමාත්‍යතුමා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු රත්නසිරි වික්‍රමනායක මහතා (අග්‍රාමාත්‍ය, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)

*(மாண்புமிகு ரத்னசிறி விக்ரமநாயக்க - பிரதம அமைச்சரும் புத்தசாசன, சமய அலுவல்கள் அமைச்சரும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும்)*

(The Hon. Ratnasiri Wickramanayake – Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs and Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කරමින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වේ, විශාල ඉතිහාසයක් තිබෙන ප්‍රදේශයක් වන ඇෆ්ගනිස්ථානයේ මේ සිදු වුණා වූ - 'අපරාධ' කියන වචනය මම පාවිච්චි කරනවා. - අපරාධ සම්බන්ධව ලංකාවේ මූලිකත්වය යටතේ අනාගත වැඩ පිළිවෙළක් ගොනු කරන්න කියලයි. ඒ අතීතය ගැන තර්කයක් නැහැ. ඇෆ්ගනිස්ථානය ඇතුළු ඒ ප්‍රදේශය බෞද්ධ දර්ශනවාදය යටතේ ඇති වුණු සංස්කෘතියක් එක්ක ඇදුණු රටවල් බව අපි කවුරුත් දන්නවා. නමුත් මේ වුණු අපාරාධය වළක්වාලන්නට මුළු ලෝකයම එක්කාසු වී සිටියත් ඇෆ්ගනිස්ථාන රජය එයට එකඟ වුණේ නැහැ. මුස්ලිම් රටවල් 81ක් සම්බන්ධ වී, ශ්‍රී ලංකාවත් ජර්මනියත් ඒකාබද්ධ වී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යෝජනා ස්ථිර කළත් මෙය නවත්වන්න බැරි වුණා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලේකම්වරයා ගිහින් ඉල්ලීමක් කළත් එයට අවනත වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ආකාරයේ පසුබිමක් යටතේයි මේ සිද්ධිය වුණේ. මේ සම්බන්ධයෙන් කළ යුතු දෙයක් ගැන දන් අපේ රජය කල්පනා කර තිබෙනවා. පිළිම වහන්සේලා දෙනමක් සම්පූර්ණයෙන් නැති කර දමා තිබෙන එක ඇත්ත. ඒ අනුව දන් කොපමණ ඉතිරි වෙලා තිබෙනවාද කියා අපට දනගන්නට වුවමනා වී තිබෙනවා.

ඒ කෞතුකාගාරවල තිබුණ වූ වස්තූන්වලට මොකද වුණේ? ඒවා කොල්ල කා තිබෙන බව ඇත්ත. ඒ බව සඳහන් වෙනවා. ඒ වස්තූන් කොල්ලකෑ පසු, සමහර ඒවා ඒ රට තුළ තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පකිස්ථානයේ සිටින ඇෆ්ඝනිස්ථානු තානාපතිවරයා පකිස්ථානයේදී මට හමු වුණා. එතුමාත් සමඟ මම මේ ගැන සාකච්ඡා කළා. 'කෞතුකාගාරවල තිබුණු වස්තූන්වලට මොකද වුණේ' කියා අපි එතුමාගෙන් ඇහුවා. 'ඒවා කොල්ල කාලාය කියා එතුමා කිව්වා. කොල්ල කෑමෙන් අනතුරුව සමහර ඒවා යුරෝපයට ගිහින් තිබෙන බව ඇත්ත. ඒවා ඓතිහාසික වස්තූන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා කී ආකාරයට සමහර ඒවා ඒ රටේ මිනිසුන් අතර තිබෙන බව ඇත්ත. 'අපට මේවා මිල දී ගන්නට වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න බැරිද ? කියා අපි එතුමාගෙන් ඇහුවා. 'ශ්‍රී ලංකාව ඇතුළු අනෙකුත් බෞද්ධ රටවල් ඒකාබද්ධ වී මේවා මිලට ගැනීමේ වැඩ පිළිවෙළක් අපි ඉදිරිපත් කරන්නම්, ඊට එකඟ වෙනවාද?' කියා අපි ඇහුවා.

ඒ අතරතුර පාකිස්ථානයේ විදේශ අමාත්‍යවරයා ජපානයේ චාරිකාවකින් පසු එරටට පැමිණ සිටින විට, මම ආපසු එන දිනට පෙර දින එතුමා මට දුරකථනයෙන් කථා කළා. මම හෙට උදේ එයාර් පෝට් එකට එනවා. ජපන් රජය සමඟ සාකච්ඡා කළ දේවල් මම එහිදී කියන්නම්' කියා එතුමා කිව්වා. ඒ අනුව එතුමා, 'ශ්‍රී ලංකාව ඇතුළු ආසියානු කලාපයේ තිබෙන අනෙකුත් බෞද්ධ රටවල් එක්කාසු වී යම්කිසි සංවිධානයක් ඇති කර ගෙන, ජනතාවට අයිති මේ කෞතුක වස්තූන් මිලට ගැනීමේ වැඩ පිළිවෙළකට එන්න' ය කියන යෝජනාව ජපානයෙන් අපට අරගෙන ආවා. ඒ කාර්‍යය සඳහා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දන් අපි විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා එවැනි සංධානයක් ඇති කර ගැනීමට වැඩ පිළිවෙළක් ගෙන යනවාය කියන පණිවුඩය තමුන්නාන්සේ ඉදිරියේ තබමින් මම නවතිනවා. ස්තුතියි.

*එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව 2001 මාර්තු 29 වන දින සභාසම්මතිය අනුව 2001 අප්‍රියෙල් 5, වන බ්‍රහස්පතින්ද, පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය*

*அப்பொழுது நேரம் பி. ப. 6.30 மணியாகிவிடவே பிரதிச் சபாநாயகர் அவர்கள் வினாவிடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி, பாராளுமன்றம் அதனது 2001 மார்ச், 29 ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2001 ஏப்பிறல் 5, வியாழக்கிழமை மு. ப. 10.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being 6.30 p.m. Mr. Deputy Speaker adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 10.00 a.m. on Thursday, 5th April, 2001 pursuant to the Resolution of the Parliament of 29th March 2001.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා හැන්සාඩ් සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் ஹன்சாட் பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 10.00 a.m. to 6.30 noon on 04.04.2001** |
| **Final set of manuscripts received from Parliament** | : | **3.25 p.m. on 09.05.2001** |
| **Printed copies despatched** | : | **15.05.2001 Morning** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Vide - Abeyaratne Committee Report, as well.
- Administrative Reforms Committee Reports

**දායකමුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2,178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු 2.50කි. කොළඹ 1. ලෝටස් පාර. ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, අංක 32. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.**

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15 தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 32, டிரான்ஸ்வேர்க்ஸ் இல்லம், லோட்டஸ் வீதி, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப் பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscription : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATION BUREAU, No. 32, Transworks House, Lotus Road, Colombo 1. The fee should reach him on or before November 30 each year. Late application for subscriptions will not be accepted.**

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org